| ප්‍රජා විහිදුම්කරණ ක්‍රියාකාරකම් | i. කේ.ජී.ප්‍රියශාන්ත මහතා වාණිජ දිනය සඳහා සම්පත් දායකයකු විය<br>ii. ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ කුඩා ව්‍යවසාය සංවර්ධන අංශය විසින් සංවිධානය කරන ලද ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහනේ සම්පත් දායකයකු ලෙස කේ.ජී.ප්‍රියශාන්ත මහතා කටයුතු කරන ලදී.<br>iii. කේ.ජී.ප්‍රියශාන්ත මහතාපෞරෂත්ව සංවර්ධන වැඩසටහනේ සම්පත් දායකයකු විය<br>iv. ආචාර්ය එම්.බී.එෆ්.මෆාසියා මිය මහ බැංකුවේ මාතර ශාඛාව විසින් සංවිධානය කරනු ලැබූ දකුණු පළාතේ ව්‍යවසායකන් සඳහා සම්මන්ත්‍රණය පවත්වන ලදී.<br>v. ආචාර්ය එම්.බී.එෆ්.මෆාසියා මිය - ව්‍යාපෘති නායක සහ එම්.ටී.ටී. ද සිල්වා මිය, සම්බන්ධීකාරක - ව්‍යාපාරික සේවා සපයන්නන්, ව්‍යවසායකයන් ශිෂ්‍යයන් සහ ප්‍රජාවේ දායකත්වය සහිතව පවත්වනු ලැබූ 2017 ව්‍යාපාරික සායනය<br>vi. දකුණු පළාත් සභාව විසින් සංවිධානය කරන ලද හොඳම ව්‍යවසායකයා සම්මානත තේරීමේ ඇගයුම් මණ්ඩල සාමාජිකයකු ලෙස ආචාර්ය එම්.බී.එෆ්.මෆාසියා මිය කටයුතු කරන ලදී.<br>vii. වෘත්තීය මාර්ගෝපදේශ ඒකකයේ පීඨ සම්බන්ධීකාරක වූ එම්.ටී.ටී. ද සිල්වා මිය විවිධ ක්‍රියාකාරකම් සහ සිදුවීම් මගින් කර්මාන්ත-පීඨ සහයෝගිතාව ඇති කිරීමට කටයුතු කරන ලදී.<br>viii. මහාචාර්ය එච්.එස්.සී. පෙරේරා මහතා සහ ආර්.එම්.ඩී.ඩී රත්නායක මහතා පහත රට තේ වගාකරුවන් සඳහා වැඩමුළුවක් පවත්වන ලදී. | i. රිච්මන්ඩ් විද්‍යාලයේ වාණිජ සිසුන්<br>ii. සංඝමිත්තා විද්‍යාලයේ වාණිජ ශිෂ්‍යාවන්<br>iii. දකුණු පළාතේ තෝරාගත් සුළු පරිමාණ ව්‍යාවසායකයන්<br><br>iv. රිච්මන්ඩ් විද්‍යාලයේ 8 සහ 9 වසරවල සිසුන්<br>v. දකුණු පළාතේ ව්‍යවසායකයන්<br><br>රාජ්‍ය-පුද්ගලික අංශ ආයතන සම්බන්ධ කර ව්‍යාපාරික ගැටලුවලට එම අවස්ථාවේම සැපයීම මගින් මෙම වැඩසටහන දකුණු පළාතේ ව්‍යාපාරික ප්‍රජාවට සහ ශිෂ්‍යයන්ට ප්‍රතිලාභ රාශියක් හිමි කර දෙන ලදී.<br><br>දකුණු පළාතේ ව්‍යවසායකයන්<br><br>පීඨයේ තෙවන සහ අවසන් වරස සිසුන් සඳහා කළමනාකරණ අභ්‍යාසලාභී |

| වැඩසටහන/ක්‍රියාකාරකම | සංඛ්‍යාව සහ/හෝ සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන් /නිමැවුම |
|---|---|---|
| | ix. එම්.ජී.ඩී.එස් සමාධි මිය නත්තල් වැඩසටහනක් සංවිධානය කරන ලදී.<br>x. මානව සම්පත් සංවර්ධන කවයේ ජ්‍යෝෂ්ඨ භාණ්ඩගාරික සහ රුහුණ විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨයේ මානම සම්පත් කළමනාකරණ බාහිර කථිකාචාර්ය ලෙස ආර්.ආර්.එන්.ටී. රත්නවීර මිය කටයුතු කරන ලදී.<br>xi. රුහුණ විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය සංගමයේ විගණක ලෙස ඒ.ජී.දීපාල් මහතා කටයුතු කරන ලදී.<br>xii. කළමනාකරණ හා මූල්‍ය පීඨයේ ආචාර්යවරුන්ගේ සංගමයේ භාණ්ඩාගාරික ලෙස ඒ.ජී.දීපාල් මහතා කටයුතු කරන ලදී.<br>xiii. කළමනාකරණ හා මූල්‍ය පීඨයේ ගිණුමකරණ හා මූල්‍ය අධ්‍යනාංශය විසින් පවත්වන ලද ගුණාත්මක පර්යේෂණ පිළිබඳ වැඩමුළුවට ජී.ඒ.එන්. දර්ශි මිය සහභාගි විය.<br>xiv. ICME 2017 ට සමගාමීව කළමනාකරණ හා මූල්‍ය පීඨයේ ගිණුමකරණ හා මූල්‍ය අධ්‍යනාංශය විසින් සංවිධානය කරන ලද ගුණාත්මක පර්යේෂණ පැවැත්විම පිළිබඳ වැඩමුළුවට ජී.කේ.චරිත් ජීවන්ත මහතා සහභාගි විය<br><br>xv. ICME 2017 හි මෙහෙයුම් කමිටුවේ සහ මූල්‍ය කමිටුවේ සාමාජිකයකු ලෙස වැඩමුළුවට ජී.කේ.චරිත් ජීවන්ත මහතා කටයුතු කරන ලදී.<br>xvi. මානව හා සමාජ විද්‍යා උසස් අධ්‍යයන ජාතික මධ්‍යස්ථානය වසින් SEM පිළිබඳව පවත්වනු ලැබූ වැඩමුළුවට ජී.කේ.චරිත් ජීවන්ත මහතා සහභාගි විය | වැඩසටහන ආරම්භ කිරීමට සහාය දක්වන ලදී |

**ප්‍රකාශන හා දැනුම ප්‍රචාරණය**

| කාණ්ඩය | සංඛ්‍යාව |
|---|---|
| උපුටා දැක්වීමේ සුචියේ ඇතුළත් ජාත්‍යන්තර සඟරාවල සම්පූර්ණ පත්‍රිකා හෝ කෙටි සන්නිවේදන | 02 |
| උපුටා දැක්වීමේ සුචියේ ඇතුළත් නොවූ ජාත්‍යන්තර සඟරාවල සම්පූර්ණ පත්‍රිකා හෝ කෙටි සන්නිවේදන | 03 |
| දේශීය සඟරාවල සම්පූර්ණ පත්‍රිකා හෝ කෙටි සන්නිවේදන | |
| මුද්‍රිත වාර්තාවල ඇතුළත් සම්පූර්ණ පත්‍රිකා | 08 |
| වාචික ඉදිරිපත් කිරීම්වල සංක්ෂේප | 03 |
| පෝස්ටර් ඉදිරිපත් කිරීම්වල සංක්ෂේප | |
| පොත් | |
| පොත්වල පරිච්ඡේද | 04 |
| වෙනත් සඟරාවල ශාස්ත්‍රීය ලිපි (සඟරා, ජාතික පුවත්පත් ආදිය.) | 01 |
| සංස්කරණ කාර්යය | 05 |

# වෛද්‍ය පීඨය

## පීඨාධිපතිගේ ප්‍රකාශය / සමාලෝචනය

ජනවාරි මාසයේ සිට නොවැම්බර් මාසය දක්වා ශිෂ්‍යයන් නොපැමිණීම හේතුවෙන් 2017 වසර තුළදී, රුහුණ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය ගැටලු රාශියකට මුහුණ දෙන ලදී. ඉහත කාල සීමාව තුළ ශිෂ්‍යයන් තම අධ්‍යයන කටයුතුවලින් ඉවත්ව සිටින ලදි.

ඒ සියලු දුෂ්කරතා මධ්‍යයේ පීඨය පහත දැක්වෙන විභාග පවත්වන ලදී.

1. තෙවන වෛද්‍ය උපාධිය කොටස I විභාගය (පුනර්) - 2017.03.22
2. තෙවන වෛද්‍ය උපාධිය කොටස IIවිභාගය (පුනර්) - 2017.04.23
3. අවසාන වෛද්‍ය උපාධි විභාගය (පුනර්) - 2017.05.02
4. අවසාන වෛද්‍ය උපාධි විභාගය (පුනර්) - 2017.11.20

ශිෂ්‍යයන් අධ්‍යයන කටයුතුවලට සහභාගි නොවූවද රුහුණ විශ්වවිද්‍යාලයේ ක්‍රිකට් තරඟාවලිය සහ අන්තර් පීඨ නැටුම් තරඟ වැනි වෙනත් ක්‍රියාකාරකම් සඳහා ඔවුන් සහභාගි විය. 2017 වසර තුළ පීඨ මණ්ඩල රැස්වීම් 11 ක් සහ විශේෂ පීඨ මණ්ඩල රැසිවීම් 5ක් පවත්වනු ලැබීය.

පීඨයේ ආචාර්ය මණ්ඩලය පහත සඳහන් පරිදි උසස්වීම් ලබාගන්නා ලදී.

**ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ධූරය**

මහාචාර්ය යූ.කේ.ජයන්ත මයා- ළමා රෝග විද්‍යා පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සහ මහාචාර්ය ටී.එස්.ඩී. අමරසේන මහතා -ළමා රෝග විද්‍යා පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය තනතුරට පත්විය.

**මහාචාර්ය ධූරය**

මහාචාර්ය එම්.ඩී.හෙට්ටිආරච්චි මහතා - න්‍යෂ්ඨීක වෛද්‍යවිද්‍යාව පිළිබඳ මහාචාර්ය ධූරය මහාචාර්ය ඒ ද එස් නාගහවත්ත මහතා - ක්ෂුද්‍ර ජීවවිද්‍යාව පිළිබඳ මහාචාර්ය ධූරයට පත්විය.

මහාචාර්ය ටී.සී.යහතුගොඩ මහතා - පරපෝෂවේද විද්‍යාව පිළිබඳ මහාචාර්ය ධූරය, මහාචාර්ය ආර්.ඩබ්ලිව්. සෙනෙවිරත්න මහතා -ශල්‍ය වෛද්‍ය විද්‍යා මහාචාර්ය ධූරය, මහාචාර්ය ආර්.එස්.ජේ. ලෙනෝරා මහතා - කායික විද්‍යාව පිළිබඳ මහාචාර්ය ධූරයට සහ මහාචාර්ය ඉසුරාණි ඉලේපෙරුම මෙනවිය - කාය ව්‍යවච්ඡේදවේදය පිළිබඳ මහාචාර්ය ධූරයට පත්විය.

**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ශ්‍රේණිය I**

ආචාර්ය එම්.ටී. නාපාගොඩ, ආචාර්ය ආර්.පී. හේවාවසම්, ආචාර්ය කේ.එම්.එස්.ඒ.කේ. ජයසේකර, ආචාර්ය සී.කේ.බෝධිනායක, ආචාර්ය එච්.එම්.එම්.හේරත්, ආචාර්ය සී.ජේ. විජේසිංහ,ආචාර්ය යූ.සී.පී. පෙරේරා,ආචාර්ය අයි.වී. දේවසිරි,ආචාර්ය එන්.ඩී.ලියනආරච්චි,ආචාර්ය පි.පී. ජයවර්ධන, ආචාර්ය කේ.ඒ.ගුණරත්න, ආචාර්ය ඒ.එස්. දසනායක, ආචාර්ය අයි.ඩී. සිරිවර්ධන, ආචාර්ය ජී.ඩී. පුංචිහේවා සහ ආචාර්ය අයි.එච්. රාජපක්ෂ යන මහත්ම මහත්මීන් පත්විය.

**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ශ්‍රේණිය II**

ආචාර්ය ජී.ඊ.ඩී ද සොයිසා, ආචාර්ය එන්.ජී. රණවක යන මහත්ම මහත්මීන් පත්විය.

පහත දැක්වෙන ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරුන්2017 වසරේදී විශ්‍රාම ගන්නා ලදී.

මහාචාර්ය අයි.එම්.ආර්. ගුණවර්ධන මහතා, මහාචාර්ය බී.ජී. නානායක්කාර මහතා සහ මහාචාර්ය සුසිරිත් මෙන්ඩිස් මහතා

වෛද්‍ය පීඨය යටතේ පැවැති සම සෞඛ්‍ය විද්‍යා උපාධි වැඩසටහන එයින් ඉවත් කොට 2017.09.21 දින සිට වෙනම පීඨයක් ලෙස පවත්වා ගෙන යන ලදී.

පීඨ යටිතල පහසුකම් සංවර්ධනය
පසුගිය වසර 15-20 ක කාලය තුළ ප්‍රයෝජනයට නොගත් "සී" දේශන ශාලාව අළුත්වැඩියා කොට සේවය සඳහා යොදා ගන්නා ලදී.

ආචාර් ධර්ම සමාලෝචන කමිටුව සඳහා කාමරයක් වෙන් කොට අළුත්වැඩියා කරන ලදී. ප්‍රතිතනය ලබාගැනීම අවශ්‍යතාවයක් බැවින් එය ආචාර ධර්ම සමාලෝචන කමිටුව වෙත බාරදෙන ලදී.
භිෂග්වේද අධ්‍යනාංශයට සම්බන්ධ වූ ආචාර්යවරයකුට ඉඩ පහසුකම් සැලසීම පිණිස භිෂග්වේද අධ්‍යනාංශය සඳහා කාර්යාල කාමරයක් ඉදිකරන ලදී.

පීඨය නැවත පින්තාරු කිරීම ආරම්භ කළ අතර එය 2018 වසරේදී සම්පූර්ණ කිරීමට නියමිතය. පීඨයේ සම්මන්ත්‍රණ ශාලාව අළුත්වැඩියා කිරිමද ආරම්භ කරන ලද අතර එය 2018 වසරේදී සම්පූර්ණ කිරීමට නියමිතය. පීඨයේ බාහිර පෙනුම ඉහළ නැංවීම පිණිස අළුතින් ගස් සිටුවා පීඨ උද්‍යානයවැඩි දියුණු කරන ලදී.

පීඨයේ දොළොස් මහල්නව ගොඩනැගිලි ඉදිකිරීම් ව්‍යාපෘතිය 2017.12.04 දින ආරම්භ කරන ලදී.

2017.11.20 සිට සිසුන් නැවත සිය අධ්‍යයන කටයුතු ආරම්භ කරන ලද අතර මේ දක්වා එම කටයුතු ඉතා හොඳින් සිදුවෙමින් පවතී.

2017 වසර සඳහා වෛද්‍ය පීඨයේ ප්‍රාග්ධන උපකරණ මිලයට ගැනීම සඳහා රු. මිලිය 39.44 ක් වැය කර තිබේ.

### කාර්ය මණ්ඩල සහභාගීත්වය හා කාර්‍ය්‍ය සාධන

| වැඩසටහන් / ක්‍රියාකාරකම | සංඛ්‍යාව සහ/ හෝ සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභින් / නිපැවුම |
|---|---|---|
| අළුතින් හඳුන්වා දුන් උපාධි පාඨමාලා | <u>ප්‍රජා වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය</u><br>2018 වසරේදී මෙම විෂය හඳුන්වාදීම පිණිස පවුල් වෛද්‍ය උපාධි අපේක්ෂක විෂයමාලාව සකස් කරන ලදී. | |
| දුරස්ථ අධ්‍යාපන වැඩසටහන් හෝ ව්‍යාප්ති පාඨමාලා | <u>ක්ෂුද්‍රජීව විද්‍යා අධ්‍යයනාංශය</u><br>පශ්චාත් වෛද්‍ය විද්‍යා උපාධි ආයතනයේ (PGIM) පුහුණුලාභින් සඳහා වෛද්‍ය ක්ෂුද්‍ර ජීව විද්‍යා ඩිප්ලෝමාව<br><br><u>ධාත්‍රික හෘත හා නාරිවේද අධ්‍යයනාංශය</u><br>**i.**වෛද්‍ය එස්. කුලරත්න මයා<br>වෛද්‍ය ජේ. ඒ. පී. ධම්මික මයා<br>වෛද්‍ය කේ. ඒ. ගුණරත්න මයා<br>වෛද්‍ය එම්. එෆ්. එම්. රමීස් මයා<br>වෛද්‍ය. ඩී එල් ඩබ්ලිව්. දසනායක මයා<br>} ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සම්බන්ධීකාරක කථිකාචාර්ය<br>වෛද්‍ය එම්. ඒ. ජී. ඉරේෂා මිය<br><br>**ii** නව යොවුන් සෞඛ්‍ය මොඩියුලය - ප්‍රජනක සෞඛ්‍ය ඩිප්ලෝමාව, වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය, කොළඹ විශ්ව විද්‍යාලය | වෛද්‍ය පශ්චාත් උපාධි ආයතනය, කොළඹ විශ්ව විද්‍යාලය<br><br>**i.** උපාධි අපේක්ෂක වෛද්‍ය සිසුන් සහ ප්‍රසවවේද සහ නාරිවේද පශ්චාත් උපාධි පුහුණුලාභීන් ප්‍රසවවේද හා නාරිවේද පශ්චාත් උපාධි පුහුණුලාභින්<br><br>**ii.** ප්‍රසවවේද හා නාරිවේද පශ්චාත් උපාධි පුහුණුලාභින් |

| වැඩසටහන් / ක්‍රියාකාරකම | සංඛ්‍යාව සහ/ හෝ සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභින් / නිපැවුම |
|---|---|---|
| | **iii** වෛද්‍ය එස්. කුලරත්න, වෛද්‍ය ජේ. ඒ. පී. ධම්මික, වෛද්‍ය කේ. ඒ. ගුණරත්න, වෛද්‍ය එම් එෆ් එම් රමීස් වෛද්‍ය ඩී එල් ඩබ් දසනායක, වෛද්‍ය එම් ඒ ජී ඉරේෂා යන මහත්ම මහත්මීන් විද්‍යාවේදී (හෙද) උපාධි වැඩසටහනට දායක විය. | **iii.** පරිපූරක වෛද්‍ය උපාධි වැඩසටහනේ ශිෂ්‍යයන් |
| ශාස්ත්‍ර අයකරන පාඨමාලා | <u>කාය ව්‍යවච්ඡේද අධ්‍යයනාංශය</u><br>තෝරා ගත් ශිෂ්‍යයින් සඳහා ඉගැන්වීම (2) | |
| | <u>මනෝ වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය</u><br>ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන උපදේශන ඩිප්ලෝමා පාඨමාලාවේ ඉගැන්වීම සිදු කරන ලදි. | |
| ප්‍රජා විහිදුම්කරණ සේවා | <u>ජෛව රසායන අධ්‍යයනාංශය</u><br>**i.** වෛද්‍ය සී.එම්. වික්‍රමතිලක මිය - ආහාර මගින් බෝවෙන රෝග සහ ආහාර සුරක්ෂිතතාව; රුහුණ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය සමග සහයෝගිතාවයෙන් ශ්‍රී ලංකා පෝෂණ සංගමය-දේශීය | **i.** ආහාර අලෙවිකිරීම් සහ ආශ්‍රිත අංශවල දැනුම වැඩි දියුණු කිරීම |
| | **ii.** වෛද්‍ය සී.එම්. වික්‍රමතිලක මිය -"බෝ නොවන රෝග සහ නිදන්ගත වකුගඩු රෝගය වැළැක්වීම" පිළිබඳ සම්මන්ත්‍රණය -දේශීය | **ii** පාසල් ළමුන් අතර බෝ නොවන රෝග සහ නිදන්ගත වකුගඩු රෝගයවැළැක්වීම පිණිස තරුණ පරම්පරාවේ දැනුම සහ චර්යාවන් වැඩි දියුණු කිරීම |
| | <u>ප්‍රජා වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය</u><br>**i.** මාතෘ හා ළමා වෛද්‍ය සායන සේවාව, පාසල් වෛද්‍ය පරීක්ෂාව<br>ප්‍රජා අක්ෂි විද්‍යා සායනය<br>ප්‍රජා සම්බන්ධන වැඩසටහන | **i.** බෝපේ පෝද්දල සෞ.වෛ.කා. ප්‍රදේශය<br>**ii.** දකුණු පළාත බෝපේ පෝද්දල සෞඛ්‍ය වෛද්‍ය කාර්යාල ප්‍රදේශය |

| වැඩසටහන් / ක්‍රියාකාරකම | සංඛ්‍යාව සහ/ හෝ සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභින් / නිපැවුම |
|---|---|---|
| | <u>වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය</u><br>**i.** වෛද්‍ය සී. කේ. බෝධිනායක මිය - සැම බදාදා දිනකම වෛද්‍ය සායන -ශික්ෂණ රෝහල, කරාපිටිය<br>**ii.** මහාචාර්ය කේ. ඩී. පතිරණ මයා- සැම බ්‍රහස්පතින්දා දිනකම උදැසන ස්නායුවේද පරික්ෂණ පැවැත්වීම,වෛද්‍ය පීඨය සහ සවස්වරුවේ ස්නායු පරික්ෂණ – ශික්ෂණ රෝහල, කරාපිටිය<br>**iii.** වෛද්‍ය එච් එම් එම් හේරත් මයා- සැම අඟහරුවාදා දිනකම වෛද්‍ය සායන – කරාපිටිය ශික්ෂණ රෝහල<br>දියවැඩියාව සහ අධිලිපිඩතාව හඳුනාගැනීම සඳහා ප්‍රජා පරීක්ෂණ වැඩසටහන, යක්කලමුල්ල<br>**iv.** වෛද්‍ය අරෝෂ දිසානායක මයා -සැම බ්‍රහස්පතින්දා දිනකම සවස්වරුවේ වෛද්‍ය සායන – ශික්ෂණ රෝහල, කරාපිටිය<br>බ්‍රහස්පතින්දා උදැසන සායන – දකුණු නාවික අනුකණ්ඩය, බූස්ස<br>**v.** වෛද්‍ය එන්. ජේ. දහනායක මයා- සැම සිකුරාදා දිනකම සවස් වරුවේ වෛද්‍ය සායන – ශික්ෂණ රෝහල, කරාපිටිය | |
| | <u>ක්ෂුද්‍රජීව විද්‍යා අධ්‍යයනාංශය</u><br>ක්ෂුද්‍ර ජීව විද්‍යා රෝග විනිශ්චය සේවා - නොමිලේ සහ මුදල් අයකර පවත්වන ලදි. | රෝහල්ගත රෝගීන් සහ බාහිර රෝගීන් |
| | <u>ධාත්‍රික හෘත හා නාරිවේද අධ්‍යයනාංශය</u><br>**i.** පාසල් ළමුන් නව යෞවන වියේදී අභියෝගයන්ට මුහුණ දිය යුත්තේ කෙසේද පිළිබඳ දේශනයක් සහ පොදු මහජනතාවට සහ 12/13 වසර පාසල් සිසුන් සඳහා ගර්භණී සමයේදී රැකවරණය පිළිබඳ දේශනය<br>**ii.** වෛද්‍ය ඩී.එල්.ඩබ්ලිව් දසනායක මයා<br>පුරෝසූති මව්වරුන් සඳහා සෞඛ්‍ය අධ්‍යාපන වැඩසටහන<br>iii. වෛද්‍ය එම්.ඒ.ජී. ඉරේෂා මිය<br>රිච්මන්ඩ්, සංඝමිත්තා සහ සවුත්ලන්ඩ්ස් පාසැල්වල සෞඛ්‍ය කඳවුරු පවත්වන ලදි. | **i.** පාසල් සිසුන්<br>**ii.** ගර්භණී මව්වරුන්<br>**iii.** පාසැල් සිසුන් |
| | <u>ළමා රෝග විද්‍යා අධ්‍යයනාංශය</u><br>**I.** සාමාන්‍ය ළමා රෝග සායන පැවැත්වීම,අඟහරුවාදා හා බ්‍රහස්පතින්දා<br>**II.** වකුගඩු සායන- බදාදා දිනයන්හි<br>**III.** වර්ධන හෝමෝන සායන - මසකට වරක් පවත්වන ලදි. | නිවාරණය සහ සත්කාරය |
| | පූර්ව සීමාවාසික හෙදියන් සඳහා උසස් ළමාරෝග ජීවිතාධාරක සහ ජාතික උසස් ජීවිතාධාරක | ජීවිතාධාරක කුසලතා |
| | <u>පරපෝෂවේද අධ්‍යයනාංශය</u><br>**i.** පරපෝෂවිද්‍යා රෝග විනිශ්චය සේවා | **i. AOC** සඳහා මල නියැදි පනස් පහක් සමීක්ෂා කරන |

| වැඩසටහන් / ක්‍රියාකාරකම | සංඛ්‍යාව සහ/ හෝ සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන් / නිපැවුම |
|---|---|---|
| | | ලදි. සෘජු මල තැවැරුම් භාවිතා කරමින් ආන්ත්‍රික ඇම්බයෝසිස් සිද්ධි හතරක්, ගියාර්ඩියාසිස් සිද්ධි එකක්, එන්ටරෝබයාසිස් සිදධි එකක් සහ කොකු පණු ආසාදන සිද්ධි දෙකක්, ඇස්කාරියාසිස් සිද්ධි දෙකක් සහ බෙරිටයිලියාසිස් සිද්ධි එකක් හඳුනා ගන්නා ලදී. මැලේරියා වැලඳී ඇතැයි සැක කරන රෝගින් සඳහා තුනී සහ ඝන පටල 16ක් සහ මැලේරියා ප්‍රතිදේහජනකපරීක්ෂණ 05 ක් සිදු කරන ලදි. එක් මිශ්‍ර ආසාදනයක් සහ **p.v.** වැළැඳුණු තුනක් සොයා ගන්නා ලදී. බරවා රෝග ICTපරීක්ෂණ පහක් සිදුකරන ලදී. පරපෝෂිතයන් සඳහා ශරීර චූෂිත හයක් පරීක්ෂා කරන ලදී. ඉන් එකක් ඇමීබයෝසිස් සඳහා ධනාත්මක විය. නියුමොසයිටිස් ජිරෝවෙසි හෝ ලෙයිෂ්මේනියා සම්බන්ධ ධනාත්මක සිද්ධි වාර්තා නොවීය. |
| | **ii.** වසා බරවා රෝගය තුරන් කිරීම සඳහා ජාතික වැඩසටහන යටතේ සම්ප්‍රේෂණ තක්සේරුකරණ සමීක්ෂණය | ii. ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කවල මූත්‍රා නියැදි 1570 ක් එකතු කර ගත් අතර ඉන් 20 ක් ධන විය. ධන නියැදි අතුරින් 15ක් (75%) ගාල්ල බලපිටිය ප්‍රදේශයේ පාසල්වලින් විය. |
| | **iii.** බරවා සායනය පැවැත්වීම | iii. බරවා වසාශෝථ රෝගීන්124 දෙනෙකු අළුතින් හඳුනා ගන්නා ලදි. ඔවුන් සියලු දෙනාම ප්‍රජා නිවාස පාදක ප්‍රතිකාර වැඩසටහනට යොමු කරන ලද අතර සායනයේදී පසු විපරම් කටයුතු කරන ලදි. **LEDoxy** අධ්‍යයනය සඳහා |

| වැඩසටහන් / ක්‍රියාකාරකම | සංඛ්‍යාව සහ/ හෝ සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන් / නිපැවුම |
|---|---|---|
| | | සුදුසුකම් ඇති අයට RCT සඳහා ආරාධනා කරනු ඇත. |
| | <u>ව්‍යාධිවේද අධ්‍යයනාංශය</u><br>i. ප්ලාස්මා ග්ලූකෝස් පරික්ෂණය අධ්‍යයනාංශයේ පවත්වමින් රසායනික ව්‍යාධිවේදයේ රෝග විනිශ්වය සේවාව ස්ථාපිත කරන ලදී.<br>කරාපිටිය ශික්ෂණ රෝහලේ මහාචාර්ය ඒකක සඳහා පටක ව්‍යාධිවේද සහ ශෛල ව්‍යාධිවේද සේවා (පටක ව්‍යාධිවේද නිදර්ශක 1395 ක් සහ සෛල ව්‍යාධිවේද නිදර්ශක 400 ක් සකසා වාර්තා කරනලදි.)<br>දකුණු පළාත / සබරගමුව පළාත සඳහා රෝග විනිශ්වය ප්‍රතිශක්ති පටක රසායන විද්‍යා පර්යේෂණාගාර සේවා (ප්‍රතිශක්ති පටක රසායන විද්‍යා පරික්සා 253 ක් පවත්වා වාර්තා කරනලදී.) | i. කරාපිටිය ශික්ෂණ රෝහලේ රෝගීන් |
| | වෛද්‍ය චන්දන වික්‍රමරත්න මයා<br>ii. නිරක්තිය සඳහා වැඩිහිටියන් පරීක්ෂණය<br>iii. නිරක්තිය සඳහා ළමුන් පරීක්ෂණය | ii. ජ්‍යෙෂ්ඨ පුරවැසියන්<br>iii. ළමුන් |
| | <u>ශල්‍ය වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය</u><br>**i.** විශ්වවිද්‍යාල ශල්‍යකර්ම ඒකකයේ වාට්ටු 3 සහ 5 - රෝගීන් සඳහා රෝගී ප්‍රතිකාර සපයන ලදී.<br>**ii.** සඳුදා සහ සිකුරාදි දිනයන්හි බාහිර රෝගී විශ්වවිද්‍යාලීය ශල්‍යකර්ම සායන පවත්වන ලදි. | i. ජාතික සෞඛ්‍ය සේවා |
| | **iii** අතිරේක සායන<br>• අපස්ඵීත ශිරා සායනය - වෛද්‍ය එම්. එම්. ඒ. ජේ. කුමාර මහතා පවත්වන මෙම සායනය **E** සහ **F** ශල්‍යාගාරයේදි සතියක් හැර සතියක් අඟහරුවාදා දින පැවැත්වේ.<br>• පසු විපරම් සායනය - වෛද්‍ය ජේ. පී. එම්. කුමාරසිංහ මහතා පවත්වන මෙම සායනය වාට්ටු අංක 03 හි පැවැත්වේ.<br>• පූර්ව නිර්වින්දක තක්සේරුකරණ සායනය - වෛද්‍ය යූ. අයි. මහතා විසින් පවත්වනු ලබන මෙම සායන සැම සිකුරාදා දිනකම වාට්ටුඅංක 03 හි පැවැත්වේ.<br>• වාට්ටු අංක 05 හි අධි පරායත්තතා ඒකකය - වාට්ටුව සහ දැඩි සත්කාර ඒකකයට අතරමැදි ප්‍රතිකාර පහසුකමක් ලෙස වෛද්‍ය යූ.අයි.හපුආරච්චි මතා එය භාරව සිටී. | ii. ජාතික සෞඛ්‍ය සේවා |
| | iv ශල්‍යකර්ම ( A සහ B, C සහ D, E සහ F, ETC ශල්‍යාගාර, කුඩා ශල්‍යාගාරය) හදිසි රෝගීන් සහ විධිගත ශල්‍ය කර්ම : | |
| | **v** අන්තරේක්ෂණය: ආමාශ යාන්ත්‍රික අන්තරේක්ෂණය | |

| වැඩසටහන් / ක්‍රියාකාරකම | සංඛ්‍යාව සහ/ හෝ සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන් / නිපැවුම |
|---|---|---|
| | **vi** ප්‍රකාශතන්තුරේක්ෂය: කරාපිටිය ශික්ෂණ රෝහලේ ශල්‍යාගාරයේ/ ETCහි උසස් ප්‍රකාශතන්තුරේක්ෂණ ශල්‍ය පහසුකම් භාවිතා කරමින් ප්‍රකාශතන්තුරේක්ෂණ ශල්‍යකර්ම සිදුකරන ලදී. | |
| | <u>මනෝ වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය</u><br>i. **අ.** සාමාන්‍ය වැඩිහිටි මනෝ වෛද්‍ය විද්‍යා සායන 2යි<br>**ආ.** ළමා මනෝ විද්‍යා සායන 1 යි<br>**ඇ.** පාසැල් වැඩසටහන | මානසික සෞඛ්‍ය ගැටලු සහිත වැඩිහිටියන් හා ළමුන් |
| | ii. අ. මාතෘ මානසික සෞඛ්‍ය සායන 1<br>ආ. සම්බන්ධීකරණ සායන 2<br>ඇ. ස්නායු මනෝවිද්‍යාත්මක ඇගයීම් -සතියකට සායන 4 | ii මානසික සෞඛ්‍ය ගැටලු සහිත ගර්භණී මව්වරුන්, නිදන්ගත වෛද්‍ය විද්‍යාත්මක ගැටලු සහිත වැඩිහිටියන් සහ ස්නායු ප්‍රජානන සහ ස්නායු සංවර්ධනමය ඇගයීම් අවශ්‍ය වැඩිහිටියන් හා ළමුන් |
| විෂයමාලා සංවර්ධනය (පාඨමාලා ඒකක / විෂය වැඩි දියුණු කිරිම) | <u>ජෛව රසායන විද්‍යා අධ්‍යයනාංශය</u><br>**i.** මහාචාර්ය කේ. ඒ. පී. ඩබ්. ජයතිලක, වෛද්‍ය ආර්. පී. හේවාවසම්. වෛද්‍ය එම්. ටී. නාපාගොඩ, වෛද්‍ය ඒ. පී. අත්තනායක, වෛද්‍ය සී. එම්. වික්‍රමතිලක, සහ වෛද්‍ය ජී.ඊ. ඩී ද සොයිසා යන මහත්ම මහත්මීන් ජෛව රසායන විද්‍යා විෂයමාලා ප්‍රතිශෝධනය සඳහා දායක වන ලදී. | උපාධි අපේක්ෂකයන් |
| | <u>ක්ෂුද්‍ර ජීව විද්‍යා අධ්‍යයනාංශය</u><br>වෛද්‍ය විද්‍යා උපාධිය කොටස 1 ක්ෂුද්‍රජීව විද්‍යා විෂයමාලාව ප්‍රතිශෝධනය | වෛද්‍ය විද්‍යා උපාධිය කොටස 1 ශිෂ්‍යයන් |
| | <u>ධාත්‍රික හෘත හා නාරිවේද අධ්‍යයනාංශය</u><br>වෛද්‍ය ඩී. එල්. ඩබ්ලිව්. දසනායක මයා<br>අනුකම්පු සාමාජික - පවුල් වෛද්‍ය විද්‍යාව උපාධි අපේක්ෂක විෂයමාලාව තුළට ඇතුලත් කිරිම | උපාධි අපේක්ෂකයන් |
| | <u>ළමා රෝග විද්‍යා අධ්‍යයනාංශය</u><br>**i.** ළමා වෛද්‍ය විද්‍යා විෂයමාලාව සංවර්ධනය | රුහුණ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය සිසුන් |
| | <u>ව්‍යාධිවේද අධ්‍යයනාංශය</u><br>වෛද්‍ය ටී.ජී. ලියනගේ මහතා<br>ජෛවපටක ප්‍රායෝගික සඳහා අසම්පූර්ණ අධ්‍යයන තොරතුරු (පින්තුර කාඩ්පත්)<br>පටක ව්‍යාධිවේදයේ ප්‍රායෝගික සංරචකයට අසම්පූර්ණ පටකව්‍යාධිවේදී කෞතුකාගාර නිදර්ශකය | සිසුන්ට පහසුවෙන්ම ප්‍රායෝගික ව්‍යාධිවේදයේ මූලික කරුණු අවබෝධ කර ගැනීමට හැකිය. |

| **වැඩසටහන් / ක්‍රියාකාරකම** | **සංඛ්‍යාව සහ/ හෝ සංක්ෂිප්ත තොරතුරු** | **ප්‍රතිලාභීන් / නිපැවුම** |
|---|---|---|
| | භිෂග්වේද අධ්‍යයනාංශය<br>(වෛද්‍ය සුධීරා ජයසිංහ මිය, වෛද්‍ය ගයනි ලියනගේ මෙය)<br>i. වෛද්‍ය උපාධිය, හෙද විද්‍යාවේදී උපාධිය සහ ඖෂධවේදී විද්‍යාවේදී උපාධියේ භිෂග්වේද විෂයමාලා ප්‍රතිශෝධනය<br>**ii.** ක්ලෝවීයශ්වාසය පිළිබඳ මොඩියුලයක් හඳුන්වා දෙන ලදී.<br>**iii.** ඉන්සියුලින් ලබාදීමේ ක්‍රමවේද පිළිබඳව ශ්‍රව්‍ය දෘශ්‍ය ඉගෙනුම් ඉගැන්වීම් ද්‍රව්‍ය සකස් කිරිම | i. උපාධි අපේක්ෂකයන්<br>ii. වෛද්‍ය උපාධි අපේක්ෂකයන්<br>iii. උපාධි අපේක්ෂකයන් |
| | ශල්‍ය වෛද්‍ය අධ්‍යයනාංශය<br>**i.** ඇගයීම් ක්‍රමවේද ඇතුළුව කෙටි හමු සඳහා ඉගෙනුම් අරමුණු සකස් කරන ලදී. අදහස් දැක්වීමපිණිස එම ලේඛන පීඨාධිපතිට සහ අදාල විශේෂඥයන්ට ඉදිරිපත් කරනලදී. පීඨ මාර්ගෝපදේශ ප්‍රකාරව පූර්ණ විෂයමාලා ප්‍රතිශෝධනයන් සිදු කෙරෙමින් පවතී. | |
| | මනෝ වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය<br>**i.** වාර්ෂික විෂයමාලා ප්‍රතිශෝධනය | |
| කාර්ය මණ්ඩල සංවර්ධන වැඩසටහන් | ප්‍රජා වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය<br>වෛද්‍ය සී. ජේ. විජේසිංහ මෙය - වෛද්‍ය අධ්‍යාපන සහ කාර්ය මණ්ඩල සංවර්ධන ඒකකය සමග එක්ව වෛද්‍ය පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා උපාධි අපේක්ෂක උපදේශනය පිළිබඳ වැඩමුළුවක් සංවිධානය කරන ලදී. (2017) | |
| | ළමා රෝග විද්‍යා අධ්‍යනාංශය<br>CCPDHE මොඩියුල 2,3,4,5,7 (සම්පත් දායක) | රුහුණ විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය |
| | ව්‍යාධිවේද අධ්‍යයනාංශය<br>වෛද්‍ය ටී.ජී. ලියනගේ මයා<br>උපාධි අපේක්ෂක උපදේශනය පිළිබඳව අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා වැඩමුළුවේ සම්පත් දායක | |
| | මනෝ වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය<br>CCPDHE මොඩියුල 2,3,4,5,7 (සම්පත් දායක) | රුහුණ විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය |
| ජාතික සංවර්ධනය සඳහා දායකත්වය | i. - LANKAPHEINලේකම් (ලංකා මහජන සෞඛ්‍ය අධ්‍යාපන ආයතනය 2016-2017)<br>ii. වෛද්‍ය සී. ජේ. විජේසිංහ මෙය -සාමාජික- වෛද්‍ය පරිපාලන අධ්‍යයන මණ්ඩලයේ සාමාජික | |

| වැඩසටහන් / ක්‍රියාකාරකම | සංඛ්‍යාව සහ/ හෝ සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභින් / නිපැවුම |
|---|---|---|
| | <u>වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය</u><br>මහාචාර්ය ටි. පී. වීරරත්න මයා<br>i. දියවැඩියා දිනය 2017 - දකුණු පළාත් සම්බන්ධීකාරක | |
| | <u>ක්ෂුද්‍ර ජීව විද්‍යා අධ්‍යයනාංශය</u><br>වෛද්‍ය අජිත් ද එස් නාගහවත්ත මහතා - ක්ෂුද්‍ර ජීවවිද්‍යා අධ්‍යයන මණ්ඩලයේ සභාපති<br>පශ්චාත් වෛද්‍ය උපාධි ආයතනයේ කාමරෝගවේද අධ්‍යයන මණ්ඩලයේ සාමාජික<br>ප.උ.වෛ. ආයතනයේ ඩිප්ලෝමා සහ MD වෛද්‍ය ක්ෂුද්‍ර ජීව විද්‍යාව විභාග පුහුණුකරු හා පරික්ෂක<br>සෞඛ්‍ය අමාත්‍යාංශය, ක්ෂුද්‍ර ජීව විද්‍යාව කාර්ය සාධක බලකායේ සාමාජික | **i.** පශ්චාත් උපාධි කළමනාකරණ ආයතනය , කොළඹ විශ්වවිද්‍යාලය<br>**ii.** පශ්චාත් උපාධි කළමනාකරණ ආයතනය , කොළඹ විශ්වවිද්‍යාලය<br>**iii.** පශ්චාත් උපාධි කළමනාකරන ආයතනය , කොළඹ විශ්ව විද්‍යාලය<br>**iv.** සෞඛ්‍ය අමාත්‍යාංශය. කොළඹ |
| | **ii.** වෛද්‍ය ඩබ්ලිව්. එම්. ඩී. ජී. බී. විජයරත්න මයා - පශ්චාත් වෛද්‍ය උපාධි ආයතනයේ වෛද්‍ය ක්ෂුද්‍ර ජීව විද්‍යා අභ්‍යාසලාභින් සඳහා අධ්‍යයන උපදේශක ලෙස කටයුතු කරන ලදි. | **i.** පශ්චාත් උපාධි කළමනාකරන ආයතනය , කොළඹ විශ්වවිද්‍යාලය |
| | <u>ධාත්‍රික හෘත හා නාරිවේද අධ්‍යයනාංශය</u><br>වෛද්‍ය එස්. කුලරත්න මයා<br>**i.** සාමාජික- සෞඛ්‍ය අමාත්‍යාංශයේ මාතෘ සෞඛ්‍ය හා පවුල් සැලසුම් පිළිබඳ තාක්ෂණික උපදේශන කමිටුව<br>**ii.** සාමාජික- පශ්චාත් උපාධි කළමනාකරන ආයතන අධ්‍යයන මණ්ඩලය<br>**iii.** සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පවත්වනු ලබන පවුල් සෞඛ්‍ය සේවිකා විභාගයේ විභාග පරීක්ෂක<br>වෛද්‍ය ජේ. ඒ. පී. ධම්මික මයා -<br>**I.** සාමාජික, - මාතෘ සෞඛ්‍යය හා පවුල් සැලසුම් පිළිබඳ තාක්ෂණික උපදේශන කමිටුව, සෞඛ්‍ය අමාත්‍යාංශය<br>II. සාමාජික,– පශ්චාත් වෛද්‍ය උපාධි ආයතනයේ අධ්‍යයන මණ්ඩලය<br>වෛද්‍ය ඩී. එල්. ඩබ්. දසනායක මයා-<br>I. පහසුකම් සම්බන්ධිකාරක, අත්‍යාසන්න පශ්චාත් ප්‍රසව අන්තර් ගර්භාෂ උපත්පාලන උපකරණ සේවා ආයතනගතකිරීම, ශ්‍රී ලංකාව<br>II. සාමාජික, වෛද්‍ය පීඨ සඳහා බහුවරණ පොදු ප්‍රශ්නපත්‍රයේ ප්‍රසවවේද හා නාරිවේද සංරචකය - 2016 විභාග | විශ්වවිද්‍යාල සහ සෞඛ්‍ය අමාත්‍යාංශයේ විශේෂඥ ප්‍රසවවේදී හා නාරිවේදී වෛද්‍යවරු<br><br>**i.** රුහුණ විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධිධාරීන්<br>**ii.** වෛද්‍ය පශ්චාත් උපාධි ආයතනයේ අභ්‍යාසලාභීන්<br><br>ශ්‍රී ලංකාවේ ප්‍රසවවේදී හා නාරිවේදී වෛද්‍යවරු<br>වෛද්‍ය උපාධි අපේක්ෂකයන් |

| වැඩසටහන් / ක්‍රියාකාරකම | සංඛ්‍යාව සහ/ හෝ සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභින් / නිපැවුම |
|---|---|---|
| | ළමා රෝග විද්‍යා අධ්‍යයනාංශය<br>i. පූර්ව සීමාවාසික වෛද්‍යවරුන් සඳහා උසස් ළමා වෛද්‍ය ජීවිතාධාරක සහ උසස් ළමා රෝග නවජාසුති ජීවිතාධාරක පුහුණුව පැවැත්වීම<br>ii. ශ්‍රී ලංකාවේ ළමා සෞඛ්‍ය පිළිබඳ ජාතික උපායමාර්ගික සැලසුම සකස් කිරීම 2016-2020<br>iii. ළමා රෝහල් ව්‍යාපෘතිය - ගාල්ල<br>iv. බරපතල ආජන්ම හෘද රෝග සොයා ගැනිම පිණිස අළුත උපන් දරුවන් පරීක්ෂා | ජාතික සෞඛ්‍යය |
| | පරපෝෂවේද අධ්‍යයනාංශය<br>i. ශ්‍රී ලංකාවේ ආන්ත්‍රික නෙමැටෝඩ ආසාදන පිළිබඳ ජාතික සමීක්ෂණය පැවැත්වීමට කැළණිය විශ්වවිද්‍යාලය හරහා ගෝලීය සෞඛ්‍යය ආයතන කාර්ය සාධක බලකාය, ජෝර්ජියා, ඇ.එ.ජ. සහ SERO-ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් ප්‍රදානයක් ලබා දෙන ලදී. | සමස්ත නියැදියේ පාසැල් 127 අතුරින් රුහුණ විශ්වවිද්‍යාලය විසින් දකුණු සහ ඌව පළාත් පාසැල් 22 ක්, නාගරික සහ වතුකර පාසල් 2 බැගින් පරීක්ෂා කරන ලදී. මල නියැදි 1020 ක් සහ ස්කොච් පටි 754ක් පරපෝෂවේද අධ්‍යනාංශයේ පරීක්ෂා කරන ලදී. ජාතික සමීක්ෂණය පිළිබඳ පූර්ණ වාර්තාවක් දැනටමත් සෞඛ්‍ය අමාත්‍යාංශයට ඉදිරිපත් කර තිබේ. අත් පිටපත් දෙකක් සකස් කරමින් පවතී. කාල සීමාව 2017 පෙබරවාරි ආරම්භ කළ අතර 2017 අප්‍රේල් මස සම්පූර්ණ කරන ලදී.<br>වටිනාකම: ඇ.ඩො. 6000 |
| | ව්‍යාධිවේද අධ්‍යයනාංශය<br>වෛද්‍ය චන්දන වික්‍රමරත්න මහතා<br>i. වෛද්‍ය රසායනාගාර ප්‍රතීතනය හා විගණනය<br>ii. රෝහල් ප්‍රතීතනය සඳහා ජාතික මාර්ගෝපදේශ සකස් කිරීම<br>iii. ජාතික තැලසීමියා පරික්ෂණ වැඩසටහන<br>iv. ජාතික හිමෝෆිලිස් දත්ත සමුදාය සංවර්ධනය කිරීම<br>v. ජාතික පිළිකා ලියාපදිංචි කිරීමේ කාර්යාල දත්ත සමුදාය වැඩිදියුණු කිරීමේ වැඩසටහන<br>වෛද්‍ය දීපානි සිරිවර්ධන මෙය<br>i. රසායනික මංපෙත වෛද්‍ය ආචාර්ය උපාධිය පරීක්ෂක 2017<br>ii. තාක්ෂණික ඇගයුම්කරු -ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය<br>වෛද්‍ය ටී.ජී.අයි. ලියනගේ මයා<br>සභාපති, ව්‍යාධිවේද අධ්‍යයන මණ්ඩලය, වෛද්‍ය පශ්චාත් උපාධි ආයතනය | සෞඛ්‍ය අමාත්‍යාංශය<br>විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යාංශය |

| වැඩසටහන් / ක්‍රියාකාරකම | සංඛ්‍යාව සහ/ හෝ සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභින් / නිපැවුම |
|---|---|---|
| | <u>භිෂග්වේද අධ්‍යයනාංශය</u><br>(වෛද්‍ය සුධීරා ජයසිංහ මිය, වෛද්‍ය ගයනි ලියනගේ මෙය )<br>i. "සහසක් නිමවුම්" පූරි සභාව | |
| | (වෛද්‍ය සුධීරා ජයසිංහ මිය)<br>ii. සායනික ධූලකවේදය පිළිබඳ විශේෂ මණ්ඩලයේ සාමාජික<br>(වෛද්‍ය ගයනි ලියනගේ මෙය)<br>FERTSL සාමාජික | |
| | <u>ශල්‍ය වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය</u><br>**i.** මහාචාර්ය රන්ජන් සෙනෙවිරත්න මයා, ශල්‍ය වෛද්‍ය වැඩ වාර සටහන, යුද හමුදා රෝහල, පළාලි | ජාතික සෞඛ්‍ය සේවා |
| | ii. මහාචාර්ය රන්ජන් සෙනෙවිරත්න මයා, බාහිර කථිකාචාර්ය-කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය | |
| | **iii.** ඡන්දවරණ ශිෂ්‍ය සම්බන්ධීකාරක, ඡන්දවරණ ශිෂ්‍ය සම්බන්ධීකරණ මධ්‍යස්ථානය, වෛද්‍ය පීඨය, ගාල්ල -01 | |
| | **iv.** ශල්‍ය සහ හදිසි අවස්ථා වෛද්‍ය පශ්චාත් උපාධි අපේක්ෂකයන් සඳහා වෛද්‍ය පශ්චාත් උපාධි ආයතනයේ පුහුණු කරුවන් -04 | ජාතික සෞඛ්‍ය සේවා |
| | <u>මනෝ වෛද්‍ය විද්‍යා අධ්‍යනාංශය</u><br>i. සමගාමී විෂය මාලාව සකස් කිරීම් කමිටුවට සම්බන්ධ විය- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව<br>ii. මනෝ වෛද්‍ය විද්‍යා විද්‍යාවේදී උපාධිය<br>iii. පූර්ව සීමාවාසික පුහුණු වැඩසටහන | |
| | මත්පැන් සහ මත්ද්‍රව්‍ය අවභාවිතය වැළැක්වීමේ ජනාධිපති කාර්ය සාධන බලකාය | |
| ජාත්‍යන්තර මට්ටමේ දායකත්වය | <u>ප්‍රජා වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය</u><br>වෛද්‍ය සී. කේ.බෝධිනායක මිය<br>i. ඩියුක් රුහුණ විශ්වවිද්‍යාල සහයෝගිතා පර්යේෂණ මධ්‍යස්ථානය.<br>මහාචාර්ය කේ.ඩී.පතිරණ මයා<br>ii. ලෝක සයන දිනයේ ශ්‍රී ලංකා නියෝජිත<br>වෛද්‍ය අරෝෂ දිසානායක මයා<br>iii. කලාපීය ජාත්‍යන්තර උපදේශක, රාජකීය වෛද්‍ය ආයතනය | |
| | <u>ළමා රෝග විද්‍යා අධ්‍යයනාංශය</u><br>i. අළුත උපන් දරුවන් පිළිබඳ ලෝක සෞඛ්‍ය සංවිධානයේ තාක්ෂණික උපදේශන කමිටුව-01 | |
| | <u>පරපෝෂවේද අධ්‍යයනාංශය</u><br>ජාත්‍යන්තර සහයෝගිතා අධ්‍යයනය දිගටම සිදුකිරීම සඳහා අතිරේක ප්‍රදානයක් ලබා දෙන ලදී. | නියෝජිතායතනය: ජපාන රජය, වෛද්‍ය ටී. සී. යහතුගොඩ මහතා වෙත ප්‍රදානය ලබා දෙන |

| වැඩසටහන් / ක්‍රියාකාරකම | සංඛ්‍යාව සහ/ හෝ සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභින් / නිපැවුම |
|---|---|---|
| | | ලදී. මාතෘකාව:ශ්‍රී ලංකාවේ ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කවලින් බරවා රෝගය තුරන් කළ බව සහතික කිරිම පිණිස දිගුකාලීන පසු විපරම් අධ්‍යයනය සහ තහවුරු කිරීමේ මෙවලමක් ලෙස මූත්‍රා **ELISA**ඇගයිම. කාල සීමාව: 2016 පෙබරවාරි මස ආරම්භ විය.වටිනාකම: ඇ.ඩො **4000** |
| | නව බහු දේශ සසම්භාවිත පාලිත පිරික්සුම් (**RCT**) දියත් කරන ලදී. | නියෝජිතායතනය: TFGH,ඇට්ලන්ටා, ඇ.එ.ජ. ටී.සී.යහතුගොඩ සහ එම්.වී. වීරසූරිය යන මහාචාර්යවරුන්ට ලෙඩොක්සි ප්‍රදානය පිරිනමන ලදී. මාතෘකාව: **සක්‍රීය බරවා ආසාදනයෙන් ස්වාධීනව වසා බරවා වැඩි දියුණු කිරීමේදී ගෞණ කල්පවලට සාපේක්ෂව සති 6 ක් සඳහා දිනකට වරක් ඩොක්සිසයික්ලින්වල ඵලදායිතාව සංසන්දනය කිරීම සඳහා බහු කේන්ද්‍රීය, ද්විත්ව බන්ධන, සසම්භාවිත මාස 24 ක අධ්‍යයනය"** කාල සීමාව: 2017 පෙබරවාරි මස ආරම්භ විය. වටිනාකම: ඇ.ඩො 339662 |
| | <u>ව්‍යාධිවේද අධ්‍යයනාංශය</u><br>වෛද්‍ය දීපානි සිරිවර්ධන මිය -අන්තර් ජාතික සායනික රසායන විද්‍යා ජාත්‍යන්තර සම්මේලනයේ(IFCC) රසායනාගාර වෛද්‍ය විද්‍යා නිරේඛනීය කමිටුව සඳහා අනුරූපී සාමාජික ලෙස සහභාගී විය.<br>1. TF -CKD<br>2. C-TLM | |
| | වෛද්‍ය දීපානි සිරිවර්ධන මිය<br>**1.** ව්‍යාධිවේද BOS හි සාමාජික<br>**2.** රසායනික ව්‍යාධිවේද හර කණ්ඩායමේ සාමාජික | ව්‍යාධිවේද/ රසායනික ව්‍යාධිවේද පශ්චාත් උපාධි අභ්‍යාසලාභීන් |

| වැඩසටහන් / ක්‍රියාකාරකම | සංඛ්‍යාව සහ/ හෝ සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන් / නිපැවුම |
|---|---|---|
| | භිෂග්වේද අධ්‍යනාංශය<br>පශ්චාත් උපාධි නිබන්ධ/ ඉදිරිපත්කිරීම් සමාලෝචනය - ඩර්හැම් විශ්වවිද්‍යාලය, එකසත් රාජධානිය | |
| කමිටු හා ඒවාට සම්බන්ධ සාමාජිකයන් සංඛ්‍යාව | ජෛව රසායන අධ්‍යයනාංශය<br>i. මහාචාර්ය කේ. ඒ. පී. ඩබ්ලිව්. ජයතිලක මහතා පහත දැක්වෙන රාජකාරි ඉටුකරන ලදී..<br>(අ)සභාපති -රසායනික ද්‍රව්‍ය හා වීදුරු භාණ්ඩ සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව<br>(ආ) පරීක්ෂක – වෛද්‍ය රසායනාගාර විද්‍යා(MLS) උපාධි වැඩසටහන<br>(ඇ) අධ්‍යයන මණ්ඩලයේ සාමාජික<br>(ඈ)සනාතන සභාවේ සාමාජික<br>(ඉ)විෂයමාලා සංවර්ධන හා ඇගයීම් කමිටුව | |
| | iiවෛද්‍ය ආර්. පි. හේවාවසම් මහතා පහත දැක්වෙන රාජකාරි ඉටුකරන ලදී..<br>( අ) විෂයමාලා සංවර්ධන හා ඇගයීම් කමිටුවේ (CD & EC) කැඳවුම්කරු | |
| | iii. වෛද්‍ය එම්. ටි. නාපාගොඩ මිය පහත දැක්වෙන රාජකාරි ඉටුකරන ලදී.<br>(අ) සනාතන සභාවේ සාමාජික<br>(ආ) විෂයමාලා සංවර්ධන හා ඇගයීම් කමිටුවේසාමාජික<br>(ඇ) අධ්‍යයන මණ්ඩලයේ සාමාජික | |
| | iv. වෛද්‍ය ඒ. පී. අත්තනායක මෙය පහත දැක්වෙන රාජකාරි ඉටුකරන ලදී.<br>(අ) පීඨ පර්යේෂණ කමිටුවේ සාමාජික | |
| | ivවෛද්‍ය සී. එම්. වික්‍රමතිලක මිය පහත දැක්වෙන රාජකාරි ඉටුකරන ලදී.<br>(අ) ලේකම්- වෛද්‍ය අධ්‍යාපන හා කාර්යමණ්ඩල සංවර්ධන කමිටුව<br>(ආ) ලේකම්/කැඳවුම්කරු ආචාර ධර්ම සමාලෝචන කමිටුව | |
| | vi. වෛද්‍ය ජී. ඊ. ඩී. ද සොයිසා පහත දැක්වෙන රාජකාරි ඉටුකරන ලදී.<br>(a) රුහුණ වෛද්‍ය පීඨ ආචාර්යවරුන්ගේ සංගමය (RFMTA) භාණ්ඩාගාරික | |
| | ප්‍රජා වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය<br>වෛද්‍ය සී. ජේ. විජේසිංහ මෙය– වෛද්‍ය ධර්ම කමිටුවේ සාමාජික, ME & SDU-2017<br>වෛද්‍ය ටී. පොන්නම්පෙරුම මෙය – ආචාර ධර්ම සමාලෝචන කමිටුවේ සාමාජික<br>වෛද්‍ය ටී. පොන්නම්පෙරුම මෙය –ලේකම් - FMAS | |

| වැඩසටහන් / ක්‍රියාකාරකම | සංඛ්‍යාව සහ/ හෝ සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභින් / නිපැවුම |
|---|---|---|
| | <u>වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය</u><br>වෛද්‍ය සී. කේ. බෝධිනායක මිය<br>සාමාජික- වෛද්‍ය අධ්‍යයපන හා කාර්ය මණ්ඩල සංවර්ධන ඒකකය,<br>සාමාජික- වෛද්‍ය විද්‍යා අධ්‍යයන මණ්ඩලය, පශ්චාත් උපාධි උපාධි ආයතනය<br>සාමාජික- චර්මවේද අධ්‍යයන මණ්ඩලය,ප.වෛ.උ.ආ<br>සාමාජික- හදිසි අවස්ථා වෛද්‍ය විද්‍යාව, ප.වෛ.උ.ආ<br>සාමාජික- විෂයමාලා සංවර්ධන හා ඇගයීම් කමිටුව<br>සාමාජික- ආචාර ධර්ම කමිටුව<br>සභාපති- රුහුණ වෛද්‍ය පීඨ ආදි ශිෂ්‍ය සංගමය<br><br>මහාචාර්ය ටි. පී. වීරරත්න මයා -<br>සභාපති, වෛද්‍ය විද්‍යා අධ්‍යයන මණ්ඩලය, පශ්චාත් උපාධි පීඨය<br>සභාපති, ශ්‍රවණාගාර කමිටුව<br>මණ්ඩල සාමාජික- ශ්‍රි ලංකා දියවැඩියා සංගමය<br>ප්‍රධාන කතෘ - රුහුණ වෛද්‍ය සඟරාවේ සඟරා කමිටුව<br><br>මහාචාර්ය කේ. ඩී. පතිරණ මහතා-<br>ප්‍රධානී - වෛද්‍ය අධ්‍යයපන හා කාර්ය මණ්ඩල සංවර්ධන ඒකකය,<br>තොරතුරු තාක්ෂණ කමිටුව, වෛද්‍ය පීඨය<br>රුහුණු වෛද්‍ය සඟරාවේ ඇගයුම්කරුවන්ගේ මණ්ඩල භාර නිලධාරී<br><br>වෛද්‍ය අරෝෂ දිසානායක මයා -<br>ශ්‍රවණාගාර කමිටුව<br>පීඨ පර්යේෂණ කමිටුව<br>ලංකා වෛද්‍ය සමාජයේ මණ්ඩල සාමාජික<br><br>වෛද්‍ය එච්. එම්. එම්. හේරත් මහතා - පවුල් වෛද්‍ය විද්‍යා අධ්‍යයන මණ්ඩලය, වෛද්‍ය පශ්චාත් උපාධි ආයතනය<br><br>වෛද්‍ය එන්. ජේ. දහනායක මයා<br>සාමාජික- ආචාර ධර්ම කමිටුව<br>සාමාජික - රුහුණු වෛද්‍ය සඟරාවේ සඟරා කමිටුව<br><br>වෛද්‍ය සී.එල්. ෆොන්සේකා මයා<br>ඡන්දවරණ ශිෂ්‍ය වැඩසටහනේ සම්බන්ධීකාරක<br>සාමාජික, සෞඛ්‍ය කෞතුකාගාර කමිටුව<br>සාමාජික, පුස්තකාල කමිටුව | |

| වැඩසටහන් / ක්‍රියාකාරකම | සංඛ්‍යාව සහ/ හෝ සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන් / නිපැවුම |
|---|---|---|
| | <u>ක්ෂුද්‍ර ජීවවිද්‍යා අධ්‍යයනාංශය</u><br>ආචාර ධර්ම සමාලෝචන කමිටුව -1<br>පීඨ පර්යේෂණ කමිටුව- 1<br>තොරතුරු තාක්ෂණ කමිටුව -1<br>ආපනශාලා කමිටුව-1<br>විෂයමාලා සංවර්ධන හා ඇගයීම් කමිටුව-1<br>පුස්තකාල කමිටුව -1 | වෛද්‍ය පීඨය<br>රුහුණ විශ්වවිද්‍යාලය |
| | <u>ධාත්‍රික භෘත හා නාරිවේද අධ්‍යයනාංශය</u><br>වෛද්‍ය එම්. ඩී. සී. එස්. කුලරත්න මහතා-<br>හෙද විද්‍යාවේදී උපාධි ශාස්ත්‍රීය කමිටුව<br>භිෂග්වේද උපාධි ශාස්ත්‍රීය කමිටුව<br>විෂයමාලා සංවර්ධන හා ඇගයීම් කමිටුව<br><br>වෛද්‍ය ජේ. ඒ. පී. ධම්මික මහතා-<br>පුස්තකාල කමිටුව<br><br>වෛද්‍ය කේ. ඒ. ගුණරත්න මහතා-<br>ශ්‍රවණාගාර කමිටුව<br>ලේකම්, බෞද්ධ සංගමය, වෛද්‍ය පීඨය, ගාල්ල<br><br>වෛද්‍ය එම් එෆ් එම් රමීස් මහතා-<br>පර්යේෂණ කමිටුව<br><br>වෛද්‍ය ඩී. එල්. ඩබ්. දසනායක මහතා -<br>ශ්‍රවණාගාර කමිටුව, දේශන ශාලා කමිටුව | වෛද්‍ය පීඨය<br>රුහුණ විශ්වවිද්‍යාලය<br><br>වෛද්‍ය පීඨය<br>රුහුණ විශ්වවිද්‍යාලය |
| | <u>ළමා රෝග විද්‍යා අධ්‍යයනාංශය</u><br>▪ ළමා රෝග වෛද්‍ය විද්‍යා අධ්‍යයන මණ්ඩලය (ප.වෛ.උ.ආ) - **1**<br>▪ බහුශික්ෂා අධ්‍යයන පාඨමාලාවේඅධ්‍යයන මණ්ඩලය– **1**<br>▪ ශ්‍රී ලංකා ළමා රෝග විශේෂඥයන්ගේ සමාජය (SLCP) -**2**<br>▪ ගාල්ල වෛද්‍ය සංගමය(GMA) – **3**<br>▪ විෂයමාලාසංවර්ධනහාඇගයීම්කමිටුව (CD & EC) – 6<br>▪ ශ්‍රවණාගාර කමිටුව – 2<br>▪ පුස්තකාල කමිටුව - 1<br>▪ ආචාර ධර්ම සමාලෝචන කමිටුව– 1<br>▪ ME & SDU සඳහා උපදේශන මණ්ඩලය– **1**<br>▪ පීඨ පර්යේෂණ කමිටුව - 3<br>▪ ශ්‍රී ලංකා පරිසූතික සමාජය -1<br>▪ සාමාජික – ශ්‍රීලංකාවේ බෝවන රෝග පිළිබඳ උපදේශන කමිටුව - **1** | |

| වැඩසටහන් / ක්‍රියාකාරකම | සංඛ්‍යාව සහ/ හෝ සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන් / නිපැවුම |
|---|---|---|
| | ▪ සාමාජික– ශ්‍රී ලංකා ළමා රෝග විශේෂඥ වෛද්‍යවරුන්ගේ සංගමයළමා *වෘක්කවේදය* පිළිබඳ අනුකමිටුව – 1<br>ශ්වසන රෝග – 1<br>අන්තරාසර්ග විද්‍යාව - 1<br>▪ රෝගී නවජ උවැටන පිළිබඳ නවජ උවැටන් උපදේශන කමිටුව -1<br>▪ නවජ හා මාතෘ සෞඛ්‍ය පිළිබඳ තාක්ෂණික උපදේශන කමිටුව - 1<br>▪ උපත් දෝෂ වැළැක්වීම් හා පාලන කමිටුව- 1<br>▪ පවුල් සෞඛ්‍යය පිළිබද ජාතික කමිටුව - 1<br>▪ මව්කිරි දීම සහ නිර්දිෂ්ඨ නිෂ්පාදන අලෙවිය ප්‍රවර්ධනය කිරීම, ආරක්ෂා කිරීම හා සහාය දීම පිළිබඳ ශ්‍රී ලංකා සංග්‍රහය පිළිබඳ ජාතික කමිටුව -1<br>▪ සාමාජික - දකුණු ආසියානු ළමා රෝග වෛද්‍ය සභාව – 1<br>▪ ආසියා ශාන්තිකර ළමා රෝග වෛද්‍ය සංගම් සභාව – ජාතික අභිනියෝජිත– 1<br>▪ නවජ පරික්ෂා කිරිම් සභාව– 1<br>▪ කලාපීය සංවර්ධනය සඳහා තාක්ෂණික උපදේශන කණ්ඩායම- ලෝක සෞඛ්‍ය සංවිධානය – 1<br>▪ පීඨය සඳහා 12 මහල් ගොඩනැගිල්ලක් සංවර්ධනය සඳහා වූ කමිටුව -1<br>▪ වෛද්‍ය පීඨය වෙනුවෙන් පාර්ලිමේන්තුවේදී පීඨාධිපති නියෝජනය කරන ලදී1<br>▪ දුර්ලභ රෝග සම්මන්ත්‍රණ කමිටු සාමාජික- ශ්‍රී ලංකා ළමා රෝග විශේෂඥයන්ගේ සමාජය-1<br>▪ කමිටු සාමාජික -කරීක තරඟය -1 | |
| | <u>පරපෝෂවේද අධ්‍යයනාංශය</u><br>i. ඒකක සම්බන්ධීකාරක – පරපෝෂවේදය– MLSවර්ෂය 2 (1)<br>ii. සාමාජික– වෛද්‍ය කමිටුවේ අධ්‍යයන මණ්ඩලය<br>iii. සභාපති –දේශන ශාලා කමිටුව (6)<br>iv. සාමාජික – විද්‍යාවේදී හෙද කමිටුව (10)<br>v. සාමාජික – ME & SDU කමිටුව (**15**)<br>vi. සාමාජික – CD & EC කමිටුව (16)<br>vii. සාමාජික – සනාතන සභාව, රුහුණ විශ්වවිද්‍යාලය<br>viii. පීඨාධිපති- පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය | |

| වැඩසටහන් / ක්‍රියාකාරකම | සංඛ්‍යාව සහ/ හෝ සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන් / නිපැවුම |
|---|---|---|
| | <u>භිෂග්වේද අධ්‍යයනාංශය</u><br>(මහාචාර්ය මැණික් හෙට්ටිහේවා මිය, වෛද්‍ය සුධීරා ජයසිංහ මිය සහ වෛද්‍ය ගයනි ලියනගේ මෙය)<br>i. ශ්‍රී ලංකා සායනික භිෂග්වේද හා චිකිත්සා සංගමයේ පාලක සභා සාමාජික සහ ගාල්ල වෛද්‍ය සංගමයේ සාමාජික<br>මහාචාර්ය මැණික් හෙට්ටිහේවා මිය<br>ii. සෞඛ්‍ය අමාත්‍යාංශයේ ජාතික සීමාසන්න නිෂ්පාදන ඇගයීම් කමිටුවේ සම ලේකම් සහ සමාජික<br>iii. වෛද්‍ය අධ්‍යාපන හා කාර්ය මණ්ඩල සංවර්ධන ඒකකයේ කමිටු සාමාජික<br>iv. විෂයමාලා සංවර්ධන හා ඇගයීම් කමිටු සාමාජික<br>v. සනාතන සභා සහ පීඨ මණ්ඩල සාමාජික<br>vi. ශ්‍රී ලංකා ශායනික භිෂග්වේද හා චිකිත්සා සංගමයේ සභා සාමාජික<br>වෛද්‍ය සුධීරා ජයසිංහ මිය<br>vii. දේශන ශාලා කමිටුව<br>viii. පර්යේෂණ හා උසස් උපාධි කමිටුව<br>ආචාර්ය සුධීරා ජයසිංහ මිය සහ ආචර්ය ගයනි ලියනගේ මිය<br>ix. රුහුණ විශ්වවිද්‍යාල වෛද්‍ය පීඨ ආදි විද්‍යාර්ථීන්ගේ සංගමයේ සභා සාමාජික<br>x. විෂයමාලා සංවර්ධන හා ඇගයීම් කමිටුව<br>වෛද්‍ය ගයනි ලියනගේ මිය<br>xi. ශාස්ත්‍රීය සැසිවලදී විශ්වවිද්‍යාලය සඳහා සභා සාමාජික/ සහ පීඨ නියෝජිත<br>xii. ආචාර් ධර්ම සමාලෝචන කමිටුව | |
| | <u>ශල්‍ය වෛද්‍ය අධ්‍යයනාංශය</u><br>**i.** ශල්‍ය වෛද්‍ය අධ්‍යයන මණ්ඩලයේ සාමාජික -02 | |
| | **ii.** කොටස I MD (ශල්‍ය වෛද්‍ය) සඳහා විභාග පරීක්ෂක -01 | |
| | **iii.** ERPM විභාගයේ විෂය සම්බන්ධීකාරක (01) සහ ERPM විභාගය සඳහා විභාග පරීක්ෂක -04 | |
| | **iv.** MD(හදිසි අවස්ථා ඖෂධ) තෝරා ගැනීමේ විභාගයේ විභාග පරීක්ෂක -01 | |
| | **v.** මහාචාර්ය රන්ජන් සෙනෙවිරත්න මයා-ශල්‍යකර්ම අධ්‍යයන මණ්ඩලයේ සභාපති (හදිසි අවස්ථා ඖෂධ) | |
| | **vi.** MD (ශල්‍ය වෛද්‍ය) විභාගය කොටස I සහ කොටස II සඳහා විභාග පරීක්ෂක -04 | |
| | **vii.** සභපති- ගාල්ලේ පැවැති ගාලු වෛද්‍ය සංගමයේ සැසි -02 | |
| | **viii.** සභාපති, ශල්‍ය වෛද්‍ය සැසි, මහනුවර -02 | |

| වැඩසටහන් / ක්‍රියාකාරකම | සංඛ්‍යාව සහ/ හෝ සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභින් / නිපැවුම |
|---|---|---|
| | **ix.** ශල්‍ය වෛද්‍යවරුන්ගේ ආයතනය, ගාලු ශාඛා නියෝජිත | |
| | <u>මනෝ වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය</u><br>**i.** ආචාරධර්ම සමාලෝචන කමිටුව– 2<br>ii. විෂයමාලා සංවර්ධන හා ඇගයීම්– 2<br>iii. පශ්චාත් උපාධි අධ්‍යයන සඳහා විද්‍යාවේදී උපාධිය - 2<br>iv. GMA – 03 | |
| | i. තොරතුරු තාක්ෂණ කමිටුව -1<br>ii. පුස්තකාල කමිටුව - 1<br>iii. නිවාස කමිටුව – 1<br>iv. තත්ත්ව සහතිකකරණ ඒකකය - 1 | |
| ලැබුණු ප්‍රදාන (අරමුණ සහ මුදල් ප්‍රමාණය)<br>- දේශීය<br>- ජාත්‍යන්තර | <u>ජෛව රසායන අධ්‍යයනාංශය</u><br>මහාචාර්ය කේ. ඒ. පී. ඩබ්. ජයතිලක මෙයට ජාතික පර්යේෂණ සභා ප්‍රදානය ලැබුණි (සම අධීක්ෂක) | |
| | ඉතාලියේ ට්‍රයිස්ටේහි "මූසික ජාන විද්‍යාව: මිනිස් ලෙඩ රෝග සඳහා ආදර්ශය" පිළිබඳ පාඨමාලාවක් හැදෑරීම සඳහා ජාන ඉංජිනේරු විද්‍යා සහ ජෛව තාක්ෂණ අන්තර්ජාතික මධ්‍යස්ථානයෙන් වෛද්‍ය ආර්.පී. හේවාවසම් මහතාට ප්‍රදානයක් ලැබුණි. | |
| | වෛද්‍ය එම්. ටී. නාපාගොඩ මෙය-<br>(අ) ඉන්දු-ශ්‍රී ලංකා පර්යේෂණ ප්‍රදානය -2017 ලැබුණි මුදල - රු. මිලියන 5.15<br>(ආ) ආදි විද්‍යාර්ථීන් සහ ආරම්භක වෘත්තීය පර්යේෂකයන් සඳහා ජර්මනියේ බර්ලින්හි පැවැති 2වැනි මැක්ස් ප්ලැන්ක් සම්මන්ත්‍රණයට සහභාගී වීම සඳහා ජර්මනියේ මැක්ස් ප්ලැන්ක් සමාජයෙන් වියදම් දීමනාව ලැබුණි. | |
| | වෛද්‍ය ඒ.පී. අත්තනායක මෙයට ජාතික පර්යේෂණ සභාවේ විමර්ශක මෙහෙයවනු ලබන පර්යේෂණ දීමනාව ලෙස රු. මිලියන 4.7 ක් ලැබුණි. | |
| | <u>ක්ෂුද්‍ර ජීවවිද්‍යා අධ්‍යයනාංශය</u><br>**i.** වෛද්‍ය එන්.පී. වීරසිංහ මය - GMA පර්යේෂණ ප්‍රදානය - රු. 200,000 | ක්ෂුද්‍ර ජීවවිද්‍යා අධ්‍යයනාංශය, වෛද්‍ය පීඨය, රුහුණ විශ්වවිද්‍යාලය |
| | **ii.** වෛද්‍ය ඩබ්.එම්. ඩී.ජී.බී. විජයරත්න මෙය- **SLMA** වෙතින් ග්ලැක්සෝ වෙල්කම් සම්මානය- රු. 50,000 | ක්ෂුද්‍ර ජීවවිද්‍යා අධ්‍යයනාංශය, වෛද්‍ය පීඨය, රුහුණ විශ්වවිද්‍යාලය |

| වැඩසටහන් / ක්‍රියාකාරකම | සංඛ්‍යාව සහ/ හෝ සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන් / නිපැවුම |
|---|---|---|
| | <u>ළමා රෝග විද්‍යා අධ්‍යයනාංශය</u><br>**i.** ළමා රෝග විශේෂඥ සංගමය සඳහා මහාචාර්ය ස්ටෙලා ද සිල්වා ප්‍රදානය<br>වි.වි.ප්‍ර.කො.ස. නියත ප්‍රදාන- රු. මිලියන 0.97 | කොළඹදී පැවැතිSLCP AAS – 2017 දී ඉදිරිපත් කරන ලද පර්යේෂණ |
| | <u>පරපෝෂවේද අධ්‍යයනාංශය</u><br>i. ජපාන රජයේ ප්‍රදානය (2016) – TAS ඉදිරියට පවත්වා ගැනීම සඳහා– ඇ.ඩො **4000.00** | නියෝජිතායතනය: ජපාන රජය, වෛද්‍ය ටී. සී. යහතුගොඩ මහතා වෙත ප්‍රදානය ලබා දෙන ලදී.මාතෘකාව:ශ්‍රී ලංකාවේ ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කවලින් බරවා රෝගය තුරන් කළ බව සහතික කිරීම පිණිස දිගුකාලීන පසු විපරම් අධ්‍යයනය සහ තහවුරු කිරීමේ මෙවලමක් ලෙස මූත්‍රා **ELISA**ඇගයීම.<br>කාල සීමාව: 2016 පෙබරවාරි මස ආරම්භ විය.වටිනාකම: ඇ.ඩො **4000** |
| | ii. නියෝජිතායතනය: TFGH, ඇට්ලන්ටා, ඇ.එ.ජ. - ලෙඩොක්සි ප්‍රදානය වටිනාකම: ඇ.ඩො. 339662 | ටී.සී.යහතුගොඩ මහතා සහ එම්.වී. වීරසූරිය මිය යන මහාචාර්යවරුන්ට මෙම ප්‍රදානය පිරිනමන ලදී. මාතෘකාව: සක්‍රිය බරවා ආසාදනයෙන් ස්වාධීනව වසා බරවා වැඩි දියුණු කිරීමේදී ගෞණ කල්පවලට සාපේක්ෂව සති 6 ක් සඳහා දිනකට වරක් ඩොක්සිසයික්ලින්වල ඵලදායිතාව සංසන්දනය කිරීම සඳහා බහු කේන්ද්‍රීය, ද්විත්ව බන්ධන, සසම්භාවිත මාස 24 ක අධ්‍යයනය”<br>කාල සීමාව: 2017 පෙබරවාරි මස ආරම්භ විය. වටිනාකම: ඇ.ඩො 339662 |
| | <u>ව්‍යාධිවේද අධ්‍යයනාංශය</u><br>වෛද්‍ය තිළිණි විජේසිරි මෙය<br>දේශීය- GMAපර්යේෂණ ප්‍රදානය<br>පර්යේෂණ මාතෘකාව: PTENප්‍රෝටීන ප්‍රකාශනයන්හි ප්‍රතිශක්තිපටකරසායන ඇගයීම සහ ඊස්ට්‍රජන් ප්‍රතිග්‍රාහක ධන පියයුරු කාසිනෝමාහි ටැමොක්සිෆෙන් ප්‍රතිරෝධය සමග එහි සබඳතාව | පර්යේෂණ පත්‍රිකාවක ප්‍රකාශයට පත්කිරීම සඳහා |

| වැඩසටහන් / ක්‍රියාකාරකම | සංඛ්‍යාව සහ/ හෝ සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන් / නිපැවුම |
|---|---|---|
| | <u>භිෂග්වේද අධ්‍යයනාංශය</u><br>වෛද්‍ය ඉසුරි අමරසිංහ මෙය<br>වි.වි.ප්‍ර.කො.ස. ප්‍රදානය-දේශීය<br>රු. 754,000.00 | |
| සම්මාන/පේටන්ට් බලපත්‍ර/විශේෂ කාර්ය සාධන | <u>ජෛව රසායන  අධ්‍යයනාංශය</u><br>i. ශ්‍රී ලංකා වෛද්‍ය සංගමය විසින් ප්‍රදානය කරනු ලබන කන්තුකවාහිණි පර්යේෂණ පිළිබඳ හොඳම ලිපිය සඳහා වන ආර්.හැන්ඩි සම්මානය වෛද්‍ය ආර්. පී. හේවාවසම් මියට ප්‍රදානය කරන ලදී. එම ලිපියේ මාතෘකාව වූයේ “The GST M2C-terminal domain depresses contractility and Ca2+ transients in neonatal rat ventricular cardiomyocytes” | |
| | ii. වෛද්‍ය එම්. ටී. නාපාගොඩ මිය<br>(අ) ගාලු වෛද්‍ය සංගමයේ 76 වැනි වාර්ෂික අධ්‍යයන සැසියේදී හොඳම වාචික ඉදිරිපත් කිරීම සඳහා සම්මානය<br>(ආ) රුහුණ විශ්වවිද්‍යාල දේශනය -2017 | |
| | iii.වෛද්‍ය ඒ.පී. අත්තනායක මෙය -<br>(අ) වෛද්‍ය විද්‍යා හොඳම නිබන්ධනය සඳහා රිච්ඩ් සහ ශීලා පීරිස් අනුස්මරණ CNAPT සම්මානය 2017 හිමි විය, ශ්‍රී ලංකා වෛද්‍ය සංගමය<br>(ආ) මහාචාර්ය එන්.ඩී.ඩබ්ලිව් ලයනල් අනුස්මරණ දේශනය-2017<br>(ඇ) විශිෂ්ඨතම තරුණ පර්යේෂකයා සඳහා සම්මානය 2016<br>(ඇ) ස්වභාවික නිෂ්පාදන සහ ඖෂධ බෙදාහැරීම පිළිබඳ 19 වැනි අන්තර්ජාතික සම්මේලනයේ හොඳම වාචික ඉදිරිපත් කිරීම සඳහා සම්මානය | |
| | <u>ප්‍රජා වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය</u><br>i. වෛද්‍ය පී. වී. ද සිල්වා මයා -ජාත්‍යන්තර සබඳතා සඳහා විශිෂ්ඨතම කැඳවුම්කරු සඳහා උපකුලපති සම්මානය<br>ii. මහාචාර්ය බී.පෙරේරා මයා- ප්‍රකාශන සඳහා ජාතික විද්‍යා පදනමේ කුසලතා සම්මානය | |
| | වෛද්‍ය සී.කේ. බෝධිනායක මිය<br>2015 පළ කරන ලද ප්‍රකාශනයක් සඳහා 2017 වසරේදී පර්යේෂණ ප්‍රකාශන ජනාධිපත් සම්මානය | |
| | <u>ක්ෂුද්‍ර ජීවවිද්‍යා අධ්‍යයනාංශය</u><br>වෛද්‍ය ඩබ්.එම්.ඩී.ජී.බී. විජයරත්න මයා - ශ්‍රී ලංකා වෛද්‍ය සංගමයෙන් ග්ලැක්සෝ වෙල්කම් සම්මානය | ක්ෂුද්‍ර ජීවවිද්‍යා අධ්‍යයනාංශය, වෛද්‍ය පීඨය, රුහුණු විශ්වවිද්‍යාලය |

| වැඩසටහන් / ක්‍රියාකාරකම | සංඛ්‍යාව සහ/ හෝ සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන් / නිපැවුම |
|---|---|---|
| | ළමා රෝග විද්‍යා අධ්‍යයනාංශය<br>පර්යේෂණ සඳහා ජනාධිපති සම්මානය -02 | |
| | ව්‍යාධිවේද අධ්‍යයනාංශය<br>වෛද්‍ය තිළිණි විජේසිරි මෙය<br>පටක ව්‍යාධිවේද වෛද්‍ය උපාධිය | |
| | භිෂග්වේද අධ්‍යයනාංශය<br>වෛද්‍ය ගයනි ලියනගේ මෙය<br>ගාල්ල වෛද්‍ය සංගමයේ දේශනය 2017 | |
| | මහාචාර්ය මැණික් හෙට්ටිහේවා මිය<br>සායනික භිෂග්වේද සහ චිකිත්සා සංගමයේ වාර්ෂික ශාස්ත්‍රීය සැසි පූර්ණ දේශනය | |
| පවත්වන ලද වැඩමුළු/ සම්මන්ත්‍රණ/ සම්මේලන (අභ්‍යන්තර හා දේශීය) | කාය ව්‍යවච්ඡේද අධ්‍යයනාංශය<br>**i.** ළමා රෝග නේවාසික විකිරණවේද සම්මන්ත්‍රණය<br>ආචාර්ය එස්.කේ.වයි.අයි. කොඩිකාර | විකිරණවේද පශ්චාත් උපාධි අභ්‍යාසලාභීන් |
| | ජෛව රසායන අධ්‍යයනාංශය<br>**i.** වෛද්‍ය සී.එම්. වික්‍රමතිලක මෙය<br>(අ) ආහාර මගින් බෝවන රෝග සහ ආහාර සුරක්ෂිතතාව, රුහුණු විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය සමග සහයෝගීතාවයෙන් ශ්‍රී ලංකා පෝෂණ සංගමය<br>බෝ නොවන රෝග සහ නිදන්ගත වකුගඩු රෝගය නිවාරණය පිළිබඳ සම්මන්ත්‍රණය -දේශීය | |
| | ප්‍රජා වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය<br>වෛද්‍ය සී.ජේ. විජේසිංහ මෙය-- ආහාර සකසන්නන් සඳහා ආහාරවලින් බෝවන රෝග සහ ආහාර සුරක්ෂිතතාව පිළිබඳව ප්‍රාදේශීය වැඩමුළුවක් පවත්වන් ලදී.<br><br>වෛද්‍ය සී.ජේ. විජේසිංහ මෙය - ‘‘ආරම්භකයන් සඳහා පර්යේෂණ ක්‍රමවේදය’’ පිළිබඳ වැඩමුළුවක් මහමෝදර ශික්ෂණ රෝහලේදී වෛද්‍යවරුන් සඳහා පවත්වන ලදී.<br><br>වෛද්‍ය ටී.පොන්නම්පෙරුම මෙය - ඇල්පිටිය රෝහලේ වෛද්‍යවරුන් සඳහා පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳ ප්‍රාද්ශීය වැඩමුළුවක් පවත්වන ලදී. | |
| | වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය<br>කරාපිටිය ශික්ෂණ රෝහලේ වෛද්‍ය විද්‍යා උපාධි පූහුණු විභාග දෙකක් පවත්වන ලදී. - වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් එම විභාග පවත්වන ලදී. | |

| වැඩසටහන් / ක්‍රියාකාරකම | සංඛ්‍යාව සහ/ හෝ සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන් / නිපැවුම |
|---|---|---|
| | <u>ක්ෂුද්‍ර ජීවවිද්‍යා අධ්‍යයනාංශය</u><br>වත්මන් සෞඛ්‍ය ගැටලු සඳහා ඉගැන්වීම් දිනය | 3 සහ 4 වසරේ පාසල් සිසුන් |
| | <u>ධාත්‍රික හෘත හා නාරිවේද අධ්‍යයනාංශය</u><br>වෛද්‍ය එම්.ඩී.සී.එස්. කුලරත්න මහතා<br>සභාපති- ගාල්ල වෛද්‍ය සංගමය<br>පූර්ව සීමාවාසික සහ වෛද්‍ය නිලධාරීන් සඳහා වැඩමුළුව<br><br>වෛද්‍ය ජේ.ඒ.පී. ධම්මික මයා<br>වෛද්‍ය කේ.ඒ.ගුණරත්න මයා<br>සම්බන්ධීකාරක - ග්‍රාමීය සෞඛ්‍ය වැඩසටහන<br>පූර්ව සීමාවාසික සහ වෛද්‍ය නිලධාරීන් සඳහා වැඩමුළුව<br><br>වෛද්‍ය එම්.එෆ්.එම් රමීස් මයා<br>වෛද්‍ය ඩී.එල්.ඩබ්. දසනායක මයා<br>වෛද්‍ය එම්.ඒ.ජී. ඉරේෂා මෙය<br>සායනික සම්බන්ධීකාරක<br>පූර්ව සීමාවාසික සහ වෛද්‍ය නිලධාරීන් සඳහා වැඩමුළුව | උපාධි අපේක්ෂකයන් සහ පශ්චාත් උපාධි අපේක්ෂකයන්<br><br><br><br><br><br>උපාධි අපේක්ෂකයන් සහ වෛද්‍ය නිලධාරීන් |
| | <u>ළමා රෝග විද්‍යා අධ්‍යයනාංශය</u><br>i. ඉගැන්වීම් වැඩමුළුව - පශ්චාත් උපාධි අභ්‍යාසලාභීන්- ගාල්ල<br>ii. උසස් ළමා වෛද්‍යවේද ජීවිතාධාරක පුහුණු වැඩසටහන් පැවැත්වීම. (APLS) කොළඹ සහ ගාල්ල.<br>iii. උසස් නවජ ජීවිතාධාරක පුහුණු පැවැත්වීම (NALS) | වෛද්‍ය වෘත්තිකයන් |
| | <u>පරපෝෂවේද අධ්‍යයනාංශය</u><br>I. සම්පත් දායක, "විද්‍යාත්මක සැසියක් ඉදිරිපත් කිරිම" පිළිබඳ වැඩමුළුවක් ගාලු වෛද්‍ය සංගමය විසින් පවත්වනු ලැබීය. (ඔක්තෝබර් 2017). | |
| | <u>ව්‍යාධිවේද අධ්‍යයනාංශය</u><br>ශ්‍රී ලංකා රසායනික ව්‍යාධිවේදීන්ගේ සංගමයේ වාර්ෂික ශාස්ත්‍රීය සැසි ආරාධිත දේශනය | |
| | <u>ශල්‍ය වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය</u><br>i. වෛද්‍යවරුන්, හෙදියන් සහ පරිපූරක වෛද්‍ය කාර්ය මණ්ඩල සඳහා හදිසි අවස්ථා වෛද්‍ය ප්‍රතිකාරවලදී "Triage" පිළිබඳ වැඩමුළු කිහිපයක් මහාචාර්ය රන්ජන් සෙනෙවිරත්න මයා විසින් පවත්වන ලදී. - සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් මෙහෙයවන ලදී. | |

| වැඩසටහන් / ක්‍රියාකාරකම | සංඛ්‍යාව සහ/ හෝ සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන් / නිපැවුම |
|---|---|---|
| | **ii.** වෛද්‍යවරුන්, හෙදියන් සහ පරිපූරක වෛද්‍ය කාර්ය මණ්ඩල සඳහා හදිසි අවස්ථා වෛද්‍ය ප්‍රතිකාරවලදී "Track Lead" පිළිබඳ වැඩමුළු කිහිපයක් මහාචාර්ය රන්ජන් සෙනෙවිරත්න මයා විසින් පවත්වන ලදී. - සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් මෙහෙයවන ලදී. | |
| | <u>මනෝ වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය</u><br>**i.** මනෝචිකිත්සා වැඩමුළු – ප්‍රජා මනෝචිකිත්සාව, වැඩිමහල්ලන් සඳහා මනෝචිකිත්සාව, සංගීත චිකිත්සාව | |
| ප්‍රජා විහිදුම්කරණ ක්‍රියාකාරකම් | <u>කාය ව්‍යවච්ඡේද අධ්‍යයනාංශය</u><br>**i.** ගාල්ල බහිර්ශාරීරික ජීවිතාධාරක සංවිධානය විසින් සංවිධානය කරන ලදුව 2017.4.1 දින පවත්වනු ලැබූ "පශ්චාත් උපාධි ඉගැන්වීම් සංසදයේ" සම්පත් දායක - වෛද්‍ය ඊ.අයි. වෛද්‍යරත්න මෙය | වෛද්‍ය විද්‍යා උපාධිය ශල්‍යකර්ම 1 කොටස සඳහා සූදානම් වන වෛද්‍යවරුන් |
| | **ii.** වෛද්‍ය විද්‍යා උපාධිය මනෝ චිකිත්සාව කොටස 1 සඳහා ස්නායුව්‍යවච්ඡේදය පුහුණුකරු (මාර්තු - පෙබරවාරි 2017) - ආචාර්ය ඊ.අයි. වෛද්‍යරත්න මෙය සහ වෛද්‍ය පී.ජී.සී.එල්. නානායක්කාර මයා | වෛද්‍ය විද්‍යා උපාධිය මනෝ චිකිත්සාව 1 කොටස සඳහා සූදානම් වන වෛද්‍ය උපාධිධාරීන් |
| | iii. මහජන සෞඛ්‍ය ක්ෂේත්‍ර නිලධාරී පුහුණු වැඩසටහනේ බාහිර කථිකාචාර්ය - වෛද්‍ය ඊ.අයි. වෛද්‍යරත්න මෙය | මහජන සෞඛ්‍ය ක්ෂේත්‍ර නිලධාරීන් |
| | <u>ජෛව රසායන අධ්‍යයනාංශය</u><br>i. ශ්‍රී ලංකා පාකිස්ථාන සහයෝගිතා පර්යේෂණ වැඩසටහනේ පර්යේෂණ යෝජනා සමාලෝචකයකු ලෙස වෛද්‍ය එම්.ටී. නාපාගොඩ මිය කටයුතු කරන ලදී. (ජාතික විද්‍යා පදනම) | |
| | ii. වෛද්‍ය එම්.ටී. නාපාගොඩ මිය- සෛල ජීව විද්‍යාව සහ ජෛවරසායනික විද්‍යාව සඳහා ඒකක සම්බන්ධීකාරක - වෛද්‍ය රසායනාගාර විද්‍යා උපාධි වැඩසටහන | |
| | iii. වෛද්‍ය එම්.ටී. නාපාගොඩ මිය - වෛද්‍ය රසායනාගාර විද්‍යා උපාධි වැඩසටහන හා ඖෂධවේදී උපාධි වැඩසටහන සඳහා බාහිර කථිකාචාර්ය | |
| | iv. වෛද්‍ය ආර්.පී. හේවාවසම් මිය, වෛද්‍ය එම්.ටී. නාපාගොඩ මිය, වෛද්‍ය. සී.එම්. වික්‍රමතිලක මෙය සහ වෛද්‍ය ජී.ඊ.ඩී. ද සොයිසා මයා ශිෂ්‍ය උපදේශකයන් ලෙස කටයුතු කරන ලදී. | |

| වැඩසටහන් / ක්‍රියාකාරකම | සංඛ්‍යාව සහ/ හෝ සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන් / නිපැවුම |
|---|---|---|
| | <u>ප්‍රජා වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය</u><br>වෛද්‍ය සී.ජේ. විජේසිංහ මෙය- ගාල්ල දිස්ත්‍රික්කයේ පාසල්, රෝහාල් සහ සේවා ස්ථානවල දැනුවත්කිරීම් වැඩසටහන් පැවැත්වූ අතර පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩමුළු පවත්වන ලදී. | |
| | <u>ක්ෂුද්‍ර ජීව විද්‍යා අධ්‍යයනාංශය</u><br>**i.** වෛද්‍ය ක්ෂුද්‍ර ජීවවිද්‍යා පශ්චාත් උපාධි ඩිප්ලෝමා පුහුණුලාභීන් සඳහා වෛද්‍ය ක්ෂුද්‍ර ජීවවිද්‍යා ඩිප්ලෝමා මොඩියුලය<br>**ii.** මහජන සෞඛ්‍ය පරීක්ෂක පුහුණුලාභී ඩිප්ලෝමාව, කලාපීය පුහුණු මධ්‍යස්ථානය | i. වෛද්‍ය පශ්චාත් උපාධි ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය<br>ii. පවුල් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය, දකුණු පළාත |
| | <u>ළමා රෝග විද්‍යා අධ්‍යයනාංශය</u><br>උප සභාපති ළමා රෝග විශේෂඥයන්ගේ සංගමය(SLCP)– 1<br>NALS, APLSවැඩමුළු -රිජ්වේ ආර්යා රෝහල, කොළඹ | |
| | <u>භිෂග්වේද අධ්‍යයනාංශය</u><br>මහාචාර්ය මැණික් හෙට්ටිහේවා මිය<br>රුහුණ විශ්වවිද්‍යාලයේ බුද්ධිමය දේපළ කළමනාකරණ කාර්යාලයේ අධ්‍යක්ෂ ලෙස පත්කරන ලදී. | |
| | <u>ශල්‍ය වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය</u><br>මහාචාර්ය රන්ජන් සෙනෙවිරත්න මයා යාපනය, පළාලි යුධ හමුදා රෝහලේ ශල්‍ය වෛද්‍යවරයකු ලෙස කටයුතු කරන ලදී. | |
| සන්ධාන වැඩසටහන් | <u>ප්‍රජා වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය</u><br>මහාචාර්ය විජිත් ද සිල්වා මයා - ඩියුක් රුහුණ - සන්ධාන වැඩසටහන<br>වෛද්‍ය සී.ජේ. විජේසිංහ මෙය - ඩියුක් රුහුණ - සන්ධාන වැඩසටහන | |
| | <u>ක්ෂුද්‍ර ජීවවිද්‍යා අධ්‍යයනාංශය</u><br>ඩියුක් රුහුණ - සන්ධාන වැඩසටහන | ක්ෂුද්‍ර ජීවවිද්‍යා අධ්‍යයනාංශය, වෛද්‍ය පීඨය, රුහුණ විශ්වවිද්‍යාලය |
| | <u>ළමා රෝග විද්‍යා අධ්‍යයනාංශය</u><br>ඩියුක් රුහුණ - සන්ධාන වැඩසටහන -02 | |
| | <u>පරපෝෂවේද අධ්‍යයනාංශය</u><br>**I.** අයිචි විශ්වවිද්‍යාලය, ජපානය<br>**II.** පරපෝෂවේද අධ්‍යයනාංශය, වෛද්‍ය පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය<br>**III.** CNTD,සර්ම කලාපීය වෛද්‍ය විද්‍යා ලිවර්පූල් පාසල, එක්සත් රාජධානිය | LF ආවේක්ෂණ වැඩසටහන සහ & TAS<br>අපගේ රසායනාගාරයේ හඳුනාගත් සියලු මැලේරියා රෝගීන් සඳහා කොළඹ වෛද්‍ය පීඨයේ PCR තහවුරු කිරීමක් සිදුකරන ලදී. |

| වැඩසටහන් / ක්‍රියාකාරකම | සංඛ්‍යාව සහ/ හෝ සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන් / නිපැවුම |
|---|---|---|
| | **IV.** වොෂිංටන් විශ්වවිද්‍යාලය, ඇ.එ.ජ. සහ ගෝලීය සෞඛ්‍ය සඳහා කාර්ය සාධක බලකාය, ඇට්ලන්ටාව | LF රෝගීන්ගේ මානසික සෞඛ්‍ය අධ්‍යයනය<br>වසාශෝථ රෝගීන් සඳහා RCT |
| | <u>භිෂග්වේද අධ්‍යයනාංශය</u><br>මහාචාර්ය මැණික් හෙට්ටිගේවා මිය<br>චීනයේ දකුණු වෛද්‍ය විශ්වවිද්‍යාලය සමග පර්යේෂණ සහ ශාස්ත්‍රීය සහයෝගිතාව ක්‍රියාත්මක වෙමින් පවතී. | |

## ප්‍රකාශන හා දැනුම ප්‍රචාරණය

| කාණ්ඩය | සංඛ්‍යාව |
|---|---|
| උපුටා දැක්විමේ සුචියේ ඇතුළත් ජාත්‍යන්තර සඟරාවල සම්පූර්ණ පත්‍රිකා හෝ කෙටි සන්නිවේදන | 42 |
| උපුටා දැක්විමේ සුචියේ ඇතුළත් නොවූ ජාත්‍යන්තර සඟරාවල සම්පූර්ණ පත්‍රිකා හෝ කෙටි සන්නිවේදන | 15 |
| දේශීය සඟරාවල සම්පූර්ණ පත්‍රිකා හෝ කෙටි සන්නිවේදන | 38 |
| මුද්‍රිත වාර්තාවල ඇතුළත් සම්පූර්ණ පත්‍රිකා | 14 |
| වාචික ඉදිරිපත්කිරීම්වල සංක්ෂේප | **127** |
| පෝස්ටර් ඉදිරිපත්කිරීම්වල සංක්ෂේප | **103** |
| පොත් | **3** |
| පොත්වල පරිච්ඡේද | **3** |
| වෙනත් සඟරාවල ශාස්ත්‍රීය ලිපි (සඟරා, ජාතික පුවත්පත් ආදිය.) | 12 |
| සංස්කරණ කාර්යය | 7 |

# විද්‍යා පීඨය

## පීඨාධිපතිගේ ප්‍රකාශය/ සමාලෝචනය

භෞතික විද්‍යා, ජෛවීය විද්‍යා සහ පරිගණක විද්‍යා සඳහා විද්‍යා පීඨය සාමාන්‍ය සහ විශේෂ උපාධි පිරිනමයි. උද්භිද විද්‍යාව, රසායන විද්‍යාව, පරිගණක විද්‍යාව, ගණිතය, භෞතික විද්‍යාව සහ සත්ත්ව විද්‍යාව යන විෂය ක්ෂේත්‍රයන්හි අධ්‍යයනාංශ හයකින් පීඨය සමන්විත වේ.

තාක්ෂණ පීඨයේ පළමු අධ්‍යයන වසර ආරම්භ කිරීම සඳහා අවශ්‍ය කටයුතු කිරීම පිණිස ධීවර සමුද්‍රීය විද්‍යා සහ තාක්ෂණ පීඨය විසින් භාවිතා කරනු ලැබූ ගොඩනැගිලි ඉඩකඩ විද්‍යා පීඨය විසින් තාක්ෂණ පීඨයට ලබා දෙන ලදී. තාක්ෂණ පීඨය සඳහා නව ගොඩනැගිලි ඉදිවෙමින් පවතින කඹුරුපිටිය භූමිය වෙත එම පීඨය රැගෙන යන තෙක් මෙම පහසුකම සපයනු ලැබේ.

විවිධ විෂය ධාරා හැදෑරීමේ අවස්ථා ශිෂ්‍යයන්ට ලැබෙන පරිදි පීඨය විසින් නව විෂයමාලා සංවර්ධනය කිරීමේ කටයතු සිදුකරමින් සිටී. හර විෂයයන් තුනක් හෝ ප්‍රධාන විෂයයන් දෙකක් සහිතව සිව් අවුරුදු විද්‍යාවේදී ගෞරව උපාධිය සම්පූර්ණ කිරීමට මෙම විෂ්‍ය ධාරා ශිෂ්‍යයන්ට අවස්ථාවසලසනු ඇත. ඒ සඳහා යෝජනාවා පීඨය විසින් අනුමතිය සඳහා වි.වි.ප්‍ර.කොමිෂන් සභාවට ඉදිරිපත් කළ අතර යෝජනාව තුළ ලැයිස්තු ගත කර තිබූ උපාධි සුදුසුකම් 8 ක් ප්‍රභේදනය කිරීම පිණිස අයදුම්පත්‍ර 8 ක් ඉදිරිපත් කරන ලෙස කොමිෂන් සභාව නිර්දේශ කරන ලදී. අයදුම්පත්‍ර වි.වි.ප්‍ර.කො. සභාවට ඉදිරිපත් කිරීමට පෙර විෂය විශේෂඥයන්ගෙන් සමාලෝචන ලබා ගනු පිණිස අභ්‍යන්තර තත්ත්ව සහතිකකරණ ඒකකය මගින් සමාලෝචන ක්‍රියාදාමය සඳහා පීඨය අයදුම්පත්‍ර 8ක් ඉදිරිපත් කරන ලදී. එක් සමාලෝචකයකුගෙන් හැරෙන්නට අනෙකුත් සමාලෝචකයන්ගේ සමාලෝචන වාර්තා පීඨයට ලැබුණු අතර එසේ ඉදිරිපත් නොකළ සමාලෝචකයා වෙනුවෙන් එම විෂය ක්ෂෙත්‍රය සමාලෝචනය සඳහා අළුතින් වෙනත් අයෙකු පත්කරන ලදී.

මූල්‍ය ගණිතය සහ කාර්මික සංඛ්‍යාලේඛන පිළිබඳ නව විද්‍යාවේදී (ගෞරව) උපාධියක් පිරිනැමීම පිණිස ගණිත අධ්‍යයනාංශය විසින් ඉදිරිපත් කරනු ලැබූ යෝජනාව විෂය විශේෂඥයන් විසින් සමාලෝචනය කරනු ලැබූ අතර සමාලෝචකයන්ගේ අදහස් හා යෝජනා ප්‍රකාරව යෝජනාව ප්‍රතිශෝධනය කිරීම අධ්‍යයනාංශය විසින් සම්පූර්ණයෙන්ම පාහේ සම්පූර්ණ කර තිබේ.

සිව්වැනි ජාත්‍යන්තර විද්‍යා සහ තාක්ෂණ සම්මේලනය සහ දෙවන උපාධි අපේක්ෂක පර්යේෂණ සම්මන්ත්‍රණය 2017දී පීඨය සාර්ථකව පවත්වන ලදී. පීඨයේ සාමාජිකයන් තම පර්යේෂණ අනාවරණ දේශීය සහ ජාත්‍යන්තර පර්යේෂණ සම්මේලන සහ සඟරා තුළින් ප්‍රකාශයට පත් කරන ලදී.

අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් ගණනාවකට විශ්වවිද්‍යාලය, ජාතික පර්යේෂණ සභාව, ජාතික විද්‍යා පදනම සහ විදේශ විශ්වවිද්‍යාල සහ ආයතන වෙතින් පර්යේෂණ/සංචාර ප්‍රදාන සහ සම්මාන හිමිවුණි.

ඊට අමතරව, පීඨ සාමාජිකයන් විශ්වවිද්‍යාලය තුළ සහ ඉන් බාහිරව විවිධ ආකාරයේ අරමුණු සඳහා විශේෂ කමිටුවල කටයුතු කරන ලදී.

විෂයමාලා සංවර්ධනය, පර්යේෂණ නිමැවුම, ජාතික සේවා, ප්‍රජා සේවා, විශ්වවිද්‍යාල සේවා පිළිබඳ සහ ජාත්‍යන්තර දායකත්වය වෙනුවෙන් එක් එක් අධ්‍යනාංශයයේ දායකත්වය පිළිබඳ නිශ්චිත තොරතුරු පහත වගුවේ දැක්වේ.

| වැඩසටහන/ ක්‍රියාකාරකම | සංඛ්‍යාව සහ/හෝ සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන් /නිමැවුම |
|---|---|---|
| අළුතින් හඳුන්වාදුන් උපාධි අපේක්ෂක උපාධි වැඩසටහන් | ගණිතය සහ භෞතික විද්‍යා විද්‍යාවේදී උපාධිය සහ රසායන විද්‍යාව සහ භෞතික විද්‍යා විද්‍යාවේදී | මෙම සිව් අවුරුදු උපාධි නිසාවෙන් වැඩි වැඩියෙන් ශිෂ්‍යයන් ආකර්ෂණය කර ගැනීමට මෙය |

| වැඩසටහන/ ක්‍රියාකාරකම | සංඛ්‍යාව සහ/හෝ සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන් /නිමැවුම |
|---|---|---|
| | උපාධිය ලෙස නව උපාධි වැඩසටහන් දෙකක් භෞතික විද්‍යා අධ්‍යයනාංශය හඳුන්වා දෙනු ලැබිය. | විශ්වවිද්‍යාලයට වඩා ප්‍රයෝජනවත් වනු ඇති අතර මෙම විෂය ධාරා හදාරන සිසුන්ට විෂයයන් දෙකක් සම්බන්ධයෙන් තම දැනුම වර්ධනය කර ගැනීමට හැකි බැවින් එය ඔවුනට වඩාත් වැඩදායී වනු ඇත. |
| අළුතින් හඳුන්වා දුන් පාඨමාලා (පාඨමාලා ඒකක) | **i.** මහාචාර්ය කාන්ති යාපා මිය සක්‍රිය පුරවැසිත්වය (අර්ස-2) විකල්ප හඳුන්වා දෙන ලදි. | විද්‍යා පීඨයේමට්ටම් II සහ III මට්ටම්වල ශිෂ්‍යයන් |
| | ii. මහාචාර්ය කාන්ති යාපා මිය සක්‍රිය පුරවැසි ප්‍රජා ව්‍යාපෘතිය (අර්ස-2)-විකල්ප හඳුන්වා දෙන ලදී. | |
| | iii. BOT 4282 ජෛව තොරතුරු තාක්ෂණය | විශේෂ උපාධි ශිෂ්‍යයන් |
| | iv. BOT 4252 උද්භිද විද්‍යාව ප්‍රායෝගික කුසලතා | විශේෂ උපාධි ශිෂ්‍යයන් |
| | **v.** වන නිෂ්පාදන සහ පේෂකර්ම තාක්ෂණය | රසායන විද්‍යා විශේෂ උපාධි ශිෂ්‍යයන් |
| | vi. කාර්මික රසායන විද්‍යාවේ තෝරාගත් මාතෘකා | රසායන විද්‍යා විශේෂ උපාධි ශිෂ්‍යයන් |
| | vii. රසායන විද්‍යාවේ කාලීන මාතෘකා | රසායන විද්‍යා විශේෂ උපාධි ශිෂ්‍යයන් |
| දුරස්ථ අධ්‍යාපන වැඩසටහන් හෝ ව්‍යාප්ති පාඨමාලා | එස්.එස්. අබේවික්‍රම මහතා රුහුණ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ සම සෞඛ්‍ය වැඩසටහනේ බාහිර කථිකාචාර්යවරයකු ලෙස සේවය කරන ලදී | රුහුණ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ විද්‍යා පීඨ උපාධි අපේක්ෂකයන් |
| ගාස්තු අයකරන පාඨමාලා | ආචාර්ය ජේ.ඒ.පී. බෝධික මයා දකුණු පළාතේ පාසල් ගුරුවරුන් සඳහා අ.පො.ස.උ/පෙ. භෞතික විද්‍යා ගුරු පුහුණු පාඨමාලාවක් සංවිධානය කරන ලදී. | පාසල් ගුරුවරුන් සහ උසස් පෙළ සිසුන් |
| ප්‍රජා විහිදුම්කරණ සේවා | i. ආචාර්ය ජී.ඩී.කේ. මහානාම මයා විද්‍යා පීඨයේ නියෝජ්‍ය විනය පාලක ලෙස කටයුතු කරන ලදි. | විද්‍යා පීඨයේ සිසුන් |
| | ii.ආචාර්ය ජී.ඩී.කේ. මහානාම මයා විද්‍යා පීඨයේ සමීපස්ථ ආචාර්යවරයකු ලෙස කටයුතු කරන ලදී | විද්‍යා පීඨයේ සිසුන් |
| | iii. 2017 භෞතික විද්‍යා සහ තාරකා විද්‍යා ඔලිම්පියාඩ් තරඟයේ මධ්‍යස්ථාන සම්බන්ධීකාරකයකු ලෙස ආචාර්ය ජී.ඩී.කේ. මහානාම මයා කටයතු කරන ලදී. | දකුණු පළාතේ පාසල් සිසුන් |
| | iv. ගංවතුරෙන් පීඩාවට පත් කාර්ය මණ්ඩල සාමාජිකයන් සඳහා ආචාර්ය ජී.ඩී.කේ. මහානාම මයා උපකාර කරන ලදී | විද්‍යා පීඨ කාර්ය මණ්ඩල සාමාජිකයන් |
| | v. මහාචාර්ය කාන්ති යාපා මිය - අවට ගම්මානවල හා අවට පාසල්වල ප්‍රජා ව්‍යාපෘති | විද්‍යා පීඨයේ සිසුන් |
| | vi. ආචාර්ය ජේ.ඒ.පී. බෝධික මයා දකුණු පළාත් නව නිපැයුම් තරඟය (සභාපති) සංවිධානය කරන ලදී. | පාසල් සිසුන් සහ දකුණු පළාතේ අනෙකුත් ප්‍රජාවන් |
| | vii. ආචාර්ය ජේ.ඒ.පී. බෝධික මයා අ.පො.ස. (උසස් පෙළ) භෞතික විද්‍යාව ප්‍රායෝගික වැඩමුළුවක් සංවිධානය කරන ලදී | පාසල් සිසුන් සහ දකුණු පළාතේ අනෙකුත් ප්‍රජාවන් |

| වැඩසටහන/ ක්‍රියාකාරකම | සංඛ්‍යාව සහ/හෝ සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන් /නිමැවුම |
|---|---|---|
| | viii. ආචාර්ය සාරංග පෙරේරා මයා විද්‍යා පීඨයේ ශිෂ්‍ය උපදේශකයකු ලෙස කටයුතු කරන ලදී. | විද්‍යා පීඨයේ සිසුන් |
| | ix. ආචාර්ය මංජුල ද සිල්වා ගංවතුරෙන් පීඩාවට පත් ජනතාවට උපකාර කරන ලදී. | ගංවතුරෙන් පීඩාවට පත් ජනතාව |
| | x. එස්.එස්. අබේවික්‍රම මහතා විද්‍යා පීඨයේ ශිෂ්‍ය සමීපස්ථ ආචාර්යවරයකු ලෙස රාජකාරී ඉටුකරන ලදී. | |
| | xi. අධ්‍යයනාංශයේ ආචාර්ය මණ්ඩලයේ ඇතැම් සාමාජිකයන්ගෙන් සමන්විත ස්වේච්ඡා සංවිධානයක් වන උම්-මාතර පොත්පදනම විසින් අම්පාර දිස්ත්‍රික්කයේ ග්‍රාමීය ප්‍රදේශවල පාසල් තුනක පුස්තකාල ස්ථාපිත කරන ලදී | පාසල් ශිෂ්‍යයන් |
| | xii. සිවිල් අභියාචන මහාධිකරණයේ නීතිඥයන් සඳහා වැඩමුළුව - අධිකරණ ස්වයංක්‍රියකරණ ව්‍යාපෘතිය | මාතර සිවිල් අභියාචන මහාධිකරණයේ නීතිඥයන් |
| | xiii. මාතර සාන්ත මරියා කන්‍යාරාමයේ විද්‍යා දින සැමරුමේ ප්‍රධාන දේශනය - පාසල් ළමුන්ගේ ආකල්ප සංවර්ධනය පිළිබඳ දෙසුමකි. | සාන්ත මරියා කන්‍යාරාමයේ උසස් පෙළ ශිෂ්‍යාවන් |
| | xiv. උසස් පෙළ ගුරු පුහුණු වැඩසටහන | උසස් පෙළ ගුරු භවතුන් හා සිසුන් |
| | xv. උසස් පෙළ ප්‍රායෝගික ආදර්ශණ | දකුණු පළාතේ උසස් පෙළ සිසුන් |
| විෂයමාලා සංවර්ධනය (පාඨමාලා ඒකක/විෂය වැඩි දියුණු කිරීම) | i. මහාචාර්ය ඩබ්.ඩී.ජී.ධර්මරත්න මහතා තාක්ෂණ පීඨය විසින් පිරිනමන උපාධි වැඩසටහන් සඳහා වූ විෂයමාලා සංවර්ධන කමිටුවේ ප්‍රධානත්වය දරන ලදී. | තාක්ෂණ පීඨය |
| | ii. නව උපාධි වැඩසටහන් සඳහා පවත්නා විෂයමාලාව ප්‍රතිශෝධනය කොට නව විෂයමාලා ඉදිරිපත් කරන ලදී. | උපාධි අපේක්ෂකයන් |
| | iii. BOT4262 විද්‍යාත්මක වාර්තා ලිවීම, සම්මන්ත්‍රණ සහ කර්මාන්ත පුහුණුව | විශේෂ උපාධි ශිෂ්‍යයන් |
| | iv. අළුතින් යෝජනා කළ සිව් අවුරුදු උපාධි අපේක්ෂක උපාධි වැඩසටහන වැඩි දියුණු කිරීම පිළබඳව පැවැති සාකච්ඡාවන්ට සහභාගි විය. | රුහුණු විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂකයන් සහ සමස්ථ රටම |
| කාර්ය මණ්ඩල සංවර්ධන වැඩසටහන් | i. අධ්‍යයනාංශය සඳහා අනුබද්ධ මහාචාර්යවරයකු ලෙස අධ්‍යයනාංශය මහාචාර්ය චන්ද්‍රා වික්‍රමසිංහ මහතා පත්කරන ලදී. | භෞතික විද්‍යා අධ්‍යයනාංශය, රුහුණු විශ්වවිද්‍යාලය |
| | ii. අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා අතිරේක සේවක සංඛ්‍යා දෙකක් සහ යන්ත්‍රකරු සහ කම්කරුවන් එක් අයෙකු බැගින් වි.වි.ප්‍ර.කො.සභාවෙන් ලබා ගන්නා ලදී. | භෞතික විද්‍යා අධ්‍යයනාංශය, රුහුණු විශ්වවිද්‍යාලය |
| | **iii.** උසස් අධ්‍යාපනයේ වෘත්තීය සංවර්ධන සහතික පාඨමාලාව ආචාර්ය මංජුල ද සිල්වා මහතා විසින් සම්පූර්ණ කරන ලදි. | ආචාර්ය මංජුල ද සිල්වා මයා |
| | **iv.** 2017 නොවැම්බර් 15 වැනි දින රුහුණ විශ්විවිද්‍යාලයේ විද්‍යා පීඨයේ පැවැති “ශිෂ්‍ය උපදේශනය සහ අධීක්ෂණය පිළිබඳ | ආචාර්ය එන්.ටී. වික්‍රමසූරිය මෙය |

| වැඩසටහන/ ක්‍රියාකාරකම | සංඛ්‍යාව සහ/හෝ සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන් /නිමැවුම |
|---|---|---|
| | වැඩමුළුවට ආචාර්ය එන්.ටී. වික්‍රමසූරිය මෙය සහභාගි විය. | |
| | v. උසස් අධ්‍යාපනයේ වෘත්තීය සංවර්ධන සහතික පාඨමාලාව-2016 - මොඩියුලය 6 - උසස් අධ්‍යාපනය සඳහා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ කුසලතා | රුහුණ විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය සහ බාහිර ආයතනවලින් සමාන පංති සහභාගිවූවන් |
| ජාතික සංවර්ධනය සඳහා දායකත්වය | i. මහාචාර්ය ඩබ්.ඩී.ජී.ධර්මරත්න මහතා, සභාපති, මූලික විද්‍යා පිළිබඳ ජාතික විද්‍යා පදනම ක්‍රියාකාරී කමිටුවේ සභාපති ලෙස සේවය කරන ලදී | ජාතික විද්‍යා පදනම |
| | ii. "මූලික විද්‍යා පර්යේෂණ ප්‍රතිපත්තිය', ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිසම සඳහා විශේෂඥ කණ්ඩායමේ සාමාජිකයකු ලෙස මහාචාර්ය ඩබ්.ඩී.ජී. ධර්මරත්න මයා කටයුතු කරන ලදි. | ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිසම සහ රට |
| | iii. මහාචාර්ය ඩබ්.ඩී.ජී. ධර්මරත්න මයා උසස් පෙළ විභාගයේ ප්‍රශ්න පත්‍ර සකස් කරන්නෙකු සහ සම-පාලකයකු ලෙස කටයුතු කරන ලදී. | ශ්‍රී ලංකාවේ පාසල් ශිෂ්‍යයන් |
| | iv. මහාචාර්ය ඩබ්.ඩී.ජී.ධර්මරත්න මහතා ශ්‍රී ලංකා භෞතික විද්‍යා ආයතනයේ භෞතික විද්‍යා සභරාවේ කර්තෘ මණ්ඩලයේ සාමාජිකයකු ලෙස කටයුතු කරන ලදී. | භෞතික විද්‍යා සඟරාව, ශ්‍රී ලංකා භෞතික විද්‍යා ආයතනය |
| | v. මහාචාර්ය ඩබ්.ඩී.ජී.ධර්මරත්න මහතා රුහුණ විද්‍යා සඟරාවේ ප්‍රධාන කර්තෘ ලෙස කටයුතු කරන ලදී. | රුහුණ විද්‍යා සඟරාව |
| | vi. මහාචාර්ය තනතුර සඳහා වූ අයදුම්පත්‍ර ඇගයීම සඳහා අනෙකුත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා නාමිකයකු ලෙස මහාචාර්ය ඩබ්.ඩී.ජී.ධර්මරත්න මහතා කටයුතු කරන ලදී. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල |
| | vii. භෞතික විද්‍යා අධ්‍යයනාංශයේ සාමාන්‍ය රාජකාරිවලට අමතරව මහාචාර්ය ඩබ්.ඩී.ජී.ධර්මරත්න මහතා තාක්ෂණ පීඨයේ පීඨාධිපති ලෙස කටයුතු කරන ලදී. | තාක්ෂණික පීඨය |
| | viii. ජාතික මූලික අධ්‍යාපන ආයතනයේ පර්යේෂකයන්ගේ වාර්ෂික ප්‍රගති වාර්තා ඇගයීම මහාචාර්ය ඩබ්.ඩී.ජී.ධර්මරත්න මහතා විසින් සිදුකරන ලදී. | ජාතික මූලික අධ්‍යාපන ආයතනය සහ පර්යේෂණ ප්‍රජාව |
| | ix. ආචාර්ය ජී.ඩී.කේ. මහානාම මහතා භෞතික විද්‍යා අධ්‍යයනාංශයේ ප්‍රධානි ලෙස කටයුතු කරන ලදී. | භෞතික විද්‍යා අධ්‍යයනාංශය |
| | x. ආචාර්ය ජී.ඩී.කේ. මහානාම මහතා - භෞතික විද්‍යා සහ තාරකා විද්‍යා ඔලිම්පියාඩ් තරඟ විභාගය -2017 පවත්වන ලදී. | දකුණු පළාතේ පාසල් ශිෂ්‍යයන් |
| | xi. ආචාර්ය ජී.ඩී.කේ. මහානාම මහතා - විද්‍යා ඔලිම්පියාඩ් තරඟ විභාගය -2017 පවත්වන ලදී. | දකුණු පළාතේ පාසල් ශිෂ්‍යයන් |

| වැඩසටහන/ ක්‍රියාකාරකම | සංඛ්‍යාව සහ/හෝ සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන් /නිමැවුම |
|---|---|---|
| | xii. භෞතික විද්‍යා සහ තාක්ෂණවේදය සඳහා විද්‍යාව යන උ/පෙ. විෂයයන් සඳහා ප්‍රශ්න පත්‍ර සකස් කරන්නෙකු හා පිළිතුරු පත්‍ර ඇගයීමේ ප්‍රධාන පරීක්ෂකයකු ලෙස ආචාර්ය ජී.ඩී.කේ. මහානාම මහතා කටයුතු කරන ලදී. | ශ්‍රී ලංකාවේ පාසල් ශිෂ්‍යයන් |
| | xiii. මහාචාර්ය කාන්ති යාපා මිය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ආයතනික සමාලෝචන කමිටුවේ සේවය කරන ලදී. | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය |
| | xiv. අ.පො.ස. (උසස් පෙළ) උත්තර පත්‍ර ඇගයීමේදී ආචාර්ය කේ.පී.එස්. ජයතිලක මහතා සම පාලකවරයකු හා පරීක්ෂකවරයකු ලෙස කටයුතු කරන ලදී. | ශ්‍රී ලංකාවේ පාසල් සිසුන් |
| | xv. දකුණු පළාත, පළමු වාර විභාගයේ අ.පො.ස. (උසස් පෙළ) භෞතික විද්‍යා ප්‍රශ්න පත්‍රයේ ප්‍රධාන පාලකවරයකු ලෙස ආචාර්ය ජේ.ඒ.පී. බෝධික මයා කටයුතු කරන ලදී. | දකුණු පළාතේ අ.පො.ස. (උසස් පෙළ) සිසුන් |
| | xvi. අ.පො.ස. (උසස් පෙළ) භෞතික විද්‍යා පිළිතුරු ඇගයීමේ ප්‍රධාන පරීක්ෂක ලෙස ආචාර්ය ජේ.ඒ.පී. බෝධික මයා කටයුතු කරන ලදි. | මෙය ශ්‍රී ලංකාවේ පාසල් සිසුන් සඳහා වැඩදායී විය |
| | xvii. උසස් පෙළ භෞතික විද්‍යා උත්තර පත්‍ර ඇගයීම් මණ්ඩලයේ ප්‍රධාන පරීක්ෂකවරයකු ලෙස ආර්.එම්. රණතුංග මහතා කටයුතු කරන ලදී. | ශ්‍රී ලංකාවේ පාසල් සිසුන් |
| | xviii. 2017-අ.පො.ස. (උ/පෙ) විභාගය සඳහා ප්‍රධාන පරීක්ෂකවරයකු ලෙස ආචාර්ය සාරංග පෙරේරා මහතා රාජකාරි ඉටු කරන ලදී. | ශ්‍රී ලංකාවේ පාසල් සිසුන් |
| | xix. උසස් පෙළ භෞතික විද්‍යා උත්තර පත්‍ර ඇගයීමේ ප්‍රධාන පරීක්ෂකවරයකු ලෙස ආචාර්ය මංජුල ද සිල්වා මහතා කටයුතු කරන ලදී. | ශ්‍රී ලංකාවේ පාසල් සිසුන් |
| | xx. රුහුණ විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨය විසින් සංවිධානය කරන ලැබූ රුහුණු නව නිපැයුම් සහ නව්‍යකරණ ප්‍රදර්ශනය-2017 හි සම්පත් දායකයකු ලෙස ආචාර්ය එන්.ටී. වික්‍රමසූරිය මෙය කටයුතු කරන ලදී. | දකුණු පළාතේ පාසල් ශිෂ්‍යයන්, ගුරුවරුන් සහ අවට ප්‍රජාවන් |
| | xxi. දකුණු පළාතේ සහ නැගෙනහිර පළාතේ නව නිපැයුම් ඇගයීම පිණිස වූ ජූරි මණ්ඩලයේ සාමාජිකයකු ලෙස එස්.එස්. අබේවික්‍රම මහතා කටයුතු කරන ලදී. | ශ්‍රී ලංකාවේ නව නිපැයුම්කරුවන් |
| | xxii. උසස් පෙළ පිළිතුරු පත්‍ර ඇගයීම සඳහා ප්‍රධාන පරීක්ෂකවරුන් ලෙස ඇතැම් අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් සහභාගි විය. | |
| | xxiii. E- මාතර සිවිල් අභියාචනා මහාධිකරණයේ ගොනු කිරීමේ ව්‍යාපෘතිය | මාතර සිවිල් අභියාචනා මහාධිකරණය |

| වැඩසටහන/ ක්‍රියාකාරකම | සංඛ්‍යාව සහ/හෝ සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන් /නිමැවුම |
|---|---|---|
| | xxiv. උසස් පෙළ ජීවවිද්‍යා විෂයමාලා ප්‍රතිශෝධ නකමිටුවට මහාචාර්ය එස්. අබේසිංහ මහතා සහභාගි විය. | උසස් පෙළ ජීව විද්‍යා ශිෂ්‍යයන් |
| | xxv. දකුණු පළාතේ උසස් පෙළ ගුරුවරුන් සඳහා උ/පෙ රසායන විද්‍යා නව විෂය නිර්දේශය පිළිබඳව අධ්‍යයනාංශය විසින් සංවිධානය කරනු ලැබූ 16 දින වැඩමුළුවේ සම්පත් දායක | උසස් පෙළ ශිෂ්‍යයන් |
| | xxvi. බාහිර පීඨ මණ්ඩල සාමාජික 01- ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය, ස්වභාවික විද්‍යා පීඨය - සත්ත්ව විද්‍යා අධ්‍යයනාංශය | |
| | xxvii. උසස් පෙළ ප්‍රශ්න පත්‍ර ඇගයීම - සත්ත්ව විද්‍යා අධ්‍යයනාංශය | |
| | xxviii. ඇගයීම් වාර්තා සංස්කරණය සඳහා විභාග කොමසාරිස් ජෙනරාල් සහ විභාග කොමිෂන් සභාව (පර්යේෂණ හා සංවර්ධන) විසින් පත්කරන ලද කමිටුවේ සාමාජිකයකු ලෙස මහාචාර්ය එන්.ජේ. ද එස් අමරසිංහ මිය කටයතු කරන ලදී. අ.පො.ස. (උ/පෙ) විභාගය-2016 ජීව විද්‍යා විෂයය සම්බන්ධයෙන් 2017 ඔක්තෝබර් 12 සහ 13 යන දිනයන්හි ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ පවත්වනු ලැබූ වැඩමුළුවට සහභාගි විය. | |
| | xxix. කෘෂිකර්ම පීඨය සහ කෘෂිකර්ම අමාත්‍යාංශය අතර සහයෝගිතාවය යටතේ "දකුණු පළාතේ ශාක වටපණු රෝගය කළමනාකරණය" මැයෙන් වූ වටපණු විද්‍යා පර්යේෂණ ව්‍යාපෘතියට මහාචාර්ය ඩබ්.ටී.එස්.ඩී. ප්‍රේමචන්ද්‍ර මිය සම්බන්ධ විය. | |
| | xxx. මහාචාර්ය ඩබ්.ටී.එස්.ඩී. ප්‍රේමචන්ද්‍ර මිය රුහුණ විශ්වවිද්‍යාලයේ "රෝහණ" සඟරාවේ සංස්කරණ මණ්ඩලයේ සාමාජිකයකු විය. | |
| | xxxi. මහාචාර්ය ඩබ්.ටී.එස්.ඩී.ප්‍රේමචන්ද්‍ර මිය විද්‍යා පීඨය මගින් ප්‍රකාශයට පත් කරනු ලබ "රුහුණ විද්‍යා සඟරාවේ" සංස්කරණ මණ්ඩලයේ සාමාජිකයකු විය | |
| ජාත්‍යන්තර මට්ටමේ දායකත්වය | i. විද්‍යා, තාක්ෂණ සහ පර්යේසණ අමාත්‍යවරයා සහ ස්විට්සර්ලන්තයේ තානාපති සමග න්‍යෂ්ඨික පර්යේෂණ පිළිබඳ යුරෝපීය සංවිධානය වෙත භෞතික විද්‍යාඥයන් පිරිසක් සිදුකළ සංචාරයේ නායකත්වය මහාචාර්ය ධර්මරත්න මහතා දරන ලදී. | ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල |
| | **ii.** දකුණු ආසියානු අධිශක්ති භෞතික විද්‍යා ආයතනය වෙත භෞතික විද්‍යාඥයන් පිරිසක් සිදුකළ සංචාරයේ නායකත්වය මහාචාර්ය ධර්මරත්න මහතා දරන ලදී. (SAHEPI-2017) | මහාචාර්ය ධර්මරත්න මහතා, ආචාර්ය එන්.එම්. වික්‍රමගේ මෙය සහ ශිෂ්‍යයෙක් |

| වැඩසටහන/ ක්‍රියාකාරකම | සංඛ්‍යාව සහ/හෝ සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන් /නිමැවුම |
|---|---|---|
| | අනාවරක තාක්ෂණයේ සහ එහි භාවිතයන් පිළිබඳ වැඩමුළුව- කත්මන්ඩු විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා HEP පිළිබඳ තත්ත්ව වාර්තාව ඉදිරිපත් කරන ලදී. | |
| | **iii.** මහාචාර්ය ධර්මරත්න මහතා - ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල සමූහයක් සඳහා CMS සාමාජිකත්වය ලබා ගැනීම පිණිස අයදුම්පත්‍රයක් ඉදිරිපත් කරන ලදී, සහයෝගිතා මණ්ඩලය - CMS දෙසැම්බර් මාසයේ පැවැති ඊළඟ රැස්වීමේදී CMS ඒ සඳහා ඉහළින්ම ඡන්දය ප්‍රකාශ කර ශ්‍රී ලංකාවට පූර්ණ සමාජිකත්වය ප්‍රදානය කරන ලදී. න්‍යෂ්ටික පර්යේෂණ පිළිබඳ යුරෝපා සංවිධානයේ තෙමස් පර්යේෂණ ක්‍රියාකාරකමක් සඳහා අධ්‍යයනාංශය අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයකු යවන ලදී. | ආචාර්ය එන්.එම්. වික්‍රමගේ මෙය සහ ශිෂ්‍යයෙක් |
| | **iv.** න්‍යෂ්ටික පර්යේෂණ පිළිබඳ යුරෝපා සංවිධානයේ මාස දෙකක වැඩමුළුවක් සඳහා අධ්‍යයනාංශය එක් සිසුවකු යවන ලදී. | කේ.එම්. ලියනගේ මිය |
| | **v.** ලෝකයේ පිළිගත් තාරකා ජීවවිද්‍යාඥයන් පස් දෙනෙකු සමගින් ශ්‍රී ලංකා තාරකා ජීවවිද්‍යාව සඳහා මධ්‍යස්ථානයක් භෞතිකවිද්‍යා අධ්‍යයනාංශයේ ස්ථාපිත කරන ලදී. | භෞතික විද්‍යා අධ්‍යයනාංශය, රුහුණු විශ්වවිද්‍යාලය |
| | **vi.** ජාත්‍යන්තර වැඩමුළු සඳහා සාමාජිකයක් තිදෙනෙකු සහභාගි කරවන ලදී. -ගණිත අධ්‍යයනාංශය | |
| | **vii.** බාහිර විභාග පරීක්ෂක - 02 ආචාර්ය උපාධිය- සත්ත්ව විද්‍යා අධ්‍යයනාංශය | ඉන්දියාවේ ශාස්ත්‍රීය නිබන්ධය |
| | **viii.** ඉන්දියාවේ තමිල්නාඩුවේ භාරතියාර් විශ්වවිද්‍යාලයේ ආචාර්ය උපාධි නිබන්ධ දෙකක බාහිර විභාග පරීක්ෂකවරයකු ලෙස මහාචාර්ය ඩබ්ලිව්.ටී.එස්.ඩී. ප්‍රේමචන්ද්‍ර මිය කටයුතු කරන ලදී. | |
| | **ix.** එක්සත් රාජධානියේ CABI සහ කෙන්යාවේ ICEPE මගින් ඒකාබද්ධව ප්‍රකාශයට පත්කරනු ලබන “සර්ම කලාපීය කෘෂි විද්‍යා ජාත්‍යන්තර සඟරාවේ” සංස්කරණ මණ්ඩලයේ සාමාජිකයකු ලෙස මහාචාර්ය ඩබ්ලිව්.ටී.එස්.ඩී. ප්‍රේමචන්ද්‍ර මිය කටයුතු කරන ලදී. | |
| | **x.** මහාචාර්ය ඩබ්ලිව්.ටී.එස්.ඩී. ප්‍රේමචන්ද්‍ර මිය - ඇ.එ.ජනපදයේ විද්‍යා සහ අධ්‍යාපන ප්‍රකාශන ආයතනය විසින් ප්‍රකාශයට පත්කරනු ලබන “කෘෂිකර්ම පර්යේෂණ පිළිබඳ ලෝක සඟරාවේ” | |

| වැඩසටහන/ ක්‍රියාකාරකම | සංඛ්‍යාව සහ/හෝ සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන් /නිමැවුම |
|---|---|---|
| කමිටු හා ඒවාට සම්බන්ධ සාමාජික සංඛ්‍යාව | i. මහාචාර්ය ඩබ්. ජී. ඩී. ධර්මරත්න මහතා විශ්වවිද්‍යාලයේ අතුරු නීති සමාලෝචන කමිටුව, තේරීම් කමිටු සහ සනාතන සභාව සහ පාලක සභාව පත්කරනු ලැබූ කමිටුවල සේවය කරන ලදී. | රුහුණ විශ්වවිද්‍යාලය |
| | ii. ආචාර්ය ජී.ඩී.කේ. මහානාම මහතා විද්‍යාපති උපාධි සංවිධාන සේවය කරන ලදී. | එම ක්ෂෙත්‍රයේ ශිෂ්‍යයන්ට මෙන්ම පීඨයට |
| | iii. ආචාර්ය ජී.ඩී.කේ. මහානාම මහතා විද්‍යා පීඨ තොරතුරු තාක්ෂණ කමිටුවේ සේවය කරන ලදී. | විද්‍යා පීඨයේ ශිෂ්‍යයන් |
| | iv. තාක්ෂණික පැවරුම් මෙහෙයුම් කමිටුවේ සාමාජිකයකු ලෙස මහාචාර්ය කාන්ති යාපා මිය සේවය කරන ලදී | විද්‍යා පීඨය |
| | v. ආචාර්ය කේ.පී.එස්. ජයතිලක මහතා පීඨයේ තාක්ෂණික ඇගැයීම් කමිටු තුනක සාමාජිකයකු ලෙස කටයුතු කරන ලදී. | විද්‍යා පීඨය |
| | vi. ආචාර්ය ජේ.ඒ.පී. බෝධික මයා ITRCC කමිටුවේ සම්බන්ධීකාරක ලෙස කටයුතු කරන ලදී. | විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂකයන් |
| | vii. ආචාර්ය ජේ.ඒ.පී. බෝධික මයා පීඨයේ තත්ත්ව ආරක්ෂණ ඒකකයේ සාමාජිකයෙකු ලෙස කටයුතු කරන ලදී. | විද්‍යා පීඨය |
| | viii. 2017 නව නිපැයුම් හා නව්‍යකරණ ප්‍රදර්ශනයේ කමිටු සාමාජිකයෙකු ලෙස ආචාර්ය සාරංග පෙරේරා මහතා සේවය කරන ලදී | විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් / පාසල් සිසුන් හා මහ ජනතාව. |
| | ix. පීඨ දින වැඩසටහනේ සාමාජිකයකු ලෙස ආචාර්ය මංජුල ද සිල්වා මහතා කටයතු කරන ලදී. | විද්‍යා පීඨය |
| | x. රුහුණ විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨය විසින් සංවිධානය කරනු ලැබූ "රුහුණු අන්තර්ජාතික විද්‍යා හා තාක්ෂණ සම්මේලනයේ" සංවිධාන කමිටු සාමාජිකයකු ලෙස ආචාර්ය එන්.ටී. වික්‍රමසූරිය මෙය කටයුතු කරන ලදී. | ජාතික හා ජාත්‍යන්තර පර්යේෂකයන් |
| | xi. 2017 නව නිපැයුම් හා නව්‍යකරණ ප්‍රදර්ශනයේ කමිටු සාමාජිකයෙකු ලෙස එස්.එස්. අබේවික්‍රම මහතා සේවය කරන ලදී. | විශ්වවිද්‍යාල සහ පාසල් සිසුන් |
| | xii. එස්.එස්. අබේවික්‍රම මහතා RISTCON 2017 කමිටු සාමාජිකයකු ලෙස සේවය කරන ලදී. | විද්‍යා පීඨය |
| | xiii. පීඨාධිපතිගේ නියෝජිත - කාර්ය මණ්ඩල සංවර්ධන ඒකකය.- (01) -පරිගණක විද්‍යා අධ්‍යයනාංශය | කාර්ය මණ්ඩලය |
| | xiv. රුහුණ විශ්වවිද්‍යාල LEARN නියෝජිත (01) - පරිගණක විද්‍යා අධ්‍යයනාංශය | කාර්ය මණ්ඩලය සහ ශිෂ්‍යයන් - රුහුණ විශ්වවිද්‍යාල සම්බන්ධීකරණය- LEARN ජාල |

| වැඩසටහන/ ක්‍රියාකාරකම | සංඛ්‍යාව සහ/හෝ සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන් /නිමැවුම |
|---|---|---|
| | | කළමනාකරණය ආශ්‍රිත කාර්යයන් |
| | xv. කමිටු සාමාජික- පරිගණක පිළිබඳ ස්ථාවර කමිටුව (01)- පරිගණක විද්‍යා අධ්‍යයනාංශය | කාර්ය මණ්ඩලය සහ ශිෂ්‍යයන් |
| | xvi.RISTCON සංවිධාන කමිටුව (02)- පරිගණක විද්‍යා අධ්‍යයනාංශය | පර්යේෂකයන් - RISTCON 2017 සම්මේලනය |
| | xvii. පීඨ දිනය (01)- පරිගණක විද්‍යා අධ්‍යයනාංශය | විද්‍යා පීඨ කාර්ය මණ්ඩලය හා ශිෂ්‍යයන් - පීඨ දිනය 2016 |
| | xviii. සම්මන්ත්‍රණය- පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය (01) - පරිගණක විද්‍යා අධ්‍යයනාංශය | පශ්චාත් උපාධි ශිෂ්‍යයන්-උපාධි අධ්‍යයන පීට සම්මන්ත්‍රණය- දෙසැම්බර් 2016 |
| | xix.පුවත් හසුන කමිටුව (01)<br>ශිෂ්‍ය ඉල්ලීම් කමිටුව (02)<br>පීඨ දින කමිටුව (01)-<br>රසායන විද්‍යා අධ්‍යයනාංශය | විද්‍යා පීඨය සහ කාර්ය මණ්ඩලය හා ශිෂ්‍යයන් |
| | xx. මහාචාර්ය ඩබ්ලිව්.ටී.එස්.ඩී. ප්‍රේමචන්ද්‍ර මිය - පීඨ ඉංග්‍රීසි සම්බන්ධීකාරක | |
| | xxi.මහාචාර්ය ඩබ්ලිව්.ටී.එස්.ඩී. ප්‍රේමචන්ද්‍ර මිය - තත්ත්ව කළමනාකරණ ඒකකයේ සාමාජික, විද්‍යා පීඨය | |
| | xxii. මහාචාර්ය ඩබ්ලිව්.ටී.එස්.ඩී. ප්‍රේමචන්ද්‍ර මිය - පීඨ නියෝජිත- උපදේශක මණ්ඩලය- සංස්කෘතික මධ්‍යස්ථානය, රුහුණ විශ්වවිද්‍යාලය | |
| | xxiii. මහාචාර්ය ඩබ්ලිව්.ටී.එස්.ඩී. ප්‍රේමචන්ද්‍ර මිය - අන්තර් පීඨ සංගීත කරඟයේ සම්බන්ධීකාරක | |
| | xxiv. මහාචාර්ය ඩබ්ලිව්.ටී.එස්.ඩී. ප්‍රේමචන්ද්‍ර මිය - අන්තර් පීඨ නැටුම් කරඟයේ සම්බන්ධීකාරක | |
| | xxv. මහාචාර්ය ඩබ්ලිව්.ටී.එස්.ඩී. ප්‍රේමචන්ද්‍ර මිය - විශ්වවිද්‍යාල සම්බන්ධීකාරක "රුහුණු සේවය" වැඩසටහන් (ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව) | |
| | xxvi. මහාචාර්ය ඩබ්ලිව්.ටී.එස්.ඩී. ප්‍රේමචන්ද්‍ර මිය - විද්‍යා පීඨ පර්යේෂණ කවයේ භාණ්ඩාගාරික | |
| | xxvii. මහාචාර්ය ඩබ්ලිව්.ටී.එස්.ඩී. ප්‍රේමචන්ද්‍ර මිය - විද්‍යා පීඨ කලා හවුලේ අනුශාසක | |
| | xxviii. මහාචාර්ය ඩබ්ලිව්.ටී.එස්.ඩී. ප්‍රේමචන්ද්‍ර මිය - සත්ත්ව විද්‍යා සංගමයේ ජ්‍යෙෂ්ඨ සංස්කාරක | |
| ලැබුණු ප්‍රදාන (අරමුණ සහ ප්‍රමාණය)<br>- දේශිය<br>- අන්තර්ජාතික | i. න්‍යෂ්ඨික පර්යේෂණ පිළිබඳ යුරෝපා සංවිධානය සමග පර්යේෂණ සහයෝගිතාව ආරම්භ කිරීම පිණිස මහාචාර්ය ධර්මරත්න මහතා විසින් ඉදිරිපත් කරනු ලැබූ අයවැය යෝජනාව (පස් අවුරුදු කාල සීමාවක් රු මිලියන 250) අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී. | ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල |

| වැඩසටහන/ ක්‍රියාකාරකම | සංඛ්‍යාව සහ/හෝ සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන් /නිමැවුම |
|---|---|---|
| | ii. රුහුණ, යාපනය, කැළණිය සහ පේරාදෙණිය විශ්වවිද්‍යාල සඳහා වසර පහක සූර්ය කෝෂ පර්යේෂණ ව්‍යාපෘතියක් සඳහා රු. මිලියන 240 ක ප්‍රදානයක් ලබා දෙන ලදී. රුහුණ විශ්වවිද්‍යාලය සඳහා සහකාර ව්‍යාපෘති අධ්‍යක්ෂ වූයේ ආචාර්ය ජී.ඩී.කේ. මහානාම මහතාය. | මෙය සියලු විශ්වවිද්‍යාල සහ සහ සමස්ත රටටම වැඩදායී වනු ඇත. |
| | iii. ආචාර්ය ජේ.ඒ.පී. බෝධික මයාට රු මිලියන 33.5ක ප්‍රදානයක් ලැබුණි. (RU/PG-R/16/12, එකවර ප්‍රදානය), රුහුණ විශ්වවිද්‍යාලය | ආචාර්ය ජේ.ඒ.පී. බෝධික මයා |
| | iv. ආචාර්ය උපාධි පර්යේෂණ ව්‍යාපෘතිය සිදු කිරීම සඳහා වි.වි.ප්‍ර.කො.ස. ප්‍රදානයෙන් ඊ.එම්. රණතුංග මහතා රු 1,493,000.00 | ඊ.එම්. රණතුංග මයා |
| | v. ආචාර්ය කේ. මාස්කෝරාළ මහතාට ජාතික පර්යේෂණ සභා ප්‍රදානය | ආචාර්ය උපාධි ශිෂ්‍යයන් |
| | vi. මහාචාර්ය එස්. අබේසිංහ මහතාට ඉන්දු- ශ්‍රී ලංකා පදනම් ප්‍රදානය | කෙටි කාලීන පුහුණුව |
| | vii. ආචාර්ය නදීෂා මියට ජාතික විද්‍යා පදනමේ විදේශ විශේෂ පුහුණු වැඩසටහන (OSTP) සඳහා ඇ.ඩො. 13134 ක් ලැබුණි. (CERN සාමාජික ගාස්තු + CERN පර්යේෂණය අඛණ්ඩව සිදු කිරීම සඳහා මාස 3 ක යැපීම් දීමනාව) | ආචාර්ය නදීෂා මිය |
| | viii. ආචාර්ය නදීෂා මියට ජාතික විද්‍යා පදනමේ ගමන් අධිශිෂ්‍යත්වය ලැබුණි. ඇ.ඩො.660 (අධිශක්ති භෞතික විද්‍යා මිනුම් උපකරණ වැඩමුළුව, නේපාලය) | ආචාර්ය නදීෂා මිය |
| | ix. මහාචාර්ය ඩබ්ලිව්.ටී.එස්.ඩී. ප්‍රේමචන්ද්‍ර මිය - ප්‍රදාන අංකය RU/SF/RP/2017/07<br>මාතෘකාව: මූල ගැට වටපණුවන් පාලනය කිරීමේ රසායනික නොවන ක්‍රියාමාර්ග පිළිබඳ විමර්ශනයක්<br>මුදල: 43,000 (RU/SF/RP/2015/03 පර්යේෂණය දිගටම සිදු කිරීම) | |
| සම්මාන/පේටන්ට් බලපත්‍ර/විශේෂ කාර්ය සාධන | i. රුහුණ නව නිපැයුම් සහ නව්‍යකරණ ප්‍රදර්ශනයේදී නව්‍යකරණයක් සඳහා පළමු ස්ථානය මහාචාර්ය ධර්මරත්න මහතාට හිමි වුණි. | මහාචාර්ය ධර්මරත්න මහතා |
| | ii. සහසක් නිමැවුම් ජාතික ප්‍රදර්ශනයේදී එම නව නිපැයුම සඳහා මහාචාර්ය ධර්මරත්න මහතාට දෙවන ස්ථානය හිමි වුණි.<br>(ඊ.එම්. රණතුංග මහතා සහ ශිෂ්‍යයෙක් සමග) | මහාචාර්ය ධර්මරත්න මහතා, රණතුංග මහතා සහ අධ්‍යයනාංශය |
| | iii. සහසක් නිමැවුම් 2017 ප්‍රදර්ශනයේදී ආචාර්ය කේ.පී.එස්. ජයතිලක මහතා දෙවස ස්ථානය දිනා ගන්නා ලදී. (නව නිපැයුම් සහ නව්‍යකරණ ජාතික ප්‍රදර්ශනය) | ආචාර්ය කේ.පී.එස්. ජයතිලක මහතා සහ අධ්‍යයනාංශය |

| වැඩසටහන/ ක්‍රියාකාරකම | සංඛ්‍යාව සහ/හෝ සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන් /නිමැවුම |
|---|---|---|
| | රුහුණ නව නිපැයුම් සහ නව්‍යකරණ ප්‍රදර්ශනය | |
| | iv. ආචාර්ය කේ.පී.එස්. ජයතිලක මහතා පේටන්ට් බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කරන ලදී. | ආචාර්ය කේ.පී.එස්. ජයතිලක මහතා සහ අධ්‍යයනාංශය |
| | v. විද්‍යා උපුටන අනුක්‍රමණිකා - 2015 වසරේ ඉහළ බලපෑම් ප්‍රකාශිත පර්යේෂණ සඳහා 2017 ජනාධිපති සම්මානය ආචාර්ය නදීෂා මියට හිමිවිය. | ආචාර්ය නදීෂා මිය සහ අධ්‍යයනාංශය |
| | vi. "සහසක් නිමවුම් - 2017" ප්‍රදර්ශනයේදී භෞතික විද්‍යා ක්ෂේත්‍රය යටතේ විශ්වවිද්‍යාල සහ තෘතීයික අධ්‍යාපන ආයතන කාණ්ඩයේ දෙවන ස්ථානය එස්.එස්.අබේවික්‍රම මහතාට හිමි විය. | එස්.එස්. අබේවික්‍රම මහතා සහ අධ්‍යයනාංශය |
| | vii. රුහුණ නව නිපැයුම් සහ නව්‍යකරණ ප්‍රදර්ශනය-2017 හි විශ්වවිද්‍යාල සහ තෘතීයික අධ්‍යාපන ආයතන කාණ්ඩයේ 2 වන ස්ථානය සහ කුසලතා ස්ථාන දෙකක් එස්.එස්. අබේවික්‍රම මහතා දිනා ගන්නා ලදී. | එස්.එස්. අබේවික්‍රම මහතා |
| | viii. ඇ.එ.ජනපදයේ උතුරු ඩැකෝටා විශ්වවිද්‍යාලයේ උපාධි අධ්‍යයන පීඨය විසින් ප්‍රදානය කරන ලද ගිම්හාන ආචාර්ය අධිශිෂ්‍යත්වය සඳනුවන් ප්‍රසාද් මහතාට හිමිවුණි | සඳනුවන් ප්‍රසාද් මහතා |
| | ix. ජනාධිපති පර්යේෂණ සම්මානය ආචාර්ය කේ.මාස්කෝරාළ මහතාට හිමිවුණි. | |
| | x. SUSRED සම්මානය (01)<br>ජනාධිපති සම්මානය (01) - රසායන විද්‍යා අධ්‍යයනාංශය | කාර්ය මණ්ඩලය, විශ්වවිද්‍යාල සහ පීඨය |
| පැවැත්වූ වැඩමුළු/සම්මන්ත්‍රණ/සම්මේලන<br>(අභ්‍යන්තර හා දේශීය) | i. විද්‍යා පීඨයේ පැවැති 2වැනි RISTCON සම්මේලනයේදී ආචාර්ය මහානාම මහතා නිබන්ධ දෙකක් ඉදිරිපත් කරන ලදී. ජනවාරි 2017 | ආචාර්ය ජී.ඩී.කේ. මහානාම මහතා සහ භෞතික විද්‍යා අධ්‍යයනාංශය |
| | ii. විශ්වවිද්‍යාලය විසින් පවත්වනු ලැබූ විභාග පැවැත්වීම සඳහා පරිපාටි අත්පොත පිළිබඳ වැඩමුළුවට ආචාර්ය මහානාම මහතා සහභාගි විය. | ආචාර්ය ජී.ඩී.කේ. මහානාම මහතා |
| | iii. විද්‍යා පීඨය විසින් පවත්වනු ලැබූ ශිෂ්‍ය උපදේශනය සහ අභිමන්ත්‍රණය පිළිබඳ වැඩමුළුවකට අචාර්ය ජී.ඩී.කේ. මහානාම මහතා සහභාගි විය. | ආචාර්ය ජී.ඩී.කේ. මහානාම මහතා |
| | iv. දකුණු පළාතේ පාසල් ගුරුවරුන් සඳහා අ.පො.ස. උසස් පෙළ භෞතික විද්‍යා ගුරු පුහුණු වැඩසටහනක් ආචාර්ය ජේ.ඒ.පී. බෝධික මයා සංවිධානය කරන ලදී. (දින 21) | පාසල් ගුරුවරුන් සහ උසස් පෙළ සිසු සිසුවියන් |
| | v. දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව හා රුහුණ විශ්වවිද්‍යාලයේ භෞතික විද්‍යා | දකුණු පළාතේ භෞතික විද්‍යා ගුරුවරුන් |

| වැඩසටහන/ ක්‍රියාකාරකම | සංඛ්‍යාව සහ/හෝ සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන් /නිමැවුම |
|---|---|---|
| | අධ්‍යයනාංශය විසින් පවත්වනු ලැබූ වැඩමුළුවේදී(2017) ආචාර්ය සාරංග පෙරේරා සම්පත් දායකයකු ලෙස කටයුතු කරන ලදී. | |
| | vi. රුහුණ විශ්වවිද්‍යාලය විසින් 2017 අගෝස්තු 28 දින සංවිධානය කරනු ලැබූ "Patent Drafting and Prosecution"පිළිබඳ වැඩමුළුවට ආචාර්ය වික්‍රමසූරිය සහභාගි විය. | ආචාර්ය එන්.ටී. වික්‍රමසූරිය මෙය |
| | vii. රුහුණ විශ්වවිද්‍යාලය විසින් 2017 සැප්තැම්බර් 28 දින පවත්වනු ලැබූ ආයතනික "බුද්ධිමය දේපළ ප්‍රතිපත්තිය සහ තාක්ෂණික පැවැරුම" පිළිබඳ වැඩමුළුවට ආචාර්ය එන්.ටී. වික්‍රමසූරිය මෙය සහභාගි විය. | ආචාර්ය එන්.ටී. වික්‍රමසූරිය මෙය |
| | මට්ටම III ශිෂ්‍යයන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන -01, ගණිත අධ්‍යයනාංශය | |
| | ix. තායිවානයේ සින්චු හි ජාතික චියාඕ ටුන් විශ්වවිද්‍යාලයේ 2017ඔක්තෝබර් 30- නොවැම්බර් 11, දක්වා පැවැති "අඩු කාබන් හරිත බලශක්තිය සහ පාරිසරික තිරසාරත්වය" පිළිබඳ ජාත්‍යන්තර ඒකාබද්ධ පර්යේෂණ සහ පුහුණු වැඩසටහන | උපාධි අපේක්ෂක ඉ ැගැන්වීමේ ගුණාත්මකබව වැඩි දියුණු කිරීම සහ පර්යේෂණ වැඩි දියුණු කිරීම |
| | x. ශිෂ්‍ය උපදේශනය සහ අභිනියෝජනය පිළිබඳ කෙටි වැඩමුළුව | විද්‍යා සහ තාක්ෂණ පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් |
| | xi. උසස් පෙළ ගුරුවරුන් සඳහා රසායන විද්‍යා වැඩමුළුව | දකුණු පළාතේ උසස් පෙළ ගුරුවරුන් |
| ප්‍රජා විහිදුම්කරණ ක්‍රියාකාරකම් | i. ආචාර්ය ජී.ඩී.කේ. මහානාම මහතා අධ්‍යයනාංශ ප්‍රධානී ලෙස කටයුතු කරන ලදී. | භෞතික විද්‍යා අධ්‍යයනාංශය |
| | ii. ආචාර්ය ජී.ඩී.කේ. මහානාම මහතා විද්‍යා පීඨයේ නියෝජ්‍ය විනය පාලක ලෙස කටයුතු කරන ලදී. | විද්‍යා පීඨය |
| | iii. ආචාර්ය ජී.ඩී.කේ. මහානාම මහතා විද්‍යා පීඨ ආචාර්ය සංගමයේ ලේකම් ලෙස කටයුතු කරන ලදී. | විද්‍යා පීඨය |
| | iv. මහාචාර්ය කාන්ති යාපා මිය ධීවර සහ සමුද්‍රීය විද්‍යා සහ කළමනාකරණ පීඨවල සක්‍රීය පුරවැසි වැඩසටහන ප්‍රවර්ධනය කරන ලදී. | පීඨ දෙකේම නවක සිසුන් |
| | v. මහාචාර්ය යාපා සක්‍රීය පුරවැසි පහසුකාරක පුහුණු වැඩසටහනේ පහසුකාරකයකු ලෙස කටයුතු කරන ලදී. | සහභාගිවූවන් බංගලාදේශය, ඉන්දියාව සහ ශ්‍රී ලංකාවෙනි |
| | vi. ආචාර්ය සාරංග පෙරේරා RISTCON- 2018 සඳහා නිබන්ධන සමාලෝචකයකු ලෙස කටයුතු කළේය. | විශ්වවිද්‍යාල ආචාර්යවරුන් |

| වැඩසටහන/ ක්‍රියාකාරකම | සංඛ්‍යාව සහ/හෝ සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන් /නිමැවුම |
|---|---|---|
| | vii. ආචාර්ය සාරංග පෙරේරා 2018 ශාස්ත්‍රීය සැසි සඳහා නිබන්ධන සමාලෝචකයකු ලෙස කටයුතු කළේය. | විශ්වවිද්‍යාල ආචාර්යවරුන් |
| | viii. නව ජීව විද්‍යා විෂය මාලාව පිළිබඳ සම්මන්ත්‍රණය | ජීව විද්‍යා ගුරු භවතුන් 400ක් පමණ පුහුණු කරන ලදී. |
| | ix. 2017 ජූනි 21 දින ප.ව. 1.30 – 3.30 දක්වා මහාචාර්ය අලවත්තාගොඩ ප්‍රේමදාස ශ්‍රවණාගාරයේදී විද්‍යා පීඨ ශිෂ්‍යයන් සඳහා සුභාවිත ගී මියැසිය- ජීවිතය සඳහා සංගීතය සංගීත වැඩසටහන පවත්වන ලදී. | |
| සන්ධාන වැඩසටහන් | i. ඉන්දියාවේ ටාටා මූලික පර්යේෂණ ආයතනය හරහා CERN සංගමය සමග මහාචාර්ය ධර්මරත්න මහතා ආරම්භ කළ සබැඳි වැඩසටහන දිගමට සිදුකරනු ලැබේ. ජාතික විද්‍යා පදනම විසින් අරමුදල් සපයනු ලැබූ මෙම වැඩසටහන හරහා ආචාර්ය එන්.එම්. වික්‍රමගේ මිය CERN හි ඇයගේ පර්යේෂණය ඉදිරියට පවත්වා ගෙන යන ලදී. | භෞතික විද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය |
| | ii. භෞතික විද්‍යා අධ්‍යයනාංශයට ඇ.එ.ජනපදයේ ඉලිනොයිස් හි සිවනාදන් පර්යේෂණාගාරය සමග සන්ධාන වැටසටහනක් තිබේ. | භෞතික විද්‍යා අධ්‍යයනාංශය |
| | iii. භෞතික විද්‍යා අධ්‍යයනාංශයට එක්සත් රාජධානියේ බකිංහැම් විශ්වවිද්‍යාලය සමග සන්ධාන වැටසටහනක් තිබේ. | භෞතික විද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය |
| | iv. අකුණුසර පිළිබඳ පර්යේෂණයන් සඳහා ආචාර්ය ජේ.ඒ.පී. බෝධික මයාට ස්වීඩනයේ උප්සාලා විශ්වවිද්‍යාලය සහ කොළඹ විශ්වවිද්‍යාලය සමග සන්ධාන වැඩසටහනක් තිබේ. | ආචාර්ය ජේ.ඒ.පී. බෝධික මයා |
| | v. ඉන්දියාවේ ටාටා මූලික පර්යේෂණ ආයතනය හරහා CERN සංගමය සමග මහාචාර්ය ධර්මරත්න මහතා ආරම්භ කළ සන්ධාන වැඩසටහන දිගමට සිදුකරනු ලැබේ. ජාතික විද්‍යා අරමුදල විසින් අරමුදල් සපයනු ලැබූ මෙම වැඩසටහන හරහා ආචාර්ය එන්.එම්. වික්‍රමගේ මිය CERN හි ඇයගේ පර්යේෂණය ඉදිරියට පවත්වා ගෙන යන ලදී. | භෞතික විද්‍යා අධ්‍යයනාංශය, |
| | vi. රසායන විද්‍යා විශේෂ උපාධි වැඩසටහනේ වැඩිම ලකුණු ලැබූ සිසුන් දෙදෙනාට සිය පර්යේෂණ සිදුකිරිම සඳහා නෝර්වේහි ඇග්ඩර් විශ්වවිද්‍යාලයට පූර්ණ මූල්‍ය අනුග්‍රහය සහිත ශිෂ්‍යත්ව හිමි වූුණි. | රසායන විද්‍යා විශේෂ උපාධි වැඩසටහනේ සිසුන් |
| | vii. ජපානයේ කනගාවා විශ්වවිද්‍යාලය සමග ආචාර්යවරුන් හුවමාරු කර ගැනීමේ වැඩසටහන | රසායන විද්‍යා විශේෂ උපාධි වැඩසටහනේ සිසුන් සහ පීඨය, විශ්වවිද්‍යාලය |

## ප්‍රකාශන හා දැනුම ප්‍රචාරණය

| කාණ්ඩය | අංකය |
|---|---|
| උපුටා දැක්වීමේ සුචියේ ඇතුළත් ජාත්‍යන්තර සඟරාවල සම්පූර්ණ පත්‍රිකා හෝ කෙටි සන්නිවේදන | 183 |
| උපුටා දැක්වීමේ සුචියේ ඇතුළත් නොවූ ජාත්‍යන්තර සඟරාවල සම්පූර්ණ පත්‍රිකා හෝ කෙටි සන්නිවේදන | 6 |
| දේශීය සඟරාවල සම්පූර්ණ පත්‍රිකා හෝ කෙටි සන්නිවේදන | 3 |
| මුද්‍රිත වාර්තාවල ඇතුළත් සම්පූර්ණ පත්‍රිකා | 5 |
| වාචික ඉදිරිපත්කිරීම්වල සංක්ෂේප | 50 |
| පෝස්ටර් ඉදිරිපත්කිරීම්වල සංක්ෂේප | 12 |
| පොත් | - |
| පොත්වල පරිච්ඡේද | - |
| වෙනත් සඟරාවල ශාස්ත්‍රීය ලිපි (සඟරා, ජාතික පුවත්පත් ආදිය.) | 3 |
| සංස්කරණ කාර්යය | 07<br>01- අන්තර්ජාතික<br>02- ජාතික |

## තාක්ෂණ පීඨය

### පීඨාධිපතිගේ ප්‍රකාශය/ සමාලෝචනය

නව ගොඩනැගිලි, විද්‍යාගාර ගොඩනැගිල්ල සහ නේවාසිකාගාර දෙක ඉදිකිරීම කරාගොඩ, උයන්ගොඩ සහ කඹුරුපිටියේදී වසර පුරා දිගමට සිදුකරන ලදී. එක් නේවාසිකාගාරයක් සම්පූර්ණ කොට විශ්වවිද්‍යාලය වෙත බාර දුන් අතර අනෙත් නේවාසිකාගාරය 2017 දෙසැම්බර් 28 දින බාර දෙනු ඇති බවට අපේක්ෂා කෙරේ. 2016 වසරේදී ආරම්භ කරනු ලැබූ පුනරුත්ථාපන වැඩ බොහෝමයක් නිමා කොට ඇති අතර 2017 වසරේදී ආරම්භ කරනු ලැබූ ඇතැම් පුනරුත්ථාපන වැඩ සිදු කරමින් පවතී. ජෛවපද්ධති තාක්ෂණවේද අධ්‍යයනාංශය සඳහා හරිතාගාර තුනක් ප්‍රතිසංස්කරණය කරන ලදී. විද්‍යාගාර ගොඩනැගිල්ලේ පළමු අදියර 2018 වසරේ පළමු කාර්තුව තුළ සම්පූර්ණ කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. විද්‍යාගාර ගොඩනැගිල්ලේ පළමු අදියර විශ්වවිද්‍යාලයට බාර දීමෙන් අනතුරුව නව පරිශ්‍රය තුළ පීඨය ස්ථාපිත කරනු ඇත.

ඉංජිනේරු තාක්ෂණවේද උපාධිය සඳහා 86 ක් සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණ උපාධිය සඳහා 50 ක් ලෙස 136 දෙනෙකුගෙන් සමන්විත පළමු ශිෂ්‍ය කණ්ඩායම 2017 ජනවාරි 02 වැනි දින ඇතුළත් කර ගන්නා ලදී. පීඨාධිපති කාර්යාල සංකීර්ණයේ, පරිගණක විද්‍යා අධ්‍යයනාංශයේ සහ භෞතික විද්‍යා අධ්‍යයනාංශයේ සපයනු ලැබූ ස්ථානවල පංති පවත්වන ලදී. පළමු අධ්‍යයන වර්ෂය 2017 දෙැසැම්බර් 18 දින සම්පූර්ණ කරන ලදී. 136 දෙනෙකුගෙන් සමන්විත දෙවන ශිෂ්‍ය කණ්ඩායම 2017 දෙසැම්බර් 20 දින ඇතුළත් කරගන්නා ලදී. ජෛවපද්ධති තාක්ෂණවේද උපාධි වැඩසටහන අනුමත කරනු ලැබ ඇති අතර උසස් පෙළ අත්පොතේ අන්තර්ගත කොට ඇත. ඇතුලත් කර ගනු ලබන මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 186 දක්වා ඉහළ නංවමින් 2018 වසරේ මීලඟ ශිෂ්‍ය කණ්ඩායම සඳහා වැඩිපුර සිසුන් 50 දෙනෙකු බඳවාගනු ඇත.

මහාචාර්ය ඊ.පී.එස්. චන්දන මහතා,අරුණ ලොරෙන්සුහේවා මහතා සහ ආචාර්යකේ.ජී.එස්. හර්ෂදේව ගුණවර්ධන මහතා පිළිවෙලින් ජෛව පද්ධති තාක්ෂණ, ඉංජිනේරු තාක්ෂණ සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණ අධ්‍යයනාංශවල ප්‍රධානීන් ලෙස තව දුරටත් කටයුතු කරන ලද අතර ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ඩබ්.ජී.ඩී. ධර්මරත්න මහතා පීඨාධිපති සහ බහුශික්ෂා අධ්‍යයනාංශයේ වැඩබලන ප්‍රධානී ලෙස තව දුරටත් සේවය කරන ලදී. මහාචාර්ය ඊ.පී.එස්. චන්දන, අරුණ ලොරෙන්සුහේවා සහ මහාචාර්ය ඩබ්.ජී.ඩී. ධර්මරත්න යන මහතුන් විද්‍යා පීඨයේ සිය සාමාන්‍ය ඉගැන්වීම් රාජකාරිවලට අමතරව තාක්ෂණවේද පීඨය සංවර්ධනය කිරීම පිණිස තම සේවාව ලබා දෙන ලදී. ඉංජිනේරු තාක්ෂණ අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් තිදෙනෙකු සහ එක් පරිවාසික කථිකාචාර්යවරයකු සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණ අධ්‍යයනාංශයේ එක් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු සහ එක් පරිවාසික කථිකාචාර්යවරුන් දෙදෙනෙකු 2016 දී පත්කරනු ලැබීය. පළමු ශිෂ්‍ය කණ්ඩායම සඳහා අනුමත කරනු ලැබූ ඉතිරි තනතුරු, 2017 වසරේ මුල් භාගයේදී, එක් එක් අධ්‍යයනාංශය සඳහා පරිවාසික කථිකාචාර්යවරුන් තිදෙනෙකු පත්කිරීම මගින් පුරවන ලදී. දෙවන කණ්ඩායම සඳහා අනුමත වූ තනතුරු සංඛ්‍යා අතුරින් ජෛවපද්ධති තාක්ෂණවේද අධ්‍යයනාංශය සඳහා ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් තිදෙනෙකු සහ ඉංජිනේරු තාක්ෂණවේද සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණ අධ්‍යයනාංශ සඳහා පරිවාසික කථිකාචාර්යවරුන් දෙදෙනෙකු බැගින් හතර දෙනෙකු ද තෝරා ගෙන පත්වීම් ලිපි නිකුත් කරන ලදී. අනධ්‍යයන සේවක සංඛ්‍යා තනතුරු සඳහා කාර්මික නිලධාරීන් දෙදෙනෙකු, එක් විද්‍යාගාර සහායකයකු සහ කම්කරුවන් තිදෙනෙකු පත්කරන ලදී. එක් පරිවාසික කථිකාචාර්යවරයකු වූ ගයනි සී. පතිරාජ මිය ඇ.එ.ජනපදයේ ඇයගේ පශ්චාත් උපාධි අධ්‍යයන සඳහා අධ්‍යයන නිවාඩු ලබාගන්නා ලදී.

පළමු වසර පන්ති සඳහා සහ දෙවන වර්ෂ වර්ෂාර්ධයේ පන්ති සඳහා අවශ්‍ය සියලු විද්‍යාගාර උපකරණ, ගෘහ භාණ්ඩ, පරිගණක, කාර්යාල, පුස්තකාල පොත් මිලදී ගන්නා ලදී. ඉංජිනේරු තාක්ෂණවේද ශිල්ප ශාලාව සඳහා අවශ්‍යකරනු ලබන යන්ත්‍ර බොහෝමයක් ඇණවුම් කර ඇත.

පළමු අධ්‍යයන වසර ඉතා සාර්ථකව නිමා කරන ලදී. විශ්වවිද්‍යාල වෘත්තීය මාර්ගෝපදේශ මධ්‍යස්ථානය යටතේ පුබුදු මල්ලවආරච්චි මිය විසින් අතිරේක වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් කිහිපයක් සංවිධානය කරන ලදී. විද්‍යා පීඨයේ නව නිපැයුම් සහ නව්‍යකරණ තරඟය සහ ප්‍රදර්ශනයට සමගාමීව තාක්ෂණ පීඨයේ කාර්ය මණ්ඩලය සහ ශිෂ්‍යයන් කණ්ඩායමක් විසින් ප්‍රදර්ශනයක් සංවිධානය කරනු ලැබීය. පීඨයේ ශිෂ්‍යයන් නැටුම් සහ සාහිත්‍ය

තරඟවලට සහභාගි විය. නිදහස් ආර නැටුම් තරඟ යටතේ තරඟ කළ කණ්ඩායම  දෙවන ස්ථානය දිනාගත් අතර නිසැඳැස් කාණ්ඩය යටතේ පීඨයේ ශිෂ්‍යයෙකු දෙවන ස්ථානය දිනා ගන්නා ලදී

විෂය නිර්දේශය පිළිබඳව ප්‍රතිපෝෂණය ලබා ගැනීමේ සහ කර්මාන්ත සහ විශ්වවිද්‍යාලය අතර හවුල්කාරිත්වය ගොඩ නැගීමේ අරමුණින් තාක්ෂණවේද උපාධි වැඩසටහන්වල විෂයමාලා ඉදිරිපත් කිරීම පිණිස රුහුණ විශ්වවිද්‍යාලයේ තාක්ෂණවේද පීඨය ප්‍රමුඛ පෙළේ කර්මාන්ත නියෝජිතයන් සමග ඉතා සාර්ථක රැස්වීමක් සංවිධානය කරන ලදී. ශිෂ්‍ය-කාර්ය මණ්ඩල සබඳතාව සහ ශිෂ්‍යයන් අතර සමගිය ඉහළ නැංවීමේ අරමුණින් තාක්ෂණවේද පීඨයේ කාර්ය මණ්ඩල සාමාජිකයන් සහ ශිෂ්‍යයන් පීඨ දින උත්සවයක් සංවිධානය කරන ලදී.

## කාර්යමණ්ඩල සහභාගිත්වය සහ සාධන

| වැඩසටහන/ ක්‍රියාකාරකම | සංඛ්‍යාව සහ/හෝ කෙටි විස්තර | ප්‍රතිලාභීන්/නිමැවුම |
|---|---|---|
| අළුතින් හඳුන්වා දුන් උපාධි අපේක්ෂක උපාධි වැඩසටහන් | i. ඉංජිනේරු තාක්ෂණ උපාධිය | i. 2017 දී සිසුන් 86 දෙනෙකු ඇතුලත් කරගනු ලැබ ඇත |
| | ii. තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ උපාධිය | ii. 2017 දී සිසුන් 50දෙනෙකු ඇතුලත් කරගනු ලැබ ඇත |
| | iii මහාචාර්ය ඊ.පී.එස්. චන්දන මහතාගේ නායකත්වයෙන් සකස්කරන ලද ජෛවපද්ධති තාක්ෂණවේද උපාධිය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී. | iii 2018 වසරේදී ශිෂ්‍යයන් 50ක් ඇතුළත් කර ගැනීමට නියමිතය |
| අළුතින් හඳුන්වා දුන් පාඨමාලා (පාඨමාලා ඒකක) | ජෛවපද්ධති තාක්ෂණවේද උපාධියේ සියලු පාඨමාලා ඒකක | i. සිසුන් 50 දෙනෙකු |
| දුරස්ථ අධ්‍යාපන වැඩසටහන් හෝ ව්‍යාප්ති පාඨමාලා | i. ඊ.ඒ.ඩී. කුමාර මහතා පහත දැක්වෙන වැඩසටහන් සම්පූර්ණ කරන ලදී.<br>(අ) කැනඩාවේ ක්වාන්සාර් ආයතනය විසින් පවත්වනු ලැබූ 6 D.O.F.රොබෝ බාහුව සහ මෘදුකාංග පැකේජය පිළිබඳ පුහුණු වැඩසටහන සාර්ථකව නිමා කරන ලදී.<br>(ආ) NDT ඉන්ස්ට්‍රමන්ට් පුද්ගලික ආයතනය විසින් පවත්වනු ලැබූ අවිනාශී පරීක්ෂණ ක්‍රමවේද පිළිබඳ වැඩමුළුව සාර්ථකව නිමා කරන ලදී<br>(ඇ) මැට්රික්ස් (පුද්) සමාගම විසින් පවත්වනු ලැබූ සම්පීඩිත වායු ජනනය සහ බෙදාහැරීම පිළිබඳ දැනුවත්කිරීමේ වැඩසටහනට සහභාගි විය.<br>(ඈ) ඔරෙල් කෝපරේෂන් (පුද්) සමාගම එන් අයි ඉන්දියා සහ ක්වාන්සර් කැනඩා සමග සහයෝගිතාවයෙන් පවත්වනු ලැබූ ඉංජිනේරු අධ්‍යාපන සහ පර්යේෂණ සම්මන්ත්‍රණයට සහභාගි විය | රොබෝ බාහුව පිළිබඳ දැනුම ලබා ගන්නා ලදී.<br><br>අවිනාශී ශිල්පීය ක්‍රම පිළිබඳ දැනුම<br>සම්පීඩිත වායු ජනනය සහ බෙදාහැරීම පිළිබඳ දැනුම යාවත්කාලීන කරන ලදී.<br>ඉංජිනේරු අධ්‍යාපනයේ වැදගත් ක්ෂෙත්‍ර හඳුනාගන්නා ලදී. |
| ප්‍රජා සේවා | i. නව නිපැයුම් සහ නව්‍යකරණ ප්‍රදර්ශනයට සමගාමීව ඉංජිනේරු තාක්ෂණවේද අධ්‍යයනාංශය ප්‍රදර්ශනයක් පවත්වන ලදී. | පාසල් ශිෂ්‍යයන් සහ ප්‍රදර්ශනය නැරඹුවන් |
| | ii. ආචාර්ය සංජය තිලකරත්න මහතා<br>(අ) පීඨයේ නියෝජ්‍ය ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය උපදේශක<br>(ආ) අධ්‍යනාංශය සඳහා ශිෂ්‍ය මාර්ගෝපදේශක | තාක්ෂණවේද පීඨයේ ශිෂ්‍යයන්<br>ඉංජිනේරු තාක්ෂණවේද අධ්‍යයනාංශයේ ශිෂ්‍යයන් |

| වැඩසටහන/ ක්‍රියාකාරකම | සංඛ්‍යාව සහ/හෝ කෙටි විස්තර | ප්‍රතිලාභීන්/නිමැවුම |
|---|---|---|
| විෂය නිර්දේශ සංවර්ධනය (පාඨමාලා ඒකක/ විෂය වැඩි දියුණු කිරීම) | i. ජෛවපද්ධති තාක්ෂණවේද උපාධිය<br>ii. ඉහත උපාධි සඳහා සියලු පාඨමාලා ඒකක | ඊළඟ කණ්ඩායමට සිසුන් 50 දෙනෙකු ඇතුලත් කරගනු ඇත. |
| කාර්ය මණ්ඩල සංවර්ධන වැඩසටහන් | i. CCPDHE වැඩසටහන සඳහා කථිකාචාර්යවරුන් කිහිප දෙනෙකු සහභාගි විය<br>ආචාර්ය බී.එල්.එස්. තිලකරත්න මහතා<br>ජී.සී. පතිරාජ මෙය<br>එම්.ඒ.එන්.ඩී. සෙව්වන්දි මිය<br>යූ.එච්.වරුණි හේවගේ මිය | සහභාගිවූ කථිකාචාර්යවරුන් |
| ජාතික සංවර්ධනය සඳහා දායකත්වය | i. ආචාර්ය බී.එල්.එස්. තිලකරත්න මහතා විනිශ්චය මණ්ඩල සාමාජික - "සහසක් නිමැවුම් -2017" ජාතික නව නිපැයුම් සහ නවෝත්පාදන ප්‍රදර්ශනයේ නව නිපැයුම් ඇගයීමේ විනිශ්චය මණ්ඩල සාමාජිකයකු ලෙස කටයුතු කළ අතර ජනාධිපත් සම්මාන තේරීමේ කමිටුව ද නියෝජනය කළේය. | ශ්‍රී ලංකාවේ නව නිපැයුම් |
| | ii. අනුර ලොරෙන්සුහේවා මහතා- විද්‍යා පීඨයේ පරිගණක විද්‍යා අධ්‍යයනාංශයේ රාජකාරී වලට අමතරව තොරතුරු සන්නිවේදන තාක්ෂණ අධ්‍යයනාංශයේ ප්‍රධානියා ලෙස කටයුතු කරන ලදී. | විශ්වවිද්‍යාලය සහ තාක්ෂණ පීඨය |
| | iii. මහාචාර්ය ඊ.පී.එස්. චන්දන මහතා විද්‍යා පීඨයේ සත්ත්ව විද්‍යා අධ්‍යයනාංශයේ රාජකාරී වලට අමතරව ජෛව පද්ධති තාක්ෂණවේද අධ්‍යයනාංශයේ ප්‍රධානියා ලෙස කටයුතු කරන ලදී. | විශ්වවිද්‍යාලය සහ තාක්ෂණ පීඨය |
| | iv. මහාචාර්ය ඩබ්.ජී.ඩී.ධර්මරත්න මහතා -<br>(අ) විද්‍යා පීඨයේ භෞතික විද්‍යා අධ්‍යයනාංශයේ රාජකාරී වලට අමතරව පීඨයේ පීඨාධිපති ලෙස කටයුතු කරන ලදී.<br>(ආ) ජාතික විද්‍යා පදනමේ මූලික විද්‍යා ක්‍රියාකාරී කමිටුවේ සභාපති ලෙස කටයුතු කරන ලදී.<br>(ඇ) ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ 'මූලික විද්‍යා පර්යේෂණ ප්‍රතිපත්තිය' සඳහා වූ විද්වත් කමිටුවේ සාමාජිකයකු ලෙස සේවය කරන ලදී.<br>(ඈ) උසස් පෙළ විභාගයේ ප්‍රශ්න පත්‍ර සකස් කරන්නකු සහ සම-පාලකවරයකු ලෙස කටයුතු කරන ලදී.<br>(ඉ) ශ්‍රී ලංකා භෞතික විද්‍යා ආයතනයේ භෞතික විද්‍යා සඟරාවේ සංස්කරණ මණ්ඩලයේ සේවය කරන ලදී.<br>(ඊ) රුහුණු විද්‍යා සඟරාවේ ප්‍රධාන කතෘ ලෙස සේවය කරන ලදී. | විශ්වවිද්‍යාලය සහ තාක්ෂණ පීඨය |

| වැඩසටහන/ ක්‍රියාකාරකම | සංඛ්‍යාව සහ/හෝ කෙටි විස්තර | ප්‍රතිලාභීන්/නිමැවුම |
|---|---|---|
| | (උ) තේරීම් මණ්ඩලවල වි.වි.ප්‍ර.කො. සභාවේ නියෝජිතයකු ලෙස මෙන්ම විශ්වවිද්‍යාල කිහිපයක මහාචාර්ය තනතුර සඳම බාහිර ඇගයුම්කරුවක් ලෙස කටයුතු කරන ලදී.<br>(ඌ) ජාතික මූලික අධ්‍යයන ආයතනයේ වාර්ෂික පර්යේෂණ ප්‍රගතිය ඇගයීමට ලක් කරන ලදී. | |
| ජාත්‍යන්තර මට්ටමේ දායකත්වය | i. මහාචාර්ය ඩබ්.ජී.ඩී.ධර්මරත්න මහතා<br>(අ) විද්‍යා, තාක්ෂණ සහ පර්යේසණ අමාත්‍යවරයා සහ ස්විට්සර්ලන්තයේ තානාපති සමග න්‍යෂ්ඨික පර්යේෂණ පිළිබඳ යුරෝපීය සංවිධානය වෙත භෞතික විද්‍යාඥයන් පිරිසක් සිදුකළ සංචාරයේ නායකත්වය මහාචාර්ය ධර්මරත්න මහතා දරන ලදී.<br><br>(ආ) දකුණු ආසියානු අධිශක්ති භෞතික විද්‍යා ආයතනය වෙත භෞතික විද්‍යාඥයන් පිරිසක් සිදුකළ සංචාරයේ නායකත්වය මහාචාර්ය ධර්මරත්න මහතා දරන ලදී. (SAHEPI-2017) අනාවරක තාක්ෂණයේ සහ එහි භාවිතයන් පිළිබඳ වැඩමුළුව- කත්මන්ඩු විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා HEPපිළිබඳ තත්ත්ව වාර්තාව ඉදිරිපත් කරන ලදී.<br><br>(ඇ) මහාචාර්ය ධර්මරත්න මහතා - ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල සමූහයක් සඳහා CMS සාමාජිකත්වය ලබා ගැනීම පිණිස අයදුම්පත්‍රයක් ඉදිරිපත් කරන ලදී, සහයෝගිතා මණ්ඩලය - CMS. දෙසැම්බර් මාසයේ පැවැති ඊළඟ රැස්වීමේදී CMS ඒ සඳහා ඉහළින්ම ඡන්දය ප්‍රකාශ කර ශ්‍රී ලංකාවට පූර්ණ සමාජිකත්වය ප්‍රදානය කරන ලදී. න්‍යෂ්ඨික පර්යේෂණ පිළිබඳ යුරෝපා සංවිධානයේ තෙමස් පර්යේෂණ ක්‍රියාකාරකමක් සඳහා අධ්‍යයනාංශය අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයකු යවන ලදී. | ශ්‍රී ලංකාවේ භෞතික විද්‍යාඥයන් සහ පශ්චාත් උපාධි ශිෂ්‍යයන් |
| කමිටු සහ ඒවාට සම්බන්ධ සාමාජිකයන් සංඛ්‍යාව | i. ආචාර්ය පී.කේ.එස්.සී. ජයසිංහ මහතා පහත දැක්වෙන කමිටුවල සේවය කරන ලදී.<br>(අ) සංස්කරණ මණ්ඩලය: රුහුණ විශ්වවිද්‍යාල සඟරාව<br>(ආ) පීඨ පර්යේෂණ කමිටුව<br>(ඇ) විශ්වවිද්‍යාල ශාස්ත්‍රීය සැසි -2018, සංවිධාන කමිටු සාමාජික<br>(ඈ) ක්‍රීඩා උපදේශක කමිටුව<br>(ඉ) පීඨයේ නියෝජ්‍ය විනය පාලක ලෙස කටයුතු කරන ලදී. | විශ්වවිද්‍යාලය, පීඨය, කාර්ය මණ්ඩලය සහ සිසුන් |

| වැඩසටහන/ ක්‍රියාකාරකම | සංඛ්‍යාව සහ/හෝ කෙටි විස්තර | ප්‍රතිලාභීන්/නිමැවුම |
|---|---|---|
| | ii. ඊ.ඒ.ඩී.කුමාර මහතා පහත දැක්වෙන කමිටුවල සේවය කරන ලදී.<br>(අ) රුහුණ විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨයේ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකයේ අධ්‍යයන වෘත්තීය මාර්ගෝපදේශන උපදේශක<br>(ආ) රුහුණ විශ්වවිද්‍යාල විද්‍යා ආචාර්යවරුන්ගේ සංගමයේ කමිටු සාමාජික | තාක්ෂණ පීඨ සිසුන්<br>සමිති ක්‍රියාකාරීන් |
| | iii. එම්.ඒ.එන්.ඩී. සෙව්වන්දි මිය තාක්ෂණ පීඨයේ ශිෂ්‍ය උපදේශක | |
| | iv. ආචාර්ය බී.එල්.එස්. තිලකරත්න මහතා<br>(අ) අන්තර් පීඨ නැටුම් සහ සාහිත්‍ය තරඟය - පීඨ නියෝජිත<br>(ආ) රුහුණු නව නිපැයුම් සහ නවෝත්පාදන ප්‍රදර්ශනය- පීඨ නියෝජිත<br>(ආ) තාකෂණ පීඨයේ අභ්‍යන්තර තත්ත්ව සහතිකරණ ඒකකය<br>(ඇ)උ/පෙ තාක්ෂණ විෂය ධාරා කමිටුව - පීඨ නියෝජිත | තාක්ෂණ පීඨ සිසුන්<br>විශ්වවිද්‍යාල සිසුන්<br>පාසල් සිසුන්<br>තාක්ෂණ පීඨ සිසුන්<br>පාසල් සිසුන් |
| | v. නුවන් ලක්සිරි මහතා<br>(අ) ක්‍රීඩා උපදේශක මණ්ඩල කමිටු සාමාජික<br>(ආ) ශිෂ්‍ය ඉල්ලීම් කමිටු සාමාජික | විශ්වවිද්‍යාල සිසුන්<br>පීඨ සිසුන් |
| ලැබුණු ප්‍රදාන (අරමුණ සහ මුදල)<br>-දේශීය<br>-ජාත්‍යන්තර | i. මහාචාර්ය ටී.පී.එස්.චන්ද්‍රන මහතා - ඖෂධීය ශාක පිළිබඳ පර්යේෂණයක් පැවැත්වීම පිණිස පීඨ ප්‍රදානය<br>රු. 150,000.00 | පර්යේෂණ ප්‍රතිඵල නව ඖෂධ සොයා ගැනීමට හේතු වනු ඇත |
| | ආචාර්ය කේ.ජී.එස්.හර්ෂදේව ගුණවර්ධන මහතා - මැටි උළු පිළිබඳ පර්යේෂණයක් පැවැත්වීම පිණිස පීඨ ප්‍රදානය<br>i. රු 150,0000 | පර්යේෂණ ප්‍රතිඵල සංවර්ධනය සඳහා හේතු වනු ඇත |
| | CERN ආයතනය සමග පර්යේෂණ සහයෝගිතාවක් ආරම්භ කිරීම පිණිස විද්‍යා, තාක්ෂණ සහ පර්යේෂණ අමාත්‍යාංශය වෙත මහාචාර්ය ධර්මරත්න මහතා විසින් ඉදිරිපත් කරනු ලැබූ අයවැය යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී. | භෞතික විද්‍යාඥයන් සහ පශ්චාත් උපාධි ශිෂ්‍යයන් |
| සම්මාන/පේටන්ට් බලපත්‍ර/විශේෂ කාර්ය සාධන | i. ගයනි සී. පතිරාජ මිය පහත දැක්වෙන සම්මාන දිනා ගන්නා ලදී.<br>(අ) විද්‍යාත්මක ප්‍රකාශන සඳහා ජනාධිපති සම්මාන<br>(ආ) ආචාර්ය උපාධි සහකාරත්වය - උතුරු කැරොලිනා විශ්වවිද්‍යාලය, ග්‍රීන්ස්බරෝ, ඇ.එ.ජ.<br>(ඇ) හොඳම වාචික ඉදිරිපත්කිරීම - ප්‍රධාන ඉංජිනේරු ද්‍රව්‍ය පිළිබඳ 7වැනි අන්තර්ජාතික සම්මේලනය, මැලේසියාව | (අ)පර්යේෂණ ප්‍රතිඵල පිළිගැනීම<br>(ආ) ගයනි පතිරාජ මිය, පීඨයට සහ ඉංජිනේරු තාක්ෂණ අධ්‍යයනාංශයට ප්‍රතිලාභ ලැබුණි<br>(ඇ) ඇයගේ සහ පීඨයේ පර්යේෂණ ප්‍රතිඵල පිළිගැනීම. |

| වැඩසටහන/ ක්‍රියාකාරකම | සංඛ්‍යාව සහ/හෝ කෙටි විස්තර | ප්‍රතිලාභීන්/නිමැවුම |
|---|---|---|
| | ii.මහාචාර්ය ඩබ්ලිව්.ජී.ඩී. ධර්මරත්න මහතා<br>(අ) රුහුණ නව නිපැයුම් සහ නවෝත්පාදන ප්‍රදර්ශනයේදී නව නිපුයමක් සඳහා ප්‍රථම ස්ථානය හිමිවුණි.<br><br>(ආ) සහසක් නිමැවුම් ජාතික තරඟයේදී එම නව නිපැයුම සඳහාම දෙවන ස්ථානය හිමිවුණි. (රණතුංග මහතා සහ ශිෂ්‍යයෙකු සමග) | |
| පවත්වනු ලැබූ වැඩමුළු/සම්මන්ත්‍රණ /සම්මේලන (අභ්‍යන්තර හා දේශීය) | ඊ.ඒ.ඩී. කුමාර මහතා<br><br>රුහුණ නව නිපැයුම් සහ නවෝත්පාදන ප්‍රදර්ශනය සඳහා සංවිධාන කමිටුවට සිය සේවය ලබා දෙන ලදී. | රුහුණ විශ්වවිද්‍යාලයේ සිසුන් සහ දකුණු පළාත් පාසල් සිසුන් |
| ප්‍රජා විහිදුම්කරණ ක්‍රියාකාකරකම් | ඊ.ඒ.ඩී. කුමාර මහතා<br>i.මිදිගම, ලෝඩ්ස්ටාර් (පුද්) සමාගමේ නායකත්ව වැඩසටහන<br>ii. ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය, කොග්ගල-ආහාර මේස ආචාර විධි | i. තාක්ෂණ පීඨයේ පළමු ශිෂ්‍ය කණ්ඩායම<br>ii. තාක්ෂණ පීඨයේ පළමු ශිෂ්‍ය කණ්ඩායම |

## ප්‍රකාශන හා දැනුම ප්‍රචාරණය

| කාණ්ඩය | අංකය |
|---|---|
| උපුටා දැක්වීමේ සුචියේ ඇතුළත් ජාත්‍යන්තර සඟරාවල සම්පූර්ණ පත්‍රිකා හෝ කෙටි සන්නිවේදන | 01 |
| උපුටා දැක්වීමේ සුචියේ ඇතුළත් නොවූ ජාත්‍යන්තර සඟරාවල සම්පූර්ණ පත්‍රිකා හෝ කෙටි සන්නිවේදන | |
| දේශීය සඟරාවල සම්පූර්ණ පත්‍රිකා හෝ කෙටි සන්නිවේදන | |
| මුද්‍රිත වාර්තාවල ඇතුළත් සම්පූර්ණ පත්‍රිකා | 07 |
| වාචික ඉදිරිපත්කිරීම්වල සංක්ෂේප | 04 |
| පෝස්ටර් ඉදිරිපත්කිරීම්වල සංක්ෂේප | 02 |
| පොත් | |
| පොත්වල පරිච්ඡේද | ආචාර්ය බී.එල්.එස්.තිලකරත්න මහතා<br>පොත: පාසල් බලශක්ති අධ්‍යාපන වැඩසටහන<br>පරිච්ඡේදය: නව නිපැයුම් සහ කුඩා ව්‍යාපෘති<br>සුනිත්‍ය බලශක්ති අධිකාරිය සහ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලදී. |
| වෙනත් සඟරාවල ශාස්ත්‍රීය ලිපි (සඟරා, ජාතික පුවත්පත් ආදිය.) | |
| සංස්කරණ කාර්යය | ආචාර්ය බී.එල්.එස්.තිලකරත්න මහතා<br>රෝහණ සඟරාවේ සංස්කරණ මණ්ඩලය - රුහුණ විශ්වවිද්‍යාලය |

## පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය

පශ්චාත් උපාධිඅධ්‍යයන පීඨය ශාස්ත්‍රපති උපාධි වැඩසටහන් සඳහා 2017 වසරේදී නවක ශිෂ්‍යයන් 252 ක් බඳවා ගන්නා ලදී. ඒ අනුව, මෙතෙක් සිය වැඩසටහන් සම්පූර්ණ කර නොමැති, දැනටමත් බඳවාගෙන ඇති සිසුන සමග ශාස්ත්‍රපති උපාධි වැඩසටහන් සඳහා 2017 වසරේ මුළු ශිෂ්‍ය බඳවාගැනීම් සංඛ්‍යාව 1182කි. (වගුව -01)

| **පශ්චාත් උපාධි වැඩසටහන** | **අළුතින් ඇතුළත්කර ගැනීම්** | **මුළු බඳවාගැනීම්** |
|---|---|---|
| ආර්ථික විද්‍යා ශාස්ත්‍රපති උපාධිය | 79 | 396 |
| සමාජ විද්‍යා ශාස්ත්‍රපති උපාධිය | 86 | 119 |
| සාමය හා සංවර්ධනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය | 29 | 55 |
| ව්‍යාපාරවේදී ශාස්ත්‍රපති උපාධිය/ව්‍යාපාරවේදී ආචාර්ය උපාධිය | 31 | 324 |
| භෝග නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ විද්‍යාපති උපාධිය | - | 99 |
| සිවිල් සහ පාරිසරික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය | 27 | 43 |
| සත්ත්ව විද්‍යා ශාස්ත්‍රපති උපාධිය | - | 19 |
| කෘෂි ආර්ථික විද්‍යා සහ සංවර්ධන ශාස්ත්‍රපති විභාගය | - | 06 |
| ආහාර විද්‍යා ශාස්ත්‍රපති විභාගය | - | 45 |
| කෘෂි ආර්ථික විද්‍යා සහ සම්පත් කළමනාකරණ ශාස්ත්‍රපති විභාගය | - | 32 |
| කෘෂි ව්‍යාපාර කළමනාකරණ ශාස්ත්‍රපති විභාගය | - | 29 |
| කෘෂි ව්‍යාපාර කළමනාකරණ ඩිප්ලෝමාව | - | 01 |
| භෝග ආරක්ෂණ ශාස්ත්‍රපති විභාගය | - | 14 |
| **එකතුව** | **252** | **1182** |

පර්යේෂණ උපාධි සඳහා (ශාස්ත්‍රපති/දර්ශනපති) 2017 වසරේ සනාතන සභාප අනුමත කරන ලද නව ලියාපදිංචිවීම් 29ක් වූ අතර ඒ අනුව පර්යේෂණ උපාධි වැඩසටහන් සඳහා පීඨයේ මුළු බඳවා ගැනීම් 186කි. (වගුව -02)

වගුව -02: **පර්යේෂණ උපාධි වැඩසටහන්වල ශිෂ්‍ය බඳවා ගැනීම්**

| **පශ්චාත් උපාධි වැඩසටහන** | **අළුතින් ඇතුළත්කර ගැනීම්** | **ශිෂ්‍ය බඳවාගැනීම්** |
|---|---|---|
| දර්ශනපති | 07 | 57 |
| දර්ශනවේදී | 22 | 122 |
| ශාස්ත්‍රපති (පර්යේෂණ අනුව) | - | 07 |
| එකතුව | 29 | 186 |

පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය ව්‍යාපාර කළමනාකරණ ශාස්ත්‍රපති උපාධිය සහ සංවර්ධන සැලසුම් ශාස්ත්‍රපති උපාධිය ආරම්භ කිරීම සඳහා සියලු මූලික කටයුතු සම්පූර්ණ කොට ඇත. මෙම වැඩසටහන සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමතිය ලබා ගත් අතර පළමු ශිෂ්‍ය කණ්ඩායම 2018 වසරේ ආරම්භයේදී බඳවා ගැනීමට නියමිතය. සංවර්ධන සැලසුම් ශාස්ත්‍රපති නමින් තවත් නව වැඩසටහනක් ආරම්භ කිරීම සඳහා වූ ප්‍රතිශෝධිත යෝජනාවක් වි.වි.ප්‍ර.කො.සභාව වෙත ඉදිරිපත් කරනු ලැබූ අතර මෙම වැඩසටහන ද ආරම්භ කිරීම පිණිස අනුමතිය 2018 වසරේදී ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. එසේම, අධ්‍යයන කටයුතු ඇණහිටීම සහ තම පර්යේෂණ උපාධි වැඩසටහන සම්පූර්ණ කිරීම පිණිස අපේක්ෂකයන් අභිප්‍රේරණය කිරීමේ ක්‍රමයක් ලෙස 2016 වසරේදී, ‘පශ්චාත් උපාධි අධ්‍යයනය සඳහා ප්‍රගති සමාලෝචන සැසි’ පීඨය විසින් ආරම්භ කරන ලදී. දෙවන ප්‍රගති සමාලෝචන සැසිය 2017 ඔක්තෝබර් මාසයේදී පවත්වනු ලැබීය. 2017 වසර තුළ ඉදිරිපත් කරනු ලැබූ නිබන්ධ සංඛ්‍යාවෙන් ප්‍රගති සමාලෝචන සැසිවල බලපෑම ඉතා පැහැදිළිව දැකිය හැකිය. පූර්ව වර්ෂ හා සැසඳීමේදී, ප්‍රගති සමාලෝචන සැසි ආරම්භ කිරීමෙන් පසුව වර්ෂයක් තුළ ඉදිරිපත් කරනු ලැබූ ආචාර්ය/ශාස්තපති නිබන්ධ සංඛ්‍යාව

300%කින් ඉහළ ගොස් තිබේ. (2012 සිට 2016 දක්වා පස් අවුරුදු කාලසීමාව තුළ වසරකට ඉදිරිපත් කරනු ලැබූ නිබන්ධවල සාමාන්‍යය වසරක් සඳහා 11.4 කි)

2017 වසර තුළ සමස්ත ඉපැයුම් සහ වියදම පිළිවෙලින් රු 30,393,582.00 ක් සහ රු 13,770,271.29 ක් විය. ඒ අනුව 2017.12.31 දිනට ඉතිරිව පවතින ශේෂය රු 16,623,310.71 කි. (වගුව-03) කෙසේ වෙතත්, එම ශේෂයෙන් වැඩි කොටසක් මෙතෙක් වියදම් කොට නැත.

වගුව -03 : **පශ්චාත් උපාධි පාඨමාලාවලින් ලැබූ ආදායම**

| **අංකය** | **පශ්චාත් උපාධි පාඨමාලාව** | **ආදායම** | **වියදම** | **ශේෂය** |
|---|---|---|---|---|
| 01 | දර්ශනපති හා දර්ශනවේදී | 2,818,577.00 | 2,550,000.00* | 268,577.00 |
| 02 | ව්‍යාපාර පරිපාලන ශාස්ත්‍රපති | 5,937,600.00 | 2,428,499.69 | 3,509,100.31 |
| 03 | ආර්ථික විද්‍යා ශාස්ත්‍රපති | 7,548,165.00 | 4,152,593.05 | 3,395,571.95 |
| 04 | සිවිල් සහ පාරිසරික විද්‍යාපති | 5,708,550.00 | 74,250.00 | 5,634,300.00 |
| 05 | සමාජවිද්‍යා ශාස්ත්‍රපති | 2,504,440.00 | 1,920,444.45 | 583,995.55 |
| 06 | භෝග නිෂ්පාදන විද්‍යාපති | 618,000.00 | 458,748.82 | 159,251.18 |
| 08 | සාමය සහ සංවර්ධන අධ්‍යයන ශාස්ත්‍රපති | 5,258,250.00 | 2,185,735.28 | 3,072,514.72 |
| 09 | **එකතුව** | **30,393,582.00** | **13,770,271.29** | **16,623,310.71** |

# කොටස VI – විශ්වවිද්‍යාලයේ විශේෂ සිදුවීම්

## 01. අධ්‍යයන සැසි සහ උපකුලපති ප්‍රදාන

රුහුණ විශ්වවිද්‍යාලයේ වාර්ෂික ශාස්ත්‍රීය සැසි පර්යේෂණ ප්‍රජාවේ පර්යේෂණ අනාවරණ ඉස්මතු කිරීම පිණිස වන මහඟු වේදිකාවකි. ශාස්ත්‍රීය සැසිවලට සමගාමීව, විශ්වවිද්‍යාලයේ සුවිශේෂී දස්කම් දැක්වූ ආචාර්යවරුන් සහ ශිෂ්‍යයන්ට උපහාර සහ ගෞරව පිණිස සහ විශ්වවිද්‍යාලය උප කුලපති සම්මාන ප්‍රදානෝත්සවය පවත්වයි.

රුහුණ විශ්වවිද්‍යාලයේ 14 වැනි ශාස්ත්‍රීය සැසිය හා උපකුලපතිගේ 13 වැනි සම්මාන ප්‍රදානෝත්සවය 'පර්යේෂණ මගින් නවෝත්පාදන ප්‍රවර්ධනය' යන තේමාව යටතේ ඉංජිනේරු පීඨයේදී 2017 මාර්තු 01 වැනි දින ඉතා සාර්ථකව පවත්වනු ලැබීය. සම්මාන ප්‍රදානෝත්සවය ,සහ තාක්ෂණික සැසි ඉංජිනේරු පීඨය විසින් සංවිධානය කරනු ලැබූ අතර එහිදී සභාපති ලෙස ආචාර්ය තුෂාරා වන්නිආරච්චි මහත්මියත් ලේකම් ලෙස ආචාර්ය රුවන් අප්පුහාමි මහතාත් කටයුතු කරන ලදී. උත්සවයේ ප්‍රධාන අමුත්තා වූයේ උප කුලපති, ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ගාමිණී සේනානායක මහතා වන අතර නියෝජ්‍ය උප කුලපති, සියලු අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් සහ අනෙකුත් සම්භාවණීය අමුත්තන් මේ සඳහා සහභාගි විය.

එහිදී, "අතීත ශ්‍රී ලංකාවේ නවෝත්පාදන සහ තිරසර සංවර්ධනය" මැයෙන් ප්‍රධාන දේශනාව පවත්වනු ලැබූයේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සිවිල් ඉංජිනේරු අධ්‍යයනාංශයේ සම්මාන මහාචාර්ය මුනිදාස පී රණවීර මැතිඳුන්ය. 14 වැනි ශාස්ත්‍රීය සැසියේ අභිදේශනය පවත්වනු ලැබූයේ වෛද්‍ය පීඨයේ ජෛවරසායන අධ්‍යයනාංශයේ ආචාර්ය මයුරී තරංගා නාපාගොඩ මහත්මියයි. එම දේශනයේ මාතෘකාව වූයේ ශ්‍රී ලංකාවේ ඖෂධීය පැලෑටි: මානවවංශ උද්භිද විද්‍යා, ශාක රසායන විද්‍යා සහ භිෂග්වේද විමර්ශන" යන්නයි.

**සම්මාන මහාචාර්ය ධූරය ප්‍රදානය**

01. ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ටි.ආර්.වීරසූරිය මහතා, වෛද්‍ය පීඨය
02. ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එම්.ආර් මොහිදීන් මහතා, වෛද්‍ය පීඨය

**13 වැනි උපකුලපති සම්මානලාභියෝ**

01. විශිෂ්ඨතම විද්වතා
    මහාචාර්ය ඩී.ඒ.එල්. ලීලමනි මිය ,පාංශු විද්‍යා අධ්‍යයනාංශය ,කෘෂිකර්ම පීඨය
02. විශිෂ්ඨතම තරුණ පර්යේෂක
    ආචාර්ය ඒ.පී. අත්තනායක මිය ,ජෛවරසායන අධ්‍යයනාංශය ,වෛද්‍ය පීඨය
03. විශිෂ්ඨතම කාර්ය මණ්ඩල නව නිපැයුම්කරු නවෝත්පාදක
    ඉල්ලුම්කරුවකු නොමැත
04. විශිෂ්ඨතම ශිෂ්‍ය නව නිපැයුම්කරු /නවෝත්පාදක
    එල්.ඩබ්.සී. පරාක්‍රම මයා SC/2013/8777**,** විද්‍යා පීඨය
05. වැඩිම ප්‍රදානලාභී
    මහාචාර්ය ඩී.ඒ.එල්. ලීලමනි මිය ,පාංශු විද්‍යා අධ්‍යයනාංශය ,කෘෂිකර්ම පීඨය
06. විශිෂ්ඨතම ජාත්‍යන්තර සම්මේලන කැඳවුම්කරු /ජාත්‍යන්තර සබඳතා ප්‍රවර්ධක
    ඉල්ලුම්කරුවකු නොමැත

## 02. ප්‍රදර්ශන

- රුහුණු නව නිපැයුම් සහ නවෝත්පාදන ප්‍රදර්ශනය, 'RIIE 2017', 2017 මැයි 17 සහ 18 යන දෙදින තුළ රුහුණ විශ්වවිද්‍යාල පරිශ්‍රයෙහි පවත්වන ලදී. ප්‍රදර්ශනයේ මුඛ්‍ය අරමුණ වූයේ නව මානයකින් සිතීමට තරුණ පරපුර දිරිමත් කිරීම සහ ඔවුන්ගේ නිර්මාණාත්මක සහ නවෝත්පාදක කුසලතා ඉහළ නැංවීමයි.

## 03. කළා උළෙල

- මූලිකවම විද්‍යා පීඨයේ පළමු වසරේ සිසුන් ඉලක්ක කර ගනිමින්'සුභාවිත ගී මියැසිය-2017' වසරේදී 9 වැනි වරටත් 2017 ජූනි 21 දින මහාචාර්ය අලවත්තාගොඩ ප්‍රේමදාස ශ්‍රවණාගාරයේදී පැවැත්වූයේ 'ජීවිතය සඳහා සංගීතය' යන තේමාව යටතේය.
- වසර දෙකකට වරක් ඉංජිනේරු පීඨය සංවිධානය කරනු ලබන විශාලතම සෞන්දර්යාත්මක වැඩසටහන වන්නේ තඹරවිල ප්‍රසංගයයි. එය නාට්‍ය, සංගීත, නැටුම් ඇතුළුව නිර්මාණාත්මක අංග රැසකින් සමන්විත වේ. අධ්‍යයන ජීවිතයෙන් පරිබාහිරව, තම හැකියා සහ කුසලතා ප්‍රදර්ශනය කිරීමට සිසුන්ට මෙහිදී අවස්ථාව හිමි විය. දිවයිනේ ප්‍රකට කලාකරුවන් ගණනාවකට මෙම ප්‍රසංගය සඳහා ආරාධනා කරනු ලැබිණ.

## 04. අනෙකුත් උත්සව

- සම්ප්‍රදායික ක්‍රීඩා රැසක් සමගින් සෑම වසරකම සිංහල හා දෙමළ අළුත් අවුරුද්ද සමරනු ලැබේ. විවිධ අංග සඳහා සහභාගිවෙමින් සිසුන් ඉන් විනෝදයට පත්වන අතර අනෙකුත් අය ඒවා නැරඹීමෙන් වින්දනයක් ලබයි.
- ධීවර සහ සාමුද්‍රීය විද්‍යා සහ තාක්ෂණ පීඨයේ වාර්ෂික තයිපොංගල් සැමරුම 2017 ජනවාරි 14 වනදා පීඨ පරිශ්‍රයේදී පවත්වන ලදී.
- මෙම වසරේ වෙසක් උත්සවයට සමගාමීව ධීවර සහ සාමුද්‍රීය විද්‍යා සහ තාක්ෂණ පීඨයේ ශිෂ්‍යයන් විසින් ධර්ම දේශනා වැඩසටහනක් සංවිධානය කරනු ලැබූ අතර එය 2017 මැයි 05 වැනි දින පීඨ පරිශ්‍රයේදී පවත්වන ලදී.
- සිවිල් සහ පාරිසරික ඉංජිනේරු භාවිතාවන්ගේ ප්‍රගමන පිළිබඳ 5වැනි ජාත්‍යන්තර සම්මේලනය (ACEPS-2017) දේශීය සහ විදේශීය නියෝජිතයන් 2000කට වැඩි පිරිසකගේ සහභාගිත්වයෙන් 2017 මාර්තු 16 වැනි දින පීඨ පරිශ්‍රයේදී ඉතා සාර්ථකව පවත්වන ලදී.
- ඉංජිනේරු පීඨයේ සිවිල් සහ පාරිසරික ඉංජිනේරු සමිතිය සහ සිවිල් සහ පාරිසරික ඉංජිනේරු අධ්‍යනාංශය විසින් ඒකාබද්ධව සංවිධානය කරනු ලැබූ 'සිවිල් ඉංජිනේරු විද්‍යාවේ මෑතකාලීන ප්‍රගමන' පිළිබඳ 6වැනි උපාධි අපේක්ෂක පර්යේෂණ සමුළුව 2017 ජනවාරි 06 දින පීඨයේදී සාර්ථකව පවත්වන ලදී.
- විද්‍යා පීඨය විසින් සංවිධානය කරනු ලැබූ 4වැනි රුහුණ ජාත්‍යන්තර විද්‍යා සහ තාක්ෂණ සමුළුව 'RISTCON 2017' 2017 ජනවාරි 26 වන දින මහාචාර්ය අලවත්තාගොඩප්‍රේමදාස ශ්‍රවණාගාරයේදී සාර්ථකව පවත්වන ලදී.
- කළමනාකරණ හා මූල්‍ය පීඨය දකුණු පළාත් සංවර්ධණ අධිකාරිය සමග 2017 මාර්තු 13 සහ 14 යන දිනයන්හි විශ්වවිද්‍යාල ගෘහස්ථ ක්‍රීඩාගාරයේ '2017 ව්‍යාපාරික සායනය' පවත්වනු ලැබූ අතර එය අතිශයින් සාර්ථක විය.

# කොටස VII - පුස්තකාලය

රුහුණු විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පුස්තකාලය වැල්ලමඩම පරිශ්‍රයේ පිහිටා ඇත. කෘෂි විද්‍යා, වෛද්‍ය, ඉංජිනේරු පුස්තකාල හා හෙද ශිෂ්‍යයන් සඳහා සම සෞඛ්‍ය විද්‍යා පීඨ පුස්තකාලය සහ සම සෞඛ්‍ය විද්‍යා ඔසුසල වෛද්‍ය රසායනාගාර විද්‍යා ශිෂ්‍යයන්ගේ පුස්තකාලය පිළිවෙලින් මාපලාන, කරාපිටිය, හපුගල, මහමෝදර හා උළුවිටකේ පිහිටා තිබේ.

නීති සුරක්ෂිතාගාර එකතුව හැර පුස්තකාලයේ ආසන්න වශයෙන් ප්‍රකාශන 215,000 ක් හා සඟරා ශීර්ෂ 300 ක එකතුවක් තිබේ. අළුතින් ස්ථාපනය කරනු ලැබූ නීති සුරක්ෂිතාගාර එකතුවෙහි ඇති ප්‍රකාශන සංඛ්‍යාව 175,000 කට ආසන්නය. මෙම සම්පත් මුද්‍රිත හා ඉලෙක්ට්‍රොනික යන දෙයාකාර මාධ්‍යයෙන් පවතී. 2017 වාර්ෂික සංසරණ සංඛ්‍යාලේඛන වාර්තාවන්ට අනුව, පුස්තකාල සම්පත් වාර්ෂික සංසරණය 66,000 ඉක්මවා තිබේ. අධ්‍යයන පුස්තකාලයක් ලෙස විමර්ශන සේවා, බැහැර දීමේ සේවා, අන්තර් පුස්තකාල හුවමාරු සේවා, කාලීන දැනුවත් කිරීමේ සේවා ආදිය පුස්තකාලය සපයයි.

අළුතින් බැඳෙන ශිෂ්‍යයන්ගේ දැනුවත්බව ඉහළ නැංවීම පිණිස ඔවුන් සඳහා පරිශීලක අධ්‍යාපන වැඩසටහනක් සෑම වසරකම පුස්තකාලය පවත්වයි. පුස්තකාලය පරිහරණය කරන්නන් සඳහා වැදගත් වන තොරතුරු පුස්තකාල වෙබ් අඩවිය සපයයි.

ඉහත දැක්වූ සේවාවන්ට අමතරව, බහුමාධ්‍යපහසුකම් සහ භාෂා ස්වයං ඉගෙනීමේ පහසුකම්ජ් සඳහා උනන්දුවක් දක්වන පාර්ශවයන්ට පුස්තකාලයේ පවතී.

| | සම සෞඛ්‍ය | කෘෂිකර්ම | වෛද්‍ය | ප්‍රධාන | ඉංජිනේරු |
|---|---|---|---|---|---|
| 1. අළුතින් ලියාපදිංචි වූ ශිෂ්‍යයන් | | | | | |
| • ශිෂ්‍යයන් | 95 | 154 | 161 | 2854 | 224 |
| • අධ්‍යයන කාර්ය මණ්ඩලය | නැත | 17 | 03 | 70 | 03 |
| • අනධ්‍යයන කාර්ය මණ්ඩලය | නැත | 04 | 04 | 35 | 1 |
| 2. විවෘතව තබන වේලාවන් | | | | | |
| • සතියේ දින | 8.00 පෙ.ව.- 6.00 ප.ව. | 8.00පෙ.ව.- 7.00 ප.ව. | 8.00පෙ.ව.- 8.00 ප.ව. | 8.00 පෙ.ව.-8.00 ප.ව. (විභාග කාල සීමාවේදී පමණි) | 8.00 පෙ.ව.- 6.00 ප.ව. |
| • සෙනසුරාදා | 8.15 පෙ.ව.- 17.15 ප.ව. | 8.00පෙ.ව.- 6.00 ප.ව. | 8.00පෙ.ව.- 6.00 ප.ව. | 8.00 පෙ.ව.-5.00 ප.ව. | 8.00 පෙ.ව.- 5.00 ප.ව. |
| • ඉරිදා | වසා ඇත | 8.00 ප.ව.-6.00 ප.ව. | 8.00 පෙ.ව.- 6.00 ප.ව. | 8.00 පෙ.ව.-5.00 ප.ව.<br>8.00 පෙ.ව.-5.00 ප.ව. | 8.00 පෙ.ව.- 5.00 ප.ව. |

| | සම සෞඛ්‍ය | කෘෂිකර්ම | වෛද්‍ය | ප්‍රධාන | ඉංජිනේරු |
|---|---|---|---|---|---|
| 3. නිකුත් කළ පොත් සංඛ්‍යාව<br>• ශිෂ්‍යයන්<br>• අධ්‍යයන කාර්ය මණ්ඩලය<br>• අනධ්‍යන කාර්ය මණ්ඩලය | 2415<br>104<br>59 | 3793<br>343<br>424 | 3288<br>796<br>531 | 45530<br>3291<br>2737 | 2608<br>255<br>539 |
| 4. දඩ<br>• කල් ඉකුත්වීම නිසා දඩ රු.<br>• නැතිවූ පුස්තකාල කාඩ්පත් සඳහා දඩ | 7121.00 | 18073.00<br>13288.27 | 37215.00 | 229408.00 | 17221.00 |
| 5 ඡායා පිටපත් සංඛ්‍යාව<br>• නිල භාවිතය<br>• ගෙවූ (පරිශීලකයන්) | ------------- | 2556 | 3407 | 5300 | 2055 |
| 6 අන්තර් පුස්තකාල හුවමාරු<br>• යැවූ<br>• ලැබුණු | නැත | -<br>01 | 02<br>02 | -<br>01 | -<br>- |
| 7 වාර සඟරා<br>• මිලදී ගත්<br>• පරිත්‍යාග | නැත | 0<br>87 | 02<br>10 | 19<br>89 | 02<br>20 |
| 8.පොත්<br>• මිලදී ගත්<br>• පරිත්‍යාග<br>• පොත්, සංයුක්ත කැටි<br>• පරිගණකගත<br>• ඉංග්‍රීසි<br>• සිංහල | 62<br>04<br>113 | 54<br>72<br>120<br>137 | 181<br>86<br>09<br>210<br>57 | 3451<br>548<br>10692<br>6350 | 61<br>596<br>342<br>342 |
| බහුමාධ්‍ය මධ්‍යස්ථානය විවෘතව තබන වේලාවන් | | නැත | 9.00 පෙ.ව.- 6.45 ප.ව. | 9.00 පෙ.ව.- 4.00 ප.ව. | නැත |

# කොටස VIII - ව්‍යාප්ති සේවා

## 01. වෛද්‍ය මධ්‍යස්ථානය

වෛද්‍ය මධ්‍යස්ථානය විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂකයන්, අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල වෙත වෛද්‍ය හා පරිපූරක වෛද්‍ය සේවා සපයන අතර විවිධ විශේෂ අවස්ථා සඳහා සෞඛ්‍යසේවා සපයයි. (උදා: උපාධි ප්‍රදානෝත්වය, විශ්වවිද්‍යාල ක්‍රීඩා තරඟ, අනෙකුත් විශේෂ අවස්ථා ආදී)

**කාර්ය මණ්ඩල කාණ්ඩය**

| | | | |
|---|---|---|---|
| ප්‍රධාන වෛද්‍ය නිලධාරී (වැඩ බලන) | 01 | මහජන සෞඛ්‍ය නිලධාරීන් (සහායක පදනමින්) | 01 |
| බාහිර වෛද්‍ය නිලධාරී (සහායක පදනමින්) | 01 | බාහිර ලියාපදිංචි වෛද්‍ය නිලධාරී (සහායක පදනමින්) | 01 |
| දන්ත ශල්‍ය වෛද්‍ය | 01 | කාර්මික නිලධාරී (සහායක පදනමින්) | 01 |
| හෙද නිලධාරී | 01 | උපස්ථායක (කාන්තා) | 03 |
| ඖෂධවේදී | 01 | උපස්ථායක (පිරිමි) | 01 |
| කම්කරු (සෞ.සේ) | 01 | කම්කරු | 01 |

**සායනික සේවා**

| | | ශිෂ්‍ය | කාර්යමණ්ඩල | එකතුව |
|---|---|---|---|---|
| 1 | බාහිර රෝගී අංශය | 8736 | 1957 | 10693 |
| 2 | දන්ත වෛද්‍ය ඒකකය | 1670 | 369 | 2039 |
| 3 | රසායානාගාර සේවා | 301 | 224 | 525 |
| 5 | මනෝ විද්‍යා උපදේශනය | 49 | 4 | 53 |
| 6 | විශේෂ ශායන සඳහ යොමුකිරිම | | | 114 |

**අනෙකුත් සේවා**

| 47 | පූජ්‍ය වල්පොල පියනන්ද ශිෂ්‍යත්ව ආයෝජනය (ඉතුරුම්) | 2G02147 | 7,523.56 | 7,229 |
| 48 | මහාචාර්ය නීල් ෆොන්සේකා ශිෂ්‍යත්ව ස්ථාවර තැන්පතුව | 2G02148 | 975,000.00 | 975,000 |
| 49 | ආචාර්ය A.D.V. ප්‍රේමරත්න රන් පදක්කම | 2G02149 | 268,477.14 | 266,537 |
| 50 | N.D. ජයසුන්දර අනුස්මරණ රන් පදක්කම | 2G02150 | 372,588.87 | 364,967 |
| 51 | IFS රන් පදක්කම | 2G02151 | 339,593.95 | 335,437 |
| 52 | ජයමිණි සමරවීර ශිෂ්‍යත්වය | 2G02152 | 3,150,500.00 | 3,125,000 |
| 53 | C.R.D.සිල්වා රන් පදක්කම | 2G02153 | 289,593.95 | 285,437 |
| 54 | නේලියා මෙන්ඩිස් අනුස්මරණ රන් පදක්කම | 2G02154 | 365,989.89 | 359,061 |
| 55 | ආචාර්ය ශකු ගෝෂින් රන් පදක්කම | 2G02155 | - | - |
| 56 | මහාචාර්ය රණවීර බණ්ඩා රන් පදක්කම | 2G02156 | 300,000.00 | 300,000 |
| 57 | ලකී ලංකා රන් පදක්කම | 2G02157 | 300,000.00 | 300,000 |
| 58 | D.A. රාජපක්ෂ අනුස්මරණ රන් පදක්කම | 2G02158 | 550,000.00 | 550,000 |
| 59 | කිරිගෝරිස් අප්පුහාමි අනුස්මරණ රන් පදක්කම | 2G02159 | 550,000.00 | 550,000 |
| 60 | මහාචාර්ය ශකු ගෝෂින් රන් පදක්කම | 2G02160 | - | - |
| 61 | මහාචාර්ය අලවත්තාගොඩ පේමදාස රන් පදක්කම | 2G02161 | 700,000.00 | 700,000 |
| 62 | සදා පෙරේරා රන් පදක්කම | 2G02162 | 308,640.22 | 302,482 |
| 63 | ක්‍රිස්ටි ඩයස් අනුස්මරණ රන් පදක්කම | 2G02163 | 250,000.00 | 250,000 |
| 64 | කසකෝ වටනබේ ශිෂ්‍යත්ව අරමුදල | 2G02164 | 10,000,000.00 | 10,000,000 |
| 65 | R. H. විජේනායක ශිෂ්‍යත්ව අරමුදල | 2G02165 | 190,000.00 | 190,000 |
| 66 | කොළඹපටබැදිගේ ජිනසේන රන් පදක්කම | 2G02166 | 945,500.00 | 945,500 |
| 67 | තිස්සවීර සිරිවර්ධන රන් පදක්කම | 2G02167 | 945,500.00 | 945,500 |
| 68 | දේශමාන්‍ය ආචාර්ය නිහාල් ජිනසේන රන් පදක්කම | 2G02168 | 945,500.00 | 945,500 |
| 69 | SCSIO රන් පදක්කම, රුහුණ විශ්වවිද්‍යාලය, වැල්ලමඩම | 2G02169 | 800,000.00 | - |
| 70 | ලැම්බඩ් වීරසේකර අනුස්මරණ රන් පදක්කම | 2G02170 | 800,000.00 | - |
| | | | **44,341,687** | **42,023,780** |

සටහන 13: වෙනත් මූල්‍ය වත්කම්

| | නම | කේතය | 2017 (රු.) | 2016 (රු.) |
|---|---|---|---|---|
| 1 | උපකුලපති අරමුදල් ආයෝජනය (ස්ථාවර) | 2G03002 | 723,800 | 672,232 |
| 2 | රුහුණ විශ්වවිද්‍යාල සංවර්ධන අරමුදල් ආයෝජනය (ඉතුරුම්) - PB | 2G03003 | 5,249,593 | 5,060,205 |
| 3 | W.H.O. - 81054/ව්‍යාපෘති ආයෝජනය | 2G03005 | 1,966,998 | 1,966,998 |
| 4 | වෛද්‍ය ප්‍රදර්ශන ආයෝජන ගිණුම | 2G03010 | 4,133,291 | 244,411 |
| 5 | බැඳුම්කර උල්ලංඝනය කිරීම් (ආයෝජන) | 2G03011 | 22,590,314 | 13,000,000 |
| 6 | Ekagu Rayo Mayoda අරමුදල | 2G03012 | 1,540,381 | 1,540,381 |
| 7 | Ekagu Rayo Mayoda අරමුදල | 2G03013 | 287,518 | 287,518 |
| 8 | Ekagu Rayo Mayoda අරමුදල | 2G03016 | 200,000 | 200,000 |
| 9 | ප්‍රාග්ධන ආයෝජන (නේවාසිකාගාර ගෘහ භාණ්ඩ) | 2G03017 | 22,301,502 | 40,000,000 |
| 10 | Mis. තැන්පතු ආයෝජනය (කළමනාකරණ පීඨ භූමිය) | 2G03018 | 1,857,250 | 1,857,250 |
| 11 | ප්‍රාග්ධන ආයෝජන (නේවාසිකාගාර ගෘහ භාණ්ඩ) | 2G03019 | 20,000,000 | 20,000,000 |
| 12 | පශ්චාත් උපාධි ස්ථාවර තැන්පතු | 2G03020 | 29,755,690 | - |
| 13 | විදේශ උපාධිධාරී ස්ථාවර තැන්පතු | 2G03022 | 25,730,455 | - |
| 14 | මුදල් වෙළඳපල ආයෝජන අරමුදල් | 2G03023 | 6,545,157 | |
| 15 | වෛද්‍ය පීඨ ස්ථාවර තැන්පතු - ලංකා බැංකුව | 2G03024 | 6,000,000 | |
| 16 | DECU අරමුදල | 2G04000 | 28,203,342 | 1,507,614 |
| | | | **77,085,291** | **86,336,608** |

සටහන 14 : ණය හිමියන්

| | නම | කේතය | 2017 (රු.) | 2016 (රු.) |
|---|---|---|---|---|
| 1 | 10% රඳවා ගැනීම් | 1K01007 | 105,111,755 | 72,149,461 |
| 2 | ණය හිමියන් | 1K02000 | 49,332,317 | 65,963,298 |
| | | | **154,444,072** | **138,112,759** |

සටහන 15 : Deposits

| | නම | කේතය | 2017 (රු.) | 2016 (රු.) |
|---|---|---|---|---|
| 1 | භූගෝල විද්‍යා තැන්පතු | 1K01001 | 23,900 | 23,900 |
| 2 | පුස්තකාල තැන්පත් | 1K01002 | 2,292,730 | 2,035,915 |
| 3 | පශ්චාත් උපාධි සඳහා පුස්තකාල තැන්පතු ගිණුම | 1K01002/1 | 795,500 | 333,500 |
| 4 | විද්‍යා තැන්පතු | 1K01003 | 734,138 | 488,838 |
| 5 | සේවක ආරක්ෂණ තැන්පතුව | 1K01004 | 39,000 | 39,000 |
| 6 | ටෙන්ඩර් තැන්පතු | 1K01005 | 997,540 | 1,676,220 |
| 7 | විවිධ තැන්පතු (වැල්ලමඩම) | 1K01006 | 3,516,893 | 3,537,535 |
| 8 | ශිෂ්‍යත්ව තැන්පතු | 1K01008 | 9,816,172 | 9,386,407 |
| 9 | ආරක්ෂණ තැන්පතු | 1K01009 | 3,108,701 | 3,212,072 |
| 10 | භෞග විද්‍යා ශිෂ්‍යත්ව අරමුදල | 1K01010 | 51,384 | 54,703 |

| | | | | |
|---|---|---|---|---|
| 11 | කාය ව්‍යවච්ඡේද විද්‍යා අධ්‍යයනාංශය සඳහා පරිත්‍යාග (ෆොන්සේකා අරමුදල) | 1K01012 | 119,150 | 109,400 |
| 12 | ක්‍රිස්ටි ඩයස් පෙරේරා අනුස්මරණ (රෝග විද්‍යා) | 1K01013 | 120,427 | 94,575 |
| 13 | රොනී ද මෙල් ශිෂ්‍යත්ව අරමුදල | 1K01014 | 58,561 | 53,734 |
| 14 | නීල් ෆොන්සේකා ශිෂ්‍යත්ව අරමුදල | 1K01017 | 1,020,962 | 1,134,400 |
| 15 | කෘෂි ආර්ථික විද්‍යා පර්යේෂණ අරමුදල | 1K01018 | 55,800 | 55,800 |
| 16 | රන් පදක්කම් අරමුදල | 1K01019 | 12,468,211 | 10,456,341 |
| 17 | ඇස්ලී ශිෂ්‍යත්ව අරමුදල | 1K01021 | (2,217) | 241,863 |
| 18 | ජනාධිපති ශිෂ්‍යත්ව අරමුදල | 1K01022 | 60,000 | 1,048,469 |
| 19 | කසුකෝ වටනබේ ශිෂ්‍යත්වය | 1K01023 | 12,712,649 | 11,889,845 |
| 20 | විවිධ තැන්පතු - (කෘෂි) | 1K01024 | 1,290,849 | 748,275 |
| 21 | විවිධ තැන්පතු - (වෛද්‍ය) | 1K01025 | 171,790 | 1,799,335 |
| 22 | විවිධ තැන්පතු - (ඉංජිනේරු) | 1K01026 | 9,707,093 | 1,613,128 |
| 23 | ජීවන වියදම් හිඟය | 1K01027 | 271,031 | 316,532 |
| 24 | ඇවර කළ අලාභ | 1K01028 | 64,368,580 | 53,520,275 |
| 25 | ජනාධිපති ශිෂ්‍යත්වය - කෘෂිකර්ම | 1K01029 | 448,549 | - |
| | | | **124,247,392** | **103,870,065** |

**සටහන 16 : ගෙවිය යුතු**

| | නම | කේතය | 2017 (රු.) | 2016 (රු.) |
|---|---|---|---|---|
| 1 | උපචිත වියදම් | 1K03001 | 26,809,096 | 18,124,023 |
| 2 | උපචිත සඳහා ප්‍රතිපාදන | 1K03002 | 54,274,451 | 48,644,889 |
| | **එකතුව** | | **81,083,547** | **66,768,912** |

**සටහන 17 : අනෙකුත් වගකීම්**

| | නම | කේතය | 2017 (රු.) | 2016 (රු.) |
|---|---|---|---|---|
| 1 | අවලංගු චෙක්පත් | 1K05000 | 1,543,114 | 364,147 |
| 2 | නොගෙවන ලද ශිෂ්‍යාධාර | 1K06004 | 12,419,750 | 12,264,450 |
| 3 | නොගෙවූ මහපොළ | 1K06005 | 3,626,050 | 2,087,500 |
| 4 | නොගෙවූ ගෙවීම් | 1K06006 | 90,060 | 107,070 |
| 5 | ශේෂය කපා හැරීම | 1K06011 | 105,944 | 104,294 |
| 6 | රඳවාගත් ආදායම | 1K06100 | 21,119,355 | 21,119,355 |
| 7 | අර්ථසාධක අරමුදල් ණය ගෙවීම | 1K06009 | (4,946) | - |
| | | | **38,899,327** | **36,046,815** |

**සටහන 18 : වියදම් කළ ප්‍රාග්ධන ප්‍රදාන**

| | නම | කේතය | 2017 (රු.) | 2016 (රු.) |
|---|---|---|---|---|
| 1 | ප්‍රාග්ධනය | 1A01000 | 4,832,945,841 | 4,111,967,395 |
| | | | **4,832,945,841** | **4,111,967,395** |

සටහන 19 : වියදම් නොකළ ප්‍රාග්ධන ප්‍රදාන

| | නම | කේතය | 2017 (රු.) වියදම් නොකළ ප්‍රාග්ධන ප්‍රදාන | 2016 (රු.) වියදම් නොකළ ප්‍රාග්ධන ප්‍රදාන |
|---|---|---|---|---|
| 1 | ගෘහභාණ්ඩ සහ උපකරණ ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම | 1A02051 | (149,495,108) | (8,330,248) |
| 2 | පරිගණක ගොඩනැගිලි ප්‍රාග්ධන ප්‍රදාන | 1A02056 | 12,762,218 | 12,879,012 |
| 3 | ගොඩනැගිලි පුනරුත්තාපනය හා වැඩිදියුණු කිරීමේ ප්‍රාග්ධන ප්‍රදාන | 1A02058 | (24,256,074) | (15,275,031) |
| 4 | පුස්තකාල පොත් හා වාර ප්‍රකාශන ප්‍රාග්ධන ප්‍රදාන | 1A02059 | (1,222,568) | (572,892) |
| 5 | කළමනාකරණ පීඨ ගොඩනැගිල්ල | 1A02061 | 62,995,695 | (2,433,966) |
| 6 | ඉංජිනේරු පීඨ පුස්තකාල ගොඩනැගිල්ල ප්‍රාග්ධන ප්‍රදාන | 1A02063 | (15,363,186) | (15,363,186) |
| 7 | ඉංජිනේරු පීඨය සඳහා යෝජිත කාර්යාලය, දේශන ශාලාව හා ශ්‍රවණාගාර සංකීර්ණය (අදියර 2) ඉදිකිරීම හා නිම කිරීම | 1A02064 | 1,049,066 | 1,049,066 |
| 8 | නගරසංවර්ධන ප්‍රදාන | 1A02066 | 32,000,000 | 22,000,000 |
| 9 | K.E.I.D. ප්‍රදාන | 1A02067 | 3,510,218.40 | 3,510,218.40 |
| 10 | රුහුණ විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා නිවාස ඒකක ඉදිකිරීම හා සම්පූර්ණ කිරීම | 1A02068 | 617,343 | 617,343 |
| 11 | රුහුණ විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ පරිපාලන හා මූල්‍ය කාර්ය මණ්ඩලය සඳහා නිවාස ඒකක ඉදිකිරීම හා සම්පූර්ණ කිරීම | 1A02069 | 1,292,793 | 1,422,429 |
| 12 | මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයේ විභාග ශාලාවේ හා ශ්‍රවණාගාරයේ යෝජිත ඉතිරි වැඩ | 1A02070 | 6,713,671 | 3,713,671 |
| 13 | ධීවර හා සාගර විද්‍යා හා තාක්ෂණ පීඨය සඳහා ගොඩනැගිලි තුනක් ඉදිකිරීම | 1A02071 | (121,251,153) | (100,884,544) |
| 14 | ජ්‍යෙෂ්ඨ අධ්‍යයන කාර්ය මණ්ඩල නිවාස ඒකකය | 1A02072 | 7,891,490 | 3,290,600 |
| 15 | ආපනශාලාව - විද්‍යා පීඨ ප්‍රදාන | 1A02073 | 13,209,426 | 12,346,277 |
| 16 | ශිෂ්‍ය පොදු කාමරය - කෘෂිකර්ම පීඨය | 1A02074 | 11,596,146 | 10,596,146 |
| 17 | ආපන ශාලාව - කෘෂි විද්‍යා පීඨ ප්‍රදාන | 1A02075 | 11,856,681 | 10,976,564 |
| 18 | රබින්ද්‍රනාත් තාගෝර් අනුස්මරණ ප්‍රදාන | 1A02079 | 45,799,160 | 19,047,374 |
| 19 | තාක්ෂණ පීඨ පුනරුත්ථාපනය කිරීම් | 1A02080 | (22,064,038) | 2,860,115 |
| 20 | තාක්ෂණ පීඨය සඳහා යෝජිත ගොඩනැගිල්ල | 1A02081 | (66,112,847) | (1,074,247) |
| 21 | කුඩා කොම්පෝස්ට් අංගනයක් ඉදිකිරීම | 1A02083 | (1,194,611) | (89,592) |
| 22 | ඉංජිනේරු පීඨ මායිම් බිත්ති | 1A02084 | 13,539,970 | 8,313,704 |
| 23 | මානව සංවර්ධන ප්‍රාග්ධන ප්‍රදාන | 1A02085 | 10,562,076 | 8,534,601 |
| 24 | පර්යේෂණ ප්‍රදාන ශක්තිමත් කිරීම | 1A02086 | 26,155,252 | 44,207,397 |
| 25 | මාණ්ඩලික නිවස 1,2,3,4 තාක්ෂණ පීඨය | 1A02087 | 4,488,225 | 11,857,326 |
| 26 | මාණ්ඩලික නිවස 5,6,7,8 තාක්ෂණ පීඨය | 1A02088 | 3,879,712 | 12,218,798 |
| 27 | කළමනාකරණ හා මූල්‍ය පීඨ නව ආපන ශාලාව | 1A02089 | (2,167,582) | (4,095,721) |
| 28 | පුස්තකාලයට දෙමහල් ගොඩනැගිල්ලක් එකතු කිරීම | 1A02090 | (5,976,287) | - |
| 29 | ක්‍රීඩා පිටිය වැඩි දියුණු කිරීම | 1A02091 | 799,250 | - |
| 30 | 12 මහල් ගොඩනැගිල්ල, වෛද්‍යය පීඨය | 1A02092 | (2,142,870) | - |

| | නම | කේතය | 2017 (රු.) වියදම් නොකළ ප්‍රාග්ධන ප්‍රදාන | 2016 (රු.) වියදම් නොකළ ප්‍රාග්ධන ප්‍රදාන |
|---|---|---|---|---|
| 31 | තෙමහල් ගොඩනැගිල්ලි දෙක - පරිපාලන සංකීර්ණය | 1A02093 | 3,898,668 | - |
| 32 | කළමනාකරණ පීඨ සංකීර්ණය - දෙවන අදියර | 1A02094 | 2,802,915 | - |
| 33 | සියළුදෙනාටම පොදු මධ්‍යස්ථානයක් | 1A02095 | 950,000 | - |
| 34 | පිළිගැන්ම් දිරිමත් කිරීම - වෛද්‍ය පීඨය | 1A02097 | 24,895,000 | - |
| 35 | නේවාසිකාගාර සඳහා ගෘහභාණ්ඩ සැපයීම - තාක්ෂණ පීඨය | 1A02098 | 40,838,998 | - |
| 36 | සරසවි සිසුන්ගේ විෂයමාලා ක්‍රියාකාරකම් ධෛර්යමත් කිරීම | 1A02099 | 2,537,000 | - |
| 37 | ඇළ අත්පත් කර ගැනීම - තාක්ෂණ පීඨය | 1A02100 | (43,052,680) | - |
| | | | **(107,658,030)** | **41,321,213** |

සටහන **20 :** පර්යේෂණ ප්‍රදාන

| | | සටහන් කේතය | 2017 (රු.) 20A හර | 2017 (රු.) 20B බැර | 2016 (රු.) 20A හර | 2016 (රු.) 20B බැර |
|---|---|---|---|---|---|---|
| 1 | ළමයින්ගේ අරමුදල (වෛද්‍ය පීඨය) | 1C02095 | - | 200,416 | - | 272,416 |
| 2 | T.A.R.E. වාර සඟරාව (කෘෂි පීඨය) | 1C02099 | - | 262,130 | - | 148,130 |
| 3 | A.D.B. ප්‍රදාන ව්‍යාපෘතිය (වැල්ලමඩම) | 1C02118 | - | 755,291 | - | 755,291 |
| 4 | WHO/ 81054 අරමුදල් ගිණුම- බද්දෙගම ව්‍යාපෘතිය | 1C02220 | - | 1,764,410 | - | 1,625,368 |
| 5 | IAEA-302-F4-SRL 11958 (වෛද්‍ය පීඨය) | 1C02223 | - | 1,644,731 | - | 2,170,450 |
| 6 | IAEA. 302 F4 SRL 11958 අත්තිකාරම් (වෛද්‍ය පීඨය) | 1C02224 | - | - | - | - |
| 7 | ගාල්ල ජල සැපයුම් ව්‍යාපෘතිය (ඉංජිනේරු පීඨය) | 1C02229 | - | 1,482,840 | - | 1,026,422 |
| 8 | CARP ව්‍යාපෘතිය (වැල්ලමඩම) | 1C02264 | - | - | 69,414 | - |
| 9 | තරුණ අවදානම් චර්යා ව්‍යාපෘතිය (වැල්ලමඩම) | 1C02286 | - | 296,186 | - | 296,186 |
| 10 | ජලය පිරිසිදු කිරීමේ ව්‍යාපෘතිය -වැලිගම (කෘෂි පීඨය) | 1C02299 | - | 626,209 | - | 626,209 |
| 11 | Dukelink ව්‍යාපෘතිය (වෛද්‍ය පීඨය) | 1C02321 | - | 3,074,221 | - | 3,257,453 |
| 12 | Dukelink ව්‍යාපෘතිය -අත්තිකාරම් ගිණුම | 1C02322 | - | - | | |
| 13 | University Industry Com: Int:Cells ව්‍යාපෘතිය (කෘෂි පීඨය) | 1C02352 | - | 318,340 | - | 327,790 |
| 14 | RG/2006/EPSD/03 ව්‍යාපෘතිය (කෘෂි පීඨය) | 1C02354 | - | 107,791 | - | 127,791 |
| 15 | DAFD/2006/04 ව්‍යාපෘතිය | 1C02361 | - | 34,838 | - | 34,838 |
| 16 | Helth sectordev. ව්‍යාපෘතිය | 1C02362 | - | - | | |
| 17 | පොදු රාජ්‍ය මණ්ඩලීය ඉගෙනීම් (COL) (වැල්ලමඩම) | 1C02397 | - | - | - | 1,048,707 |
| 18 | පොදු රාජ්‍ය මණ්ඩලීය ඉගෙනීම් (COL) අත්තිකාරම් | 1C02398 | - | - | - | - |
| 19 | ජපන් ප්‍රදාන (වෛද්‍ය පීඨය) | 1C02401 | - | 210,642 | - | 86,891 |
| 20 | I.C.R.A.F. ව්‍යාපෘතිය (කෘෂි පීඨය) | 1C02405 | - | 113,730 | - | 239,550 |

| | | | 2017 (රු.) | | 2016 (රු.) | |
|---|---|---|---|---|---|---|
| | | සටහන් | 20A | 20B | 20A | 20B |
| | | කේතය | හර | බැර | හර | බැර |
| 21 | T.R S.L. ව්‍යාපෘතිය (Enginering) | 1C02412 | - | 54,733 | - | 54,733 |
| 22 | පැළ තවාන් හා පුහුණු කිරීම් ව්‍යාපෘතිය (කෘෂි පීඨය) | 1C02438 | - | 29,262 | - | 29,262 |
| 23 | SC/ සහයෝගීතා පර්යේෂණ ව්‍යාපෘතිය (වැල්ලමඩම) | 1C02454 | - | 17,535 | - | 17,535 |
| 24 | Art Gold Sri Lanka වැඩසටහන (වැල්ලමඩම) | 1C02462 | - | 235,180 | - | 235,180 |
| 25 | I.A.E.A. CRP ව්‍යාපෘතිය (කෘෂි පීඨය) | 1C02468 | - | 706,405 | - | 2,554,819 |
| 26 | I.A.E.A. CRP ව්‍යාපෘතිය අත්තිකාරම් (කෘෂි පීඨය) | 1C02469 | - | - | | |
| 27 | AG/UNDP IHP ව්‍යාපෘතිය (කෘෂි පීඨය) | 1C02472 | - | 41,074 | - | 41,074 |
| 28 | මානසික සෞඛ්‍ය -LF රෝගීන්, UK (වෛද්‍ය පීඨය) | 1C02474 | - | 1,290,401 | - | 1,587,169 |
| 29 | මානසික සෞඛ්‍ය -LF රෝගීන්, UK අත්තිකාරම් (වෛද්‍ය පීඨය) | 1C02475 | - | - | - | - |
| 30 | Cocoon Integrated ව්‍යාපෘතිය (කෘෂි පීඨය) | 1C02480 | - | 273,215 | - | 273,215 |
| 31 | SRLSO(10)WHO Registry/ No/2011/149551 (වෛද්‍ය පීඨය) | 1C02486 | - | 63,633 | - | 63,633 |
| 32 | Paraticipation Programme 2010-2011(කෘෂි පීඨය) | 1C02490 | - | 348,867 | - | 347,967 |
| 33 | ජාතික කෘෂි පර්යේෂණ සැලැස්ම (කෘෂි පීඨය) | 1C02496 | 20,587 | - | - | 303,051 |
| 34 | MD-NRC ව්‍යාපෘතිය (වෛද්‍ය පීඨය) | 1C02500 | - | 66,549 | - | 66,549 |
| 35 | කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයේ වැඩසටහන් | 1C02502 | - | 6,569,049 | - | 7,413,306 |
| 36 | කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයේ වැඩසටහන් සඳහා අත්තිකාරම් | 1C02503 | 92,044 | - | 31,549 | - |
| 37 | ඉන්දියා ශ්‍රී ලංකා පදනම් ව්‍යාපෘතිය | 1C02504 | - | 80,046 | - | 80,046 |
| 38 | ඉන්දීය සංස්කෘතික වැඩසටහන - අත්තිකාරම් | 1C02507 | - | - | - | - |
| 39 | HECT ව්‍යාපෘතිය (වෛද්‍ය පීඨය) | 1C02510 | - | 27,147 | - | 27,147 |
| 40 | AG MIP ව්‍යාපෘතිය (කෘෂි පීඨය) | 1C02518 | - | 25,368 | - | 25,368 |
| 41 | Satrep ව්‍යාපෘතිය (ඉංජිනේරු පීඨය) | 1C02522 | - | 3,481,573 | - | 3,830,378 |
| 42 | විෂබීජ සහ තෙල් කාන්දුවීමේ කාර්යක්ෂමතාවය පිළිබඳ පර්යේෂණ (ධීවර පීඨය) | 1C02524 | - | 9,353 | - | 606,154 |
| 43 | සාගර තෙල් පරිවහනය පරීක්ෂා කිරීම | 1C02525 | - | - | | |
| 44 | ඉන්දු-ශ්‍රී ලංකා ඒකාබද්ධ පර්යේෂණ වැඩසටහන (වෛද්‍ය පීඨය) | 1C02530 | - | 534,999 | - | 534,999 |
| 45 | ඉන්දියා-ශ්‍රී ලංකා ඒකාබද්ධ පර්යේෂණ ප්‍රදාන (කෘෂි පීඨය) | 1C02532 | - | 151,900 | - | 163,390 |
| 46 | COCOON ව්‍යාපෘතිය | 1C02534 | - | 311,191 | - | 311,191 |
| 47 | වොෂින්ටන් විශ්වවිද්‍යාල පර්යේෂණ ව්‍යාපෘතිය (වෛද්‍ය පීඨය) | 1C02537 | - | 66,401 | - | 22,199 |
| 48 | ICGEB ව්‍යාපෘතිය (කෘෂි පීඨය) | 1C02539 | - | 151,647 | - | 165,947 |
| 49 | ICGEB ව්‍යාපෘතිය-අත්තිකාරම්(කෘෂි පීඨය) | 1C02540 | - | - | | |

| | | | 2017 (රු.) | | 2016 (රු.) | |
|---|---|---|---|---|---|---|
| | | සටහන් | 20A | 20B | 20A | 20B |
| | | කේතය | හර | බැර | හර | බැර |
| 50 | GEF - IFAD (ධීවර හා සාගර විද්‍යා පීඨය) | 1C02541 | - | 1,168,934 | - | 1,168,934 |
| 51 | NSF/RG/2014/OMR/01/ ව්‍යාපෘතිය (වැල්ලමඩම) | 1C02545 | - | 399,562 | - | 17,749 |
| 52 | NSF/PG/2014/OMR/01/ අත්තිකාරම් (වැල්ලමඩම) | 1C02546 | - | - | - | - |
| 53 | Heiwa Nakajima පදනම (කෘෂි පීඨය) | 1C02547 | - | 32,964 | - | 42,964 |
| 54 | NSF/RG/2014/SS/03/ ව්‍යාපෘතිය (කෘෂි පීඨය) | 1C02549 | - | 107,905 | - | 660,902 |
| 55 | NSF/RG/2014/Ss/03 ව්‍යාපෘතිය - අත්තිකාරම් | 1C02550 | - | - | | |
| 56 | ජාතික විද්‍යා පදනම (වැල්ලමඩම) | 1C02553 | - | 488,444 | - | 871,108 |
| 57 | NSF/RG/2015/BS/01 ව්‍යාපෘතිය (වෛද්‍ය පීඨය) | 1C02555 | - | 298,123 | - | 199,551 |
| 58 | NSF/TG/2015/TECH-D/04 (වැල්ලමඩම) | 1C02557 | - | 261,050 | - | 550,605 |
| 59 | NSF/ ශිෂ්‍ය පර්යේෂණ ශිෂ්‍යත්ව (කෘෂි පීඨය) | 1C02561 | - | 478,241 | - | 456,321 |
| 60 | NSF/ ශිෂ්‍ය පර්යේෂණ ශිෂ්‍යත්ව - අත්තිකාරම් (කෘෂි පීඨය) | 1C02562 | - | - | | |
| 61 | BACC ව්‍යාපෘතිය (කෘෂි පීඨය) | 1C02563 | - | 2,858 | - | 740 |
| 62 | NSF of Medical Plant (වෛද්‍ය පීඨය) | 1C02565 | - | 571,391 | - | 241,186 |
| 63 | NSF-SP/CIN/2016/04 ව්‍යාපෘතිය | 1C02567 | - | 5,987,605 | - | - |
| 64 | NSF-SP/CIN/2016/04 ව්‍යාපෘතිය- අත්තිකාරම් | 1C02568 | 17,080 | - | - | - |
| 65 | NSF-RPHS/2016/04 ව්‍යාපෘතිය (වෛද්‍ය පීඨය) | 1C02569 | - | 1,374,206 | - | - |
| 66 | NSF-RPHS/2016/04 වෛද්‍ය පීඨය - අත්තිකාරම් | 1C02570 | - | - | | |
| 67 | NSF/SCH/2017/05 ව්‍යාපෘතිය | 1C02571 | - | 279,891 | | |
| | | | **29,711** | **6,878,475** | **100,963** | **35,007,862** |

**සටහන 21 : සීමාසහිත අරමුදල් හා සංචිත**

| | නම | | 2017 (රු.) | | 2016 (රු.) | |
|---|---|---|---|---|---|---|
| | | සටහන් | 21A | 21 B | 21 A | 21 B |
| | | කේතය | හර | බැර | හර | බැර |
| 1 | රෝහණ ශාස්ත්‍රීය අරමුදල් ගිණුම | 1C03008 | - | 30,424 | - | 30,424 |
| 2 | රුහුණු විශ්වවිද්‍යාල සංවර්ධන අරමුදල් ගිණුම | 1C03009 | - | 25,934,397 | - | 26,812,139 |
| 3 | රුහුණු විශ්වවිද්‍යාල පුස්තකාල අරමුදල් ගිණුම | 1C03010 | - | 942,216 | - | 583,888 |
| 4 | ක්‍රීඩා උපකරණ ප්‍රදාන ගිණුම | 1C03011 | - | 196,813 | - | 192,523 |
| 5 | උපකුලපති අරමුදල් ගිණුම | 1C03012 | - | 12,018,460 | - | 12,011,553 |
| 6 | W.H.O. ප්‍රදාන ගිණුම | 1C03014 | - | 124,096 | - | 124,096 |
| 7 | ත්‍යාග සහ පරිත්‍යාග පොදු ගිණුම | 1C03017 | - | 92,736 | - | 92,736 |
| 8 | ස්වයං උපකාර ශිෂ්‍යත්ව අරමුදල් ගිණුම | 1C03018 | - | 7,829,122 | - | 7,239,955 |

| | නම | සටහන් කේතය | 2017 (රු.) 21A හර | 2017 (රු.) 21 B බැර | 2016 (රු.) 21 A හර | 2016 (රු.) 21 B බැර |
|---|---|---|---|---|---|---|
| 9 | සංවර්ධන අරමුදල (වෛද්‍ය පීඨය) | 1C03019 | - | 15,032,795 | - | 18,684,600 |
| 10 | ගවේෂණ සමාජීය ගිණුම | 1C03023 | - | 1,036,966 | - | 692,258 |
| 11 | පාරිසරික ව්‍යාපෘති ගිණුම (වැල්ලමඩම) | 1C03029 | - | 4,205 | - | 1,046,069 |
| 12 | පීඨ සංවර්ධන අරමුදල (ඉංජිනේරු පීඨය) | 1C03043 | - | 1,265,130 | - | 1,153,534 |
| 13 | T.L.W.I. අනුස්මරණ සම්මන්ත්‍රණය (වැල්ලමඩම) | 1C03052 | - | 53,400 | - | 53,400 |
| 14 | සුනාමි අරමුදල (වැල්ලමඩම) | 1C03053 | - | - | - | 185,734 |
| 15 | වෛද්‍ය ප්‍රදර්ශන ගිණුම (වෛද්‍ය පීඨය) | 1C03055 | - | 4,900,309 | - | 4,924,052 |
| 16 | වෛද්‍ය පැලෑටි ව්‍යාපෘතිය (කෘෂි පීඨය) | 1C03057 | 23,229 | - | 23,229 | - |
| 17 | වෛද්‍ය පැලෑටි ව්‍යාපෘතිය -අත්තිකාරම් (කෘෂි පීඨය) | 1C03058 | 7,827 | - | 7,827 | - |
| 18 | ඩරම් විශ්වවිද්‍යාලයේ පරිත්‍යාග ගිණුම | 1C03061 | - | 5,990 | - | 5,990 |
| 19 | NOMA ආරම්භක අරමුදල | 1C03063 | - | 2,667,120 | - | 2,667,120 |
| 20 | NOMA (CPDS) අරමුදල් ගිණුම | 1C03065 | - | 1,094,980 | - | 1,094,980 |
| 21 | කෞතුකාගාර ගිණුම (වෛද්‍ය පීඨය) | 1C03066 | - | 821,323 | - | 815,223 |
| 22 | ශිෂ්‍ය සහයෝගීතා සේවා අරමුදල (වෛද්‍ය පීඨය) | 1C03068 | - | - | - | 29,350 |
| 23 | සම්මන්ත්‍රණය- 2008 ගිණුම (කෘෂි පීඨය) | 1C03069 | - | 1,205,242 | - | 743,792 |
| 24 | Green Dyke ව්‍යාපෘතිය | 1C03076 | - | - | - | 372,781 |
| 25 | පීඨ සංවර්ධන අරමුදල (මානව ශාස්ත්‍ර පීඨය) | 1C03084 | - | 3,323,749 | - | 6,124,016 |
| 26 | කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ ප්‍රදාන (වෛද්‍ය පීඨය) | 1C03086 | - | 2,080,355 | - | 2,080,355 |
| 27 | වි.වි.ප්‍ර.කො.ස. PHD පර්යේෂණ ප්‍රදාන ගිණුම | 1C03091 | - | 5,811,525 | - | 5,430,728 |
| 28 | වි.වි.ප්‍ර.කො.ස. PHD පර්යේෂණ ප්‍රදාන අත්තිකාරම් ගිණුම | 1C03092 | 335,000 | - | - | |
| 29 | පීඨාධිපති අරමුදල (වෛද්‍ය පීඨය) | 1C03097 | - | 49,278 | - | 65,278 |
| 30 | ශ්‍රවණාගාර සංවර්ධන අරමුදල (වෛද්‍ය පීඨය) | 1C03098 | - | 6,860,583 | - | 4,234,522 |
| 31 | පීඨාධිපති අරමුදල (මානව ශාස්ත්‍ර පීඨය) | 1C03099 | - | 2,534,648 | - | 2,534,648 |
| 32 | අධ්‍යයනාංශ අරමුදල (ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය) | 1C03100 | - | 2,678,561 | - | 2,533,561 |
| 33 | ධීවර සහ සාගර විද්‍යා සංවර්ධන අරමුදල | 1C03101 | - | - | - | 59,167 |
| 34 | පීඨාධිපති අරමුදල (කළමනාකරණ හා මූල්‍ය පීඨය) | 1C03105 | - | - | - | 593,400 |
| 35 | පීඨ අරමුදල (කළමනාකරණ හා මූල්‍ය පීඨය) | 1C03106 | - | 0.73 | - | 1,952,357 |
| 36 | ක්‍රීඩාංගනය සංවර්ධන අරමුදල (ඉංජිනේරු පීඨය) | 1C03107 | - | 336,350 | - | 243,700 |
| 37 | රජූ මයෙදා අරමුදල | 1C03110 | - | 2,160,352 | - | 2,147,666 |
| 38 | සිවිල් සහ පාරිසරික ඉංජිනේරු අධ්‍යයනාංශ සංවර්ධන අරමුදල | 1C03113 | - | 2,716,220 | - | 2,540,953 |
| 39 | විද්‍යුත් සහ තොරතුරු ඉංජිනේරු අධ්‍යයනාංශ සංවර්ධන අරමුදල | 1C03114 | - | 138,117 | - | 31,755 |

| | නම | සටහන් කේතය | 2017 (රු.) 21A හර | 2017 (රු.) 21 B බැර | 2016 (රු.) 21 A හර | 2016 (රු.) 21 B බැර |
|---|---|---|---|---|---|---|
| 40 | විෂයාන්තර අධ්‍යයන අධ්‍යයනාංශ සංවර්ධන අරමුදල | 1C03115 | - | 277,816 | - | 277,816 |
| 41 | යාන්ත්‍රික හා නිෂ්පාදන ඉංජිනේරු අධ්‍යයනාංශ සංවර්ධන අරමුදල | 1C03116 | - | 131,361 | - | 45,719 |
| 42 | වෛද්‍ය පීඨය සඳහා පරිත්‍යාග | 1C03117 | - | 79,985 | - | 141,082 |
| 43 | ICOAST ව්‍යාපෘතිය (වැල්ලමඩම) | 1C03118 | - | - | - | 970,811 |
| 44 | දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකයේ අරමුදල | 1C03122 | - | 59,596,469 | - | 57,998,165 |
| 45 | ඉංග්‍රීසි අධ්‍යයනාංශ සංවර්ධන අරමුදල | 1C03123 | - | 9,986,269 | - | 9,986,269 |
| 46 | උපදේශන සේවා පාලන අරමුදල (ඉංජිනේරු පීඨය) | 1C03124 | - | 6,709,330 | - | 5,825,069 |
| 47 | පරිගණක විද්‍යා අධ්‍යයනාංශ සංවර්ධන අරමුදල | 1C03125 | - | 3,539,465 | - | 3,539,465 |
| 48 | විද්‍යා පීඨ සංවර්ධන අරමුදල | 1C03126 | - | 431,873 | - | 134,611 |
| 49 | පීඨාධිපති අරමුදල (විද්‍යා පීඨය) | 1C03127 | - | 157,055 | - | 157,055 |
| 50 | භූගෝල විද්‍යා අධ්‍යයනාංශ සංවර්ධන අරමුදල | 1C03129 | - | 547,549 | - | 547,549 |
| 51 | සමාජ විද්‍යා අධ්‍යයනාංශ සංවර්ධන අරමුදල | 1C03130 | - | 675,595 | - | 644,299 |
| 52 | ජාත්‍යන්තර ඒකකයේ සංවර්ධන අරමුදල | 1C03131 | - | 725,217 | - | 710,132 |
| 53 | කෙටිකාලීන පාඨමාලා (ඉංග්‍රීසි) | 1C03132 | - | 419,527 | - | 404,725 |
| 54 | ICME ව්‍යාපෘතිය ( කළමනාකරණ හා මූල්‍ය පීඨය) | 1C03133 | - | 373,553 | - | 272,610 |
| 55 | ICME ව්‍යාපෘතිය ( කළමනාකරණ හා මූල්‍ය පීඨය) -අත්තිකාරම් | 1C03134 | 221,048 | - | - | - |
| 56 | RISTCON ව්‍යාපෘතිය (විද්‍යා) | 1C03136 | - | 763,799 | - | 541,496 |
| 57 | ඉන්දියා - ශ්‍රී ලංකා සංස්කෘතික වැඩසටහන | 1C03138 | - | - | - | 244,197 |
| 58 | ඉන්දියා - ශ්‍රී ලංකා සංස්කෘතික වැඩසටහන -අත්තිකාරම් | 1C03139 | - | - | 77,300 | |
| 59 | NORHEAD-CPDS ව්‍යාපෘතිය (CINTA) | 1C03142 | - | 5,752,363 | - | 7,677,101 |
| 60 | NORHED-CPDS ව්‍යාපෘතිය - අත්තිකාරම් | 1C03143 | - | - | | |
| 61 | South China Sea Institute Ocenology අරමුදල | 1C03146 | - | 1,313,820 | - | 10,082,524 |
| 62 | South China Sea Institute: ව්‍යාපෘතිය - අත්තිකාරම් ගිණුම | 1C03147 | - | - | | |
| 63 | වෛද්‍ය සංවර්ධන අරමුදල -අත්තිකාරම් (වෛද්‍ය පීඨය) | 1C03148 | - | - | - | |
| 64 | පීඨ සංවර්ධන අරමුදල (පශ්චාත් උපාධි පීඨය) | 1C03149 | - | 1,095,462 | 4,850 | |
| 65 | පීඨාධිපති අරමුදල (කෘෂි පීඨය) | 1C03150 | - | 181,210 | - | 22,960 |
| 66 | SGMMSI-201-ව්‍යාපෘති ගිණුම (විද්‍යා පීඨය) | 1C03152 | 58,670 | - | 58,670 | |
| 67 | චාල්ස් ඩර්වින් විශ්වවිද්‍යාලයේ PhD වැඩසටහන් අරමුදල | 1C03154 | - | 122,469 | - | 122,469 |
| 68 | තෝරාගත් විදේශීය සිසුන්ගේ අරමුදල (වෛද්‍ය පීඨය) | 1C03156 | - | 75,892,590 | - | 38,630,893 |
| 69 | RUHSS අරමුදල - මානව ශාස්ත්‍ර පීඨය | 1C03158 | - | 162,713 | - | - |

| | නම | | 2017 (රු.) | | 2016 (රු.) | |
|---|---|---|---|---|---|---|
| | | සටහන් | 21A | 21 B | 21 A | 21 B |
| | | කේතය | හර | බැර | හර | බැර |
| 70 | RUHSS අරමුදල- මානව ශාස්ත්‍ර පීඨය - අත්තිකාරම් | 1C03159 | 96,000 | - | - | - |
| 71 | ලෝක සාගර විශ්වවිද්‍යාලය (ධීවර හා සාගර පීඨය) | 1C03160 | - | 558,026 | - | 549,356 |
| 72 | ලෝක සාගර විශ්වවිද්‍යාලය (ධීවර හා සාගර පීඨය)-අත්තිකාරම් | 1C03161 | 276,000 | - | 276,000 | - |
| 73 | B.A.සංවර්ධන වැඩසටහන (මානව ශාස්ත්‍ර පීඨය) | 1C03162 | - | 1,255,251 | - | 975,627 |
| 74 | NORHED දේශගුණ වෙනස්වීමේ ව්‍යාපෘතිය | 1C03164 | - | 8,301,971 | - | 7,223,641 |
| 75 | NORHED ව්‍යාපෘති අත්තිකාරම් ගිණුම | 1C03165 | - | - | 50,000 | - |
| 76 | ධීවර සහ සාගර විද්‍යා හා තාක්ෂණ පීඨ සේවා විද්‍යාගාර ගිණුම | 1C03166 | - | 612,033 | - | 296,554 |
| 77 | කුඩා පරිමාණ කොම්පෝස්ට් ව්‍යාපෘතිය (කෘෂි පීඨය) | 1C03168 | - | 12,866 | - | 12,866 |
| 78 | නිපැයුම් හා නවෝත්පාදන ප්‍රදර්ශනය (විද්‍යා පීඨය) | 1C03170 | - | 90,241 | - | 60,616 |
| 79 | නිපැයුම් හා නවෝත්පාදන ප්‍රදර්ශනය (විද්‍යා පීඨය) -අත්තිකාරම් ගිණුම | 1C03171 | - | - | - | - |
| 80 | විද්‍යා පීඨ දින අරමුදල | 1C03173 | - | 2,320 | - | 387 |
| 81 | රසායන විද්‍යා අධ්‍යයනාංශ අරමුදල (විද්‍යා පීඨය) | 1C03174 | - | 579,665 | - | 159,774 |
| 82 | කොරල් ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය | 1C03175 | - | 12,330 | - | 12,330 |
| 83 | Enteric Fermentation ව්‍යාපෘතිය | 1C03177 | - | 117,150 | - | 310,750 |
| 84 | Spriulina & Virgin Coconut ව්‍යාපෘතිය | 1C03179 | - | 141,280 | - | 155,000 |
| 85 | භෞතික විද්‍යා අධ්‍යයනාංශ සංවර්ධනය (විද්‍යා පීඨය) | 1C03181 | - | 153,028 | - | 40,712 |
| 86 | නිපුණතා වර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | 1C03182 | - | 2,947,341 | - | 3,005,854 |
| 87 | නිපුණතා වර්ධනය කිරීමේ ව්‍යාපෘතිය- අත්තිකාරම් ගිණුම | 1C03183 | - | - | - | - |
| 88 | බලශක්තිය සඳහා අතිධ්වනිය තාක්ෂණය (කෘෂි පීඨය) | 1C03184 | - | 664,765 | - | 903,895 |
| 89 | බලශක්තිය සඳහා අතිධ්වනිය තාක්ෂණය (කෘෂි පීඨය) -අත්තිකාරම් ගිණුම | 1C03185 | - | - | - | - |
| 90 | ගොවීන් සඳහා තිරසාර ජීවනෝපාය ව්‍යාපෘතිය (කෘෂි පීඨය) | 1C03188 | 130,343 | - | - | 101,278 |
| 91 | ගොවීන් සඳහා තිරසාර ජීවනෝපාය ව්‍යාපෘතිය (කෘෂි පීඨය)-අත්තිකාරම් | 1C03189 | - | - | | - |
| 92 | විදේශ උපාධි අපේක්ෂක අරමුදල (වෛද්‍ය පීඨය) | 1C03190 | - | 33,021,860 | - | 25,969,844 |
| 93 | විදේශ උපාධි අපේක්ෂක අරමුදල (වෛද්‍ය පීඨය)-අත්තිකාරම් | 1C03191 | - | - | - | - |
| 94 | සාරස විද්‍යා හා ජල තාක්ෂණ අරමුදල (ධීවර හා සාගර පීඨය) | 1C03192 | - | 75,222 | - | - |
| 95 | භෝග ආරක්ෂණය (කෘෂි පීඨය) | 1C03193 | - | 481,042 | - | - |
| 96 | දෙමළ පාඨමාලාව ( මානව ශාස්ත්‍ර පීඨය) | 1C03194 | - | 1,502,976 | - | - |
| 97 | CRRP2016-05MY-ROWLINGS PRO.කෘෂි. | 1C03195 | - | 83,933 | - | - |
| 98 | රුහුණ Ac ඒකකය ව්‍යාපෘතිය | 1C03197 | 412,466 | - | | |

| | නම | සටහන් කේතය | 2017 (රු.) 21A හර | 21 B බැර | 2016 (රු.) 21 A හර | 21 B බැර |
|---|---|---|---|---|---|---|
| 99 | කෘෂි ආර්ථික විද්‍යා සංවර්ධන අරමුදල (කෘෂි පීඨය) | 1C03198 | - | - | - | - |
| 100 | රුහුණු AC ඒකකය | 1C03199 | - | 148,420 | - | - |
| 101 | Le Doxy ව්‍යාපෘතිය (වෛද්‍ය පීඨය) | 1C03200 | - | 8,479,356 | | |
| 102 | Le Doxy ව්‍යාපෘතිය (වෛද්‍ය පීඨය)- අත්තිකාරම් | 1C03201 | - | - | | |
| 103 | RASAS H & SS ව්‍යාපෘතිය | 1C03202 | - | 284,975 | | |
| 104 | RASAS H & SS ව්‍යාපෘති අත්තිකාරම් ගිණුම | 1C03203 | 44,000 | - | | |
| 105 | කාළගුණික වෙනස්වීම්-කඩොලාන (යුනෙස්කෝ) ව්‍යාපෘතිය | 1C03204 | - | 805,818 | | |
| 106 | Lung Function Testing ව්‍යාපෘතිය (වෛද්‍ය පීඨය) | 1C03206 | - | 581,698 | | |
| 107 | ජනාධිපති අංශ සංවර්ධන වැඩසටහන (කෘෂි පීඨය) | 1C03208 | - | 215,083 | | |
| 108 | ජනගහන සෞඛ්‍ය පර්යේෂණ ආයතනය (වෛද්‍ය පීඨය) | 1C03210 | - | 43,578 | | |
| 109 | Volvo Hamputom UK ව්‍යාපෘතිය (වෛද්‍ය පීඨය) | 1C03212 | - | 363,288 | | |
| 110 | Aciar/Fmst/2017/002 ව්‍යාපෘතිය, (ධීවර හා සාගර පීඨය) | 1C03214 | - | 3,508,248 | | |
| 111 | United Nationsindu.Deve.Org. ව්‍යාපෘතිය (කෘෂි පීඨය) | 1C03216 | - | 422,200 | | |
| 112 | MSTR/TRD/AGR/03/02/06 ව්‍යාපෘතිය - (වෛද්‍ය පීඨය) | 1C03218 | - | 2,295,000 | | |
| 113 | විශ්වවිද්‍යාල ඒකාබද්ධ අරමුදල | 1C03220 | - | 9,162,464 | | |
| | **එකතුව** | | **1,604,582** | **349,804,379** | **497,876** | **288,883,804** |

සටහන **22** : වෙනත් අරමුදල්

| | නම | කේතය | 2017 (රු.) | 2016 (රු.) |
|---|---|---|---|---|
| 1 | බැඳුම්කර හා ගිවිසුම් උල්ලංඝනය කිරීම් අරමුදල් ගිණුම | 1B01002 | 97,973,073 | 91,225,626 |
| 2 | වත්කම් විකුණුම් මත ලාභ අරමුදල් ගිණුම | 1B01003 | 4,007,065 | 1,552,865 |
| | | | **101,980,138** | **92,778,492** |

සටහන **23** : විදේශ ආධාර සහ වෙනත් දේශීය ප්‍රදාන

| | නම | කේතය | 2017 (රු.) | 2016 (රු.) |
|---|---|---|---|---|
| 1 | විදේශ ආධාර ගිණුම (වෛද්‍ය) | 1D01000 | 1,170,000 | 2,340,000 |
| 2 | විදේශ ආධාර ගිණුම (IRQUE) | 1D01001 | 22,255,007 | 50,354,102 |
| 3 | විදේශ ආධාර ගිණුම (වැල්ලමඩම) | 1D01002 | 157,522 | 315,042 |
| 4 | දේශීය ප්‍රදාන ගිණුම | 1D02000 | 167,000 | 250,500 |
| | **එකතුව** | | **23,749,529** | **53,259,644** |

සටහන 24 : සංචිත

| | නම | කේතය | 2017 (රු.) | 2016 (රු.) |
|---|---|---|---|---|
| 1 | සාමාන්‍ය සංචිත ගිණුම | 1B03001 | 666,626,503 | 743,274,220 |
| 2 | ප්‍රත්‍යාගණන පොදු සංචිත ගිණුම | 1B03002 | 1,972,520,680 | 1,972,520,680 |
| 3 | A.U.C.සංචිත | 1B03003 | 496,259 | 496,259 |
| 4 | වාර්ෂික ශුද්ධ අතිරික්තය / (හිඟය) | | (165,850,112) | (76,040,206) |
| | **එකතුව** | | **2,473,793,330** | **2,640,250,953** |

සටහන 25 : මූල්‍ය කල්බදු යටතේ වන වගකීම්

| නම | කේතය | 2017 (රු.) | 2016 (රු.) |
|---|---|---|---|
| කල්බදු ණය හිමියන් (Peoples Leasing පුද්ගලික සමාගම සහ ලංකා බැංකුව) | K02001 | 11,733,502 | 11,733,502 |
| **අඩු කිරීම්:** | | | |
| 2017 වසර තුළ ගෙවීම් | | (4,328,880) | (4,328,880) |
| **2017.12.31 ට කල් බදු ණයහිමියන්ගේ ශේෂය** | | **7,404,622** | **11,733,502** |
| අවිනිශ්චිත පොළී | H014017 | 1,671,168 | 1,671,168 |
| **අඩු කිරීම්:** | | | |
| වසර තුළ ගෙවීම් | | (903,143) | (903,143) |
| | | **768,025** | **1,671,168** |
| **2017.12.31 ට ශුද්ධ කල්බදු ණය හිමියන්** | | **6,636,597** | **10,062,334** |
| වසර එකක කාලසීමාව තුළ වූ කල්බදු ණය හිමියන් | | 1,896,289 | 3,425,737 |
| වසරකට වඩා වැඩි කල්බදු ණය හිමියන් | | 4,740,307 | 6,636,597 |
| | | **6,636,597** | **10,062,334** |

සටහන 26 : බැංකු අයිරා

| | නම | කේතය | 2017 (රු.) | 2016 (රු.) |
|---|---|---|---|---|
| 1 | පුනරාවර්තන - මහජන බැංකුව -032-1-001-1-2477589 * | 2H15001 | 10,075,875 | - |
| 2 | පුනරාවර්තන -ලංකා බැංකුව-0033695757 | 2H15003 | 154,123 | - |
| | | | **10,229,998** | - |

* වසර අවසානයේ රු.මිලියන 50 ක් මුදල් වෙළඳපල ගිණුමකට මාරු කිරීම හේතුවෙන් 2017.12.31 දිනට මහජන බැංකුවේ පුනරාවර්තන ගිණුම කල් ඉකුත් වී ඇත.

සටහන 27 - ක්‍රමක්ෂය

| | 2012 දක්වා රු. | 2013 රු. | 2014 රු. | 2015 රු. | 2014/2015 Adj. රු. | 2016 රු. Restated | 2017 රු. | B/F ශේෂය-2017.12.31 | මුළු ශේෂය රු. |
|---|---|---|---|---|---|---|---|---|---|
| **රජයේ ප්‍රදාන** | | | | | | | | | |
| ගොඩනැගිලි | 2,080,658,520 | 117,276,080 | 138,345,847 | 175,078,716 | 8,458,859 | 209,582,282 | 263,347,187 | 4,050,850,958 | 7,043,598,448 |
| උපකරණ | 1,055,867,462 | 105,423,812 | 125,457,066 | 145,480,460 | (21,172) | 162,181,879 | 176,739,525 | 577,405,672 | 2,348,509,021 |
| ගෘහ භාණ්ඩ හා සවිකිරීම් | 28,683,087 | 5,912,304 | 8,001,224 | 9,251,819 | (93,657) | 8,718,905 | 21,531,263 | 195,738,278 | 277,743,222 |
| | **3,165,209,070** | **228,612,196** | **271,804,136** | **329,810,995** | **8,344,030** | **380,483,065** | **461,617,974** | **4,823,994,907** | **9,669,850,692** |
| පරිත්‍යාග | 70,688,100 | 395,842 | 58,609,182 | 30,548,036 | - | 30,548,036 | 29,510,115 | 53,259,642 | 244,048,838 |
| **එකතුව** | **3,235,897,170** | **229,008,038** | **330,413,318** | **360,359,031** | **8,344,030** | **411,031,101** | **491,128,089** | **4,877,254,550** | **9,913,899,530** |

# කොටස XII – විගණකාධිපති වාර්තාව සහ පිළිතුරු

## 01. විගණකාධිපති වාර්තාව

**විගණකාධිපති දෙපාර්තමේන්තුව**
**கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்**
**AUDITOR GENERAL'S DEPARTMENT**

මගේ අංකය / எனது இல. / My No. } එස්එන්පී/එම්ආර්/සී/යූඕආර්/1/17/42 ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2018 ඔක්තෝබර් 02 දින

උපකුලපති,
රුහුණ විශ්වවිද්‍යාලය.

**රුහුණ විශ්වවිද්‍යාලයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(1) උප වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

රුහුණ විශ්වවිද්‍යාලයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උප වගන්තිය ප්‍රකාරව විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. විශ්වවිද්‍යාල පනතේ 108(2) උප වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා වෙත 2018 ජූලි 19 දින නිකුත් කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලැසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත්, විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 111 වගන්තිය ප්‍රකාර විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට රුහුණ විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

(අ) රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02

ප්‍රමිතයේ අරමුණු ඡේදය පරිදි මුදලින් ගලා එන ප්‍රභවයන් හා මුදල් වියදම් වූ අයිතමයන් සහ වාර්තා කරන දිනට මුදල් ශේෂයන් පමණක් ඇතුලත් කර මුදල් ප්‍රවාහ ප්‍රකාශන පිළියෙල කළ යුතු වුවද, ඊට පටහැනි ලෙස දේපළ පිරියත අත්පත් කර ගැනීම වෙනුවෙන් සැපයුම්කරුවන්ට ඉදිරියේදී ගෙවිය යුතු රු 45,657,830 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මුදල් ගලායාම් යටතේ දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

(i) වත්කම් හඳුනා ගැනීමේ නිර්ණායක සම්පූර්ණ කර තිබුණු නමුත් 2016 ජූනි 30 දින අවසන් වී තිබුණු 21 වන සියවස සඳහා වූ උසස් අධ්‍යාපන ව්‍යාපෘතිය (HETC) මඟින් විශ්වවිද්‍යාලයට ලබාදී තිබුණු එකතුව රු.123,325,853 ක් වූ වත්කම් ගිණුම් ගතකර නොතිබුණි.

(ii) ප්‍රමිතයේ 55 වන වගන්තිය පරිදි ප්‍රත්‍යාගණනය කරන ලද වත්කමක් ඉවත් කිරීමේදී එම වත්කමට අදාලව හඳුනාගෙන තිබුණු ප්‍රත්‍යගණන අතිරික්තය සමුච්චිත අතිරික්තය හෝ ඌනතාවයට මාරු කළ යුතුය. එහෙත් 2014 වර්ෂයේදී ප්‍රත්‍යාගණනය කරන ලද රු.2,315,000 ක් වටිනා මෝටර් රථ තුනක් සමාලෝචිත වර්ෂය තුළ ඉවත් කිරීමේදී අදාල මෝටර් රථ සම්බන්ධයෙන් ප්‍රත්‍යාගණන සංචිතයට මාරු කර තිබුණු රු.2,313,600 ක් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) Specific Agrement and Resarch Cooperation between the Swedish International Development Corperation Agency ව්‍යාපෘතිය 2010 දෙසැම්බර් අවසන් වී තිබුණු අතර එම ව්‍යාපෘතියට අයිතිව තිබුණු රු. 6.300,000 ක් වටිනා වෑන් රථය විශ්වවිද්‍යාලය විසින් භාවිතා කරමින් පැවතියද, එය විශ්වවිද්‍යාලයට පවරාගෙන ගිණුම්ගත කිරීමට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාම කටයුතු කර නොතිබුණි.

(ආ) විශ්වවිද්‍යාලය සතු දේපළ වෙනුවෙන් සමාලෝචිත වර්ෂය හා ඊට පෙර වර්ෂ වලට අනුකූලව ගෙවිය යුතු වරිපනම් බදු හා ප්‍රතිහාර ගාස්තු රු. 402,048 ක් සම්බන්ධයෙන් ගිණුම්වල ප්‍රතිපාදන වෙන්කර නොතිබුණි.

(ඇ) 2017 වර්ෂයේදී ලැබී තිබූ බාහිර මූල්‍යන පාඨමාලා ආදායම් රු.84,399,021 ක් තුළ ඉදිරි වර්ෂවලට අදාලව ලැබී තිබූ රු.53.084.777 ක් විලම්බිත ආදායම් ලෙස ගිණුම්ගත කළ යුතු වූවද, රු.31,965,422 ක් පමණක් ගිණුම්ගත කර තිබීම හේතුවෙන් එම ගිණුමේ ශේෂය රු. 21,119,355 ක් අඩුවෙන් සහ සමාලෝචිත වර්ෂයේ ඌනතාවය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී විශ්වවිද්‍යාල අරමුදල් වලින් දරන ලද රු. 107.658,030 ක් අදාල වත්කම් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට වියදම් නොවූ ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමේ හර ශේෂයක් (Capital Grant Unspent) ලෙස දක්වා තිබුණි.

(ඉ) 2017 අගෝස්තු 16 දින මිලදීගැනීම් වලට අදාළ ඉන්වොයිස් පත්‍රය අනුව රු.3.750,000 ක් වටිනා Automotive Test Bench නැමති උපකරණය රු.4,162,500 ක් ලෙස ගිණුම් ගත කිරීම නිසා සැපයුම්කරුවන්ට ගෙවියයුතු මුදල හා ජංගම නොවන වත්කම් රු. 412,500 කින් වැඩියෙන් දක්වා තිබුණි.

### 2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

ගිණුම් විෂයයන් 02 කට අදාලව මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ශේෂයන් හා ඊට අදාළ විස්තරාත්මක උපලේඛනවල දැක්වෙන ශේෂ අතර රු.1,086.681 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතුව රු.11,188,851 ක් වූ බැංකු ජංගම ගිණුම් 03 කට අදාලව ශේෂ සනාථන සහතික ඉදිරිපත් නොකෙරුණි.

## 2.3 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

2016 වර්ෂයේ අයවැය යෝජනා අනුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ඉංජිනේරු පීඨ ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ විශ්වවිද්‍යාලයට රු.මිලියන 150 ක් ලබා දී ඇතත්. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතියකින් තොරව එම මුදල රු.මිලියන 33 කින් ඉක්මවා ඉංජිනේරු පීඨය විසින් ප්‍රාග්ධන වත්කම් මිලදී ගැනීම සඳහා වැයකර තිබුණි.

## 2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

2017 මූල්‍ය ප්‍රකාශන අනුව විශ්වවිද්‍යාලය සමග ඇතිකරගෙන තිබුණු ගිවිසුම් හා බැඳුම්කර කඩකර තිබුණු ආචාර්යවරුන් 18 දෙනෙකුගෙන් වර්ෂ 01 සිට 15 අතර කාලපරිච්ඡේදයකට අයත් රු.20,932,217 ක් ලැබිය යුතුව තිබුණි.

## 2.5 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත දැක්වෙන අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 135 වන වගන්තිය | විශ්වවිද්‍යාලය විසින් පවත්වාගෙන යන පශ්චාත් උපාධි පාඨමාලා සඳහා ශිෂ්‍යයන් ඇතුළත් කර ගැනීමට තිබිය යුතු සුදුසුකම් ඇතුළත් කරමින් අනුරූ ව්‍යවස්ථා පිළියෙල කර පාලක සභාව මගින් අනුමත කරගත යුතු වුවද, ආර්ථික විද්‍යා පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සහ ව්‍යාපාර පරිපාලනපති උපාධිය සඳහා ආරම්භයේ සිට එලෙස අනුරූ ව්‍යවස්ථා පිළියෙල කරගෙන නොතිබුණි. |
| (ආ) 2006 අංක 06 දරන දේශීය ආදායම් පනතේ 116 වන වගන්තිය | (i) විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය සඳහා ගෙවනු ලබන මාසික පරිශ්‍රමික හා දීමනා එකතුව රු.50,000 ක් ඉක්මවන විට උපයන විට ගෙවීම් බදු අඩුකර මාසිකව දේශීය ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය කළ යුතුව තිබුණද 2017 ජනවාරි සිට ජුලි දක්වා කාලපරිච්ඡේදය තුළ ඇතැම් නිලධාරීන්ගෙන් අඩුවෙන් හා ඇතැම් නිලධාරීන්ගෙන් වැඩියෙන් බදු මුදල් අයකර තිබුණු අතර එම මුදල් පිළිවෙලින් රු.1,236,929 ක් හා රු.419.802 ක් වී තිබුණි. |

(ii) උපයන විට ගෙවීම් ආදායම් බදු චක්‍ර අංක 01 හි 2 (ii) ඡේදය යටතේ නිත්‍ය සේවා නියුක්ති ලාභ යන්නට නිවාස පහසුකම්, වාහන පහසුකම්, වෛද්‍ය බිල්පත්, රක්ෂණ, විදුලිය, දුරකථන බිල් සහ සංග්‍රහ දීමනාද දක්වා තිබුණද නිලධාරීන්ගෙන් අයකළ යුතු උපයන විට ගෙවීම් බදු ගණනය කිරීමේදී ඉහත දීමනා ඇතුළත් කරගෙන නොතිබුණි.

| | |
|---|---|
| (ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන XX පරිච්ඡේදයේ 3.1 හා 3.2 වගන්ති | සෑම උසස් අධ්‍යාපන ආයතනයක් විසින්ම පැමිණීමේ ලේඛනයක් පවත්වාගෙන යා යුතු අතර, අදාල ආයතනයේ සේවයේ නියුක්ත සෑම තැනැත්තෙකුම තම පැමිණීම හා පිටවීම පැමිණීමේ ලේඛනයේ හෝ ඇඟිලි සලකුණු යන්ත්‍රයේ සටහන් කළ යුතුය. කෙසේ වුවද, ඊට අනුකූලව කටයුතු නොකරන ලද අධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 515 කට සමාලෝචිත වර්ෂයේදී වැටුප් හා දීමනා වශයෙන් රු.1,356,629,469 ක් ගෙවා තිබුණි. |
| (ඈ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 381 | රාජකාරී බැංකු ගිණුමක් ආරම්භ කිරීම සඳහා භාණ්ඩාගාරයෙන් (රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවෙන්) අනුමැතිය ලබාගතයුතු වුවත්, 2017 වර්ෂය තුළ ආරම්භ කර තිබුණු විශ්වවිද්‍යාල රැස්කිරීම් ගිණුම හා Money Market ඉතිරි කිරීමේ ගිණුම සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 396 (ඈ) | නිකුත් කර මාස 06 කට වඩා වැඩි කාලයක් ඉක්මවා තිබුණද, බැංකුවට ඉදිරිපත් කර නොතිබුණු රු.59,702 ක් වූ චෙක්පත් 07 ක් සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

| | |
|---|---|
| (iii) මුදල් රෙගුලාසි 571 | රඳවා ගැනීම් ගිණුමේ වසර 02 ක් ඉක්මවූ එකතුව රු.23,540,673 ක් වූ ශේෂයක් පැවති අතර ඒ පිළිබඳ මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ඉ) 2015 - 09 දරන විශ්වවිද්‍යාල මුදල් අනුකමිටු තීරණය | 2006 – 2010 දක්වා ඇණවුම් කරන ලද පුස්තකාල පොත්වලට අදාළ රු.540,446 ක් වූ නිරවුල් නොකළ පොත් මිලදීගැනීමේ අත්තිකාරම් සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණක වෙතින් වාර්තාවක් ලබාගෙන මුදල් අනුකමිටුව වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඊ) 2015 ජුලි 14 දිනැති අංක 3/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | අත්තිකාරම් ලබාගන්නා ලද කාර්ය නිම වූ වහාම පියවිය යුතු වුවද සමාලෝචිත වර්ෂයේ ගෙවා තිබුණු පර්යේෂණ අත්තිකාරම් රු.192,070 ක්, මිශ්‍ර අත්තිකාරම් රු.525,000 ක්, බාහිර අරමුදල් අත්තිකාරම් රු.476,818 ක් වශයෙන් එකතුව රු.1,193 ,888 ක් 2018 මැයි 31 දක්වාම පියවා නොතිබුණි. |
| (උ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | වටිනාකම රු. 10,008,259,338 ක් වූ ස්ථාවර වත්කම් (පරිගණක දෘඩාංග හා මෘදුකාංග හැර) සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ඌ) 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | වටිනාකම රු.307,040,172 ක් වූ පරිගණක දෘඩාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් වෙනමම ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.165,850,112 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.76,040,206 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 89,809,906 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. පුනරාවර්තන වියදම් සඳහා රාජ්‍ය ප්‍රදාන රු.130,674,145 කින් වැඩි වුවද, සේවක පාරිශ්‍රමික රු.176,087,719 කින් වැඩි වීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 හා 2014 වර්ෂවලදී ඌනතාවයක්ද 2015 වර්ෂයේදී අතිරික්තයක්ද 2016 හා 2017 වර්ෂවලදී නැවත ඌනතාවයක්ද ඇතිවී තිබුණි. කෙසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පරිශ්‍රමිකය, බදු හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂයවීම් නැවත ගැලපීමේදී 2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා දායකත්වය ක්‍රමයෙන් වර්ධනය වී තිබුණි. ඒ අනුව 2016 වර්ෂයේදී රු.2,307,417,826 ක් වූ දායකත්වය සියයට 8 කින් වර්ධනය වී සමාලෝචිත වර්ෂයේදී රු.2,494,042,928 ක් වී තිබුණි.

## 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දී ජංගම අනුපාතයේ 1.48:1 සිට 0.81:1 දක්වා පිරිහී තිබුණි.

## 3.3 විශ්වවිද්‍යාලයට එරෙහිව හෝ විශ්වවිද්‍යාලය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

පහත දැක්වෙන නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අවසානයට විශ්වවිද්‍යාලය විසින් විවිධ පාර්ශවයන්ට එරෙහිව රු.8,409,361 ක් අයකර ගැනීම සඳහා දිසා අධිකරණවල නඩු 05 ක් ගොනුකර තිබුණි.

(ආ) විශ්වවිද්‍යාලයට එරෙහිව විවිධ පාර්ශවයන් විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු 07 ක්ද, විශ්වවිද්‍යාල අභියාචනා මණ්ඩලයේ පැමිණිලි 09 ක් ද, කම්කරු විනිශ්චය සභාවේ පැමිණිලි 08 ක් ද, අභියාචනාධිකරණයේ නඩු 03 ක්, මහාධිකරණයේ නඩු 02 ක් ද, දිසා අධිකරණයේ හා කම්කරු වන්දි කොමසාරිස් හමුවේ නඩු 01 ක් බැගින්ද වශයෙන් ගොනු කරන ලද නඩු 31 ක් පැවතුණු අතර ඉන් එක් නඩුවක් සඳහා ඉල්ලා තිබුණු වන්දි මුදල රු.4,005,977 ක් වූ අතර එම මූල්‍ය ප්‍රකාශනවල සටහන් යටතේ හෙළිදරව් කර නොතිබුණි.

# 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

### 4.1.1 සැලසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අරමුණු ඉටුකර ගැනීම සඳහා විවිධ ක්‍රියාකාරකම් හඳුනාගෙන තිබුණද, ඒවා ඉටුකර ගැනීම සඳහා ඇති අවස්ථාවන් (Opportunities) සහ බාධක (Threats) පිළිබඳ මනා ඇගයීමකට ලක්කර නොතිබුණි.

(ආ) කාලීනව ලඟා කර ගත යුතු ඉලක්කයන් (Targets) ස්ථාපිත කිරීම හා එම ඉලක්කයන් සපුරා ගැනීමේ වගකීම මෙහෙයුම් මට්ටම දක්වා තර්කානුකූල පදනමකින් බෙදා හැර නොතිබුණි.

(ඇ) 2017 හා 2018 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලසුම් 2017 නොවැම්බර් 06 දින විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණද 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය ප්‍රකාරව පහත සඳහන් කරුණු ඇතුළත් කර එම වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් පිළියෙල කර නොතිබුණි.

- (i) ආයතනයේ සංවිධාන ව්‍යුහය.අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර.
- (ii) අදාළ වර්ෂය සඳහා අයවැය ලේඛනය
- (iii) වාර්ෂික අයවැය පදනම් කරගත් ප්‍රමුඛතා අනුව සකස් කළ ක්‍රියාකාරකම්.
- (iv) ප්‍රසම්පාදන සැලැස්ම.
- (v) අභ්‍යන්තර විගණන සැලැස්ම.

### 4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

විශ්වවිද්‍යාලයේ අරමුණු ඉටු කර ගැනීම සම්බන්ධයෙන් පහත දැක්වෙන නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2018 වර්ෂය වන විට විශ්වවිද්‍යාලයට ඇතුළත් කර ගන්නා මුළු සිසුන් සංඛ්‍යාව 1,860 සිට 2,340 ක් දක්වා වැඩිකර ගැනීමට සැලසුම් කර තිබුණි. නමුත් පීඨ 06 ක් සඳහා සැලසුම් කර තිබුණු සිසුන් සංඛ්‍යාවට වඩා සිසුන් 339 ක් අඩුවෙන් ඇතුළත් කර ගෙන තිබුණි.

(ආ) 2017 වර්ෂය වන විට උපාධි ලබා ගැනීමෙන් මාස 06 ක් තුළ සමස්ත උපාධිධාරීන්ගේ (වෛද්‍ය උපාධිධාරීන් හැර) රැකියා නියුක්තිභාවය සියයට 85 ක් දක්වා වර්ධනය කරගැනීම ඉලක්ක කරගෙන තිබුණද, ඉංජිනේරු උපාධිධාරීන් හැර අනෙකුත් සියලුම උපාධිධාරීන්ගේ රැකියා නියුක්තිභාවය සියයට 85 කට පහළ මට්ටමක වී තිබුණි. ඒ අතරින් කලා උපාධිධාරීන්ගේ රැකියා නියුක්තිභාවය සියයට 37 ක් තරම් පහළ මට්ටමක විය.

(ඇ) විශ්වවිද්‍යාලය ලෝක ශ්‍රේණිගත කිරීම් ලැයිස්තුවේ (Times Higher Educational and QS Ranking list) මුල් 2000 අතරට ගෙන ඒමට සැලසුම් කර තිබුණද එකී අරමුණ ඉටුකර ගැනීමට නොහැකිව තිබුණි. වෙබෝමෙට්‍රික්ස් ශ්‍රේණිගත කිරීම්වලට අනුව

රුහුණ විශ්වවිද්‍යාලය දේශීය ශ්‍රේණිගත කිරීම් ලැයිස්තුවේ 2017 වර්ෂයේ 5 වන ස්ථානය හිමි කරගෙන තිබුණි.

(ඇ) (i) කෘෂිකර්ම පීඨයේ පශ්චාත් උපාධි පාඨමාලා හදාරන ශිෂ්‍ය සංඛ්‍යාව වාර්ෂිකව සියයට 5 කින් වැඩිකර ගැනීමට අපේක්ෂා කර තිබුණද පීඨය හඳුන්වා දී තිබුණු පශ්චාත් උපාධි පාඨමාලා 07 න් පාඨමාලා 06 ක් සමාලෝචිත වර්ෂයේ අවසානය වන විට ක්‍රියාත්මක වී නොතිබුණි. ක්‍රියාත්මකව තිබුණු MSC in Crop Production Technology පාඨමාලාව සඳහාද 2015 වර්ෂයෙන් පසු සිසුන් ඇතුළත් කරගෙන නොතිබුණි.

(ii) දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය මගින් පරිපාලන කටයුතු සිදුකරනු ලබන සහතික පත්‍ර පාඨමාලා 04 ක් කෘෂිකර්ම පීඨය සඳහා හඳුන්වා දී තිබුණ ද එම පාඨමාලා 04 ම 2017 වර්ෂය අවසානය දක්වා ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) (i) යාන්ත්‍රික හා නිෂ්පාදන ඉංජිනේරු අධ්‍යයනාංශය සඳහා අමතර සිසුන් 25 බඳවාගැනීමට සැලසුම් කර තිබුණද බඳවා ගැනීම් සිදු කර නොතිබුණි.

(ii) ඉංජිනේරු පීඨයේ ආචාර්ය මණ්ඩලයේ තිදෙනෙකු 2017 වර්ෂය තුළදී දර්ශණපති උපාධිය (PHD) සම්පූර්ණ කිරීමට ඉලක්ක කර තිබුණත් ආචාර්යවරුන් දෙදෙනෙකු අදාළ ඉලක්කය සම්පූර්ණ කර ගෙන නොතිබුණි.

(ඊ) උපාධි පාඨමාලා 11 ක් සඳහා ඇතුළත් කර ගත හැකිව තිබුණු සිසුන් සංඛ්‍යාව 1,090 ක් වී තිබුණද තත්‍ය වශයෙන් එකී පාඨමාලා 11 සඳහා ඇතුළත් කර ගෙන තිබුනේ සිසුන් 1009 ක් පමණි. ඒ අනුව විශ්වවිද්‍යාලයට සුදුසුකම් ලබා තිබුණු තවත් සිසුන් 81 කට විශ්වවිද්‍යාලයට ඇතුළත් වීමේ අවස්ථාව අහිමි වී ගොස් තිබුණි.

(උ) පෙර වර්ෂයේ කළමනාකරණ හා මූල්‍ය පීඨයේ සිසුන් 36 ක් අසමත්වී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ එය සිසුන් 122 ක් දක්වා ඉහළ ගොස් තිබුණි. එය විභාගයට පෙනීසිටි මුළු සිසුන්ගෙන් සියයට 35 ක ප්‍රතිශතයක් විය.

(ඌ) මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ පෙර වර්ෂයේ සිසුන් 54 ක් උපාධි පරීක්ෂණය අසමත් වී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ එය සිසුන් 97 ක් දක්වා ඉහළ ගොස් තිබූ අතර එය විභාගයට පෙනීසිටි සංඛ්‍යාවෙන් සියයට 18 ක ප්‍රතිශතයක් විය.

(එ) වෛද්‍ය උපාධිය සඳහා උපාධි පරීක්ෂණයට පෙනී සිටි සංඛ්‍යාවෙන් 22 ක් අසමත් හෝ ඌණ සමාර්ථ ලබා තිබුණි. එය විභාගයට පෙනී සිටි සංඛ්‍යාවෙන් සියයට 30 ක ප්‍රතිශතයක් විය.

## 4.2 කළමණාකරණ ක්‍රියාකාරකම්

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2010 දෙසැම්බර් 31 දින අවසන් වී තිබුණු Specific Agrement and Resarch Cooperation between the Swedish International Development Corperation Agency ව්‍යාපෘතිය යටතේ භාවිතා කළ වත්කම් ලැයිස්තුවක් පිළියෙල කර එම වත්කම් විධිමත් පරිදි ධීවර සහ සාගර විද්‍යා හා තාක්ෂණ පීඨයේ පීඨාධිපති වෙත භාරදිය යුතුව තිබුණද සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාම එම කටයුතු සිදුකර නොතිබුණු අතර ඒ සම්බන්ධයෙන් පසු විපරම් කිරීමක්ද කර නොතිබුණි.

(ආ) විශ්වවිද්‍යාලයට අයත් වරිපනම් බද්ද ගෙවන දේපළ 11 ක් සඳහා සමාලෝචිත වර්ෂය දක්වාම වරිපනම් බද්ද ඒවායේ මුල් අයිතිකරුවන්ගේ නමින් ගෙවා තිබුණු අතර එම දේපළවල අයිතිය විශ්වවිද්‍යාලය නමට පවරා ගැනීමට සහ විශ්වවිද්‍යාලය නමින් වරිපනම් බිල්පත් සංශෝධනය කරවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) කෘෂිකර්ම පීඨයේ ඉගෙනුම ලබන 830 ක් වූ සියලු සිසුන් පරිගණක හා තොරතුරු තාක්ෂණය විෂයයක් වශයෙන් හදාරනු ලැබුවද පරිගණක විද්‍යාගාර 2 කින් සමන්විත පරිගණක ඒකකයේ සිසුන්ගේ පරිහරණය සඳහා ක්‍රියාකාරි තත්ත්වයේ තිබුණු පරිගණක සංඛ්‍යාව 06 ක් පමණක් විය. පරිගණක 19 ක් ක්‍රියාවිරහිතව තත්ත්වයේ පැවතුණි.

(ඈ) විශ්වවිද්‍යාල ගම්මාන වැඩසටහන් ව්‍යාපෘතිය සඳහා මුළු පිරිවැය ලෙස රු.මිලියන 2,512.8 ක් ඇස්තමේන්තු කර තිබුණු අතර 2017 අයවැය ලේඛනයෙන් රු.මිලියන 50 ක මූල්‍ය ප්‍රතිපාදන වෙන්කර තිබුණි.එහෙත් එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබූ අතර මූල්‍ය ප්‍රතිපාදනවලින් රු.මිලියන 40 ක් වැඩසටහනේ අරමුණුවලට අනුකූල නොවන පීඨ හා පරිපාලන අංශවල ප්‍රාග්ධන වත්කම් මිලදී ගැනීම සඳහා වෙන් කිරීමට 2017 ජූලි 10 දිනැති 370 වන පාලක සභා රැස්වීමේදී තීරණය කර තිබුණි.

(ඉ) හොංකොංහි International Economic Development and Research Center ආයතනයෙහි පවත්වා තිබුණු සම්මන්ත්‍රණයකට පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කර තිබුණු සිසුන් 04 දෙනෙකුට එම සම්මන්ත්‍රණයට සහභාගි වීමට විශ්වවිද්‍යාලය විසින් එක්

සිසුවෙකුට රු.100,000 ක් බැගින් එකතුව රු.400.000 ක් උපකුලපති අරමුදලින් ගෙවා තිබුණි. විදේශගත වීම සඳහා සිසුන්ට උපදෙස් හා නිසි මඟපෙන්වීමක් විශ්වවිද්‍යාලය විසින් ලබා නොදීම හේතුවෙන් වීසා ලබා ගැනීමට නොහැකි වීම මත සම්මන්ත්‍රණයට සහභාගී වීමට තිබුණු වටිනා අවස්ථාව මඟ හැරී ගොස් තිබුණි. ඒ අනුව එක් සිසුවෙකුගෙන් රු.50,000 ක් බැගින් එකතුව රු. 200.000 ක් නැවත අයකර ගෙන තිබුණද විශ්වවිද්‍යාලය විසින් ගෙවා තිබුණු ඉතිරි රු. 200.000 ක් ව මුදල ඵලදායක නොවූ ගනුදෙනුවක් වී තිබුණි.

(ඊ) 2018 අගෝස්තු 02 දිනට එකතුව රු. 275.166,473 ක්වූ නිරීක්ෂණ ඇතුළත් විගණන විමසුම් 04 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි

(උ) ව්‍යාපාර පරිපාලනපති පශ්චාත් උපාධි පාඨමාලාව හදාරන ලද 37 දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට එකතුව රු.3.003.300 ක් වූ උපාධි පාඨමාලා ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබූ අතර ඉන් 15 දෙනෙකුගේ උපාධි සහතික පත්‍ර නිකුත් කර තිබුණි.

(ඌ) දීර්ඝ කාලයක සිට පැවත එන නොගෙවූ ශිෂ්‍යාධාර හා මහපොළ ශිෂ්‍යත්වල 2017 වර්ෂයේ ආරම්භක ශේෂ පිළිවෙලින් රු.12,264,450 ක් හා රු.2.087.500 ක් වී තිබුණු අතර එම ශේෂ හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

සම සෞඛ්‍ය පීඨයට අදාළ හෙද උපාධි පාඨමාලාව 2008 වර්ෂයේදී ආරම්භ කර මේ වන විට සිසුන් කණ්ඩායම් 04 ක එකතුව සිසුන් 145 ක් උපාධිය සම්පූර්ණ කර පිටවී ගොස් තිබුණි. ඔවුන්ට වෘත්තීය පිළිගැනීම සඳහා අත්‍යවශ්‍ය වූ ශ්‍රී ලංකා හෙද සභාවේ ලියාපදිංචි සහතිකය (Accreditation) පාඨමාලාව සඳහා ලබා ගැනීමට 2017 වර්ෂය අවසානය දක්වා නොහැකි වී තිබුණි.

## 4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පහත දැක්වෙන නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 24 (ඇ) සහ 27 (1) උපවගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාල සඳහා පීඨයක් හෝ පීඨ පැවරුම් කිරීමේ බලය අමාත්‍යවරයා සතු වුවද. ඊට අනුකූල නොවන ලෙස රුහුණ විශ්වවිද්‍යාලට පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය පැවරීම

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සිදු කර තිබූ අතර කොමිෂන් සභාවට එවැනි බලයක් තිබේද යන්න තහවුරු වන සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ආ) 1985 අංක 07 දරණ විශ්වවිද්‍යාල (සංශෝධිත) පනතේ 28 වන වගන්තිය මඟින් සංශෝධිත 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 48 (අ) 2 උපවගන්තිය ප්‍රකාරව පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයක ව්‍යුහය, බලතල, කාර්යය හා කර්තව්‍යය සහ ඒ පීඨයේ පීඨාධිපතිවරයා පත් කිරීම හෝ තෝරා පත් කර ගැනීම සඳහා වූ කාර්යය පටිපාටිය කොමිෂන් සභාව විසින් නියමාවලි මඟින් නිශ්චය කරනු ලැබිය යුතුව තිබුණි. නමුත් රුහුණ විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය සඳහා එලෙස නියම කරන ලද නියමාවලියක් 2018 මැයි 31 දක්වා සකස් කර නොතිබුණි.

(ඇ) ව්‍යාපාර පරිපාලනපති උපාධිය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ව්‍යාපාර පරිපාලනපති උපාධිය සඳහා අයදුම්කරුවන් ඇතුළත් කර ගැනීමට පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය තුළ පොදු අතුරු ව්‍යවස්ථාවක් පිලියෙළ කර තිබුණ ද, 2017 වර්ෂය අවසානය දක්වාම ඒ සඳහා පාලක සභාවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 45 (2) උප වගන්තිය ප්‍රකාරව අතුරු ව්‍යවස්ථාව සකස්කිරීමේ බලය පාලක සභාවට පවරා ඇති බැවින් ව්‍යාපාර පරිපාලනපති උපාධිය සඳහා බල පවත්වන පීඨය විසින් සකස්කර තිබුණු පොදු අතුරු ව්‍යවස්ථාව සම්පූර්ණයෙන් පිළිගත හැකි ව්‍යවස්ථාවක්ද යන්න මතභේදයට තුඩුදෙන කරුණක් විය.

(ii) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 46 (6) (VIII) උපවගන්තිය ප්‍රකාරව අධ්‍යයන පාඨමාලාවලට අයදුම්කරුවන් ඇතුළත් කර ගැනීම සඳහා තිබිය යුතු සුදුසුකම් පාලක සභාව වෙත නිර්දේශ කිරීමේ බලය සනාථන සභාව සතු වුවත්, ඊට අනුකූල නොවන පරිදි 2017 අප්‍රේල් 05 දින පවත්වන ලද 36 වන කළමනාකරණ හා මූල්‍ය පීඨයේ අධ්‍යයන මණ්ඩල සැසිය (BOS) තුලදී ව්‍යාපාර පරිපාලනපති උපාධිය සඳහා ඇතුළත් වීමට අවශ්‍ය සුදුසුකම් නිර්ණය කර තිබුණි.

(iii) නිර්ණය කර තිබුණු සුදුසුකම් වල අංක 03 යටතේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ශිල්පීය ආයතනයේ විභාග උසස් මට්ටමෙන් සම්පූර්ණ කිරීම, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි පූර්ණ සාමාජිකත්වය සමග සමාන සුදුසුකම් ලෙස සලකා ව්‍යාපාර පරිපාලනපති පශ්චාත් උපාධි අධ්‍යයන පාඨමාලාව සඳහා අයදුම් කිරීමට සුදුසුකමක් ලෙස පීඨ අධ්‍යයන මණ්ඩය විසින් තීරණය කර තිබූ නමුත් එය තාර්කික නොවන බව විගණනයේදී නිරික්ෂණය විය.

(ඇ) ඉංජිනේරු පීඨය විසින් පෞද්ගලික ආයතනයකින් ගලිබවුසර් සේවාව ලබාගෙන එක් ගමන් වාරයකට රු.8,500 බැගින් ගමන් වාර 57 ක් සඳහා රු.484,500 ක් ගෙවීම් කර තිබුණි. පාරක්ෂක අංශයේ තිබුණු වාහන පැමිණීමේ පිටවීමේ ලේඛනය අනුව කිලෝමීටර් 25 ක පමණ දුරක් අපද්‍රව්‍ය ප්‍රවාහනය කිරීමට හා අපද්‍රව්‍ය පැටවීමට හා බෑමට ගතකර තිබුණු සාමාන්‍ය කාලය විනාඩි 38 ක් තරම් පිළිගත නොහැකි කෙටි කාලයක් වී තිබුණි. ඒ අනුව අදාළ ගෙවීම් කිරීමට ප්‍රථම එහි නිවැරදිභාවය තහවුරු කරගෙන නොතිබුණු බැවින් මෙම ගෙවීම් මතභේදයට තුඩුදෙන්නකි.

## 4.5 නිශ්ක්‍රීය හෝ ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වෛද්‍ය පීඨයට අයත් ඖෂධවේදී උපාධි පාඨමාලා මධ්‍යස්ථානයේ පරිගණක විද්‍යාගාරය සඳහා Dell වර්ගයේ පරිගණක 20 ක් 2011 මැයි 31 දින ලබාදී තිබුණි. ඉහත පරිගණක 20 න් 7 ක් පරිගණක විද්‍යාගාරය තුළ දීර්ඝ කාලයක සිට අක්‍රියව පැවතී අතර තවත් පරිගණක 06 ක් අළුත්වැඩියා කටයුතු සඳහා 2017 පෙබරවාරි 23 දින වෛද්‍ය පීඨයට යවා තිබුණද 2017 ඔක්තෝබර් 11 විගණන දිනය දක්වාම නැවත ලබා දී නොතිබුණි.

(ආ) 2016 දෙසැම්බර් 31 දින වෛද්‍ය පීඨයට අයත් හෙද උපාධි පාඨමාලාව සඳහා රු.495,600 ක් වටිනා HP වර්ගයේ Laptop පරිගණක 07 ක් ලබා දී තිබුණද විගණන දිනය වූ 2018 ජූනි 30 දක්වාම ඉන් පරිගණක 05 ක් අදාල මෘදුකාංග ඇතුළත් කර භාවිතයට ගෙන නොතිබුණි.

## 4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

### (අ) අධ්‍යයන කාර්ය මණ්ඩලය

(i) ඉංජිනේරු පීඨයේ අනුමත මහාචාර්ය තනතුරු 04 ම ආරම්භයේ සිටම පුරප්පාඩු වී පැවතුණි.

(ii) විශ්වවිද්‍යාලයට අයත් පීඨ 09 හි කථිකාචාර්ය තනතුරු පුරප්පාඩු 188 ක් පැවතුණි. ඉන් වෛද්‍ය, ඉංජිනේරු සහ විද්‍යා යන පීඨවල පුරප්පාඩු ප්‍රමාණය පිළිවෙළින් 42 ක් , 25 ක් හා 33 ක් තරම් ඉහළ අගයන් ගෙන තිබුණි. 2018 මැයි 31 දක්වාද මෙම පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණි.

**(ආ) අනධ්‍යයන කාර්ය මණ්ඩලය**

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2010 නොවැම්බර් 04 දින සිට පුරප්පාඩු වී පවතින මූල්‍යාධිකාරී තනතුර සඳහා අවස්ථා 10 කදී අයදුම්පත් කැඳවා තිබුණි. සුදුසුකම් සම්පූර්ණ කර තිබුණු අයදුම්කරුවන් තිදෙනෙකු සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීමට මාස 06 සිට 08 දක්වා කාලයක් ප්‍රමාද වීම හේතුවෙන් එම තිදෙනාම සම්මුඛ පරීක්ෂණ සඳහා පැමිණ නොතිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාද පුරප්පාඩුව පුරවා ගැනීමට නොහැකිව තිබුණි.

(ii) වැඩ ඉංජිනේරු තනතුරු 02 ක 2010 වර්ෂයේ සිට පුරප්පාඩු පැවති අතර ඒ සඳහා අවස්ථා 07 කදී අයදුම්පත් කැඳවා තිබුණද, 2018 මැයි 31 දින වන විටත් අවශ්‍ය බඳවා ගැනීම් කිරීමට නොහැකිව තිබුණි.

(iii) අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ මාණ්ඩලික තනතුරු 10 ක, මාණ්ඩලික නොවන තනතුරු 45 ක, සුළු සේවක තනතුරු 63 ක පුරප්පාඩු පැවතුනි. නමුත් මෙම පුරප්පාඩු පිරවීම සඳහා කටයුතු කර නොතිබුණි.

(iv) අංශ 03 ක පමණක් සේවය කර තිබුණු ලිපිකාර හා සමාන්තර ශ්‍රේණිවල කාර්ය මණ්ඩල සංඛ්‍යාව 278 ක් වූ අතර එහි 20 දෙනෙකු වසර 05 සිට වසර 20 කට වැඩි කාලයක් එකම අංශයක සේවය කර තිබුණි.

(v) විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර ආරක්ෂක අංශයේ කාර්ය මණ්ඩලය 124 ක් වූ අතර තථ්‍ය සංඛ්‍යාව 94 ක් විය. ඒ අනුව පුරප්පාඩු සංඛ්‍යාව 30 ක් වූ අතර එම පුරප්පාඩු සඳහා බඳවා නොගෙන 2017 ජනවාරි සිට පෞද්ගලික ආරක්ෂක සේවකයින් 65 දෙනෙකුගේ සේවය ලබා ගෙන තිබුණි. එය පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයකටද වැඩි විය. එම පෞද්ගලික ආරක්ෂක සේවය සඳහා 2017 ජනවාරි සිට ජූලි දක්වා පමණක් රු.14,322,710 ක් ගෙවා තිබියදී විශ්වවිද්‍යාලයේ ආරක්ෂක නිලධාරීන්ටද අතිකාල ලෙස එම කාලපරිච්ඡේදයටම රු.7,484,926 ක් ගෙවා තිබුණි. ඒ අනුව විශ්වවිද්‍යාලය ආරක්ෂක සේවාවන් ලබා ගැනීමේදී ආර්ථික වශයෙන් ඵලදායි ආකාරයට කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

AGDSL

## 5. තිරසාර සංවර්ධනය

## 5.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව රුහුණ විශ්වවිද්‍යාලය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී තිබුණි.

(අ) ඉහත පරිදි වසර 2030 න්‍යාය පත්‍රය පිළිබඳව දැනුවත්වීම මත විශ්වවිද්‍යාලය විසින් සිය විෂය පථයට අනුව ළඟා කර ගත යුතු අරමුණු හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. එසේ හෙයින් ඒ හා සම්බන්ධවන ඉලක්ක, පාදක දත්ත, ඉලක්ක ළගා විය යුතු සංධිස්ථානයන් මෙන්ම ප්‍රගතිය මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) තිරසාර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීමට සූදානම්වීමේදී අනෙකුත් ආයතන සමඟ මනා සම්බන්ධීකරණයක් නොකිරීම හේතුවෙන් ඉලක්ක ගත අරමුණු කරා ළඟාවීමට සැලසුම් සකස් කිරීමේ හා පෙර සූදානම්වීමේ ක්‍රියාවලිය ඉතා මන්දගාමී හෝ දුර්වල තත්වයක පැවැති බව නිරීක්ෂණය විය.

## 6. ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය

## 6.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2017 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 පෙබරවාරි 28 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණද, වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් විගණකාධිපති විසින් නිකුත් කර තිබුණු 2017 දෙසැම්බර් 29 දිනැති හා අංක විලේ/පොදු/2017/142 දරන ලිපිය පරිදි මූල්‍ය ප්‍රකාශන සමඟ අවශ්‍ය උපලේඛන සහ උපයෝගී ලේඛන එදිනම විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. ඒ අනුව උපලේඛන සමඟ මූල්‍ය ප්‍රකාශන විධිමත් පරිදි 2018 අප්‍රේල් 11 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

## 6.2 අභ්‍යන්තර විගණනය

කාර්ය මණ්ඩලය 07 කින් යුත් අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 133 (2) ප්‍රකාරව අභ්‍යන්තර විගණන ඒකකවල කාර්යයන් සහ ඒවායේ විෂයය සීමාව ආවරණය වන ආකාරයට විශ්වවිද්‍යාලයේ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 134 (3) පරිදි විශ්වවිද්‍යාලයේ මුදල් කටයුතුවලට අදාල අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත යැවිය යුතු වුවද, එසේ කටයුතු කර නොතිබුණි.

## 6.3 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

---------------------------------------------

### 6.3.1 ප්‍රසම්පාදනයන්

--------------------

පහත සදහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කෘෂිකර්ම පීඨය සහ වෛද්‍ය පීඨය සඳහා භාණ්ඩ මිලදී ගැනීම වෙනුවෙන් පිළිවෙලින් රු.මිලියන 96 ක් හා රු. මිලියන 22 ක් ප්‍රසම්පාදන සැලසුමට ඇතුළත් කර තිබුණද ප්‍රතිපාදන වෙන්කර තිබුණේ රු.මිලියන 08 ක් හා මිලියන 12 ක් පමණක් වන අතර සත්‍ය වියදම රු.මිලියන 07 ක් හා රු. මිලියන 11 ක් පමණක් වී තිබුණි.

(ආ) විශ්වවිද්‍යාලය සඳහා පොදුවේ ආපනශාලාවලට සුදුසු මේස හා පුටු මාදිලිය නිර්ණය කිරීමෙන් තොරව ඉංජිනේරු පීඨයේ ආපනශාලා අංක 01 සඳහා රු. 2,375,923 ක් වැය කර මිල අධික දැව මේස හා බංකු මිලදීගෙන තිබූ අතර අංක 02 ආපනශාලාවට ඉහත මිල ගණන්වලට වඩා අඩු වටිනාකම් සහිත ෆයිබර් වර්ගයේ මේස හා පුටු මිලදීගෙන තිබුණි.තවද, ඉහත මිලදී ගැනීමත් සමඟ අංක 01 ආපනශාලාවට 2013 වර්ෂයේදී මිලදීගෙන තිබුණු රු. 95,200 ක් වූ හොඳ තත්ත්වයේ තිබුණු මේස 10 ක් ඉවත් කිරීමට සිදුවී තිබුණි.

(ඇ) කෘෂි පීඨයේ 2017 වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ප්‍රසම්පාදන සැලසුමට අනුව Desktop පරිගණක 60 ක්, Laptop පරිගණක 60 ක් Scanner 01 ක් හා UPS 10 ක් මිලදී ගැනීම සඳහා සැලසුම් කර තිබුණද සමාලෝචිත වර්ෂය තුළ කිසිවක් මිලදී ගෙන නොතිබුණි.

## 6.3.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

රු.මිලියන 94 ක් වැයකර ඉදිකර තිබුණු ඉංජිනේරු පීඨයේ නව පුස්තකාල ගොඩනැගිල්ල 2015 අප්‍රේල් 22 විශ්වවිද්‍යාලයට භාරදී තිබුණද, ගොඩනැගිලි බිත්ති, කොන්ක්‍රීට් බීම් සහ කුළුණු ඉරිතැලීම් හා පිපිරීම්වලට ලක්වී තිබුණු ස්ථාන 170 ක් නිරීක්ෂණය වූ අතර පළමු මහල හා දෙවන මහලවල බිත්ති මත ජලය කාන්දුවන ස්ථාන 03 ක් නිරීක්ෂණය විය. තවද විදුලි පරිපථය විධිමත් පරිදි සකසා නොතිබුණු බැවින් විදුලි පැන්නුම් ස්විචය (Trip Switch) ක්‍රියාත්මක නොවීම හේතුවෙන් ගොඩනැගිල්ලේ සවිකර තිබූ 3 ක් අතරින් රු. 624,094 ක් වටිනා ස්විච් සම්පූර්ණයෙන්ම විනාශ වී තිබුණු අතර අනෙක් ස්විචයක කොටසක් අක්‍රිය වී තිබුණි.

## 6.4 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂය සඳහා වූ වැය විෂයයන් 64 ක අයවැයගත හා සත්‍ය වියදම් අතර සියයට 25 සිට සියයට 559 ක් දක්වා සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන්, අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 6.5 නොවිසඳී ඇති විගණන ඡේද

ඉකුත් විගණකාධිපති වාර්තා මගින් පෙන්වා දී තිබුණු නමුත්, පහත විස්තර දැක්වෙන විගණන ඡේද සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් විශ්වවිද්‍යාලයේ අවධානය යොමු වී නොතිබුණි.

(අ) ධීවර, සාගර විද්‍යා හා තාක්ෂණ පීඨය මගින් 2006 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා ක්‍රියාත්මක කර තිබුණු Specific Agreement on Research Co-operation Between the Swedish International Development Co-operation Agency ව්‍යාපෘතිය යටතේ උසස් අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර ගැනීම සඳහා කිසිදු ඇප බැඳුම්කරයකට එළඹීමෙන් තොරව තාවකාලික කථිකාචාර්යවරයෙකුට සහ ස්ථිර කථිකාචාර්යවරයෙකුට එකතුව රු. 1,740,622 ක මූල්‍යාධාර සපයා තිබුණි. එහෙත් 2017 දෙසැම්බර් 31 දක්වාම එම කථිකාචාර්යවරුන් උසස් අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර සේවයට වාර්තා කර නොතිබීම හේතුවෙන් දරන ලද වියදමට කිසිදු ප්‍රතිලාභයක් විශ්වවිද්‍යාලයට ලැබී නොමැති බව නිරීක්ෂණය විය.

(ආ) (i) කෘෂිකර්ම විද්‍යා පීඨයේ ආහාර හා තාක්ෂණ විද්‍යා අධ්‍යයනාංශය සඳහා අවශ්‍ය විද්‍යා උපකරණ ජර්මනියේ ආයතනයකින් මිලදී ගැනීම සඳහා වසර 04 කට පෙර රු. 751,463 ක අත්තිකාරම් මුදලක් ගෙවා තිබුණි. කෙසේ වුවද එම උපකරණ 2014 වර්ෂයේ මාර්තු දක්වාම විශ්ව විද්‍යාලයට ලැබී නොතිබූ නමුත් ඒ පිළිබඳ කිසිදු පසු විපරම් කිරීමකින් තොරව නැවත වරක් රු. 329,179 ක් වැයකර ඉන්දියාවෙන් උපකරණ ආනයනය කර තිබුණි.

(ii) එහෙත් ඇනවුම් නොකරන ලද භාණ්ඩ ලැබීම් සහ විවිධ අඩුපාඩු හේතුවෙන් එම උපකරණ විශ්ව විද්‍යාලය වෙත ලැබී සමාලෝචිත වර්ෂයේ අවසානය වන විට වසර 2 ක් ඉක්මවා තිබුණද ප්‍රයෝජනයට ගත නොහැකිව තිබුණි.

(iii) ඉහත ඡේද අංක (ආ) (i) දක්වා ඇති භාණ්ඩ ශ්‍රී ලංකා රේගු අධිකාරියට අයත් ඔරුගොඩවත්ත ගබඩාවේ තිබී 2016 මැයි 04 දින නිදහස් කරගෙන තිබුණි. ඒ අනුව 2013 නොවැම්බර් 25 දින සිට 2016 අප්‍රේල් 29 දක්වා දින 887 ක් භාණ්ඩ ගබඩාවේ රඳවා ගැනීමට සිදුවීම වෙනුවෙන් රු.88,700 ක ගබඩා ගාස්තුවක්ද, ගුවන්තොටුපල ගාස්තු වශයෙන් රු.30,750 ක් ද වශයෙන් එකතුව රු.119,450 ක් ගෙවීමට සිදු වී තිබුණි. එය අදාල නිලධාරින්ගේ ප්‍රමාදය හා නොසැලකිල්ල නිසා රජයට සිදු වූ පාඩුවක් වුවද, ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 156 (1) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඇ) ලෝක සෞඛ්‍ය සංවිධාන ව්‍යාපෘතියට අදාල වෛද්‍ය පීඨ අරමුදල් ගිණුමේ 2017 දෙසැම්බර් 31 දිනට රු. 1,764,410 ක ශේෂයක් පැවතුණි. 2015 සැප්තැම්බර් 09 හා 2017 ජනවාරි 17 යන දිනවල විගණනයට ඉදිරිපත් කර තිබුණු පිළිතුරු ලිපි මඟින් ඉහත අරමුදල් ගිණුමේ ශේෂය පීඨයට නව බස් රථයක් මිලදී ගැනීම සඳහා යෙදවීමට බලාපොරොත්තු වන බව දක්වා තිබුණද, 2018 මැයි 31 දින දක්වා එය ක්‍රියාත්මක කර නොතිබුණි.

## 6.6 සමාජ වගකීම් ඉටු කිරීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්ලාස්ටික් හා පොලිතීන් භාවිතය නිසා සිදු වන සෘජු හා වක්‍ර සෞඛ්‍ය, පාරිසරික හා සමාජීය බලපෑම් අවම කර ගැනීමට වැඩසටහන් විවිධ රාජ්‍ය ආයතන සම්බන්ධ කර ගෙන ක්‍රියාත්මක කළ හැකිව තිබුණද, විශ්වවිද්‍යාලය ඒ සම්බන්ධයෙන් ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණි.

(ඍ) පහත විස්තර දැක්වෙන පරිසර හිතකාමී වැඩසටහන් ක්‍රියාත්මක කිරීම කෙරෙහි විශ්වවිද්‍යාලයේ අවධානය යොමු වී නොතිබුණි.

(i) දැනට තහනම් කර ඇති මයික්‍රෝන 20 ට අඩු පොලිතීන් බෑග් හා ආහාර දැවටුම් විශ්වවිද්‍යාලය තුළට රැගෙන ඒම තහනම් කිරීම.

(ii) මයික්‍රෝන 20 ට වැඩි පොලිතීන් හා අනෙකුත් ද්‍රව්‍ය හා ප්ලාස්ටික් රැගෙන ඒම පාලනය කිරීම.

(iii) විශ්වවිද්‍යාලය තුළට ආහාර රැගෙන ඒමේදී ප්ලාස්ටික්,පොලිතීන් බෑග් සහ කෑම දවටන කොළ වෙනුවට වෙනත් පරිසර හිතකාමී ඇසුරුම් ක්‍රමවේද කෙරෙහි සිසුන් හා කාර්ය මණ්ඩලය දිරි ගැන්වීම.

7. **පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු විටින් වර විශ්වවිද්‍යාලයේ උපකුලපතිගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ස්ථාවර වත්කම් පාලනය | ආයතනයට ලැබෙන භාණ්ඩ වෙනුවෙන් භාණ්ඩ ලැබීම් තුණ්ඩු නිකුත් නොකිරීම. |
| (ආ) ගිණුම්කරණය | ඒකාකාරී ගිණුම්කරණ ප්‍රතිපත්තියක් අනුගමනය නොකිරීම, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති නිවැරදිව භාවිතා නොකිරීම,ගෙවිය යුතු වියදම් සඳහා ප්‍රතිපාදන වෙන්කර නොතිබීම, ආදායම නිවැරදිව ගිණුම්ගත නොකිරීම, වියදම් නොවූ ප්‍රාග්ධන ප්‍රදාන නිවැරදිව මූල්‍ය ප්‍රකාශන වලින් හෙළිදරව් කර නොතිබීම හා මුදල් ප්‍රවාහ නිවැරදිව හඳුනා නොගැනීම. |
| (ඇ) මුදල් හා බැංකු කටයුතු | ලැබිය යුතු මුදල් කඩිනමින් නිරවුල් කර නොගැනීම. රාජකාරී බැංකු ගිණුම් ආරම්භ කිරීම සඳහා භාණ්ඩාගාරයෙන් අනුමැතිය ලබා නොගැනීම.බැංකු ජංගම ගිණුම් වලට අදාලව මුදල් පොත්වල ශේෂය අයිරාවක් වී තිබීම හා නිකුත් කර කල් ඉකුත් වූ චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබීම. |

| | |
|---|---|
| (ඇ) අත්තිකාරම් කටයුතු | අත්තිකාරම් පියවා නොතිබීම. |
| (ඉ) කාර්ය මණ්ඩල කළමනාකරණය | තනතුරු පුරප්පාඩු පුරවා ගැනීමට කටයුතු නොකිරීම. තනතුරු පුරප්පාඩු සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමැතිය ලබා ගෙන නොතිබීම. |
| (ඊ) අයවැය පාලනය | නිශ්චිත පුරෝකථනයකින් තොරව අයවැය ලේඛන පිළියෙල කිරීම හා අයවැය ගත ඉලක්ක සම්පූර්ණ කර ගැනීම සඳහා පසු විපරම් කටයුතු කර ඒ අනුව අයවැය සංශෝධනය කර ගැනීමට පියවර ගෙන නොතිබීම. |
| (උ) කොන්ත්‍රාත් පරිපාලනය | ගොඩනැගිලි ඉදිකිරීම් වල ගුණාත්මකභාවය සහතික නොකිරීම. |

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති

# 02. විගණකාධිපතිගේ වාර්තාව සඳහා පිළිතුරු

**රුහුණ විශ්වවිද්‍යාලයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(1) උප වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාවෙන් විමසීම් කරන ලද කරුණු හා ඒ සඳහා ලබාදී ඇති පිළිතුරු**

| ඡේද අංකය | විගණකාධිපති විසින් විමසීම් කරන ලද කරුණ | විශ්වවිද්‍යාලය විසින් ලබා දී ඇති පිළිතුර |
|---|---|---|
| | රුහුණ විශ්වවිද්‍යාලයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උප වගන්තිය ප්‍රකාරව විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. විශ්වවිද්‍යාල පනතේ 108(2) උප වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා වෙත 2018 ජූලි 19 දින නිකුත් කරන ලදී. | |
| **1.2** | <u>**මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**</u><br>මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ. | |
| **1.3** | <u>**විගණකගේ වගකීම**</u><br>මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට | |

| ඡේද අංකය | විගණකාධිපති විසින් විමසීම් කරන ලද කරුණු | විශ්වවිද්‍යාලය විසින් ලබා දී ඇති පිළිතුර |
|---|---|---|
| | (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.<br><br>මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට අදාළ වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත්, විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 111 වගන්තිය ප්‍රකාර විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.<br><br>මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. | |
| **1.4** | <u>තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම</u><br>මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. | |

| ඡේද අංකය | විගණකාධිපති විසින් විමසීම් කරන ලද කරුණ | විශ්වවිද්‍යාලය විසින් ලබා දී ඇති පිළිතුර |
|---|---|---|
| **2.** | <u>**මූල්‍ය ප්‍රකාශන**</u> | |
| **2.1** | <u>**තත්ත්වාගණනය කළ මතය**</u><br>මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට රුහුණ විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ. | |
| **2.2** | **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම** | |
| **2.2.1** | <u>**ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**</u><br><br>(අ) <u>**රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02**</u><br>ප්‍රමිතයේ අරමුණු ඡේදය පරිදි මුදලින් ගලා එන ප්‍රභවයන් හා මුදල් වියදම් වූ අයිතමයන් සහ වාර්තා කරන දිනට මුදල් ශේෂයන් පමණක් ඇතුලත් කර මුදල් ප්‍රවාහ ප්‍රකාශන පිළියෙල කළ යුතු වුවද, ඊට පටහැනි ලෙස දේපළ පිරියත අත්පත් කර ගැනීම වෙනුවෙන් සැපයුම්කරුවන්ට ඉදිරියේදී ගෙවිය යුතු රු.45,657,830 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මුදල් ගලායාම් යටතේ දක්වා තිබුණි. | (අ) අදාළ ගැලපීම හේතුවෙන් සමස්ථ මුදල් ප්‍රවාහයට කිසිදු බලපෑමක් සිදුව නොමැති අතර, සැපයුම්කරුවන්ට ගෙවිය යුතු මුදල්හි වෙනස කාරක ප්‍රාග්ධන වෙනස්වීම් යටතේ ගලපා ඇත. විගණනය විසින් පෙන්වා දී ඇති පරිදි අවශ්‍ය ගැලපීම සංශෝධිත මූල්‍ය ප්‍රකාශනයන්හි නිවැරදි කරනු ඇත. |
| | **(ආ)** <u>**ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07**</u><br>පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.<br>(i) වත්කම් හඳුනා ගැනීමේ නිර්ණායක සම්පූර්ණ කර තිබුණු නමුත් 2016 ජූනි 30 දින අවසන් වී තිබුණු 21 වන සියවස සඳහා උසස් අධ්‍යාපන ව්‍යාපෘති (HETC) මඟින් විශ්වවිද්‍යාලයට ලබාදී තිබුණු එකතුව රු.123,325,853 ක් වූ වත්කම් ගිණුම් ගතකර නොතිබුණි.<br>(ii) ප්‍රමිතයේ 55 වන වගන්තිය පරිදි ප්‍රත්‍යාගණනය කරන ලද වත්කමක් ඉවත් කිරීමේදී එම වත්කමට අදාලව හඳුනාගෙන තිබුණු ප්‍රත්‍යාගණන අතිරික්තය සමුච්චිත අතිරික්තය හෝ ඌනතාවයට මාරු කළ යුතුය. එහෙත් 2014 වර්ෂයේදී ප්‍රත්‍යාගණනය කරන ලද රු.2,315,000 ක් වටිනා මෝටර් රථ තුනක් සමාලෝචිත වර්ෂය තුළ ඉවත් කිරීමේදී අදාල මෝටර් රථ | (i) ඉහත වත්කම් විශ්වවිද්‍යාලයට විධිමත් ලෙස භාර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින අතර, විගණනයේ උපදෙස් පරිදි 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයන්හි අවශ්‍ය ගැලපීම් සිදු කරනු ඇත.<br><br>(ii) 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශයන්හි අවශ්‍ය නිවැරදි කිරීම සිදු කරනු ඇත. |

| ඡේද අංකය | විගණකාධිපති විසින් විමසීම් කරන ලද කරුණ | විශ්වවිද්‍යාලය විසින් ලබා දී ඇති පිළිතුර |
|---|---|---|
| | සම්බන්ධයෙන් ප්‍රත්‍යාගණන සංචිතයට මාරු කර තිබුණු රු.2,313,600 ක් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | |
| 2.2.2 | <u>ගිණුම්කරණ අඩුපාඩු</u><br>(අ) Specific Agreement and Research Cooperation between the Swedish International Development Corperation Agency ව්‍යාපෘතිය 2010 දෙසැම්බර් අවසන් වී තිබුණු අතර එම ව්‍යාපෘතියට අයිතිව තිබුණු රු. 6,300,000 ක් වටිනා වෑන් රථය විශ්වවිද්‍යාලය විසින් භාවිතා කරමින් පැවතියද, එය පවරා ගෙන වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාද කටයුතු කර නොතිබුණි. | (අ) 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශණයන්හි අවශ්‍ය ගැලපුම් සිදුකර ඇත. |
| | (ආ) විශ්වවිද්‍යාලය සතු දේපළ වෙනුවෙන් සමාලෝචිත වර්ෂය හා ඊට පෙර වර්ෂ වලට අනුකූල ගෙවිය යුතු වරිපනම් බදු හා අධිභාර ගාස්තු රු. 402,048 ක් සම්බන්ධයෙන් ගිණුම්වල ප්‍රතිපාදන වෙන්කර නොතිබුණි. | (ආ)ගෙවිය යුතු වරිපනම් බදු වෙනුවෙන් ඉදිරි වර්ෂයේ ගිණුම්වල ප්‍රතිපාදන සිදු කරන අතර අධිභාර සම්බන්ධව වෙනම කටයුතු සිදු කරමින් පවතී. 2017.12.31 දක්වා සියලු හිඟ වරිපනම් ගෙවා ඇත. |
| | (ඇ) 2017 වර්ෂයේදී ලැබී තිබූ බාහිර මූල්‍යන පාඨමාලා ආදායම රු.84,399,021ක් තුළ ඉදිරි වර්ෂවලට අදාලව ලැබී තිබූ රු.53,084,777ක් විලම්බිත ආදායම ලෙස ගිණුම්ගත කල යුතු වුවද, රු.31,965,422 ක් පමණක් ගිණුම්ගතකර තිබීම හේතුවෙන් එම ගිණුමේ ශේෂය රු. 21,119,355 ක් අඩුවෙන් සහ සමාලෝචිත වර්ෂයේ ඌනතාවය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | (ඇ)ඔබ ඉදිරිපත් කර ඇති කරුණු නිවැරදිය. විලම්බිත ආදායම් ගිණුමේ ආරම්භක ශේෂය මඟහැර ආදායමට ගැලපීම හේතුවෙන් එම දෝෂය හටගෙන තිබුණි. අදාළ නිවැරදි කිරීම 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශයන්හි සිදු කරනු ඇත. |
| | (ඈ) සමාලෝචිත වර්ෂයේදී විශ්වවිද්‍යාල අරමුදල් වලින් දරන ලද රු. 107,658,030ක් අදාල වත්කම් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට වියදම් නොවූ ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමේ හර ශේෂයක් (Capital Grant Unspent) ලෙස දක්වා තිබුණි. | (ඈ )ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් කරණ ප්‍රමිත අංක 01 වගන්ති 76 ට අනුව ජංගම වත්කමක් හඳුනා ගැනීමේ නිර්ණායක දක්වා ඇත. ඒ අනුව විගණනය විසින් දක්වා ඇති පරිදි ලැබිය යුතු ප්‍රාග්ධන ප්‍රදානයන් ජංගම වත්කමක් ලෙස වාර්තා කිරීම ඉහත ප්‍රමිතයට පටහැනි බව විගණනයේ අවධානයට යොමු කරමි. එසේම ප්‍රවර්තන වර්ෂයේ වැඩිපුර වියදම් වූ ප්‍රාග්ධන ප්‍රතිපාදන ඊළඟ වර්ෂයේ සාමූහික ප්‍රාග්ධන ප්‍රතිපාදන ලැබීමේදී ආවරණය වන හෙයින් විගණනය විසින් පෙන්වා දි ඇති පරිදි ලැබිය යුතු ප්‍රාග්ධන ප්‍රදානය ජංගම වත්කමක් ලෙස වාර්තා කිරීම ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 උල්ලංඝනය කිරීමකි. |

| ඡේද අංකය | විගණකාධිපති විසින් විමසීම් කරන ලද කරුණ | විශ්වවිද්‍යාලය විසින් ලබා දී ඇති පිළිතුර |
|---|---|---|
| | | එසේම විගණනය විසින් පෙන්වා දී ඇති ගිණුම්ගත කිරීමේ ප්‍රතිපත්තිය ප්‍රාග්ධන ව්‍යාපෘතිවල මුළු පිරිවැය ඇස්තමේන්තුව ඉක්මවා (TEC) ප්‍රාග්ධන වියදම් කර ඇති අවස්ථාවන්හිදී පමණක් අදාළ කරගත හැකි බව විගණනයේ අවධානයට යොමු කරමි. විගණනය විසින් පෙන්වා දි ඇති පරිදි වැඩිපුර ගෙවූ ප්‍රාග්ධන ප්‍රතිපාදන සමුච්චිත අරමුදලින් අඩුකර පෙන්වීමක් සිදුකර නොමැති අතර මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ නොගෙවූ ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමෙහි හර ශේෂයක් ලෙස පමණක් දක්වා ඇත. |
| | (ඉ) 2017 අගෝස්තු 16 දින මිලදී ගැනීම් වලට අදාල ඉන්වොයිස් පත්‍රය අනුව රු.3,750,000 ක් වටිනා Automotive Test Bench නැමති උපකරණය 4,162,500 ක් ලෙස ගිණුම් ගත කිරීම නිසා සැපයුම්කරුවන්ට ගෙවියයුතු මුදල හා ජංගම නොවන වත්කම් රු. 412,500 කින් වැඩියෙන් දක්වා තිබුණි. | (ඉ) මෙම රුපියල් 412,500.00 ක මුදල් ශේෂය අදාල භාණ්ඩයේ ගැණුම් වටිනාකමට අදාල එකතු කළ අගය මත බදු (VAT) අගය වේ. |
| **2.2.3** | <u>පැහැදිලි නොකළ වෙනස්කම්</u><br>ගිණුම් විෂයයන් 02 කට අදාලව මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ශේෂයන් හා ඊට අදාළ විස්තරාත්මක උපලේඛනවල දැක්වෙන ශේෂ අතර රු.1,086,681ක වෙනසක් නිරීක්ෂණය විය. | 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශයන්හි අවශ්‍ය ගැලපුම් සිදුකරනු ඇත. |
| **2.2.4** | <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u><br>සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතුව රු. 11,188,851ක් වූ බැංකු ජංගම ගිණුම් 03 කට අදාලව ශේෂ සනාථන සහතික ඉදිරිපත් නොකෙරුණි. | සියළු බැංකු ගිණුම් සම්බන්ධ 2017.12.31 දිනට ශේෂ සනාතන ලිපි සෘජුවම විගණන අංශයට යොමුකරන ලෙස 2017.12.31 දිනැති ලිපියෙන් මහජන බැංකු කළමනාකාරිත්වය හා ලංකා බැංකු කළමනාකාරිත්වය දැනුවත් කර ඇත. ඒ පිළිබඳ මූල්‍ය අංශය වෙත ලද ශේෂ ලිපියේ පිටපතක් විගණනයට ඉදිරිපත් කර ඇත. |
| **2.3** | <u>ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු</u><br>2016 වර්ෂයේ අයවැය යෝජනා අනුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ඉංජිනේරු පීය ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ රුහුණ විශ්වවිද්‍යාලයට රු.මිලියන 150 ක් ලබා දී ඇතත්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතියකින් තොරව එම මුදල රු.මිලියන 33 කින් ඉක්මවා ඉංජිනේරු පීයය | 2016 අයවැය යෝජනා යටතේ ඉංජිනේරු පීඨ ශක්තිමත් කිරීමේ වැඩ සටහනට අනුව රුහුණ විශ්වවිද්‍යාලයට ලද රුපියල් මිලියන 150ට අමතරව තවත් රුපියල් මිලියන 50ක මුදලක් ලබා දීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම වාචිකව එකග වී ප්‍රසම්පාදන කටයුතු සිදු කර ඇති අතර, පසුව එම ප්‍රතිපාදන ලැබී නොමැති බැවින් මෙම තත්වය පැන නැගී ඇත. |

<table>
<tr><th>ඡේද අංකය</th><th>විගණකාධිපති විසින් විමසීම් කරන ලද කරුණ</th><th>විශ්වවිද්‍යාලය විසින් ලබා දී ඇති පිළිතුර</th></tr>
<tr><td></td><td>විසින් ප්‍රාග්ධන වත්කම් මිලදී ගැනීම සඳහා වැයකර තිබුණි.</td><td></td></tr>
<tr><td>2.4</td><td>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්<br>2017 මූල්‍ය ප්‍රකාශන අනුව විශ්වවිද්‍යාලය සමග ඇතිකරගෙන තිබුණු ගිවිසුම් හා බැඳුම්කර කඩකර තිබුණු ආචාර්යවරුන් 18 දෙනෙකුගෙන් වර්ෂ 01 සිට 15 අතර කාලපරිච්ඡේදයකට අයත් රු.20,932,217ක් ලැබිය යුතුව තිබුණි.</td><td>අදාළ ආචාර්යවරුන්ගෙන් ගිවිසුම් හා බැඳුම්කර කඩ කිරීම සම්බන්ධව 2018.09.20 දක්වා රුහුණ විශ්වවිද්‍යාලයේ නීති හා ලේඛන අංශය යටතේ පාලක සභාව විසින් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට අනුමත කර ඇති ලේඛනය ඇමුණුම් 01 මගින් දැක්වේ.</td></tr>
<tr><td>2.5</td><td>නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම
<table>
<tr><th>නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව</th><th>අනුකූල නොවීම</th></tr>
<tr><td>(අ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 135 වන වගන්තිය</td><td>විශ්වවිද්‍යාලය විසින් පවත්වාගෙන යන පශ්චාත් උපාධි පාඨමාලා සඳහා ශිෂ්‍යයන් ඇතුළත් කර ගැනීමට තිබිය යුතු සුදුසුකම් ඇතුළත් කරමින් අතුරු ව්‍යවස්ථා පිළියෙල කර පාලක සභාව මඟින් අනුමත කරගත යුතු වුවද, ආර්ථික විද්‍යා පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සහ ව්‍යාපාර පරිපාලනපති උපාධිය සඳහා ආරම්භයේ සිට එලෙස අතුරු ව්‍යවස්ථා පිළියෙල කරගෙන නොතිබුණි.</td></tr>
</table></td><td>නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම
<table>
<tr><th>නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව</th><th>අනුකූල නොවීම</th></tr>
<tr><td>(අ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 135 වන වගන්තිය</td><td>විශ්වවිද්‍යාලය විසින් පවත්වා ගෙන යනු ලබන සියලු පශ්චාත් උපාධි පාඨමාලා සඳහා 375 වන පාලක සභාව විසින් 2016.03.30 දින සිට ක්‍රියාත්මක වන ලෙස අනුමත කළ අංක 11-2016 අතුරු ව්‍යවස්ථාවක් ඇති අතර එකී අතුරු ව්‍යවස්ථාවේ සඳහන් පරිදි බඳවා ගැනීමට අදාල මූලික නිර්ණායක අනුව වර්තමානයේ සියලු පශ්චාද් උපාධි පාඨමාලාවන්ට සිසුන් බඳවා ගැනීම සිදුකරනු ලබන අතර ව්‍යාපාර පරිපාලනපති උපාධිය සඳහාද 2010 වසරේ අනුමත කළ අතුරු ව්‍යවස්ථාවක් ක්‍රියාත්මකව පවතී.<br><br>SNP/MR/C/රු.වි/17/වි. 10 හා 14 යන විගණන විමසුම් සඳහා 2018.05.15 සහ 2018.10.02 දිනයන්හි විස්තරාත්මක පිළිතුරු ලබා දී ඇති අතර අතුරු ව්‍යවස්ථාවේ පිටපතක්ද ඉදිරිපත් කොට ඇත.</td></tr>
</table></td></tr>
</table>

| ඡේද අංකය | විගණකාධිපති විසින් විමසීම් කරන ලද කරුණ | | විශ්වවිද්‍යාලය විසින් ලබා දී ඇති පිළිතුර | |
|---|---|---|---|---|
| | (ආ) 2006 අංක 06 දරන දේශීයආදායම් පනතේ 116 වන වගන්තිය | (i) විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය සඳහා ගෙවනු ලබන මාසික පරිශ්‍රමික හා දීමනා එකතුව රු.50,000ක් ඉක්මවන විට උපයන විට ගෙවීම් බදු අඩුකර මාසිකව දේශීය ආදායම් කොමසාරිස්වරයා වෙත ප්‍රේෂණය කළ යුතුව තිබුණද, 2017 ජනවාරි සිට ජුලි දක්වා කාලපරිච්ඡේදය තුළ ඇතැම් නිළධාරීන්ගෙන් අඩුවෙන් හා ඇතැම් නිළධාරීන්ගෙන් වැඩියෙන් බදු මුදල් අයකර තිබුණු අතර එම මුදල් පිළිවෙලින් රු.1,236,929 ක් හා රු.419,802 ක් වී තිබුණි. | (ආ) 2006 අංක 06 දරන දේශීයආදාය ම් පනතේ 116 වන වගන්තිය | (i) 2006 අංක 10 දරණ දේශීය ආදායම් පනතට අනුව විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය සඳහා ගෙවනු ලබන මාසික පරිශ්‍රමික හා දීමනාවල එකතුවෙන් උපයනවිට ගෙවීම් බදු අඩුකර දේශීය ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය කර ඇත. මේ පිළිබඳ සවිස්තර තොරතුරු 2017.09.05 සහ 2018.07.19 දාතමින් SNP/MR/රු.වි./17/වි.02 යන විමසුමට එවා ඇති පිළිතුරු මගින් වැඩිදුරටත් විස්තර ලබාදී ඇත. |
| | | (ii) උපයන විට ගෙවීම් ආදායම් බදු චක්‍ර අංක 01 හි 2 (ii) ඡේදය යටතේ නිත්‍ය සේවා නියුක්ති ලාභ යන්නට නිවාස පහසුකම්, වාහන පහසුකම්, වෛද්‍ය බිල්පත්, රක්ෂණ, විදුලිය, දුරකථන බිල් සහ සංග්‍රහ දීමනාද දක්වා තිබුණද නිලධාරීන්ගෙන් අයකළ යුතු උපයන විට ගෙවීම් බදු ගණනය කිරීමේදී ඉහත දීමනා අදාල කරගෙන නොතිබුණි. | | (ii) නිත්‍ය සේවා නියුක්ති ලාභ යටතේ ලබා දී ඇති නිවාසපහසුකම් සඳහා ඒ ඒ නිවාසවල ශ්‍රේණිය අනුව නිවාස කුලී අයකර ඇතතනිකඩ . නිවාස පහසුකම් සඳහා විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් තීරණය කරන ලද රේටයන් මත විදුලිය හා ජල ගාස්තුද ඇතුළත් කුලියක් අයකරනු තනිකඩ නොවන .ලබයි ජල ,නිවාස සඳහා කුලිය විදුලිය ,ගාස්තුගාස්තු වෙන වෙනම අයකරනු ලැබේ. වාහන පහසුකම් සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 2015/13(i)ප්‍රකාරව රුදක්වා බදු -/50,000 . නිදහස් වන අතර ඉතිරිය |

| ඡේද අංකය | විගණකාධිපති විසින් විමසීම් කරන ලද කරුණ | | විශ්වවිද්‍යාලය විසින් ලබා දී ඇති පිළිතුර | |
|---|---|---|---|---|
| | | | | වාහනයට යොදනු ලබන තෙල් සඳහා ප්‍රතිපූරණය .කිරීමකි දූරකථන සහ සංග්‍රහ බිල්පත්ප්‍රතිපූරණ ,ය කිරීමක් වන අතර දීමනාවක් වශයෙන් ගෙවීම් කරනු නොලැබේවෙදා බිල්පත් . සඳහා වාරික ගෙවීම සේවා ,%25 සේවක දායකත්වය බැගින් වන අතර %75 සේවා යෝජක දායකත්ව 43.75 .මුදල රුකි . ලැබෙන ප්‍රතිලාභ ඉතාමත් වසරකට බාහිර ) අවම ප්‍රතිපූරණ සඳහා උපරිම ප්‍රතිලාභ සීමාව රු -/2,000 . මේ .මට්ටමක පවතී (කි සඳහා සවිස්තර තොරතුරු SNP/MR/රු.වි./17/වි.02 දරණ පිළිතුරෙහි දක්වා ඇත. |
| | (ඇ)විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන XX පරිච්ඡේදයේ 3.1හා 3.2 වගන්ති | සෑම උසස් අධ්‍යාපන ආයතනයක් විසින්ම පැමිණීමේ ලේඛනයක් පවත්වාගෙන යා යුතු අතර, අදාල ආයතනයේ සේවයේ නියුක්ත සෑම තැනැත්තෙකුම තම පැමිණීම හා පිටවීම පැමිණීමේ ලේඛනයේ හෝ ඇඟිලි සලකුණු යන්ත්‍රයේ සටහන් කළ යුතුය. කෙසේ වුවද, ඊට අනුකූලව කටයුතු නොකරන ලද අධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 515 කට සමාලෝචිත වර්ෂයේදී වැටුප් හා දීමනා වශයෙන් රු.1,356,629,469 ක් ගෙවා තිබුණි. | (ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන XX පරිච්ඡේද යේ 3.1හා 3.2 වගන්ති | මෙය ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ආරම්භයේ පටන්ම පවතින තත්ත්වයකි. අධ්‍යයන කාර්ය මණ්ඩලය දෛනික කාල සටහනකට අනුව අධ්‍යයන කටයුතු වල නිරතවන අතර ඉගැන්වීම් කටයුතු වලට අමතරව පර්යෙෂණ කටයුතුවලද නිරතව සිටී. මේ පිළිබඳව කතිකාවතක් ඇතිකර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් මේ සම්බන්ධව කිසියම් සුදුසු පියවරක් ගන්නේ නම් ඒ අනුව විශ්වවිද්‍යාලය කටයුතු කිරීමට බැඳී සිටී. |
| | | | (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |

<table>
<tr><th>ඡේද අංකය</th><th>විගණකාධිපති විසින් විමසීම් කරන ලද කරුණ</th><th>විශ්වවිද්‍යාලය විසින් ලබා දී ඇති පිළිතුර</th></tr>
<tr><td></td><td>
<table>
<tr><td colspan="2">(ඇ)ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය</td></tr>
<tr><td>(i) මුදල් රෙගුලාසි 381</td><td>රාජකාරි බැංකු ගිණුමක් ආරම්භ කිරීම සඳහා භාණ්ඩාගාරයෙන් (රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවෙන්) අනුමැතිය ලබාගතයුතු වුවත්, 2017 වර්ෂය තුළ ආරම්භ කර තිබුණු විශ්වවිද්‍යාල රැස්කිරීම් ගිණුම හා Money Market ඉතිරි කිරීමේ ගිණුම සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.<br>විගණන යොමුව - SNP/MR/C/රූ.වි/17/වි.29 - 2018.05.04</td></tr>
</table>
</td><td>
<table>
<tr><td>මුදල් රෙගුලාසි 381</td><td>මුදල් රෙගුලාසි 381 ප්‍රකාරව රාජකාරි බැංකු ගිණුමක් ආරම්භ කිරීමට රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවෙන් ඉල්ලුම් කළ යුතු බව දන්වා තිබුණි. එහෙත් විගණනය විසින් දක්වා ඇති ගිණුම් විශ්වවිද්‍යාලය ලද භාණ්ඩාගාර අරමුදල් පරිහරණය සඳහා භාවිතා කරන රාජකාරි බැංකු ගිණුම් නොවීම හේතුවෙන් භාණ්ඩාගාරයෙන් ගිණුම් ආරම්භ කිරීමට ඉල්ලුම් කර නොතිබුණි.
<table>
<tr><th>ගිණුම</th><th>විස්තරය</th><th>අනුමැතිය</th></tr>
<tr><td>මුදල් වෙළඳ පොල ආයෝජන ඉතුරුම් ගිණුම</td><td>මු.රෙගුලාසි 380 හා 381 හි බැංකු ජංගම ගිණුම් ආරම්භ කිරීම හා පවත්වා ගෙන යාම සම්බන්ධ රෙගුලාසි දක්වා ඇති අතර, ඉතුරුම් ගිණුම් සම්බන්ධයෙන් සඳහන් කර නොමැත. බැංකු ජංගම ගිණුම්වල ශේෂයන් දෛනිකව මුදල් වෙළඳ පොලේ ආයෝජ</td><td>විශ්වවිද්‍යාල පනතේ 45 (15) වගන්තිය ප්‍රකාරව පාලක සභා බලතල යටතේ 370 වැනි පාලක සභාව අනුමැතිය යටතේ ගිණුම් ආරම්භ කර ඇත.</td></tr>
</table>
</td></tr>
</table>
</td></tr>
</table>

| ඡේද අංකය | විගණකාධිපති විසින් විමසීම් කරන ලද කරුණ | | විශ්වවිද්‍යාලය විසින් ලබා දී ඇති පිළිතුර | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | නයට ඇරඹුන ගිණුමකි. | |
| | | | | විශ්වවිද්‍යාල රැස් කිරීමේ ගිණුම | බාහිර මූලායන පාඨමාලා වලින් සිසුන්ගේ ගෙවීම් රැස් කිරීම සඳහා ආරම්භ කර ගිණුමක් වන අතර මුදල් රැස් කිරීම පමණක් මෙම ගිණුම් මගින් සිදුවේ. | 2017 (04) මුදල් අනු කමිටු නිර්දේශය මත ආරම්භ කර ඇත. |
| | (ii)මුදල් රෙගුලාසි 396 (ඇ) | නිකුත් කර මාස 06 කට වඩා වැඩි කාලයක් ඉක්මවා තිබුණද බැංකුවට ඉදිරිපත් කර නොතිබුණු රු.59,702 ක් වූ චෙක්පත් 07 ක් සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | (ii)මුදල් රෙගුලාසි 396 (ඇ) | මේ සම්බන්ධයෙන් මු.රෙ. 396 (ඇ) ප්‍රකාරව අවශ්‍ය කටයුතු කරන අතර ඉදිරියේදී මෙවැනි තත්ත්වයක් ඇති නොවීමට කටයුතු සිදු කරනු ලැබේ. | | |
| | (iii) මුදල් රෙගුලාසි 571 | රඳවා ගැනීම් ගිණුමේ වසර 02 ක් ඉක්මවූ එකතුව රු.23,540,673ක් වූ ශේෂයක් පැවති අතර ඒ පිළිබඳ මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | (iii) මුදල් රෙගුලාසි 571 | විගණනය විසින් පෙන්වා දී ඇති පරිදි මුදල් රෙගුලාසි 571 යටතේ අවශ්‍ය ගැලපුම් කිරීමට අදාල අංශ දැනුවත් කර ඇත. | | |
| | | | (ඉ) 2015 – 09 මුදල් අනුකමිටු තීරණය | පියවිය නොහැකි පුස්තකාල පොත් සහ වාර සඟරා මුදල් සම්බන්ධව 2018.10.09 දින ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක විසින් ලබාදුන් වාර්තාව, මුදල් | | |

| ඡේද අංකය | විගණකාධිපති විසින් විමසීම් කරන ලද කරුණ | | විශ්වවිද්‍යාලය විසින් ලබා දී ඇති පිළිතුර | |
|---|---|---|---|---|
| | (ඉ) 2015 – 09 මුදල් අනුකමිටු තීරණය | 2006 – 2010 දක්වා ඇණවුම් කරන ලද පුස්තකාල පොත්වලට අදාල රු.540,446 ක් වූ නිරවුල් නොකළ පොත් මිලදී ගැනීමේ අත්තිකාරම් සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණක වෙතින් වාර්තාවක් ලබාගෙන මුදල් අනුකමිටු වෙත ඉදිරිපත් කර නොතිබුණි. | | අනු කමිටුවට ඉදිරිපත් කර එහි නිර්දේශ පරිදි ක්‍රියා කිරීමට අපේක්ෂා කරමි. |
| | (ඊ) 2015 ජුලි 14 දිනැති අංක 3/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | අත්තිකාරම් ලබාගන්නා ලද කාර්ය නිම වූ වහාම පියවිය යුතු වුවද සමාලෝචිත වර්ෂයේ ගෙවා තිබුණු පර්යේෂණ අත්තිකාරම් රු. 192,070ක්, මිශ්‍ර අත්තිකාරම් රු. 525,000 ක් බාහිර අරමුදල් අත්තිකාරම් රු.476,818 ක් වශයෙන් එකතුව රු.1,193,888 ක් 2018 මැයි 31 දක්වාම පියවා නොතිබුණි. | (ඊ) 2015 ජුලි 14 දිනැති අංක 3/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | විගණනය විසින් දක්වා ඇති රු.10,000/-ක අත්තිකාරම් මුදල හැර අනෙකුත් අත්තිකාරම් 2018.10.30 දින වන විට පියවා තිබුණු අතර නොපියවූ ශේෂ සම්බන්ධයෙන් අදාල නිලධාරීන් දැනුවත් කර ඇත. |
| | (උ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | වටිනාකම රු. 10,008,259,338 ක් වූ ස්ථාවර වත්කම් (පරිගණක දෘඩාංග හා මෘදුකාංග හැර) සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. | (උ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | රු. 5,333,748,921 ක් වූ වත්කම් සඳහා උපලේඛන (ඉඩම්, ගොඩනැගිලි, මෝටර් රථ) විගණනයට ඉදිරිපත් කර ඇත. අනෙකුත් වත්කම් සඳහා ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කරමින් පවතී. |
| | (ඌ) 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | වටිනාකම රු.307,040,172 ක් වූ පරිගණක දෘඩාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් වෙනමම ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. | (ඌ) 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | එක් එක් අධ්‍යනාංශ විසින් තම අංශයට අදාල පරිගණක සම්බන්ධයෙන් වෙනම වත්කම් ලේඛනයන් පවත්වාගෙන යාම සිදු කරනු ලබයි. |

| ඡේද අංකය | විගණකාධිපති විසින් විමසීම් කරන ලද කරුණ | විශ්වවිද්‍යාලය විසින් ලබා දී ඇති පිළිතුර |
|---|---|---|
| 3 | <u>මූල්‍ය සමාලෝචනය</u> | |
| 3.1 | <u>මූල්‍ය ප්‍රතිඵල</u><br>ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 165,850,112ක ඌණතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.76,040,206 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.89,809,906 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. පුනරාවර්තන වියදම් සඳහා රාජ්‍ය ප්‍රදාන රු. 130,674,145 කින් වැඩි වුවද, සේවක පාරිශ්‍රමික රු. 176,087,719 කින් වැඩිවීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබිණි.<br>සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 හා 2014 වර්ෂ වලදී ඌනතාවයක්ද, 2015 වර්ෂයේදී අතිරික්තයක්ද, 2016 හා 2017 වර්ෂවලදී නැවත ඌනතාවයක්ද ඇති වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, බදු හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂයවීම් නැවත ගැලපීමේදී 2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා දායකත්වය ක්‍රමයෙන් වර්ධනය වී තිබුණි. ඒ අනුව 2016 වර්ෂයේදී රු.2,307,417,826 ක්වූ දායකත්වය සියයට 8 කින් වර්ධනය වී සමාලෝචිත වර්ෂයේදී රු.2,494,042,928 ක් වී තිබුණි. | |
| 3.2 | <u>විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය</u><br>ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචික වර්ෂයේ දී ජංගම අනුපාතය 1:48:1 සිට 0:81:1 දක්වා පිරිහී තිබුණි. | |
| 3.3 | <u>විශ්වවිද්‍යාලයට එරෙහිව හෝ විශ්වවිද්‍යාලය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි</u><br>පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.<br>(අ) සමාලෝචිත වර්ෂයේ අවසානයට විශ්වවිද්‍යාලය විසින් විවිධ පාර්ශවයන්ට එරෙහිව රු.8,409,361 ක් අයකර ගැනීම සඳහා දිසා අධිකරණයේ නඩු 05 ක් ගොනු කරන තිබුණි. | (අ) රුහුණ විශ්වවිද්‍යාලය විසින් ගිවිසුම් හා බැඳුම්කර කඩ කිරීම සම්බන්ධව නඩු 5 ක් පවරා තිබූ අතර මේ වන විට එක් නඩුවක් විභාගයට ගැනීමට දින නියම කර ඇත. එක් නඩුවක සම්පූර්ණ මුදල අධිකරණය ඉදිරියේ විශ්වවිද්‍යාලයට ගෙවා ඇත. තවත් නඩු දෙකක් අධිකරණය ඉදිරියේ සමථයකට පත් වීමෙන් වාරික වශයෙන් ගෙවා ගෙන යනු ලැබේ. (එක් නඩුවක වාරික දහයෙන් 7 ක් ගෙවා ඇති අතර අනෙක් නඩුවේ වාරික දොළහෙන් 6 ක් ගෙවා ඇත) එක් නඩුවක් කාලාවරෝධය මත අධිකරණය මගින් ප්‍රතික්ෂේප කර ඇත. |

| ඡේද අංකය | විගණකාධිපති විසින් විමසීම් කරන ලද කරුණ | විශ්වවිද්‍යාලය විසින් ලබා දී ඇති පිළිතුර |
|---|---|---|
| | (ආ) විශ්වවිද්‍යාලයට එරෙහිව විවිධ පාර්ශවයන් විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු 07 ක්ද, විශ්වවිද්‍යාල අභියාචනා මණ්ඩලයේ පැමිණිලි 09 ක් හා කම්කරු විනිශ්චය සභාවේ පැමිණිලි 08, අභියාචනාධිකරණයේ නඩු 03ක්,මහාධිකරණයේ නඩු 02ක් ද, දිසා අධිකරණයේ හා කම්කරු වන්දි කොමසාරිස් හමුවේ නඩු 01ක් බැගින්ද වශයෙන් ගොනු කරන ලද නඩු 31 ක් පැවතුණු අතර ඉන් එක් නඩුවක් සඳහා ඉල්ලා තිබුණු වන්දි මුදල රු.4,005,977 ක් වූ අතර එය මූල්‍ය ප්‍රකාශනවල සටහන් යටතේ හෙළිදරව්කර නොතිබුණි. | (ආ) ශ්‍රේෂ්ඨාධිකරණයේ පවරා ඇති නඩු 7 න් පහක් තවදුරටත් පවතින අතර 2 ක් විශ්වවිද්‍යාලයට පක්ෂව තීන්දු ලැබී ඇත. එක් නඩුවක රු.4,005,977/- ක මුදල විශ්වවිද්‍යාලය විසින් ගෙවිය යුතු නොවන බව තීරණය කර ඇත. (ගිවිසුමට අදාළ ව පවිත්‍රතා කටයුතු නොකිරීම මත අය කර ගත් මුදල)<br>අභියාචනාධිකරණයේ පවරා ඇති නඩු 3 න් 2 ක් තවදුරටත් පවතින අතර එක් නඩුවක තීන්දුව විශ්වවිද්‍යාලයට පක්ෂව ලැබී ඇත.<br>මහධිකරණයේ පවරා ඇති නඩු 2 න් 1 ක් තවදුරටත් පවතින අතර එක් නඩුවක තීන්දුව විශ්වවිද්‍යාලයට පක්ෂව ලැබී ඇත.<br>දිස්ත්‍රික් අධිකරණයේ පවරා ඇති නඩුව තවදුරටත් පවතිනු ලැබේ.<br>කම්කරු වන්දි කොමසාරිස් ඉදිරියේ පවරා ඇති නඩුවද තවදුරටත් පවතිනු ලැබේ.<br>කම්කරු විනිශ්චය සභාවේ පවරා ඇති නඩු 8 න් 3 ක් තවදුරටත් පවතින අතර නඩු පහක් තීන්දුව විශ්වවිද්‍යාලයට පක්ෂව ලැබී ඇත. (එක් නඩුවක තීන්දුව ලබා දීමට දින නියම කර ඇත.)<br>විශ්වවිද්‍යාල අභියාචනා සේවා මණ්ඩලයේ පවරා ඇති නඩු 9න් 6 ක් තවදුරටත් පවතින අතර ඉන් 2 ක තීන්දුව විශ්වවිද්‍යාලයට පක්ෂ ව ලැබී ඇති අතර එක් නඩුවක තීන්දුව විරුද්ධව ලබා දී ඇත.<br>ඒ අනුව 2017.12.31 දිනට අදාළ නඩු 31න් තවදුරටත් පවතින්නේ නඩු 19ක් බව පෙන්වා දෙමි. |
| 4 | <u>**මෙහෙයුම් සමාලෝචනය**</u> | |
| 4.1 | <u>**කාර්යසාධනය**</u> | |
| 4.1.1 | <u>**සැලසුම් කිරීම**</u><br>පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.<br><br>(අ) අරමුණු ඉටුකර ගැනීම සඳහා විවිධ ක්‍රියාකාරකම් හඳුනාගෙන තිබුණද, ඒවා ඉටුකර ගැනීම සඳහා ඇති අවස්ථාවන් (Opportunities) සහ බාධක (Threats) පිළිබඳ මනා ඇගයීමකට ලක්කර නොතිබුණි. | විශ්වවිද්‍යාලය විසින් සෑම වර්ෂ 05ක කාලසීමාවක් සඳහාම සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබෙන අතර එම සැලැස්ම පිළියෙල කරන විට බාහිර සහ අභ්‍යන්තර පරිසර විශ්ලේෂණ උපකරණයක් ලෙස SWOT විශ්ලේෂණ ක්‍රමය භාවිතා කර ඇත. අදාල උපාය මාර්ගික ඉලක්ක ලගාකර ගැනීම ඇගයීම සඳහා KPI ද නිශ්චය කර ඇත.<br><br>අපේක්ෂිත අරමුණු ඉටුකර ගත් බව ඇගයීමට නිශ්චය කර ඇති KPI අනුව ලගා කර ගත් ප්‍රතිඵල වල උච්චාවචනයන් යම් යම් කාල පරිච්ඡේදයන් තුල නිරීක්ෂණය වන අවස්ථාවලදී එළබෙන |

| ඡේද අංකය | විගණකාධිපති විසින් විමසීම් කරන ලද කරුණ | විශ්වවිද්‍යාලය විසින් ලබා දී ඇති පිළිතුර |
| --- | --- | --- |
| | | වර්ෂයන්හි ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීමේදී ඒ පිළිබඳ අවධානය යොමු කරයි. |
| | (ආ) කාලීනව ලගා කර ගත යුතු ඉලක්කයන් (Target) ස්ථාපිත කිරීම හා එම ඉලක්කයන් සපුරා ගැනීමේ වගකීම මෙහෙයුම් මට්ටම දක්වා තර්කානුකූල පදනමකින් බෙදා හැර නොතිබුණි. | උපාය මාර්ගික සැලැස්ම පිළියෙල කිරීමෙන් අනතුරුව ඊට සමගාමීව පිළියෙල කරන ක්‍රියාකාරී සැලැස්ම මෙහෙයුම් මට්ටම දක්වා ව්‍යාප්ත කර ඇත. |
| | (ඇ) 2017 හා 2018 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලසුම් 2017 නොවැම්බර් 06 දින විගණනය සඳහා ඉදිරිපත්කර තිබුණද 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය ප්‍රකාරව පහත සඳහන් කරුණු ඇතුළත් කර එම වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් පිළියෙල කර නොතිබුණි.<br>(අ) ආයතනයේ සංවිධාන ව්‍යුහය,අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර.<br>(ආ) අදාල වර්ෂය සඳහා අයවැය ලේඛනය<br>(ඇ) වාර්ෂික අයවැය පදනම් කරගත් ප්‍රමුඛතා අනුව සකස් කළ ක්‍රියාකාරකම්.<br>(ඈ) ප්‍රසම්පාදන සැලැස්ම.<br>(ඉ) අභ්‍යන්තර විගණන සැලැස්ම. | නිරීක්ෂණ හා එකඟ වේ. 2019 වර්ෂයේ සිට ක්‍රියාකාරී සැලසුම් ඉහත චක්‍ර ලේඛ ප්‍රකාරව පිළියෙල කිරීමට අවශ්‍ය කටයුතු පිළියෙල කරමින් පවතී. |
| **4.1.2** | <u>**ක්‍රියාකාරිත්වය හා සමාලෝචනය**</u><br><br>විශ්වවිද්‍යාලයේ අරමුණු ඉටු කර ගැනීම සම්බන්ධයෙන් පහත දැක්වෙන නිරීක්ෂණ කරනු ලැබේ.<br>(අ) 2018 වර්ෂය වන විට විශ්වවිද්‍යාලයට ඇතුළත් කර ගන්නා මුළු සිසුන් සංඛ්‍යාව 1,860 සිට 2,340 ක් දක්වා වැඩිකර ගැනීමට සැලසුම් කර තිබුණි. නමුත් පීඨ 06 ක් සඳහා සැලසුම් කර තිබුණු සිසුන් සංඛ්‍යාවට වඩා එකතුව සිසුන් 339 ක් අඩුවෙන් ඇතුළත් කර ගෙන තිබුණි. | (අ) පීඨ 04 කට ඇතුළත් කර ගන්නා ලද සිසුන් සංඛ්‍යාව සංයුක්ත සැලැස්මේ සඳහන් අවම සිසුන් සංඛ්‍යාවට වඩා ඉතා සුළු වශයෙන් අඩුවී ඇති බව පිළිගන්නා අතර පීඨ 03 ක් සඳහා අතිරික්ත සිසුන් ප්‍රමාණයක් ඇතුළත් කර ගැනීමට ද කටයුතු කර ඇති බව සඳහන් කරමි. එමෙන්ම අනෙකුත් පීඨ සඳහාද අවම අපේක්ෂිත සිසුන් සංඛ්‍යාව ඇතුළත් කර ගැනීමට කටයුතු කර ඇත. |
| | (ආ) 2017 වර්ෂය වන විට උපාධි ලබා ගැනීමෙන් මාස 06 ක් තුළ සමස්ත උපාධිධාරීන්ගේ (වෛද්‍ය උපාධිධාරීන් හැර) රැකියා නියුක්තිභාවය සියයට 85ක් දක්වා වර්ධනය කරගැනීම ඉලක්ක කරගෙන තිබුණද, ඉංජිනේරු උපාධිධාරීන් හැර අනෙකුත් සියලුම උපාධිධාරීන්ගේ රැකියා නියුක්තිභාවය සියයට 85 කට පහළ | (ආ) මේ සඳහා තොරතුරු ලබා ගන්නේ අවසාන විභාගය පවත්වා මාස 06කට අඩු කාලයක් තුළ පවත්වනු ලබන උපාධි ප්‍රදානෝත්සවයට සමගාමීව පවත්වනු ලබන නිසා මෙම කෙටි කාලය තුල ඇතැම් උපාධි පාඨමාලාවන් හදාරණු ලැබූ උපාධිධාරීන් රැකියාවක නියුක්ත වීමට යම් කාලපරාසයක් ගතවන බැවින් උපාධිලාභීන්ගේ රැකියා වියුක්තභාවය |

| ඡේද අංකය | විගණකාධිපති විසින් විමසීම් කරන ලද කරුණ | විශ්වවිද්‍යාලය විසින් ලබා දී ඇති පිළිතුර |
|---|---|---|
| | මට්ටමක වී තිබුණි. ඒ අතරින් කලා උපාධිධාරීන්ගේ රැකියා නියුක්තිභාවය සියයට 37 ක් තරම් පහළ මට්ටමක විය. | නිරීක්ෂණය වන නිසා මෙම තත්ත්වය වලක්වා ගැනීමට වඩාත් නිවැරදි සංඛ්‍යා ලේඛන ලබාගැනීමේ ක්‍රමවේදයක් පිළියෙල කිරීම සඳහා විශ්වවිද්‍යාලය අවධානය යොමුකර ඇත. |
| | (ඇ) විශ්වවිද්‍යාලය ලෝක ශ්‍රේණිගත කිරීම් ලැයිස්තවේ (Times Higher Educational and QS Ranking list) මුල් 2000 අතරට ගෙන ඒමට සැලසුම් කර තිබුණද එකී අරමුණ ඉටුකර ගැනීමට නොහැකිව තිබුණි. වෙබෝමෙට්‍රික්ස් ශ්‍රේණිගත කිරීම්වලට අනුව රුහුණ විශ්වවිද්‍යාලය දේශීය ශ්‍රේණිගත කිරීම් ලැයිස්තුවේ 2017 වර්ෂයේ 5 වන ස්ථානය හිමි කරගෙන තිබුණි. | (ඇ) මෙම ශ්‍රේණිගත කිරීම අනුව අපේක්ෂිත ස්ථානය වෙත ලඟාවීමට නොහැකි වී ඇතත් මීට සමාන වෙනත් ශ්‍රේණිගත කිරීම් වලින් ඉහළ ස්ථානයක මෙම විශ්වවිද්‍යාලය පවතින බව සඳහන් කරමි.<br>මීට අමතරව පසුගිය COPE කමිටුව ලබාදී ඇති නිර්දේශයන්ද සැලකිල්ලට ගනිමින් ලංකාවේ විශ්වවිද්‍යාල සඳහා සුදුසු ශ්‍රේණිගත කිරීමේ ක්‍රමයක් හඳුන්වා දීම සඳහා මූලික කටයුතු ආරම්භ කර ඇත. |
| | (ඈ) (i) කෘෂිකර්ම පීඨයේ පශ්චාත් උපාධි පාඨමාලා හදාරන ශිෂ්‍ය සංඛ්‍යාව වාර්ෂිකව සියයට 5 කින් වැඩිකර ගැනීමට අපේක්ෂා කර තිබුණද පීඨය හඳුන්වා දී තිබුණු පශ්චාත් උපාධි පාඨමාලා 07 න් පාඨමාලා 06 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විට ක්‍රියාත්මක වී නොතිබිණි. ක්‍රියාත්මකව තිබුණු Msc in crop production පාඨමාලාව සඳහාද 2015 වර්ෂයෙන් පසු සිසුන් ඇතුළත් කරගෙන නොතිබිණි. | (ඈ) 2014 – 2018 උපාය මාර්ගික සැලැස්මෙහි 1.5 අරමුණ යටතේ පශ්චාත් උපාධි සඳහා නව ශිෂ්‍ය බඳවා ගැනීම් වාර්ෂිකව 5%කින් වැඩි කර ගැනීමට අපේක්ෂා කර ඇත. ඒ අනුව පසුගිය වසර කිහිපය තුළ විශ්වවිද්‍යාලය විසින් නව පශ්චාත් උපාධි පාඨමාලා කිහිපයක් (Master of Peace & Development Studies, Master of Business Management, Master of Engineering, Master of Science in Engineering වැනි) ආරම්භ කර ඇති අතර නව පාඨාමාලා කිහිපයක් (Master of Arts in Development Planning වැනි) ආරම්භ කිරීමට සැලසුම් කරමින් පවතී. නිරීක්ෂිත පරිදි කෘෂිකර්ම අධ්‍යයන මණ්ඩලයට අදාළව ක්‍රියාත්මක වන පාඨමාලා 05ක් (Master of Science in Agricultural Economic `& Development, Master of Science in Agricultural Economics & Resource Management, Master of Science in Agribusiness Management, Master of Science in Green Technology & Master of Science in Crop Protection Technology)<br>සඳහා නව ශිෂ්‍ය කණ්ඩායමේ බඳවා ගැනීමට පුවත්පත් දැන්වීම් වලින් අයදුම්පත් කැඳවා ඇත. නමුත් Master of Science in Crop Protection Technology පාඨමාලාව සඳහා පමණක් ප්‍රමාණවත් අයදුම්පත් සංඛ්‍යාවක් ලැබී ඇති අතර එකී පාඨමාලාව නුදුරු අනාගතයේදී අගෝස්තු මස මුල ආරම්භ |

| ඡේද අංකය | විගණකාධිපති විසින් විමසීම් කරන ලද කරුණ | විශ්වවිද්‍යාලය විසින් ලබා දී ඇති පිළිතුර |
|---|---|---|
| | | කෙරෙනු ඇත. අනෙකුත් පාඨමාලා කිසිවක් සඳහා ප්‍රමාණවත් අයදුම්පත් සංඛ්‍යාවක් නොමැති බැවින් අදාළ පාඨමාලා ආරම්භ කිරීමට නොහැකි වී ඇත. මෙම සියලු පාඨමාලා ඉතා සීමිත විභව වෙළඳපොළක් පදනම් කර ගත් පාඨමාලා වන අතර සේවා අවශ්‍යතාවය මත එකී අදාළතාවය ඇති ඉතා සීමිත පිරිසක් මෙම පාඨමාලා පිළිබඳ අවධානය යොමු කරනු ලබයි. කෙසේ නමුත් විශ්වවිද්‍යාලයට සිය අරමුදල් (භාණ්ඩාගාර අරමුදල්) මගින් පුළුල් වෙළඳපොළ ප්‍රචාරණයක් සිදු කළ හැකි නම් සමහර විටක ප්‍රමාණවත් සිසු පිරිසක් ආකර්ෂණය කර ගැනීමට හැකිවනු ඇත. විගණනය විසින් ඒ සඳහා එකඟතාවය පළ කරයි නම් නියමු ව්‍යාපෘතියක් ලෙස එක් පාඨමාලාවක් සඳහා හෝ එවන් ප්‍රචාරණ කටයුත්තක් සිදු කල හැකි වනු ඇත. |
| | (ii) දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය මඟින් පරිපාලන කටයුතු සිදුකරනු ලබන සහතික පත්‍ර පාඨමාලා 04 ක් කෘෂිකර්ම පීඨය සඳහා හඳුන්වා දී තිබුණ ද එම පාඨමාලා 04 ම ආරම්භ කිරීමට 2017 වර්ෂය අවසානය දක්වා කටයුතු කර නොතිබුණි. | (ii) ශිෂ්‍ය ලියාපදිංචිය අවම වීම නිසා නව ශිෂ්‍ය කණ්ඩායම් බඳවා ගැනීමට නොහැක වී ඇත. සමස්ථයක් ලෙස නව ශිෂ්‍ය බඳවා ගැනීම් ප්‍රමාණවත් ලෙස වැඩි කර ගැනීමට විශ්වවිද්‍යාලයට හැකි වී ඇත. |
| | (ඉ)(i) යාන්ත්‍රික හා නිෂ්පාදන ඉංජිනේරු අධ්‍යයනාංශය සඳහා අමතර සිසුන් 25 බඳවා ගැනීමට සැලසුම් කර තිබුණත් එය ක්‍රියාත්මක වී නොතිබුණි. | (ඉ)(i) දැනට තීරණය කොට ඇති සිසුන් 225ට අමතරව තවත් සිසුන් 25ක් වැඩි පුර පීඨය වෙත බඳවා ගැනීම සඳහා පීඨ මණ්ඩලය විසින් කල නිර්දේශය සඳහා සනාතන සභාවේ සහ පාලක සභාවේ අනුමැතිය ලැබී ඇති අතර එය ඉදිරි කටයුතු සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත මේ වන විට ඉදිපත් කර ඇත. ඒ අනුව 2018 වර්ෂය සඳහා සිසුන් 250ක් ඉංජිනේරු පීඨය වෙත බඳවා ගැනීමට අපේක්ෂා කෙරේ. |
| | (ii) ඉංජිනේරු පීඨයේ ආචාර්ය මණ්ඩලයේ තිදෙනෙකු 2017 වර්ෂය තුළදී දර්ශණපති උපාධිය (PHD) සම්පූර්ණ කිරීමට ඉලක්ක කර තිබුණත් ආචාර්යවරුන් දෙදෙනෙකු අදාළ ඉලක්කය සම්පූර්ණ කර ගෙන නොතිබුණි. | (ii) පීඨයේ එක් ආචාර්යවරයකු දර්ශණපති (PHD) නිබන්ධනය සම්පූර්ණ කර 2017 වර්ෂයේදී ඉදිරිපත් කර ඇති අතර අනෙක් ආචාර්යවරුන් දෙදෙනාට දර්ශනපති නිබන්ධන 2017 වසරේදී සම්පූර්ණ කිරීමට නොහැකි වී ඇත. |
| | (ඊ) උපාධි පාඨමාලා ක් සඳහා ඇතුළත් කර 11 1090 ගත හැකිව තිබුණු සිසුන් සංඛ්‍යාව ක් වී තිබුණද සත්‍ය වශයෙන් එකී පාඨමාලා 11 | (ඊ) විශ්වවිද්‍යාල සඳහා සිසුන් ලියාපදිංචිය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් ජාතික ප්‍රතිපත්තියක් මත සිදු කර, එම සිසුන් |

<table>
<tr><th>ඡේද අංකය</th><th>විගණකාධිපති විසින් විමසීම් කරන ලද කරුණ</th><th>විශ්වවිද්‍යාලය විසින් ලබා දී ඇති පිළිතුර</th></tr>
<tr><td></td><td>සඳහා ඇතුළත් කර ගෙන තිබුනේ සිසුන් ඒ අනුව විශ්වවිද්‍යාල .ක් පමණි 1009යට සුදුසුකම් ලබා තිබුණු තවත් සිසුන් කට 81 විශ්වවිද්‍යාලයට ඇතුළත් වීමේ අවස්ථාව .අහිමි වී ගොස් තිබුණි</td><td>ඇතුළත් කර ගැනීම සඳහා අදාළ ශිෂ්‍ය නාම ලේඛන විශ්වවිද්‍යාලය වෙත යොමු කරනු ලබන බව දන්වා සිටිමි.එලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලියාපදිංචිව, රුහුණ විශ්වවිද්‍යාලය වෙත යොමු කරන ලද ශිෂ්‍ය ශිෂ්‍යාවන් සියළුදෙනා විශ්වවිද්‍යාලය විසින් ඇතුළත් කර ගැනීමට අවශ්‍ය සියළු කටයුතු සිදු කර ඇති බව සඳහන් කරමි.</td></tr>
<tr><td></td><td>(උ). පෙර වර්ෂයේ කළමනාකරණ හා මූල්‍ය පීඨයේ සිසුන් 36 ක් අසමත්වී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ සිසුන් 122 ක් අසමත්වී තිබුණි. එය විභාගයට පෙනීසිටි මුළු සිසුන්ගෙන් සියයට 35 ක ඉහළ අසතුටුදායක ප්‍රතිශතයක් විය.</td><td>(උ) කළමනාකරණ හා මූල්‍ය පීඨය මගින් එහි සියලු විභාගයන් පවත්වනු ලබන්නේ නිසි ක්‍රමවේදයක් අනුගමනය කරමින් සකසන ලද විභාග පරිපාටියට අනුව වන අතර එම විභාගයනට අදාල ප්‍රතිඵලද නිකුත් කරනුයේ ඊට අනුගත වන පරිදි වේ.</td></tr>
<tr><td></td><td>(ඌ) මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ පෙර වර්ෂයේ සිසුන් 54 ක් උපාධි පරීක්ෂණය අසමත්වී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ අසමත් සිසුන් සංඛ්‍යාව 97 ක් දක්වා ඉහල ගොස් තිබූ අතර එය විභාගයට පෙනී සිටි සංඛ්‍යාවෙන් සියයට18ක ප්‍රතිශතයක් විය.</td><td>(ඌ) මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයේ උපාධි පරීක්ෂණයට පෙනී සිටින සිසුන් සංඛ්‍යාවට පෙර වර්ෂවල විභාගය අසමත් වන සිසුන් ද අන්තර්ගත වේ. මීට අමතරව සිසුන්ගේ වෛද්‍ය හේතූන්, ආර්ථික අපහසුතා සහ වෙනත් කරුණු නිසා උපාධි පරීක්ෂණ අසමත් වීමේ ප්‍රතිශතය ඉහළ යයි</td></tr>
<tr><td></td><td>(එ). වෛද්‍ය උපාධිය සඳහා උපාධි පරීක්ෂණයට පෙනී සිටි සංඛ්‍යාවෙන් 22 ක් අසමත් හෝ ඌණ සමාර්ථ ලබා තිබුණි. එය විභාගයට පෙනීසිටි සංඛ්‍යාවෙන් සියයට 30 ක ප්‍රතිශතයක් විය.</td><td>(එ).
<table>
<tr><th>විභාගය</th><th>උපාධි පාඨමාලාව</th><th>2017 වර්ෂය තුළ උපාධි පරීක්ෂණයට පෙනී සිටි සිසුන් සංඛ්‍යාව</th><th>2017 වර්ෂය තුළ උපාධි පරීක්ෂණය සමත් සිසුන් සංඛ්‍යාව</th><th>උපාධි පරීක්ෂණය අසමත් /ඌණ සාමාර්ථ ලද සිසුන් සංඛ්‍යාව</th></tr>
<tr><td rowspan="2">2017 මැයි ($1^{st}$ repeat)</td><td rowspan="2">වෛද්‍ය</td><td rowspan="2">54</td><td rowspan="2">36</td><td>අසමත් නැත. වෛද්‍ය සහතික 1</td></tr>
<tr><td>ඌණ සාමාර්ථ 17</td></tr>
<tr><td rowspan="2">2017 නොවැම්බර් ($2^{nd}$ repeat)</td><td rowspan="2">වෛද්‍ය</td><td rowspan="2">19</td><td rowspan="2">15</td><td>අසමත් නැත.</td></tr>
<tr><td>ඌණ සාමාර්ථ 4</td></tr>
<tr><td>2016 නොවැම්බර් Proper</td><td>වෛද්‍ය</td><td>135</td><td>92</td><td>ඌණ සාමාර්ථ 39 අසමත් 4</td></tr>
</table></td></tr>
</table>

| ඡේද අංකය | විගණකාධිපති විසින් විමසීම් කරන ලද කරුණ | විශ්වවිද්‍යාලය විසින් ලබා දී ඇති පිළිතුර |
|---|---|---|
| | | මේ අනුව සමස්ථ ශිෂ්‍ය කණ්ඩායම් සැලකීමේදී අසමත් ප්‍රතිශතය<br>= 4/135 x 100 = 2.9%<br>ඒ අනුව විභාගයට පෙනී සිටි සංඛ්‍යාවෙන් 30%ක ප්‍රතිශතයක් අසමත් ලෙස සටහන් වුවද, පළමුවර (Proper) පෙනී සිටි සිසුන් සැලකීමේදී සිසුන් 39ක් ඌණ සාමාර්ථ ලබාගෙන ඇති අතර (එනම් ඔවුන් අදාළ විෂයයන්ගෙන් එකක් හෝ දෙකක් පමණක් අසමත් ව ඇත.). ඔවුන් සඳහා පුනර් පරීක්ෂණ පවත්වා ඇත. |
| **4.2** | <u>**කළමණාකරණ ක්‍රියාකාරකම්**</u> | |
| | <u>**කළමනාකරණ අකාර්යක්ෂමතා**</u><br>(අ) 2010 දෙසැම්බර් 31 දින අවසන් වී තිබුණු Specific Agreement on Research Co-operation Between the Swedish International Development Co-operation Agency ව්‍යාපෘතිය යටතේ භාවිතා කළ වත්කම් ලැයිස්තුවක් පිළියෙළ කර එම වත්කම් විධිමත් පරිදි ධීවර, සාගර විද්‍යා හා තාක්ෂණ පීඨයේ පීඨාධිපති වෙත භාරදිය යුතුව තිබුණද සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාම එම කටයුතු සිදුකර නොතිබුණු අතර ඒ සම්බන්ධයෙන් පසු විපරම් කිරීමක්ද කර නොතිබුණි. | (අ) 2018.04.02 දිනැති ලිපිය මගින් SIDA/ SAREC ව්‍යාපෘතියේ සම්බන්ධිකාරක ලෙස කටයුතු කළ මහාචාර්ය පී.ආර්.ටී. කුමාරණතුංග මිය විසින් අදාල ව්‍යාපෘතියේ වත්කම් ධීවර සහ සාගර විද්‍යා හා තාක්ෂණ පීඨයේ පීඨාධිපති වෙත භාරදී ඇති බව දන්වා ඇත. |
| | (ආ) විශ්වවිද්‍යාලයට අයත් වරිපනම් බදු ගෙවන දේපළ 11 ක් සඳහා සමාලෝචිත වර්ෂය දක්වාම වරිපනම් බදු ඒවායේ මුල් අයිතිකරුවන්ගේ නමින් ගෙවා තිබුණු අතර එම දේපළවල අයිතිය විශ්වවිද්‍යාලය නමට පවරා ගැනීමට සහ විශ්වවිද්‍යාලය නමින් වරිපනම් බිල්පත් සංශෝධනය කරවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | (ආ) මේ සම්බන්ධව අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතී. |
| | (ඇ) කෘෂිකර්ම පීඨයේ ඉගෙනුම ලබන 830 ක් වූ සියලු සිසුන් පරිගණක හා තොරතුරු තාක්ෂණය විෂයයක් වශයෙන් හදාරනු ලැබුවද පරිගණක විද්‍යාගාර 2 කින් සමන්විත පරිගණක ඒකකයේ සිසුන්ගේ පරිහරණය සඳහා ක්‍රියාකාරි තත්ත්වයේ තිබුණු පරිගණක 06 ක් පමණක් විය. පරිගණක 19 ක් ක්‍රියාවිරහිත තත්ත්වයේ පැවතුණි. | (ඇ) දැනට කෘෂිකර්ම පීඨයේ පරිගණක විද්‍යාගාරයෙහි සිසුන්ගේ පරිහරණය සඳහා පරිගණක 75ක් පමණ පවතින අතර පරිගණක 05 පමණ ප්‍රමාණයක් වරින් වර පරිගණක විද්‍යාගාරයක් තුල ක්‍රියා විරහිතව පවතී. එම ක්‍රියාවිරහිත පරිගණක අලුත්වැඩියා කිරීමෙන් පසු භාවිතයට ගත හැකි තත්ත්වයේ පවතින බැවින් එම පරිගණක අලුත්වැඩියා කිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. |

| ඡේද අංකය | විගණකාධිපති විසින් විමසීම් කරන ලද කරුණ | විශ්වවිද්‍යාලය විසින් ලබා දී ඇති පිළිතුර |
|---|---|---|
| | (ඈ) විශ්වවිද්‍යාල ගම්මාන වැඩසටහන් ව්‍යාපෘතිය සඳහා මුළු පිරිවැය ලෙස රු.මිලියන 2,512.8 ක් ඇස්තමේන්තු කර තිබුණු අතර 2017 අයවැය ලේඛනයෙන් රු.මිලියන 50 ක මූල්‍ය ප්‍රතිපාදන වෙන්කර තිබුණි. එහෙත් එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබූ අතර මූල්‍ය ප්‍රතිපාදනවලින් රු.මිලියන 40ක් වැඩසටහනේ අරමුණුවලට අනුකූල නොවන පීඨ හා පරිපාලන අංශවල ප්‍රාග්ධන වත්කම් මිලදී ගැනීම සඳහා වෙන් කිරීමට 2017 ජූලි 10 දිනැති 370 වන පාලක සභා රැස්වීමේදී තීරණය කර තිබුණි. | (ඈ) විශ්වවිද්‍යාලය තුළ ක්‍රියාත්මක වන ව්‍යාපෘති සියල්ල සඳහා එකතුවක් ලෙස ප්‍රතිපාදන ලබා දෙන අතර එක් එක් ව්‍යාපෘතිය සඳහා වෙන් වෙන් වශයෙන් නිශ්චය කොට ප්‍රතිපාදන ලබා දීමක් සිදු නොකරයි. අවශ්‍යතාවය පාලක සභාවේ අනුමැතිය පරිදි පමණක් මෙම ප්‍රතිපාදන නැවත වෙන් කිරීම් (Reallocation) සිදුකර ඇත. |
| | (ඉ) හොංකොං දේශයේ International Economic Development and Research Center ආයතනයෙහි පවත්වා තිබුණු සම්මන්ත්‍රණයකට පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කර තිබුණු සිසුන් 04 දෙනෙකුට එම සම්මන්ත්‍රණයට සහභාගී වීමට විශ්වවිද්‍යාලය විසින් එක් සිසුවෙකුට රු. 100,000 ක් බැගින් එකතුව රු.400,000 ක් උපකුලපති අරමුදලින් ගෙවා තිබුණි. විදේශගත වීම සඳහා සිසුන්ට උපදෙස් හා නිසි මඟපෙන්වීමක් විශ්වවිද්‍යාලය විසින් ලබා නොදීම හේතුවෙන් වීසා ලබා ගැනීමට නොහැකි වීම මත සම්මන්ත්‍රණයට සහභාගී වීමට තිබුණු වටිනා අවස්ථාව මඟ හැරී ගොස් තිබුණි. ඒ අනුව එක් සිසුවෙකුගෙන් රු.50,000 ක් බැගින් එකතුව රු. 200,000 ක් නැවත අයකර ගෙන තිබුණද විශ්වවිද්‍යාලය විසින් ගෙවා තිබුණු රු.200,000ක් මුදල ආර්ථික නොවූ ගණුදෙනුවක් වී තිබුණි. | (අ) මේ සඳහා භූගෝල විද්‍යා අධ්‍යයනාංශ ප්‍රධාන ඇතුළු ආචාර්යවරුන් විසින් සිසුනට අවශ්‍ය මඟ පෙන්වීම කලද ඔවුන් සතුව ප්‍රමාණවත් මුදල් නොතිබීම හේතුවෙන් නිසි කලට වීසා ලබා ගැනීමට නොහැකි වී ඇත. |
| | (ඊ) 2018 අගෝස්තු 02 දිනට එකතුව එකතුව රු.275,166,473ක් වූ නිරීක්ෂණ ඇතුළත් විගණන විමසුම් 04කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. | (ඊ) 2017 වර්ෂය සඳහා විගණන විමසුම් 42ක් නිකුත් කර තිබූ අතර එම විමසුම් 42 සඳහාම පිළිතුරු 2018 ඔක්තෝම්බර් 02 දින වන විට රජයේ විගණන අංශය වෙත යොමුකර ඇත. |
| | (උ) ව්‍යාපාර පරිපාලනපති පශ්චාත් උපාධි පාඨමාලාව හදාරන ලද 37 දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට එකතුව රු.3,003,300ක් වූ උපාධි පාඨමාලා ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබූ අතර මින් 15 දෙනෙකුගේ උපාධි සහතික පත්‍ර නිකුත් කර තිබුණි. | (උ) ව්‍යාපාර පරිපාලනපති උපාධි පාඨමාලාවට අදාළව ගාස්තු ගෙවා නැති බවට සඳහන් කර ඇති 37 දෙනා අතරින් කොටසක් පාඨමාලාව අතර මඟ නතර කර දමා ඇති අතර ඇතමෙක් පාඨමාලාවට අදාළ නිබන්ධනය භාරදීමට අසමත්ව ඇත. තවත් කිහිප දෙනෙක් මේ වන විටත් සම්පූර්ණ ගාස්තුව ගෙවා අවසන් කර ඇත. කෙසේ වුවද මෙම නාමලේඛනයෙහි සඳහන් 37 දෙනා පිළිබඳව තවදුරටත් තොරතුරු සොයා බලමින් සිටී. |

| ඡේද අංකය | විගණකාධිපති විසින් විමසීම් කරන ලද කරුණ | විශ්වවිද්‍යාලය විසින් ලබා දී ඇති පිළිතුර |
|---|---|---|
| | (ඌ) දීර්ඝ කාලයක සිට පැවත එන නොගෙවූ ශිෂ්‍යාධාර හා මහපොළ ගිණුම්වල 2017 වර්ෂයේ ආරම්භක ශේෂ පිළිවෙලින් රු.12,264,450 ක් හා රු. 2,087,500 ක් වී තිබුණු අතර එම ශේෂ හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | (ඌ) නොගෙවූ ශිෂ්‍යාධාර ශේෂය 2016 සිට 2017 වර්ෂය දක්වා වැඩිවීමේ ප්‍රතිශතය 1.2% ක් වූ අතර එය ශිෂ්‍යයන් සඳහා නොගෙවූ ශිෂ්‍යාධාර සංඛ්‍යාව වැඩිවීම හේතුවෙන් වර්ධනය වී ඇත.<br><br>නොගෙවූ මහපොල වෛද්‍ය පීය සිසුන් වෙත පෙබරවාරි සහ මාර්තු මාස සඳහා ගෙවීමට සූදානම් කරන ලද මහපොල වාරිකයන් අත්හිටවීම හේතුවෙන් රු. 617,400.00 න් 989,800.00 ක් වූ එම චෙක්පත් ලදුපත් අංක R20669 මගින් නොගෙවූ මහපොල ගිණුමට බැර කිරීම හේතුවෙන් නොගෙවූ මහපොල ශේෂය වර්ධනය වී ඇත. මෙම මුදල විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ප්‍රතිපූරණය කිරීම සිදුකර නොමැති හෙයින්,මෙම ශේෂයන් එම ගිණුමෙන් ඉවත්කර වැය විෂයට මාරුකර සංශෝධිත මූල්‍ය ප්‍රකාශණයන්හි ගැලපීම සිදුකර ඇත. |
| **4.3** | <u>**මෙහෙයුම් අකාර්යක්ෂමතා**</u><br><br>සම සෞඛ්‍ය පීඨයට අදාල හෙද උපාධි පාඨමාලාව 2008 වර්ෂයේදී ආරම්භ කර මේ වන විට සිසුන් කණ්ඩායම් 04ක එකතුව සිසුන් 145ක් උපාධිය සම්පූර්ණ කර පිටවී ගොස් තිබුණි. ඔවුන්ට වෘත්තීය පිළිගැනීම සඳහා අත්‍යාවශ්‍ය වූ ශ්‍රී ලංකා හෙද සභාවේ ලියාපදිංචි සහතිකය (Accreditation) පාඨමාලාව සඳහා ලබා ගැනීමට 2017 වර්ෂය අවසානය දක්වා නොහැකි වී තිබුණි. | සම සෞඛ්‍ය පීඨයේ හෙද උපාධි පාඨමාලාවට අදාලව ශ්‍රී ලංකා හෙද සභාවේ ලියාපදිංචිය ලබා ගැනීමට සම සෞඛ්‍ය පීඨය මේ වන විට කටයුතු කරමින් පවතී. පසුගිය වසර කිහිපය තුලදී උක්ත හෙද පාඨමාලාව සඳහා හෙද සභාවේ ලියාපදිංචිය ලබා ගැනීමට පෙර එකී පාඨමාලාවේ සම්බන්ධිකාරක සහ දැනට එකී අධ්‍යයනාංශ ප්‍රධානි කටයුතු කර ඇති අතර රේඛීය අමාත්‍යාංශයේ සෘජු මැදිහත්වීම ද මේ සඳහා මේ වන විට ලැබී ඇති නිසා නුදුරු අනාගතයේදී එකී ලියාපදිංචිය ලබාගත හැකි වෙතැයි පීඨය බලාපොරොත්තු වේ. |
| **4.4** | <u>**මතභේදයට තුඩුදෙන ගනුදෙනු**</u><br><br>(අ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 24 (ඇ) සහ 27 (1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාල සඳහා පීඨයක් හෝ පීඨ පැවරුම් කිරීමේ බලය අමාත්‍යවරයා සතු වුවද, ඊට අනුකූල නොවන ලෙස රුහුණ විශ්වවිද්‍යාලයට පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය පැවරීම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සිදුකර තිබූ අතර කොමිෂන් සභාවට එවැනි බලයක් තිබේද යන්න තහවුරු වන සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | (අ) 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනත යටතේ නව පීඨයක් ස්ථාපනය සඳහා වන ගැසට් නිවේදනය නිකුත් කිරීම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ කාර්යභාරයක් වන අතර එකී කාර්ය මග හැරීම පිළිබඳව කොමිෂන් සභාව දැනුවත් කර අදාළ ගැසට් නිවේදනය නිකුත් කිරීමට මේ වන විට කටයුතු සිදු කරමින් පවතී. |

| ඡේද අංකය | විගණකාධිපති විසින් විමසීම් කරන ලද කරුණ | විශ්වවිද්‍යාලය විසින් ලබා දී ඇති පිළිතුර |
|---|---|---|
| | (ආ) 1985 අංක 07 දරන විශ්වවිද්‍යාල (සංශෝධිත) පනතේ 28 වන වගන්තිය මඟින් සංශෝධිත 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 48 (අ) 2 උපවගන්තිය ප්‍රකාරව පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයක ව්‍යුහය, බලතල, කාර්යය හා කර්තව්‍යය සහ ඒ පීඨයේ පීඨාධිපතිවරයා පත් කිරීම හෝ තෝරා පත් කර ගැනීම සඳහා වූ කාර්යය පරිපාටිය කොමිෂන් සභාව විසින් නියමාවලි මඟින් නිශ්චය කරනු ලැබිය යුතුව තිබුණි. නමුත් රුහුණ විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය සඳහා එලෙස නියම කරන ලද නියමාවලියක් 2018 මැයි 31 දක්වා සකස් කර නොතිබුණි. | (ආ) 1985 අංක 7 දරණ විශ්වවිද්‍යාල සංශෝධිත පනත යටතේ නිකුත් කළ 1987 අංක 7 දරණ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨ නියමාවලිය යටතේ පීඨය ස්ථාපනය කර ඇත. |
| | (ඇ) ව්‍යාපාර පරිපාලනපති උපාධිය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.<br><br>(i) ව්‍යාපාර පරිපාලනපති උපාධිය සඳහා අයදුම්කරුවන් ඇතුළත් කර ගැනීමට පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය තුළ පොදු අතුරු ව්‍යවස්ථාවක් පිලියෙළ කර තිබුණ ද, 2017 වර්ෂය අවසානය දක්වාම ඒ සඳහා පාලක සභාවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 45 (2) උප වගන්තිය ප්‍රකාරව අතුරු ව්‍යවස්ථාව සකස්කිරීමේ බලය පාලක සභාවට පවරා ඇති බැවින් ව්‍යාපාර පරිපාලනපති උපාධිය සඳහා බල පවත්වන පීඨය විසින් සකස් කර තිබුණු පොදු අතුරු ව්‍යවස්ථාව සම්පූර්ණයෙන් පිළිගත හැකි ව්‍යවස්ථාවක්ද යන්න මතභේදයට තුඩුදෙන කරුණක් විය. | (i) 375 වන පාලක සභාව විසින් 2016.03.30 දින සිට ක්‍රියාත්මක වන ලෙස අනුමත කළ අංක 11-2016 අතුරු ව්‍යවස්ථාව රුහුණ විශ්වවිද්‍යාලීය පශ්චාද් උපාධි පීඨයේ සියලු පාඨමාලා සඳහා අදාළ වේ. |
| | (ii) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 46 (6) (VIII) උපවගන්තිය ප්‍රකාරව අධ්‍යයන පාඨමාලාවලට අයදුම්කරුවන් ඇතුළත් කර ගැනීම සඳහා තිබිය යුතු සුදුසුකම් පාලක සභාව වෙත නිර්දේශ කිරීමේ බලය සනාතන සභාව සතු වුවත්, ඊට අනුකූල නොවන පරිදි 2017 අප්‍රේල් 05 දින පවත්වන ලද 36 වන කළමනාකරණ හා මූල්‍ය පීඨයේ අධ්‍යයන මණ්ඩල සැසිය (BOS) තුලදී ව්‍යාපාර පරිපාලනපති උපාධිය සඳහා ඇතුළත් වීමට අවශ්‍ය සුදුසුකම් නිර්ණය කර තිබුණි. | (ii) කළමනාකරණ හා මූල්‍ය අධ්‍යයන මණ්ඩලය විසින් නිර්දේශ කරන ලද ව්‍යාපාර පරිපාලනාධිපති උපාධි පාඨමාලාව සඳහා අදාළ විකල්ප බඳවා ගැනීමේ සුදුසුකම් පශ්චාද් උපාධි අධ්‍යයන මණ්ඩල නිර්දේශය මත 2018 මැයි මස 30 දින පැවති 326 වන සනාතන සභාව විසින් අනුමත කර ඇත. |

| ඡේද අංකය | විගණකාධිපති විසින් විමසීම් කරන ලද කරුණ | විශ්වවිද්‍යාලය විසින් ලබා දී ඇති පිළිතුර |
|---|---|---|
| | (iii) නිර්ණය කර තිබුණු සුදුසුකම්වල අංක 03 යටතේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ශිල්පීය ආයතනයේ විභාග උසස් මට්ටමෙන් සම්පූර්ණ කිරීම ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි පූර්ණ සාමාජිකත්වය සමග සමාන සුදුසුකම් ලෙස සලකා ව්‍යාපාර පරිපාලනපති පශ්චාත් උපාධි අධ්‍යයන පාඨමාලාව සඳහා අයදුම් කිරීමට සුදුසුකමක් ලෙස පීඨ අධ්‍යයන මණ්ඩලය විසින් තීරණය කර තිබූ නමුත් එය තාර්කික නොවන බව විගණනයේදී නිරීක්ෂණය විය. | (iii) පශ්චාත් උපාධි පාඨමාලවක ප්‍රමිතිය තීරණය කරන එකම සාධකය පාඨමාලාවක සිසුන් බඳවා ගනු ලබන සුදුසුකම් නොවේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය වැනි වෘත්තිය ආයතන අනුගමනය කරනු ලබන ක්‍රමවේද සෘජුවම විශ්වවිද්‍යාලයට අනුයුක්ත කර ගත නොහැකිය. එසේ වුවද, පෙර සඳහන් කළ පරිදි පශ්වාද් උපාධි නවක බඳවා ගැනීම් සුදුසුකම් පිළිබඳව නැවත සමාලෝචනයක් මේ දිනවල අදාළ අධ්‍යයන මණ්ඩලවල සිදු කරමින් පවති. |
| | (ඇ) ඉංජිනේරු පීඨය විසින් පෞද්ගලික ආයතනයකින් ගලිබවුසර් සේවාව ලබාගෙන එක් ගමන් වාරයකට රු.8,500 බැගින් ගමන් වාර 57 ක් සඳහා රු.484,500ක් ගෙවීම් කර තිබුණි. ආරක්ෂක අංශයේ තිබුණු වාහන පැමිණීමේ පිටවීමේ ලේඛනය අනුව කිලෝමීටර් 25 ක පමණ දුරක් අපද්‍රව්‍ය ප්‍රවාහනය කිරීමට හා අපද්‍රව්‍ය පැටවීමට හා බැමට ගතකර තිබුණු සාමාන්‍ය කාලය විනාඩි 38ක් තරම් පිළිගත නොහැකි කෙටි කාලයන් වී තිබුණි. ඒ අනුව අදාල ගෙවීම් කිරීමට ප්‍රථම එහි නිවැරදිභාවය තහවුරු කරගෙන නොතිබුණු බැවින් මෙම ගෙවීම මතභේදයට තුඩුදෙන්නකි. | (ඇ) මේ පිලිබඳව මේ වන විට අභ්‍යන්තර විගණන අංශය මගින් පරීක්ෂණයක් පැවැත්වේ. එම වාර්තාව අනුව ඉදිරියේදී කටයුතු කරනු ඇත. |
| **4.5** | <u>**නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිත වත්කම්**</u><br>පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ<br><br>(අ) වෛද්‍ය පීඨයට අයත් ඖෂධවේදී උපාධි පාඨමාලා මධ්‍යස්ථානයේ පරිගණක විද්‍යාගාරය සඳහා Dell වර්ගයේ පරිගණක 20 ක් 2011 මැයි 31 දින ලබාදී තිබුණි. ඉහත පරිගණක 20 න් 7 ක් පරිගණක විද්‍යාගාරය තුළ දීර්ඝ කාලයක සිට අක්‍රියව තිබුණු අතර තවත් පරිගණක 06 ක් අළුත්වැඩියා කටයුතු සඳහා 2017 පෙබරවාරි 23 දින වෛද්‍ය පීඨයට යවා තිබුණද 2017 ඔක්තෝබර් 11 විගණන දිනය දක්වාද නැවත ලැබී නොතිබුණි. | (අ) 2011 වසරේ සිට ඖෂධවේදී උපාධි පාඨමාලාවට ප්‍රමාණවත් අන්තර්ජාල පහසුකම් ලබාදීම ප්‍රමාදවීම නිසා එම පරිගණක දැනට දේශන ශාලා සහ කාර්යාල කටයුතු සඳහා භාවිතා කෙරේ.<br><br>මේ වන විට මෙම උපාධි පාඨමාලාව හා අනිකුත් සම සෞඛ්‍ය පාඨමාලා වෙනම පීඨයන් ලෙස ස්ථාපනය කර ඇති අතර මේවන විට ශිෂ්‍ය අවශ්‍යතා සලකා අන්තර්ජාල පහසුකම් සැපයීමට පියවර ගනිමින් ඇත.<br><br>ඖෂධවේදී උපාධි පාඨමාලාවට අයත් ක්‍රියාවිරහිත වූ පරිගණක වෛද්‍ය පීඨය වෙත යොමුකර ඒවා අදාළ කාර්මික |

| ඡේද අංකය | විගණකාධිපති විසින් විමසීම් කරන ලද කරුණ | විශ්වවිද්‍යාලය විසින් ලබා දී ඇති පිළිතුර |
|---|---|---|
| | | නිලධාරී මහතා විසින් පරීක්ෂාකර අලුත්වැඩියා කිරීම හෝ අදාළ නිර්දේශ ලබාගනු ලබන අතර ඒ මහතාගේ කාර්ය බහුලතාවය නිසා එම කටයුතු ප්‍රමාද විය. සම සෞඛ්‍ය පීඨය වෙනම පීඨයක් ලෙස මේ වනවිට ස්ථාපිත කර ඇත. එබැවින් ඉහත ප්‍රමාදයන් ඉදිරියේදී වැලැක්වීමට පියවර ගනු ලැබේ. |
| | (ආ) 2016 දෙසැම්බර් 31 දින වෛද්‍ය පීඨයට අයත් හෙද උපාධි පාඨමාලාව සඳහා රු.495,600 ක් වටිනා HP වර්ගයේ Laptop පරිගණක 07 ක් ලබා දී තිබුණද විගණන දිනය වූ 2018 ජුනි 30 දක්වාම ඉන් පරිගණක 05 ක් අදාල මෘදුකාංග ඇතුළත් කර භාවිතයට ගෙන නොතිබුණි. | **(ආ)** 2016.12.31 දින හෙද උපාධි අංශයට මිලදී ගත් ලැප්ටොප් පරිගණක යන්ත්‍ර 05ක් විගණන දිනය වනවිට මෘදුකාංග ඇතුළත් කිරීමට නොහැකි වූයේ පහත සඳහන් කරුණු නිසාය.<br><br>මෙම ලැප්ටොප් පරිගණක යන්ත්‍ර මිලදී ගෙන ඇත්තේ සිසුන්ගේ දේශන කටයුතු සඳහා වන අතර ලැප්ටොප් යන්ත්‍ර මල්ටිමීඩියා යන්ත්‍ර සමඟ සම්බන්ධ කරන HDMI VGA connector ලැප්ටොප් මිලදී ගත් ආයතනයෙන් ලැබී නොතිබිණි. එම නිසා හෙද උපාධි අංශයෙන් HDMI VGA connector 2017.05.08 දින ඇණවුම් කරනු ලැබුවද එය ලැබීමේ ප්‍රමාදයක් පැවතුණි.<br><br>තව ද හෙද උපාධි අංශය මුහුද ආශ්‍රිත ලවණ පරිසර සාධකයන්ගේ සිදුවන ප්‍රශ්න මින් බලපාන බැවින් ලැප්ටොප් යන්ත්‍ර වලට HDMI VGA connector ලැබෙන තුරු මෘදුකාංග ඇතුළත් නොකරන ලදී.<br><br>මෙම ලැප්ටොප් යන්ත්‍රවල ආයතන වගකීම් සහතිකය වන්නේ එම ලැප්ටොප්වල අලවා ඇති ස්ටිකරය යි. වගකීම් කාලය 2016.12.31 සිට 2019.12.30 දින දක්වා සඳහන් ලේබලය සෑම ලැප්ටොප් යන්ත්‍රයකම පිටුපස අලවා ඇත. |
| **4.6** | <u>**කාර්ය මණ්ඩල පරිපාලනය**</u><br>පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.<br><br>**(අ) <u>අධ්‍යයන කාර්ය මණ්ඩලය</u>**<br>(i) ඉංජිනේරු පීඨයට අනුමත මහාචාර්ය තනතුරු 04 ම පුරප්පාඩු වී පැවතුණි. | <br><br><br>(i) සෑම වසරකම මෙම විශ්වවිද්‍යාලයේ පවතින පුරප්පාඩු සඳහා වසරකට දෙතුන් වතාවක් අයදුම්පත් කැඳවනු ලබයි. මෙම 2018 වසරේද පෙබරවාරි මස පීඨවල පවතින සියලුම පුරප්පාඩු සඳහා පුවත් පත් දැන්වීමක් මගින් අයදුම්පත් කැඳවන ලදී. එසේ වුවද ඉංජිනේරු |

| ඡේද අංකය | විගණකාධිපති විසින් විමසීම් කරන ලද කරුණ | විශ්වවිද්‍යාලය විසින් ලබා දී ඇති පිළිතුර |
|---|---|---|
| | | පීඨයේ මහාචාර්ය තනතුරට අදාල පුරප්පාඩුව සඳහා කිසිවෙකු අයදුම් කර නොතිබිණි. මේ හේතුවෙන් ඉංජිනේරු පීඨයට අනුමත මහාචාර්ය තනතුරු 04 ම මේ වන තෙක් පුරප්පාඩුව පවතී. |
| | (ii) විශ්වවිද්‍යාලයට අයත් පීඨ 09 හි කථිකාචාර්ය තනතුරු පුරප්පාඩු 188 ක් පැවතුණි. ඉන් වෛද්‍ය, ඉංජිනේරු සහ විද්‍යා යන පීඨවල පුරප්පාඩු ප්‍රමාණය පිළිවෙළින් 42 ක් , 25 ක් හා 33 ක් තරම් ඉහළ අගයන් ගෙන තිබුණි. 2018 මැයි 31 දක්වාද මෙම පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණි. | (ii) මෙම පීඨවල පවතින සියලුම පුරප්පාඩු සඳහාද 2018 පෙබරවාරි මස පළ කරන ලද පුවත්පත් දැන්වීම මගින් අයදුම්පත් කැඳවා ඇත. මෙම අයදුම්පත් සඳහා සම්මුඛ පරීක්ෂණවලට කැඳවීමට අදාල මූලික කටයුතු සිදුවෙමින් පවතින අතර මූලික කටයුතු අවසන් කර ඇති සමහර පීඨයන්හි අයදුම්පත් සඳහා මෙම මස සිට සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට කටයුතු යොදා ඇත.<br><br>විශේෂයෙන් 2017 වර්ෂයට අදාලව අලුතින් කාර්ය මණ්ඩල ප්‍රතිපාදන ලැබීම සමහර ආචාර්යභවතුන් සේවයෙන් විශ්‍රාම යාම සේවයෙන් ඉල්ලා අස්වීම හේතුවෙන් සහ ඉංජිනේරු පීඨයට බඳවා ගන්නා ආචාර්ය භවතුන් සේවයෙන් ඉල්ලා අස්වීම හේතුවෙන් මෙසේ පුරප්පාඩු සංඛ්‍යාව ඉහළ යාමට හේතු වී ඇත. |
| | (ආ) <u>අනධ්‍යයන කාර්ය මණ්ඩලය</u><br>පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.<br><br>(i) 2010 නොවැම්බර් 04 දින සිට පුරප්පාඩු වී පවතින මූල්‍යාධිකාරි තනතුර සඳහා අවස්ථා 10කදී අයදුම්පත් කැඳවා තිබුණි. සුදුසුකම් සම්පූර්ණ කර තිබුණු අයදුම්කරුවන් තිදෙනෙකු සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීමට මාස 06 සිට 08 දක්වා කාලයක් ප්‍රමාද වීම හේතුවෙන් එම තිදෙනාම සම්මුඛ පරීක්ෂණ සඳහා පැමිණි නොතිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාද පුරප්පාඩුව පුරවා ගැනීමට නොහැකිව තිබුණි. | <br><br><br>(i) මේ වන විට මූල්‍යාධිකාරි තනතුර සඳහා අයදුම්පත් කැඳවා ඇති අතර සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට කටයුතු කෙරෙමින් පවතී. |
| | (ii) වැඩ ඉංජිනේරු තනතුරු 02ක 2010 වර්ෂයේ සිට පුරප්පාඩු පැවති අතර ඒ සඳහා අවස්ථා 07 කදී අයදුම්පත් කැඳවා තිබුණද, 2018 මැයි 31 දින වන විටත් අවශ්‍ය බඳවා ගැනීම් කිරීමට නොහැකිව තිබුණි. | (ii) මේ වනවිට මෙම පුරප්පාඩු පිරවීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග සිදුකරමින් පවතී. |

| ඡේද අංකය | විගණකාධිපති විසින් විමසීම් කරන ලද කරුණ | විශ්වවිද්‍යාලය විසින් ලබා දී ඇති පිළිතුර |
|---|---|---|
| | (iii) අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ මාණ්ඩලික තනතුරු 10 ක, මාණ්ඩලික නොවන තනතුරු 45 ක, සුළු සේවක තනතුරු 63 ක පුරප්පාඩු පැවතුනි. නමුත් මෙම පුරප්පාඩු පිරවීම සඳහා කටයුතු කර නොතිබුණි. | (iii) 2013 වර්ෂයේ අනුමත ඇස්තමේන්තුවෙහි සඳහන් තනතුරු පුරප්පාඩු 64 ක් සඳහා බඳවා ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමැතිය ලබා දී නොතිබුණි. එසේ වුවද 2017 වර්ෂයේ නිකුත් වූ නව තනතුරු ඇස්තමේන්තුව මගින් එම තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කිරීමට අනුමැතිය ලබා දී ඇත.<br><br>තනතුරු පුරප්පාඩු වෙනුවෙන් අභ්‍යන්තරව, බාහිරව පුවත්පත් මගින් සහ නාමලේඛන මගින් බඳවා ගැනීමේ කටයුතු අඛණ්ඩව සිදු කරන අතර, තනතුරු කිහිපයක් වෙනුවෙන් බඳවා ගැනීමේ කටයුතු මේ වනවිට අවසන් කර ඇත. |
| | (iv) අංශය 03ක පමණක් සේවය කර තිබුණු ලිපිකාර හා සමාන්තර ශ්‍රේණිවල කාර්ය මණ්ඩල සංඛ්‍යාව 278 ක් වූ අතර එහි 20 දෙනෙකු වසර 05 සිට වසර 20 කට වැඩි කාලයක් එකම අංශයක සේවය කර තිබුණි. | (iv) විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලය ඒ ඒ අංශයන්ගේ අවශ්‍යතාවය හා විශ්වවිද්‍යාලයේ අංශ තුළ කටයුතු සිදු කිරීමේදී රහස්‍යභාවය සලකා බලා අනුයුක්ත කර ඇත. එහෙත් ඕනෑම නිලධාරියෙකුට ස්ථාන මාරුවීම් ලබාගැනීම සඳහා අවස්ථාව ලබා දී ඇත. එසේ ස්ථාන මාරුවීම් අයදුම් කරන නිලධාරීන් වෙත සුදුසු පරිදි ස්ථාන මාරුවීම් ලබාදෙනු ලැබේ. |
| | (v) විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර ආරක්ෂක අංශයේ කාර්ය මණ්ඩලය 124 ක් වූ අතර තථ්‍ය සංඛ්‍යාව 94 ක් විය. ඒ අනුව පුරප්පාඩු සංඛ්‍යාව 30 ක් වූ අතර එම පුරප්පාඩු සඳහා බඳවා නොගෙන 2017 ජනවාරි සිට පෞද්ගලික ආරක්ෂක සේවකයින් 65 දෙනෙකුගේ සේවය ලබාගෙන තිබුණි. එය පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයකටද වැඩි විය. එම පෞද්ගලික ආරක්ෂක සේවය සඳහා 2017 ජනවාරි සිට ජූලි දක්වා පමණක් රු.14,322,710 ක් ගෙවා තිබියදී විශ්වවිද්‍යාලයේ ආරක්ෂක නිලධාරීන්ටද අතිකාල ලෙස එම කාල පරිච්ඡේදයටම රු.7,484,926 ක් ගෙවා තිබුණි. ඒ අනුව විශ්වවිද්‍යාලය ආරක්ෂක සේවාවන් ලබා ගැනීමේදී ආර්ථිකමය ආකාරයට කටයුතු කර නොතිබුණි. | (v) විශ්වවිද්‍යාලයේ පීඨ සංඛ්‍යාව පුළුල් වීමත් සමගම විශාල භූමි ප්‍රදේශයක ආරක්ෂාව සම්බන්ධයෙන් වගකීම ආරක්ෂක අංශය සතු විය. එක් එක් පීඨයන් දුරස්ථව පිහිටීම නිසාත් එම පීඨයන් සතුව විශාල භූමි ප්‍රදේශක් හා දේපළ ආවරණය වන පරිදි ආරක්ෂක වැඩ පිළිවෙල සකස් කළ යුතු විය. ඒ අනුව අවශ්‍ය ප්‍රමාණයට අභ්‍යන්තර ආරක්ෂක නිළධාරීන් විශ්වවිද්‍යාලය සතු ව නොසිටීම හේතුවෙන් පෞද්ගලික ආරක්ෂක අංශයන්හි සේවාව ලබා ගන්නා ලදී.<br><br>එසේම අභ්‍යන්තර ආරක්ෂක සේවකයින් සේවා මුර ක්‍රමය යටතේ සේවයේ යෙදවීමේදී නිවාඩු ලබා ගන්නා සේවකයින් සඳහා වෙනත් සේවකයින් රාජකාරිවල යෙදවීමත් සලකා බලන ලද කාල පරිච්ඡේදය තුළ රජයේ නිවාඩු දින විශාල සංඛ්‍යාවක් පැවතීමත් හේතුවෙන් අතිකාල සේවයේ යොදවා ආරක්ෂක කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට විශ්වවිද්‍යාලයට සිදුවිය. |

| ඡේද අංකය | විගණකාධිපති විසින් විමසීම් කරන ලද කරුණ | විශ්වවිද්‍යාලය විසින් ලබා දී ඇති පිළිතුර |
|---|---|---|
| 5 | <u>තිරසර සංවර්ධනය</u> | |
| 5.1 | <u>තිරසාර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීම</u><br>තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව රුහුණ විශ්වවිද්‍යාලය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී තිබුණි.<br><br>(අ) ඉහත පරිදි වසර 2030 න්‍යාය පත්‍රය පිළිබඳව දැනුවත්වීම මත විශ්වවිද්‍යාලය විසින් සිය විෂය පථයට අනුව ළඟා කර ගත යුතු අරමුණු හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. එසේ හෙයින් ඒ හා සම්බන්ධවන ඉලක්ක, පාදක දත්ත, ඉලක්ක ළඟා විය යුතු සංධිස්ථානයන් මෙන්ම ප්‍රගතිය මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.<br><br>(ආ) තිරසාර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීමට සූදානම්වීමේදී අනෙකුත් ආයතන සමඟ මනා සම්බන්ධීකරණයක් නොකිරීම හේතුවෙන් ඉලක්ක ගත අරමුණු කර ළඟාවීමට සැලසුම් සකස් කිරීමේ හා පෙර සූදානම්වීමේ ක්‍රියාවලිය ඉතා මන්දගාමී හෝ දුර්වල තත්ත්වයක පැවති බව නිරීක්ෂණය විය. | (අ) සහ (ආ)<br>තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රය 2030ට අනුව තිරසාර සංවර්ධනය සඳහා ලඟාකර ගත යුතු අරමුණු 17ක් දක්වා ඇත. එම අරමුණු අතරින් අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාල අංක 04 ඇමුණුම යටතේ මූලික වශයෙන් ගුණාත්මක තත්ත්වය වැඩිකිරීම හා ප්‍රවේශවීමේ අවස්ථාවන් පුළුල් කිරීම් (Quality Accessibility) ආමන්ත්‍රණය කර ඇත. එම අරමුණු දැනටමත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා උපායමාර්ගික සැලැස්මේ මෙන්ම විශ්වවිද්‍යාලයේ සංයුක්ත සැලැස්මට ඇතුලත් කර ඇති අතර අපේක්ෂිත ඉලක්ක වලට ලගාවීම් සාර්ථකත්වය මැන බැලීමට දර්ශකයන්ද (KPI) නිශ්චය කර ඒ පිළිබඳව කටයුතු කරමින් පවතී. |
| 6 | <u>ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය</u> | |
| 6.1 | <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u><br><br>2017 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 පෙබරවාරි 28 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණද, වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් විගණකාධිපති විසින් නිකුත් කර තිබුණු 2017 දෙසැම්බර් 29 දිනැති හා අංක විලේ/පොදු/2017/142 දරන ලිපිය පරිදි මූල්‍ය ප්‍රකාශන සමඟ අවශ්‍ය උපලේඛන සහ උපයෝගී ලේඛන එදිනම විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. ඒ අනුව උපලේඛන සමඟ මූල්‍ය | වර්ෂයන්හිදි විගණකාධිපති දෙපාර්තමේන්තුව වෙත මූල්‍ය ප්‍රකාශණ කට්ටලය පමණක් භාර දී ඇති අතර උපලේඛන පිළිබඳ විමසීමක් නොකරන ලදි. මේ වර්ෂයේද ප්‍රධාන කාර්යාලය වෙත 2018 පෙබරවාරි 28 දින වන විට මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කරන ලදි. ඉදිරි වර්ෂයන්හිදී උපලේඛන පිටපත්ද සහිතව මූල්‍ය ප්‍රකාශණ ප්‍රධාන කාර්යාලය වෙත ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ඇත. |

| ඡේද අංකය | විගණකාධිපති විසින් විමසීම් කරන ලද කරුණ | විශ්වවිද්‍යාලය විසින් ලබා දී ඇති පිළිතුර |
|---|---|---|
| | ප්‍රකාශන විධිමත් පරිදි 2018 අප්‍රේල් 11 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. | |
| **6.2** | <u>අභ්‍යන්තර විගණනය</u><br><br>කාර්ය මණ්ඩලය 07 කින් යුත් අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් සිදුකෙරේ.<br><br>(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 133 (2) ප්‍රකාරව අභ්‍යන්තර විගණන ඒකකවල කාර්යයන් සහ ඒවායේ විෂයය ආවරණය වන ආකාරයට විශ්වවිද්‍යාලයේ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි. | (අ) විගණන නිරීක්ෂණ හා එකඟ නොවේ. අභ්‍යන්තර විගණන අංශය විසින් 2017 වර්ෂයට අදාලව සිදුකර ඇති කාර්යයන් පිළිබඳ වාර්තාවක් 2018.06.05 දින රජයේ විගණන අංශය වෙත භාරදී ඇති අතර එම වාර්තාව තුළ අඩංගු කරුණු හා විෂය පථය ගුණාත්මක ලෙස සලකා බැලීමේදී විගණන නිරීක්ෂනයෙහි සඳහන් තත්ත්වයක් නිරීක්ෂණය නොවේ. |
| | (ආ) මුදල් රෙගුලාසි 134 (3) පරිදි විශ්වවිද්‍යාලයේ මුදල් කටයුතුවලට අදාල අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත යැවිය යුතු වුවද, එසේ කටයුතු කර නොතිබුණි | (ආ) 2017 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන වාර්තා 03ක් නිකුත් කර ඇති අතර එම වාර්තා 03 මේ වන විට විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත. තවද උපකුලපතිතුමාගේ නියෝග පරිදි විශේෂ විගණන වාර්තා 07ක් පිළියෙල කර උපකුලපතිතුමාට භාරදී ඇත. එම වාර්තා පදනම් කර ගනිමින් විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ උපදෙස් මත නීති හා ලේඛන අංශය මගින් යම් යම් ක්‍රියාමාර්ග ආරම්භ කර ඇත. එම ක්‍රියාවලීන්ට බාධාවක් ඇති නොවන පරිදි එම වාර්තා රජයේ විගණන අංශය වෙත ලබාදීමට කටයුතු කරනු ඇත. |
| **6.3** | <u>**ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය**</u> | |
| **6.3.1** | <u>**ප්‍රසම්පාදනය**</u><br>පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.<br>(අ) කෘෂිකර්ම පීඨය හා වෛද්‍ය පීඨය සඳහා භාණ්ඩ මිලදී ගැනීම වෙනුවෙන් පිළිවෙලින් රු.මිලියන 96 ක් හා රු.මිලියන 22ක් ප්‍රසම්පාදන සැලැසුමට ඇතුළත් කර තිබුණද ප්‍රතිපාදන වෙන්කර තිබුණේ රු.මිලියන 08 ක් හා මිලියන 12ක් පමණක් වන අතර තත්‍ය වියදම රු. මිලියන 07 ක් හා රු.මිලියන 11ක් පමණක් වී ඇත. | (අ) ප්‍රසම්පාදන සැලසුම් පීඨයන්හි සියළු අවශ්‍යතාවයන් මත පදනම්ව පිළියෙල කිරීම සිදු කරණු ලබයි. එහෙත් වාර්ෂික අයවැයෙන් අත්පත්කර ගැනීම් උදෙසා වෙන් කරන ලද ප්‍රතිපාදන, ප්‍රසම්පාදන සැලැස්මේ අවශ්‍යතාවයන්ට ප්‍රමාණවත් නොවන අතර, වෙන් කරන ලද ප්‍රතිපාදන අනුව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සංශෝධනයට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. |

| ඡේද අංකය | විගණකාධිපති විසින් විමසීම් කරන ලද කරුණ | විශ්වවිද්‍යාලය විසින් ලබා දී ඇති පිළිතුර |
| --- | --- | --- |
| | (ආ) විශ්වවිද්‍යාලය සඳහා පොදුවේ ආපන ශාලා වලට සුදුසු මේස හා පුටු මාදිලිය නිර්ණය කිරීමෙන් තොරව ඉංජිනේරු පීඨයේ ආපනශාලා අංක 01 සඳහා රු. 2,375,923 ක් වැය කර මිල අධික දැව මේස හා බංකු මිලදීගෙන තිබුණු අතර අංක 02 ආපනශාලාවට ඉහත මිල ගණන් වලට වඩා අඩු වටිනාකම් සහිත ෆයිබර් වර්ගයේ මේස හා පුටමිලදී ගෙන තිබුණි. තවද ඉහත මිලදී ගැනීමත් සමඟ අංක 01 ආපනශාලාවට 2013 වර්ෂයේදී මිලදීගෙන තිබුණු රු. 95,200 ක් වූ හොඳ තත්ත්වයේ තිබුණු මේස 10 ක් ඉවත් කිරීමට සිදුවී තිබුණි. | (ආ)තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශය පරිදි ඉංජිනේරු පීඨයේ අංක 01 දරණ ආපන ශාලාව සඳහා තේක්ක වලින් සෑදූ මේස සහ පුටු යෙදවීමට තීරණය කරන ලද අතර, එහිදී මෙතෙක් ආපන ශාලා අංක 01 හි හොඳ තත්වයේ තිබූ මේස 10ක් අවශ්‍යතාවය පරිදි කාන්තා සහ පිරිමි නේවාසිකාගාර වලට හා අනෙකුත් පීඨවල අවශ්‍යතාවයන් මත ලබා දීමට තීරණය කරන ලදී. |
| | (ඇ) කෘෂි පීඨයේ 2017 වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ප්‍රසම්පාදන සැලසුමට අනුව Desktop පරිගණක 60 ක්, Laptop පරිගණක 60 ක් Scanner 01 ක් හා UPS 10ක් මිලදී ගැනීම සඳහා සැලසුම් කර තිබුණද සමාලෝචිත වර්ෂය තුළ එම භාණ්ඩ කිසිවක් මිලදී ගෙන නොතිබුණි. | (ඇ) කෘෂිකර්ම පීඨයේ පරිගණක ඒකකය සඳහා සඳහන් කර ඇති උපකරණ මිලදී ගැනීමට හඳුනාගෙන ඇති බවට පිළිගන්නා කරුණකි. එසේ වුවද කිසියම් අංශයකට එම අංශයන්හි ඇති අඩුපාඩු සම්බන්ධයෙන් අවශ්‍යතාවය හඳුනා ගැනීම හා ඒවා ක්‍රියාවේ යෙදවීම යන්න ක්‍රියාවන් දෙකකි. ඒ අනුව මෙහි සඳහන් කර ඇති පරිදි අවශ්‍යතාවය හඳුනාගෙන අදාල වර්ෂයේ ප්‍රසම්පාදන සැලසුමට ඇතුළත් කර තිබුණ ද ඒවා ක්‍රියාවේ යෙදවීම සිදු කළ හැකි වන්නේ භාණ්ඩාගාරය විසින් ලබාදෙන අරමුදල් ප්‍රමාණය අනුවය. එහිදී අවශ්‍යතා හඳුනා ගැනීම සිදුකර තිබුණ ද 2017 වර්ෂය සඳහා ප්‍රමුඛතා පදනමක් යටතේ ප්‍රසම්පාදන කටයුතු සිදුකර ඇත. එහිදී පීඨයට වෙන් කරන මුදලින් පරිගණක අංශය සඳහා වෙන් කළ හැකි අරමුදල් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් මේවා මිලදී ගැනීමට නොහැකි විය.<br><br>දැනට කෘෂිකර්ම පීඨයේ පරිගණක විද්‍යාගාරයෙහි සිසුන්ගේ පරිහරණය සඳහා පරිගණක 75ක් පමණ පවතින අතර පරිගණක 05ක පමණ ප්‍රමාණයක් වරින් වර පරිගණක විද්‍යාගාරයක් තුළ ක්‍රියා විරහිතව පවතී. එම ක්‍රියාවිරහිත පරිගණක අලුත්වැඩියා කිරීමෙන් පසු භාවිතයට ගත හැකි තත්ත්වයයේ පවතින බැවින් එම පරිගණක අලුත්වැඩියා කිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. |

| ඡේද අංකය | විගණකාධිපති විසින් විමසීම් කරන ලද කරුණ | විශ්වවිද්‍යාලය විසින් ලබා දී ඇති පිළිතුර |
|---|---|---|
| 6.3.2 | <u>**කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**</u><br><br>රු. මිලියන 94 ක් වැයකර ඉදිකර තිබුණු ඉංජිනේරු පීඨයේ නව පුස්තකාල ගොඩනැගිල්ල 2015 අප්‍රේල් 22 විශ්වවිද්‍යාලයට භාරදී තිබුණද, ගොඩනැගිලි බිත්ති, කොන්ක්‍රීට් බීම් සහ කුළුණු ඉරිතැලීම් හෝ පිපිරීම්වලට ලක්වී තිබුණු ස්ථාන 170 ක් නිරීක්ෂණය වූ අතර පළමු මහල හා දෙවන මහලවල බිත්ති මත ජලය කාන්දුවන ස්ථාන 03ක් නිරීක්ෂණය විය. තවද විදුලි පරිපථය විධිමත් පරිදි සකසා නොතිබුණු බැවින් විදුලි පැන්නුම් ස්විචය (Trip Switch) ක්‍රියාත්මක නොවීම හේතුවෙන් ගොඩනැගිල්ලේ සවිකර තිබූ ස්විච 3ක් අතරින් රු. 624,094ක් වටිනා ස්විච් සම්පූර්ණයෙන්ම විනාශ වී තිබුණු අතර අනෙක් ස්විචයක කොටසක් අක්‍රීය වී තිබුණි. | සඳහන් කර ඇති පරිදි බිත්ති හා කොන්ක්‍රීට් ඉරිතැලීම් ප්‍රමාණය නිවැරදිය. මෙය විශාල ගොඩනැඟිල්ලක් වන නිසා එවැනි කුඩා ප්‍රමාණයේ ඉරිතැලීම්/පිපිරීම් කාලයත් සමඟ මතුවීම ඉතා සාමාන්‍ය දෙයකි. තවද මෙම කුඩා ඉරිතැලීම් හේතුවෙන් ගොඩනැඟිල්ලේ ආරක්ෂාවට හෝ සවිශක්තියට කිසිදු හානියක් සිදුව නොමැත. කෙසේ වෙතත් ගොඩනැඟිල්ල විශ්වවිද්‍යාලය විසින් භාරගත් අවස්ථාවේදී සුපරික්ෂාකාරී ලෙස කටයුතු කළ අතර, එම අවස්ථාවේදී එනම් 2015 අප්‍රේල් 22 දින වන විට මෙම ඉරිතැලීම්/පිපිරීම් නිරික්ෂණය නොවූ බවද සහතික කළ හැකිය. මෙම ඉරිතැලීම් සම්බන්ධව පරික්ෂා කොට ඒ සම්බන්ධ ඉදිරි පියවර ගැනීමට කටයුතු කරනු ඇත.<br><br>විදුලි පැන්නුම් ස්විචයක් ක්‍රියාත්මක වීමේදී කරුණු කිහිපයක් බලපායි. ඒ අනුව සෑම අකුණු ගැසීමකදීම විදුලි පැන්නුම් ස්විචය ක්‍රියාත්මක නොවන අතර, අකුණේ තීව්‍රතාවය, අකුණු ගැසීම සිදුවූ ස්ථානය හා විදුලි පැන්නුම් ස්විචයේ සංවේදීතාවය යන කරුණු මත එය සිදුවේ. සාමාන්‍යයෙන් Network Switch වල සංවේදීතාවය ඉතා අධික බැවින් හා මේ සඳහා භාවිතා කරනු ලබන භූගත අන්තර්ජාල කේබල් වල සංවේදීතාවය නිසා අකුණු සැර වැදීමේ ප්‍රවණතාවය අධිකය. එම නිසා විදුලි පැන්නුම් ස්විචය අක්‍රිය වී තිබුණද භූගත කේබල් හරහා විදුලි සැර එම උපකරණයට ලඟාවීමේ ඉහළ සම්භාවිතාවක් පවතී. මේ හේතුව මත විදුලි පැන්නුම් ස්විචයේ දෝෂයක් නිසා එම උපකරණ වලට හානි වී ඇති බව පැවසීම සම්පූර්ණ ලෙස පිළිගත නොහැක.<br><br>විදුලි පද්ධතියේ සඳහන් කර ඇති දුර්වලතා පිළිබඳ මේ වන විට අවධානය යොමු වී ඇති අතර අදාල ආයතන මේ වන විට දැනුවත් කර අවශ්‍ය පියවර ගෙන තිබේ. |
| 6.4 | <u>**අයවැය පාලනය**</u><br><br>සමාලෝචිත වර්ෂය සඳහා වූ වැය විෂයයන් 64 ක අයවැයගත හා තත්‍ය වියදම් අතර සියයට 25 සිට සියයට 559ක් දක්වා සැලකිය යුතු විචලනයක් නිරීක්ෂණය වූයෙන්, අයවැය ලේඛනය ඵලදායි | උසස් අධ්‍යාපනය වැනි සේවා සපයන ආයතනයක කටයුතු හුදෙක් වාණිජ පරමාර්ථයෙන් කටයුතු කරනු ලබන ආයතනයක කටයුතු මෙන් නියමිත වැය සීමාවන් තුළම කටයුතු කළ නොහැක. එසේ වැය සීමාවන් තුළම කටයුතු කළහොත් සපයනු ලබන සේවාවේ ගුණාත්මක භාවයද අඩුවේ. මෙහිදී |

| ඡේද අංකය | විගණකාධිපති විසින් විමසීම් කරන ලද කරුණ | විශ්වවිද්‍යාලය විසින් ලබා දී ඇති පිළිතුර |
|---|---|---|
| | කළමනාකරණ පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. | විශේෂ අවධානයක් සපයන සේවාවේ ගුණාත්මක භාවය කෙරෙහි යොමු කළ යුතුව ඇත. |
| **6.5** | <u>**නොවිසඳි ඇති විගණන ඡේද**</u><br>ඉකුත් විගණකාධිපති වාර්තා මඟින් පෙන්වා දී තිබුණු නමුත්, පහත විස්තර දැක්වෙන විගණන ඡේද සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් විශ්වවිද්‍යාලයේ අවධානය යොමු වී නොතිබුණි.<br><br>(අ) ධීවර, සාගර විද්‍යා හා තාක්ෂණ පීඨය මඟින් 2006 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා ක්‍රියාත්මක කර තිබුණු Specific Agreement on Research Co-operation Between the Swedish International Development Co-operation Agency ව්‍යාපෘතිය යටතේ උසස් අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර ගැනීම සඳහා කිසිදු ඇප බැඳුම්කරයකට එළඹීමෙන් තොරව තාවකාලික කථිකාචාර්යවරයෙකුට සහ ස්ථිර කථිකාචාර්යවරයෙකුට එකතුව රු.1,740,622 ක මූල්‍යාධාර සපයා තිබුණි. එහෙත් 2017 දෙසැම්බර් 31 දක්වාම එම කථිකාචාර්යවරුන් උසස් අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර සේවයට වාර්තා කර නොතිබීම හේතුවෙන් දරන ලද වියදමට කිසිදු ප්‍රතිලාභයක් විශ්වවිද්‍යාලයට ලැබී නොමැති බව නිරීක්ෂණය විය. | <br><br><br><br><br><br>(අ) මෙම ව්‍යාපෘතිය යටතේ පහත සඳහන් ආචාර්යවරුන් සඳහා මූල්‍යාධාර සපයා තිබිණ.<br>ආචාර්ය. චන්දන නිශ්ශංක මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>ආචාර්ය චන්දන නිශ්ශංක මහතා 2007.09.27 දින සිට 2007.12.21 දින දක්වා මාස 02ක් සඳහා නිවාඩු ඉල්ලුම් කර ඇත. එම නිවාඩුවලින් නිවාඩු දින 25ක් වැටුප් සහිත නිවාඩු ලෙස 2007.10.08 දින පවත්වන ලද 258 වන පාලක සභාව විසින් අනුමත කර ඇත.<br>ඉහත සඳහන් කළ විවේක නිවාඩු Principles and Applications of remote sensing and Geography Information System (GIS) පාඨමාලාව හැදෑරීම සඳහා ඉල්ලුම් කරන ලද අතර, එම පාඨමාලාව 2007.09.27 දින සිට 2007.12.11 දින දක්වා International Institute for Geo Information Science and Earth Observation (ITC) ආයතනය මඟින් පවත්වන ලදී. එම පාඨමාලාව හැදෑරීමෙන් පසුව ආචාර්ය නිශ්ශංක මහතා 2007.12.14 දින නැවත සේවයට වර්තා කර ඇත.<br>ආචාර්ය නිශ්ශංක මහතාට නැවතත් 2008.01.24 දින සිට 2008.02.07 දින දක්වා දින 14 ක් වැටුප් සහිත විවේක නිවාඩු ලබා දී ඇත. ඉන් පසුව 2008.06.13 දින නැවත සේවයට වාර්තා කර ඇති අතර 2008.09.30 දින නැවත පෞද්ගලික හේතුවක් මත නිවාඩු ඉල්ලා ඇත. 2008.10.02 දින සිට සේවය අත හැර ගියා සේ සළකා ඇත.<br><br>එන්.කේ.එන්.කේ. විද්‍යාරත්න මෙය - තාවකාලික කථිකාචාර්ය<br>එන්.කේ.එන්.කේ. විද්‍යාරත්න මෙනවිය 2007.10.05 වන දින SIDA/SAREC ව්‍යාපෘතියේ ප්‍රතිපාදන මගින් පුහුණු පාඨමාලාවක් සඳහා සහභාගී වීමට 2007.10.15 දින සිට 2007.12.15 දින දක්වා මාස දෙකක නිවාඩු ඉල්ලුම් කර ඇත. |

| ඡේද අංකය | විගණකාධිපති විසින් විමසීම් කරන ලද කරුණ | විශ්වවිද්‍යාලය විසින් ලබා දී ඇති පිළිතුර |
|---|---|---|
| | | 2007.12.18 වන දින තාවකාලික සහකාර කථිකාචාර්ය තනතුරේ වැඩ භාර ගෙන ඇත.<br><br>එසේම මාස 9කට අඩු කාලයක් සඳහා අයදුම් කරන නිවාඩු සඳහා ගිවිසුම් හා බැඳුම්කරයන්ට එළඹීම අවශ්‍ය නොවන බව විශ්වවිද්‍යාල පනතේ සඳහන් වන අතර එවකට මෙම පීඨයේ පැවති ආචාර්ය මණ්ඩලයේ අවශ්‍යතාවය සහ ජාතිකමය වශයෙන් ඇති ප්‍රතිලාභය සලකා බලා මෙම ආචාර්යභවතුන් දෙදෙනාට මෙම නිවාඩු ලබාදී ඇත. |
| | (ආ)<br>(i) කෘෂිකර්ම විද්‍යා පීඨයේ ආහාර හා තාක්ෂණ විද්‍යා අධ්‍යයනාංශය සඳහා අවශ්‍ය විද්‍යා උපකරණ ජර්මනියේ ආයතනයකින් මිලදී ගැනීම සඳහා වසර 04 කට පෙර රු. 751,463 ක අත්තිකාරම් මුදලක් ගෙවා තිබුණි. කෙසේ වුවද එම උපකරණ 2014 වර්ෂයේ මාර්තු දක්වා විශ්වවිද්‍යාලයට ලැබී නොතිබුණු නමුත් ඒ පිළිබඳව කිසිදු පසු විපරම් කිරීමකින් තොරව නැවත වරක් රු. 329,179ක් වැයකර ඉන්දියාවෙන් උපකරණ ආනයනය කර තිබුණි.<br><br>(ii) එහෙත් ඇණවුම් නොකරන ලද භාණ්ඩ ලැබීම් සහ විවිධ අඩුපාඩු හේතුවෙන් එම උපකරණ විශ්වවිද්‍යාලය වෙත ලැබී සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් වසර 02ක් ඉක්මවා තිබුණද ප්‍ර යෝජනයට ගත නොහැකිව තිබුණි.<br><br>(iii) ඉහත ඡේද අංක (ආ) (i) දක්වා ඇති භාණ්ඩ ශ්‍රී ලංකා රේගු අධිකාරියට අයත් ඔරුගොඩවත්ත ගබඩාවේ තිබී 2016 මැයි 04 දින නිදහස් කර ගෙන තිබුණි. ඒ අනුව 2013 නොවැම්බර් 25 දින සිට 2016 අප්‍රේල් 29 දක්වා දින 887 ක් භාණ්ඩ ගබඩාවේ රඳවා ගැනීමට සිදුවීම වෙනුවෙන් රු.88,700 ක ගබඩා ගාස්තුවක්ද, ගුවන්තොටුපල ගාස්තු වශයෙන් රු. 30,750 ක් ද වශයෙන් එකතුව රු. 119,450 ක් ගෙවීමට සිදු වී තිබුණි. එය අදාල නිලධාරින්ගේ ප්‍රමාදය හා නොසැලකිල්ල නිසා රජයට සිදු වූ පාඩුවක් වුවද, ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 156 (1) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි | (ආ). (i), (ii), (iii)<br>ආහාර විද්‍යා හා තාක්ෂණ අධ්‍යයනාංශය විසින් මිලදී ගෙන ඇති මෙම උපකරණ වල අඩුපාඩු පරික්ෂා කිරීම සඳහා මුදල් අනුකමිටුව මඟින් කමිටුවක් පත්කර අදාල අයිතමයන් පරිහරණය කළ හැකි තත්ත්වයට පත් කිරීම සඳහා වැය වන වියදම ගණන් බලා ඒ අනුව සිදු වූ අලාභය අවම කළ හැකිද යන්න සොයා බලා වාර්තා කරන ලෙස උපදෙස් ලබාදී ඇත. එසේ වුවද අදාල කමිටුවේ තීරණය වී ඇත්තේ එකී උපකරණ කිසිවක් පරිහරණය කළ හැකි තත්ත්වයට පත් කළ නොහැකි බවයි. ඒ අනුව 2018-02 මුදල් අනුකමිටුව වෙත අදාල සියලු තොරතුර ඉදිරිපත් කිරීමෙන් පසු නිර්දේශය වී ඇත්තේ මෙම ක්‍රියාවලියේ සිදු වූ අක්‍රමිකතා හා අලාභයන් සම්බන්ධයෙන් ක්‍රියා කරන්නේ කෙසේද යන්න උපදෙස් ලබා ගැනීමට පාලක සභාව වෙත ඉදිරිපත් කිරීමට නියමිතව ඇති බවයි. පාලක සභා තීරණය අනුව ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ. |
| | (ඇ) ලෝක සෞඛ්‍ය සංවිධාන ව්‍යාපෘතියට අදාල වෛද්‍ය පීඨ අරමුදල් ගිණුමේ 2017 | (ඇ) නව බස්රථයක් මිලදී ගැනීම සඳහා වන අනුමැතිය ලබාගැනීමට කම්ප්ට්‍රෝලර් |

| ඡේද අංකය | විගණකාධිපති විසින් විමසීම් කරන ලද කරුණ | විශ්වවිද්‍යාලය විසින් ලබා දී ඇති පිළිතුර |
|---|---|---|
| | දෙසැම්බර් 31 දිනට රු. 1,764,410 ක ශේෂයක් පැවතුණි. 2015 සැප්තැම්බර් 09 හා 2017 ජනවාරි 17 යන දිනවල විගණනයට ඉදිරිපත් කර තිබුණු පිළිතුරු ලිපි මගින් ඉහත අරමුදල් ගිණුමේ ශේෂය පීඨයට නව බස් රථයක් මිලදී ගැනීම සඳහා යෙදවීමට බලාපොරොත්තු වන බව දක්වා තිබුණද, 2018 මැයි 31 දින දක්වා එය ක්‍රියාත්මක කර නොතිබුණි. | ජෙනරාල් දෙපාර්තමේන්තුව වෙත අදාල ලේඛන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන අමාත්‍යංශය මගින් යවා ඇත. ඒ අනුව අදාල අනුමැතිය ලබා ගත්පසු ඉදිරියේදී බස් රථය මිලදී ගැනීමට අදාල කටයුතු කිරීමට නියමිතව ඇත. |
| **6.6** | <u>**පාරිසරික හා සමාජ වගකීම් ඉටුකිරීම**</u><br><br>පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.<br>(අ) ප්ලාස්ටික් හා පොලිතීන් භාවිතය නිසා සිදු වන සෘජු හා වක්‍ර සෞඛ්‍ය, පාරිසරික හා සමාජීය බලපෑම අවම කර ගැනීමට වැඩසටහන් විවිධ රාජ්‍ය ආයතන සම්බන්ධ කර ගෙන ක්‍රියාත්මක කළ හැකිව තිබුණද, විශ්වවිද්‍යාලය ඒ සම්බන්ධයෙන් අවදානයක් යොමු කර නොතිබුණි. | (අ) රුහුණ විශ්වවිද්‍යාලය විසින් පවිත්‍රතා සේවා කොන්ත්‍රාත්තුව ලබා දීමේදී මේ පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරමින් කටයුතු කර ඇත.<br><br>රුහුණ විශ්වවිද්‍යාලයේ වැල්ලමඩම පරිශ්‍රයේ සහ කෘෂිකර්ම පීඨයේ කසල භාවිතයෙන් කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කරනු ලබන අතර විශ්වවිද්‍යාලය තුළ ප්ලාස්ටික් සහ පොලිතීන් එක් ස්ථානයකට එක් රැස් කර තොග වශයෙන් මාතර මහ නගර සභාවට භාරදීම සිදු කරනු ලබයි. මේ අනුව රාජ්‍ය ආයතන සම්බන්ධ කර ගනිමින් ප්ලාස්ටික් හා පොලිතීන් ඉවත් කිරීම සඳහා වැඩපිළිවලක් යොදා ඇත.<br><br>තවද හරිත ඵලදායීතා ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් විධිමත් කසල බැහැර කිරීමේ වැඩ සටහනක් දැනටමත් ක්‍රියාත්මක කර ඇත. |
| | (ආ) පහත විස්තර දැක්වෙන පරිසර හිතකාමී වැඩසටහන් ක්‍රියාත්මක කිරීම කෙරෙහි විශ්වවිද්‍යාලයේ අවධානය යොමු වී නොතිබුණි.<br>(i) දැනට තහනම් කර ඇති මයික්‍රෝන 20 ට අඩු පොලිතීන් බෑග් හා ආහාර දැවටුම් විශ්වවිද්‍යාලය තුළට රැගෙන ඒම තහනම් කිරීම.<br>(ii) මයික්‍රෝන 20 ට වැඩි පොලිතීන් හා අනෙකතුත් ද්‍රව්‍ය හා ප්ලාස්ටික් රැගෙන ඒම පාලනය කිරීම.<br>(iii) විශ්වවිද්‍යාලය තුළට ආහාර රැගෙන ඒමේදී ප්ලාස්ටික්,පොලිතීන් බෑග් සහ කෑම දවටන කොළ වෙනුවට වෙනත් ඇසුරුම් ක්‍රමවේද | (ආ) (i), (ii), (iii)<br>පාරිසරික ගැටළු අවම කිරීම සඳහා පොලිතීන් භාවිතය තහනම් කිරීම සඳහා අති විශේෂ ගැසට් පත්‍රිකා අංක 2034/34 සහ 2034/35 මගින් වැඩි ඝනත්වයෙන් යුත් පොලිතීන් (HDPE) අඩු ඝනත්යෙන් යුත් පොලිතීන් (LDPE) සහ පොලිප්‍රොපිලීන් (PP) පොලිතීන් අමුද්‍රව්‍යයක් ලෙස නිෂ්පාදිත ආහාර දවටන (ලන්ච් ෂීට්) සහ වැඩි ඝනත්වයෙන් යුත් (HDPE) පොලිතීන් අමුද්‍රව්‍යයක් ලෙස නිෂ්පාදිත ග්‍රොසරි බෑග්/පොලිතීන් බෑග් ආහාර බහාලුම් භාවිතය තහනම් කර ඇති බව රුහුණ විශ්වවිද්‍යාලයේ ආපනශාලා හිමිකරුවන් වෙත ලිපියක් මගින් දැනුම් දී ඇත. |

<table>
<tr><th>ඡේද අංකය</th><th>විගණකාධිපති විසින් විමසීම් කරන ලද කරුණ</th><th>විශ්වවිද්‍යාලය විසින් ලබා දී ඇති පිළිතුර</th></tr>
<tr><td></td><td>කෙරෙහි සිසුන් හා කාර්ය මණ්ඩලය දිරි ගැන්වීම.</td><td>ඒ අනුව එම රෙගුලාසි වලට අනුව කටයුතු කරන ලෙස ආපනශාලා හිමිකරුන් දැනුවත් කර ඇති බැවින් අවශ්‍ය කටයුතු ඒ අනුව සිදු කරමින් පවතී.</td></tr>
<tr><td>7</td><td><u>පද්ධති හා පාලනයන්</u><br>විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර විශ්වවිද්‍යාලයේ උපකුලපතිගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.
<table>
<tr><th>පද්ධති හා පාලන ක්ෂේත්‍ර</th><th>නිරීක්ෂණ</th></tr>
<tr><td>(අ) ස්ථාවර වත්කම් පාලනය</td><td>ආයතනයට ලැබෙන භාණ්ඩ වෙනුවෙන් භාණ්ඩ ලැබීම් තුණ්ඩු නිකුත් නොකිරීම.</td></tr>
<tr><td>(ආ)ගිණුම්කරණය</td><td>ඒකාකාරී ගිණුම්කරණ ප්‍රතිපත්තියක් අනුගමනය නොකිරීම, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති නිවැරදිව භාවිතා නොකිරීම, ගෙවිය යුතු වියදම් සඳහා ප්‍රතිපාදන වෙන්කර නොතිබීම, ආදායම නිවැරදිව ගිණුම්ගත නොකිරීම, වියදම් නොවූ ප්‍රාග්ධන ප්‍රදාන නිවැරදිව මූල්‍ය ප්‍රකාශන වලින් හෙළිදරව් කර නොතිබීම හා මුදල් ප්‍රවාහ නිවැරදිව හඳුනා නොගැනීම.</td></tr>
<tr><td>(ඇ) මුදල් හා බැංකු කටයුතු</td><td>ලැබිය යුතු මුදල් කඩිනමින් නිරවුල් කර නොගැනීම, රාජකාරී බැංකු ගිණුම් ආරම්භ කිරීම සඳහා භාණ්ඩාගාරයෙන් අනුමැතිය ලබා නොගැනීම, බැංකු ජංගම ගිණුම් වලට අදාලව මුදල් පොත්වල ශේෂය අයිරාවක් වී තිබීම හා නිකුත් කර කල් ඉකුත් වූ චෙක්පත් සම්බන්ධයෙන් මුදල්</td></tr>
</table></td><td>විශ්වවිද්‍යාලයේ මූල්‍යාමය පාලනයන් හා කළමනාකරණ පාලනයන් ශක්තිමත් කර ගැනීමට රජයේ විගණන අංශය විසින් ලබා දෙන සහාය පිළිබඳව අගය කරමින් පෙන්වා දී ඇති පරිදි පාලන පද්ධති සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමුකර කටයුතු කිරීමට අවශ්‍ය පියවර ගනු ඇත.</td></tr>
</table>

| ඡේද අංකය | විගණකාධිපති විසින් විමසීම් කරන ලද කරුණ | | විශ්වවිද්‍යාලය විසින් ලබා දී ඇති පිළිතුර |
|---|---|---|---|
| | | රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබීම. | |
| | (ඇ)අත්තිකාරම් කටයුතු | අත්තිකාරම් පියවා නොතිබීම. | |
| | (ඉ)කාර්ය මණ්ඩල කළමනාකරණය | තනතුර පුරප්පාඩු පුරවා ගැනීමට කටයුතු නොකිරීම, තනතුර පුරප්පාඩු සඳහා කළමනාකරණ සේවා දෙපාර්තුමේන්තු අනුමැතිය ලබා ගෙන නොතිබීම. | |
| | (ඊ) අයවැය පාලනය | නිශ්චිත පුරෝකථනයකින් තොරව අයවැය ලේඛන පිළියෙල කිරීම හා අයවැය ගත ඉලක්ක සම්පූර්ණ කර ගැනීම සඳහා පසු විපරම් කටයුතු කර ඒ අනුව අයවැය සංශෝධනය කර ගැනීමට පියවර ගෙන නොතිබීම. | |
| | (උ) කොන්ත්‍රාත් පරිපාලනය | ගොඩනැගිලි ඉදිකිරීම් වල ගුණාත්මකභාවය සහතික නොකිරීම. | |



ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ගාමිණී සේනානායක
උපකුලපති
රුහුණ විශ්වවිද්‍යාලය
2018.12.11

**විස්තරාත්මක විගණකාධිපති වාර්තාවේ ඡේද අංක 1.5.1 ලැබිය යුතු මුදල් යටතේ විශ්වවිද්‍යාලය සමග ඇති කර තිබුණු ගිවිසුම් හා බැඳුම් කර කඩ කිරීම් සම්බන්ධව 2018.09.20 දක්වා නීති හා ලේඛන අංශය යටතේ පාලක සභාව විසින් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට අනුමත කර ඇති ලිපි ගොනු**

| අංකය | ආචාර්යවරයාගේ නම | බැඳුම්කර වටිනාකම | ආපසු ගෙවා ඇති මුදල් ප්‍රමාණය | අවසන් වාර්තාව යොමු කළ දිනය | වාරිකය ගෙවා නැති ප්‍රමාණය | නොගෙවා ඇති වටිනාකම් අයකර ගැනීමට ගෙන ඇති ක්‍රියාමාර්ග (නීති අංශයේ වාර්තා අනුව) |
|---|---|---|---|---|---|---|
| | | ආයතන අධ්‍යයනාංශයේ වාර්තා අනුව | | | | |
| 1 | පී.ආර්.ටී.එන්. ද සිල්වා මහතා | රු.908243.44 | රු.71918.00 | - | රු.836325.44 | නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. නීතිපති ගො අංකය C/260/17/UR |
| 2 | ඩබ්.එම්.කේ. කිත්සිරි මහතා | රු.269450.00(මුදල් අංශ ලේඛණයට අනුව) | - | - | රු.269450.00 | නීති හා ලේඛන අංශයට යොමු වී නොමැත |
| 3 | ජී.එස්.පී.ගරුසිංහ මහතා | රු.5108344.84 | - | - | රු.5108344.84 | නීති හා ලේඛන අංශයට යොමු වී නොමැත |
| 4 | අයි.ආර්. ප්‍රියන්ත මහතා | රු.1445505.72 | රු.1445505.72 | - | - | නීතිමය ක්‍රියමාර්ග ගැනීමට නීතිපති දෙපාර්තමේන්තුවට යොමු කර නීතිපති ගොනු C/97/16/UR ලබා දී ඇත. ඉන් පසුව ගිවිසුම් හා බැඳුම්කර මුදල වන රු 1445505.72 ක මුදල ගෙවා ඇත. |
| 5 | පී.යූ.යූ. ප්‍රනාන්දු මහත්මිය | රු.556529.44 | රු.382307.22 | - | රු.174222.22 | නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට නීතිපති දෙපාර්තමේන්තුවට යොමු කර ඇත. නීපති ගොනු අංකය C/229/14/UR. මුදල් අංශය මගින් ගෙවා නැති මුදල වශයෙන් සඳහන් කර ඇති රු 174222.22 ක මුදල ගෙවා ඇති බව තහවුරු කරන ලදි. |

| අංකය | ආචාර්යවරයාගේ නම | බැඳුම්කර වටිනාකම | ආපසු ගෙවා ඇති මුදල් ප්‍රමාණය | අවසන් වාර්තාව යොමු කළ දිනය | වාරිකය ගෙවා නැති ප්‍රමාණය | නොගෙවා ඇති වටිනාකම් අයකර ගැනීමට ගෙන ඇති ක්‍රියාමාර්ග (නීති අංශයේ වාර්තා අනුව) |
|---|---|---|---|---|---|---|
| | | ආයතන අධ්‍යයනාංශයේ වාර්තා අනුව | | | | |
| 6 | ආචාර්ය පී.පී.එම්. ජයවීර මහතා | රු.478784.39 | - | - | රු.478784.39 | නීතිපති දෙපාර්තමේන්තුව විසින් කොළඹ දිසා අධිකරණයේ නඩු අංක DMR/2190/2015 යටතේ නඩු පවරා ඇත. |
| 7 | ජී.සී.ජේ.කුරුප්පු මහතා | රු.1721299.36 | රු.1148840.27 | - | රු.572459.09 | නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට නීතිපති දෙපාර්තමේන්තුව  වෙත යොමු කර ඇත. නීතිපති ගොනු අංකය C/57/15/UR |
| 8 | වී.එම්.අකුරටිය ගමගේ මහත්මිය | රු.751997.99 | - | - | රු.751997.99 | නීතිපති දෙපාරත්මේන්තුව විසින් මාතර දිසා අධිකරණයේ M/15084 යටතේ නඩු පවරනු ලැබීය මෙම නඩුව සම්බන්ධව ඉදිරිපත් කරන ලද මූලික විරෝධතා සළකා බැලූ අධිකරණය 2018.04.24. දිනැති නියෝගය පරිදි තීරණය කරන ලද්දේ ගිවිසුම් හා බැඳුම්කර කඩ වීමෙන් අය විය යුතු මුදල වග උත්තරකාර පාර්ශවය ගෙවීමට බැඳීමක් නැති බවයි. |
| 9 | එන්.ජී.බී.එස්. කුමාර මහතා | රු.2432517.63 | රු.454452.50 | - | රු.1978065.13 | නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. නීතිපති ගො අංකය C/170/14/UR ලබා දී ඇත. ඉන් පසුව ඔහුගේ ඒකඟත්වය පරිදි රු 197465/13 ක මුදල ඔහුගේ අර්ථසාධක අරමුදලින් අය කර ගැනීමට කටයුතු කර ඇත. |
| 10 | වෛද්‍ය කේ.පී.ආර්.සී. පරාක්‍රමවංශ මහතා | රු.3293531.65 | රු.160300.00 | - | රු.3133231.65 | නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට නීතිපති දෙපාර්තමේන්තුවට යොමු කර ඇත. නීතිපති ගොනු අංකය C/227/14/UR වේ. |

| අංකය | ආචාර්යවරයාගේ නම | බැඳුම්කර වටිනාකම | ආපසු ගෙවා ඇති මුදල් ප්‍රමාණය | අවසන් වාර්තාව යොමු කළ දිනය | වාරිකය ගෙවා නැති ප්‍රමාණය | නොගෙවා ඇති වටිනාකම් අයකර ගැනීමට ගෙන ඇති ක්‍රියාමාර්ග (නීති අංශයේ වාර්තා අනුව) |
|---|---|---|---|---|---|---|
| | | ආයතන අධ්‍යයනාංශයේ වාර්තා අනුව | | | | |
| 11 | වෛද්‍ය එන්.එස්. ප්‍රනාන්දු මහත්මිය | රු.1876206.30 | රු.1532737.62 | - | රු.343468.68 | නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට නීතිපති දෙපාර්තමේන්තුවට යොමු කර ඇත. නීතිපති ගොනු අංකය C/60/17/UR වේ. |
| 12 | ටී.එල්.එස්.එල්. විජේසිංහ මහතා | රු.943948.47 | - | - | - | නීතිපති දෙපාර්තමේන්තුව මගින් මාතර දිසා අධිකරණයේ නඩු අංක M/14436 යටතේ නඩු පවරා ඇත.  ඉන් පසුව 2018.05.23. වැනි දින විවෘත අධිකරණයේ දී රු 943948/47 ක මුදල රුහුණ විශ්වවිද්‍යාලයේ මුදල් අයකැමි වෙත ලබා දෙන ලදි. මුදල් ලදුපත් අංකය 18715 |
| 13 | ඩී.එස්. වික්‍රමනායක මහතා | රු.952521.18 | රු 952521.18 | රු 600000.00 | රු.352521.18 | නීතිපති දෙපාර්තමේන්තුව විසින් මාතර දිසා අධිකරණයේ නඩු අංක M/15104 යටතේ නඩු පවරා ඇත. ඒකී නඩුවේ දී ගිවිසුම් හා බැඳුම්කර මුදල වන රු 952521/18 ක මුදල වාරික 10 කින් ගෙවීමට ඒකඟත්වය පළ කළ ඒනම් මුල් වාරික 9 රු 100000/- බැගින් ද 10 වැනි වාරිකය රු 52521/18 ක මුදල කි. මේ අනුව දැනට 6 වන වාරිකය2018.08.15. දාතමින් රු 100000/- ගෙවා ඇති අතර දැනට ගෙවා ඇති මුදල රු 600000/- |
| 14 | කේ.ඩී.කේ.ඒ. සෝමරත්න මහතා | රු.2662125.02 | රු.2662125.02 | - | - | නීතිපති දෙපාර්තමේන්තුවට නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට යොමු කර ඇති අතර නීතිපති ගොනු අංක C/137/15/UR වේ අනුව ගිවිසුම් හා බැඳුම්කර මුදල  ගෙවා ඇත. |

| අංකය | ආචාර්යවරයාගේ නම | බැඳුම්කර වටිනාකම | ආපසු ගෙවා ඇති මුදල් ප්‍රමාණය | අවසන් වාර්තාව යොමු කළ දිනය | වාරිකය ගෙවා නැති ප්‍රමාණය | නොගෙවා ඇති වටිනාකම් අයකර ගැනීමට ගෙන ඇති ක්‍රියාමාර්ග (නීති අංශයේ වාර්තා අනුව) |
|---|---|---|---|---|---|---|
| | | ආයතන අධ්‍යයනාංශයේ වාර්තා අනුව | | | | |
| 15 | ආර්.එම්.පී.එන්.රණසිංහ මහත්මිය | රු.2171444.12 | - | - | රු.2171444.12 | නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. නීතිපති ගො අංකය C/25/12/UR |
| 16 | ඩී.ඒ. සුදත් ටෙරන්ස් මහතා | රු.3,997,417.07 | රු.1679051.25 | - | රු.2,318,365.82 | නීතිපති දෙපාර්තමේන්තුව විසින් මාතර දිසා අධිකරණයේ නඩු අංක M/13302 යටතේ නඩු පවරා ඇත. ඒකී නඩුවේ දී ගිවිසුම් හා බැඳුම්කර මුදල වන රු 4029723/- ක මුදල වාරික 12 කින් ගෙවීමට ඒකඟත්වය පළ කළ දිසා අධිකරණයේ දී සමතයකට පත් වූ අතර ඒක් වාරිකයක අගය රු 335810/25 ක් වශයෙන් දැක්වෙන අතර ඒ් අනුව මේ වන විට 2018.08.21. දාතමින් 05 වැනි වාරිකය ද ගෙවා ඇත. ඒ් අනුව දැනට ගෙවා ඇති මුදල රු 1679051.25 කි. |
| 17 | සී. පී. ගුණසේන | 1,917,925.95 | - | - | 1,917,925.95 | නීතිපති දෙපාර්තමේන්තුව වෙත ලිපි ගොනුව යොමු කොට ඇත. |

**නියෝජ්‍ය ලේඛකාධිකාරි**
**නීති හා ලේඛන**